**2019.03.05 වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පැවති මාසික සභා රැස්වීම් වාර්තාව**

**සහභාගීත්වය**

| | |
|---|---|
| ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා | ගරුසභාපති |
| කමල් වැල්ලගේ මහතා | ගරු උප සභාපති |
| ජී.සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ග්‍රේෂන් කෙරමිණියගේ මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඒ. ඩබ්. ජගත් කුමාර මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඒ.පී. ලක්ෂ්මී හේමන්තා ද සිල්වා මෙනවිය | ගරු නගර සභා මන්ත්‍රිනි |
| දිනයාදූර ධර්මදාස මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| නන්දන රාජපක්ෂ මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ලලිත් ධම්මික කොඩිකාර මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ආර්. එම්. ලසන්ත අජිත් කුමාර මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩෙනට් පනියන්දුවගේ මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| මගගේ අතුල ප්‍රියන්ත මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය | ගරු නගර සභා මන්ත්‍රී |
| ජී. ජී. ආර්. පේෂලා කුමාරි මහත්මිය | ගරු නගර සභා මන්ත්‍රිනි |
| එච්.ඉනෝකා ක්‍රිෂාන්ති මහත්මිය | ගරු නගර සභා මන්ත්‍රිනි |
| එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩබ්. එම්. නිලානි මෙනවිය | ගරු නගර සභා මන්ත්‍රිනි |
| ධනසේන මාදුවගේ මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| එස්. එම්. සරත්චන්ද්‍ර ද සිල්වා මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| මගගේ චම්පා සුමුදු කුමාරි මහත්මිය | ගරු නගර සභා මන්ත්‍රිනි |

❁ **පන්සිල් සමාදන් වීමෙන් අනතුරුව පෙ.ව. 9.30 රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී❁**

## (01)

**01.01** **2019 – 02 – 05 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම**

**2019-02-05 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව පිළිගත යුතු බවට ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රිනි ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය විසින් ස්ථිර කරන ලදී.**

❖ **ඒ අනුව 2019- 02- 05 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**(02)** සභාපතිවරයා විසින් කරන විශේෂ නිවේදන — නැත

**(03)** **ලැබී ඇති පැමිණිලි ,පෙත්සම් හා ලිපි සභාවට ඉදිරිපත් කිරීම**

**03.01 2019.03.16 වන දින ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගෙන යනු ලබන බළපිටිය ජීවත ආරක්ෂක පුහුණු පාසල විසින් සැතපුම් 2ක පිහිණුම් තරඟයක් පැවැත් වීමට කටයුතු සංවිධානය කර ඇත. ඒ පිළිබඳව මහජනතාව දැනුවත් කිරිම සඳහා 2019.02.10 වන දින ධර්මාශෝක විද්‍යාලයේ මුහුදු පිහිණුම් තරගය පැවැත්වෙන ස්ථානයේ සහ ඉන්පසු අම්බලන්ගොඩ ප්‍රධාන බස් නැවතුම්පල ඉදිරිපිට බැනරයක් ප්‍රදර්ශනය කිරිම සඳහා අයකරන ගාස්තු නිදහස් කර දෙන මෙන් ඉල්ලා ඇති ලිපිය සභා අනුමතියට යටත්ව සභාගත සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන බළපිටිය ජීවත ආරක්ෂක පුහුණු පාසල විසින් සැතපුම් 2ක පිහිණුම් තරඟයක් පැවැත් වීමට කටයුතු සංවිධානය කර ඇත.මේ පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම පිළිබඳ අදාල දැන්වීම් හා බැනර් ප්‍රදර්ශනය සඳහා අදාල ස්ථාන වල බැනරයක් ප්‍රදර්ශනය කිරීමට අයකරනු ලබන ගාස්තු නිදහස් කිරිම සඳහා එහි අණ දෙන නිලධාරි කමාන්ඩර් ආර්.ජේ.එස්. ජේ. ගුණවර්ධන මහතා විසින් ඉල්ලීමක් කර ඇත. මෙය සභා අනුමතියට යටත්ව ඉටු කර ඇති බැවින් එය අනුමත කරන මෙන් ඉල්ලා සිටිනවා.

**තීරණය -**

2019.03.16 වන දින ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගෙන යනු ලබන බළපිටිය ජීවත ආරක්ෂක පුහුණු පාසල විසින් සැතපුම් 2ක පිහිණුම් තරඟයක් පැවැත් වීමට කටයුතු සංවිධානය කර ඇත. ඒ පිළිබඳව මහජනතාව දැනුවත් කිරිම සඳහා 2019.02.10 වන දින ධර්මාශෝක විද්‍යාලයේ මුහුදු පිහිණුම් තරගය පැවැත්වෙන ස්ථානයේ සහ ඉන්පසු අම්බලන්ගොඩ ප්‍රධාන බස් නැවතුම්පල ඉදිරිපිට බැනරයක් ප්‍රදර්ශනය කිරිම සඳහා අයකරන ගාස්තු සභා අනුමතියට යටත්ව නිදහස් කර දිම සම්බන්ධයෙන් සභා අනුමතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍ර දිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව මේ සඳහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**03.02 ගා/ප්‍රජාපති ගෝතමී බාලිකා විද්‍යාලය ක්‍රීඩා උළෙලේ සරඹ සංදර්ශනය පුහුණු වීම් කටයුතු සම්බන්ධයෙන් 2019.02.7,8හා 11 යන තෙදින පෙ.ව.8.00 සිට 11.30 දක්වා මානාන ක්‍රිඩා පිටිය නොමිලේ ලබා දිම සම්බන්ධයෙන් සභා අනුමතියට යටත්ව ලිපිය සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

එම විදුහලේ විදුහල්පතිතුමිය විසින් ක්‍රීඩා උළෙලේ සරඹ සංදර්ශනය පුහුණු වීම් කටයුතු සම්බන්ධයෙන් 2019.02.7,8 හා 11 යන තෙදින පෙ.ව.8.00 සිට 11.30 දක්වා මානාන ක්‍රිඩා පිටිය ගාස්තු අයකිරීමකින් තොරව නොමිලේ ලබා දෙන ලෙස ඉල්ලීමකර තිබෙනවා. එය සභා අනුමතියට යටත්ව ලබා දී ඇත. එය අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.

තීරණය -

ගා/ප්‍රජාපති ගෝතමී බාලිකා විද්‍යාලය ක්‍රීඩා උළෙලේ සරඹ සංදර්ශනය පුහුණු වීම් කටයුතු සඳහා 2019.02.7,8 හා 11 යන තෙදින පෙ.ව.8.00 සිට 11.30 දක්වා මානාන ක්‍රිඩා පිටිය සභා අනුමතියට යටත්ව නොමිලේ නිදහස් කර දිම සම්බන්ධයෙන් සභා අනුමතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා

කළ අතර ගරු නගර සභා මන්ත්‍රිනි ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව මේ සඳහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**03.03 බලපිටිය මූලික රෝහල හා අම්බලන්ගොඩ නගර සභා ක්‍රිකට් කණ්ඩායම අතර 2019.03.04 පැවැත්වෙන සුහද ක්‍රිකට් තරඟය සඳහා මානාන ක්‍රිඩා පිටිය නොමිලේ වෙන්කර ගැනිම සහ පුටු 60 කුඩාරම් 03, වර්ණ කොඩි 30 (කණු සමඟ) ,ශබ්ද විකාශන පහසුකම් සභා අනුමතියට යටත්ව නොමිලේ ලබාදිමට 2019.02.12 දිනැති ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

උක්ත කරුණට අදාල බලපිටිය මූලික රෝහලේ වෛද්‍ය අධිකාරි විසින් ඉදිරිපත් කරන ලද ලිපියට අදාලවයි.එහි වෛද්‍ය අධිකාරිතුමා විසින් අප ආයතනයේ ක්‍රිකට් කණ්ඩායම අතර සුහද ක්‍රිකට් තරඟයක් පැවැත්වීම සඳහා අරාධනාවක් කර ඉල්ලීමක් කර තිබෙනවා. ඒ අනුව ප්‍රජා සංවර්ධන නිලධාරිතුමියට එය යොමු කිරීමෙන් පසු, අප ආයතනයේ ක්‍රිකට් ක්‍රිඩාවේ සුහදතාවය වර්ධනය කිරිම සඳහා පහත අවශ්‍යතාවයන් ලබා දීම සුදුසු බවට ඉල්ලීමක් කර තිබෙනවා. 2019.03.04 සුහද ක්‍රිකට් තරඟය සඳහා මානාන ක්‍රිඩා පිටිය නොමිලේ වෙන්කර ගැනිමටත් , පුටු 60 කුඩාරම් 03, වර්ණ කොඩි 30 (කණු සමඟ) ,ශබ්ද විකාශන පහසුකම් නොමිලේ ලබා දෙන ලෙස ඉල්ලීමක් කර තිබෙනවා. එය සභා අනුමතියට යටත්ව ලබා දි ඇති බැවින් ඒ සඳහා අනුමතිය ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

එය අපි දන්නේ නැහැ. මන්ත්‍රිවරුන්ට දන්වා සිටියා නම් ඒ සඳහා සහභාගි වෙනවා.

**තීරණය -**

බලපිටිය මූලික රෝහල හා අම්බලන්ගොඩ නගර සභා ක්‍රිකට් කණ්ඩායම අතර 2019.03.4 පැවැත්වෙන සුහද ක්‍රිකට් තරඟය සඳහා මානාන ක්‍රිඩා පිටිය නොමිලේ ලබා දීමටත් , පුටු 60 , කුඩාරම් 03, වර්ණ කොඩි 30 (කණු සමඟ) හා ශබ්ද විකාශන පහසුකම් සභා අනුමතියට යටත්ව නොමිලේ ලබාදිම සම්බන්ධයෙන් සභා අනුමතිය ලබා දිම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රිනි ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව මේ සඳහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**03.04 කරිත්ත කන්ද ප්‍රජා මණ්ඩලයේ 2019 වර්ෂයේ ආගමික හා සුහද චාරිකාව සඳහා ප්‍රජා මණ්ඩල ගිණුමෙන් මුදල් නිදහස් කර ගැනිමට 2019.02.05 දින පැවති සභා තිරණ අංක 12.15 යටතේ ප්‍රජා සංවර්ධන නිලධාරි වාර්තාව සමඟ නැවත සභා අනුමතිය ලබා ගැනිම සම්බන්ධ ලිපිය සභා ගත කිරීම.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

කරිත්ත කන්ද ග්‍රාම නිලධාරි වසමේ කරිත්ත කන්ද ප්‍රජා මුල මණ්ඩලය විසින් ඉල්ලීමක් කර තිබෙනවා. 2019 වර්ෂයේ කරිත්ත කන්ද ප්‍රජා මුල මණ්ඩලයේ ආගමික හා සුහද චාරිකාව සඳහා ප්‍රජා මණ්ඩල ගිණුමෙන් රු.210000/= ක මුදල් නිදහස් කර දෙන ලෙස ඉල්ලා ඇත.2019 ජනවාරි මස 05 දින පවත්වන ලද මහ සභා රැස්වීරමේදි සභා සම්මත කර ගනු ලැබු සමුහ චාරිකාව සඳහා 2019 ජනවාරි මස 15 දින පවත්වන ලැබු කාරක සභා රැස්වීමට අදාලව 2019 අප්‍රෙල් මස 17,18 හා 19 යන දිනවල මහනුවර හරහා ගොස් නුවරඑළිය ප්‍රදේශයේ දින දෙකක නවාතැන් ගාස්තු සහ බස්රථයේ වියදම ප්‍රජා මණ්ඩල ගිණුමෙන් ලබා ගැනිමටත් ආහාර පාන සමාජිකයන් දැරිමටත් තින්දු විය.2018.12.17 දින බැංකුවේ ඇති ගිණුමේ ශේෂය රු.256992/= ක මුදලකි. වැඩ අවසන් කළ කොන්ත්‍රාත් වලින් ලැබිය යුතු ප්‍රතිපාදන රු.50000/= කි. 17/18 දෙදින වලදි නුවරඑළියේ නවාතැන් කාමර 14 ක කුළිය 140000/= ක් ද , දින තුන සඳහා බස්රථයේ වියදම එක් දිනකට රු.20000/= බැගින් රු.60000/= කි . අමතර වියදම් රු.10000/= කි . මේ සමඟ සාමාජික 56 කුගේ නාමලේඛණය හා ඇස්තමේන්තුව ඉදිරිපත් කර ඇත. ඉදිරි දින 10 තුලදි නවාතැන් හා බස්රථයේ මුදල් ගෙවා වෙන් කර ගත යුතුය.ඉහත චාරිකාව සාර්ථක කර ගැනීම සඳහා බිල් ඉදිරපත් කිරීමෙන් පසු ඉතිරි මුදල ගිණුමට බැර කිරීමේ එකඟතාවය මත රු.210000/= ක මුදලක් නිදහස් කර දෙන මෙන් ඉල්ලා ඇත. ප්‍රජා සංවිධානයේ ලේකම්තුමා සහ සභාපතිවරයා විසින් ඉල්ලීමක් කර ඇත. මේ සම්බන්ධව ප්‍රජා සංවර්දන නිලධාරි විසින් වාර්තාවක් ඉදිරිපත් කර ඇත.ප්‍රජා මණ්ඩල ගිණුමෙන් ඉහත සඳහන් මුදල

නිදහස් කර  ලෙස ඉල්ලා ඇත. ප්‍රජා මණ්ඩල ව්‍යවස්ථාවේ අංක 04 කාර්ය කටයුතු හි (අ) වගන්ති ප්‍රකාරව ශ්‍රමදාන කඳවුරු පිහිටුවීම හා සාමූහික චාරිකා හා වාර්ෂික දිස්ත්‍රික් සම්මේලන පැවැත්වීම අනුමත කර ඇත.ප්‍රජා මණ්ඩල පැවැත්ම වෙනුවෙන් හා සාමූහික චාරිකාව සංවිධානයට ප්‍රජා මණ්ඩල අරමුදල් පරිහරණය කිරීමට හැකියාව ඇති බැවින් ඉහත මුදල් නිදහස් කිරීමට යෝජනා කරමින් අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, මා මේ පිළිබඳ දන්නේ නැති නිසායි විමසන්නේ. මගේ කිසිම විරුද්ධත්වයක් නැහැ මෙම මුදල නිදහස් කිරීම සම්බන්ධව. ප්‍රජා මණ්ඩල වලින් සමාන්‍යයෙන් විනෝද  චාරිකා පමණක් යාම ද සිදු වන්නේ. ඊට සමගාමීව එම මුදල් වලින් ප්‍රජාවටත් යම්කිසි සේවාවක් සිදු විය යුතු නේද? එම මුදල චාරිකාවට පමණක් වියදම් කරනවා සේම ප්‍රජාවටත් යම්කිසි සේවාවක් ඉටුවිය යුතුයි.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ප්‍රජා සංවර්ධනය පිළිබඳව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සම්මත කරල ලද පණතක් තිබෙනවා.එහි අරමුණු මොනවාද , මේ අරමුණු ඔස්සේ කටයුතු කරන්න කියා සඳහන් කර ඇත. එම අරමුණු වලට වැටෙන කාර්යයකි.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**</u>

එහෙත් අනෙක් අරමුණු සම්පූර්ණ නොවී මෙම අරමුණ විතරක් දිගටම ක්‍රියාත්මක වීම එතරම් හොඳ නැහැ නේද?

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

එය තින්දු කිරීමේ බලය ඇත්තේ අපට නොවේ. එහි බලය ඇත්තේ ප්‍රජා සංවර්ධන කමිටුවයි. අපි කරනු ලබන්නේ මෙම මුදල් නිදහස් කිරීමේ බලය ලබා දීම පමණකි.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි එය හරි ප්‍රජා සේවාවක් ඉටු කරන විට චාරිකා සඳහා සහභාගි වෙනවා.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මෙය තීරණය කරනු ලබන්නේ කරිත්ත කන්ද ප්‍රජා මූල මණ්ඩලයයි.කරිත්ත කන්ද ප්‍රජා මූල මණ්ඩලයයි සාර්ථකම මූල මණ්ඩලය.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

එය නිවැරදියි. ප්‍රජා සේවාවක් තමයි සිදු කරන්නේ. නමුත් මුදල් නිදහස් කරනු ලබන්නේ අපි. රු.210000/= ක මුදලක් නිදහස් කර දිම ගැටළු සහගත තත්වයකි. නිත්‍යානුකූල ක්‍රමවේදයට මෙම මුදල් නිහස් කිරීම කළ යුතුයි. වෙනත් ප්‍රජා මූල මණ්ඩල වලිනුත් මෙසේ ඉල්ලීම් කළ හැකියි. එසේ සිදු වීමටත් පුළුවනි.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මා මෙය දකින්නේ අපගේ අනෙක් කොට්ඨාශ වල මන්ත්‍රීවරුන්ට හොඳ ආදර්ශයකි.තමන්ගේ කොට්ඨාශවල ප්‍රජා මණ්ඩල සක්‍රිය කර ගැනීම සඳහා.සක්‍රිය කර ඒ ප්‍රජා මණ්ඩල වල අරමුණු ඔස්සේ වැඩ කටයුතු කරන්න. දැන් මේ නිදහස නගර සභාවේ අපේ අරමුණට නැහැ. නමුත් මෙම නිදහස ලබා දී තිබෙනවා ප්‍රජා මූල මණ්ඩලයට. ඒ අයට තිබෙන අයිතියක් එය.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

ඒ අයිතිය හරි . අපිට තිබෙන ගැටළුව එය නෙමේ. මෙය නිත්‍යානුකූල ක්‍රම වේදයකට විය යුතුයි. එය කිසි ගැටළුවකි නැහැ. කොයි දෙයට මුදල් වියදම් කළත් ප්‍රයෝජනවත් ආකාරයෙන් මුදල් වියදම් කිරීම තමයි කළ යුත්තේ. අනෙක් කොට්ඨාශවලත් එය ක්‍රියාත්මක කරනවා නම් හොඳයි. සමහර තැන්වල විනෝද චාරිකා සඳහා පළාත් සභාවෙනුත් මුදල් වෙන්කරනවා. නිත්‍යානුකූල ක්‍රමවේදයට අනුව නිර්දේශයත් සමඟ ඉදිරිපත් කරන්න.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මෙහි නිර්දේශ ලබා දී තිබෙනවා ප්‍රජා සංවර්ධන නිලධාරිතුමිය..

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

ලේකම්තුමිය මොකක්ද කියා තිබෙන්නේ

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

සභා අනුමතිය ලබා දීම සුදුසු බවට නිර්දේශ ලබා දී තිබෙනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

ඒ කියන්නේ සුදුසු පරිදිද මොකක්ද ?

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

සභා අනුමතිය ලබා ගැනීමට සුදුසු බවට නිර්දේශ කරමි.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

සභා අනුමතියකින් තොරව ගෙවීම් අනුමත කරනවා නේද එතුමිය.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

නැහැ මෙය ගෙවා නැහැ. එය ලබා ගැනීම සඳහා සභා අනුමතිය ඉල්ලා සිටින්නේ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

ගෙවන්න අනුමත කරනවානේ. නොදී ඉන්නේ නැහැනේ.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

සභා අනුමතියෙන් පසුව තමයි ගිණුමේ මුදල් බැර කරනු ලබන්නේ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

එය බලා ගෙවීමට නිර්දේශ කරන්න. අපගේ අකමැත්තක් නැහැ.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මේ සම්බන්ධව ගිය සභාවෙත් කතා කළා.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

මේ ප්‍රජා මූල මණ්ඩල ක්‍රියාත්මක වන්නේ පළාත් පාලන හරහා.ඒ පාර්ලිමේන්තුවෙන් පනවන ලද චක්‍රලේඛණයක් අනුව. වෙනත් සමිති වලත් 5% අයකර ගත් විට ප්‍රාදේශිය ලේකම්ගේ නිර්දේශය අනුව ගෙවනවා. නමුත් මේ ප්‍රජා

මණ්ඩලයේ බලය තිබෙන්නේ නගර සභාවට. මේ ප්‍රජා මණ්ඩල පිහිටුවා ඇත්තේ නගර සභාව මඟිනි. ප්‍රජා මණ්ඩලය යනු ගමේ සැදුණු සංවිධානයකි.එහි මුදල් තර කිරීමක් කර හෝ ගමේ පොදු කටයුත්තක් සිදු කරනවා නම් එම මුදල් නිදහස් කිරීමේ ඉල්ලීමක් කරනු ලැබුවහොත් එම ඉල්ලීම පැහැර හැරීමක් කළ නොහැක. ප්‍රාදේශිය ලේකම්තුමිය හෝ වෙනත් සමාගමකින් යෝජනා කර ස්ථිර කර සමිතියකින් ඉල්ලීමක් කළහොත් 5% ගාස්තු නිදහස් කරන මෙන් ඉල්ලීමක් කළහොත් එම ගාස්තු නිදහස් කරගත යුතුයි. මොවුන් ගිය වසරෙත් මෙම වාරිකාවට සහභාගි වුණා.ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා, ගරු නගර සභා මන්ත්‍රි ධම්මික කොඩිකාර මහතා ප්‍රකාශ කළ ආකාරයට ගමේ වෙනත් ප්‍රජා කටයුතුත් සිදු කළ යුතුයි. මෙම ඉල්ලීම අනුව මෙම ගාස්තු නිදහස් කළ යුතුයි. මීට වඩා ඵලදායි වැඩ කිරීමට ගමේ තිබෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>

මේ සඳහා අනුමකරනවා මෙම ගෙවීම සම්බන්ධව. කිසි විරුද්ධත්වයක් නැහැ.ගමේ එවැනි දෙයක් සිදු වෙනවා නම් හොඳයි.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

ඔය තින්දුව ගැනීමට කොච්චර ප්‍රමාණයක් අත්සන් කර තිබෙනවාද ? කොපමණ ප්‍රමාණයක් සහභාගි වෙනවාද ? එම තත්වය කොහොමද කියා. අපිත් ඔය කමිටු වලට සහභාගි වූ විට සමහරු පැමිණීමකුත් නැහැ. සමහර තැන්වල ඔය වැනි දෙවල් සිදු වෙනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මෙහි ලෙඛණයක් ඉදිරිපත් කර තිබෙනවා. 58කු පමණ මේ සඳහා අත්සන් කර ඇත.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

ලෙඛණයක් කියන්නේ එදින සහභාගිත්වය පිළිබඳවයි.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>
එදා සහභාගිත්වය මා දන්නේ නැහැ.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

එදා සහභාගිත්වය කියද ? ප්‍රජා මණ්ඩලයෙන් එදා තිරණයක් ගෙන තිබෙනවා නේද රැස්වෙලා. එහි කිදෙනෙක් අත්සන් කර තිබෙනවාද? ඔබතුමිය ඒ පිළිබඳ විස්තරයක් අපට ලබා දෙන්න.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>
ගරු මන්ත්‍රිතුමනි මෙය ප්‍රතික්ෂේප කිරීමට අවශ්‍යද ?

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

නැ. අපි එය අනුමත කරනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මෙය රාහුල ලලිත වික්‍රම මහතාගේ තිරණය පරිදි ප්‍රතික්ෂේප කරනවා. එහි වගකීමක් භාර ගන්න ඔබතුමා මෙය ප්‍රතික්ෂේප කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

නැ.නැ ඔබතුමා එහෙම කතා කරන්න එපා. රු.210000/= ක මුදලක් නිදහස් කරනවා නම් ඒ ගැන සොයා බලන්න ඕන.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නීතිය අනුව කටයුතු කරන්න ඕන. පාර්ලිමේන්තු පනවන ලද නීතිය අනුව කටයුතු කළ යුතුයි. එය ඉක්මවා කටයුතු කළ නොහැක.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ඔබතුමාට කෙන්ති ගියා කියා එහෙම කරන්න බැහැ.ඔබතුමා මෙය මෙසේ දමා තිබුණත් අපිට විස්තරයක් මුකුත් නැහැ. අපිට විස්තරයක් ලබා දිය යුතුයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගිය සභාවට මෙය ඉදිරිපත් කර එහි වාර්තාව තමයි මේ තිබෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , අපි කැමතියි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්රදීප් මහතා කතා කරමින්</u>**

කැමතිනම් ඡන්දය විමසීමක් කරන්න.මේ සඳහා විරුද්ධ අය සිටිනවාද?

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

අපි විරුද්ධ නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ සඳහා විරුද්ධත්වයක් නොමැති නම් එම රු.210000/= ක මුදල ලබා දෙන්න සභාවේ එකමතිකව අනුමතිය ලබා දෙන්න. තමන්ගේ කොට්ඨාශයේ ප්‍රජා මුල සංවිධාන පිහිටුවා ගැනිමට බැරි නිසා තමයි ඔය තරම් කැගහන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

අපිට පුළුවන් ප්‍රජා මුල මණ්ඩල පිහිටුවා ගැනිමට.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

පුළුවන්නම් පිහටුවන්න. ඕකන්ද ප්‍රදේශයට ප්‍රජා මුල මණ්ඩලයක් නැහැ.තමන්ගේ කොට්ඨාශයේ ඒ ටික ඉටු තරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

අනවශ්‍ය විදියට මුදල් වියදම් කරන්න කැමති නැහැ.

**තීරණය -**

කරිත්ත කන්ද ප්‍රජා මණ්ඩලයේ 2019 වර්ෂයේ ආගමික හා සුහද චාරිකාව සඳහා 2019.02.05 දින පැවති සභා තිරණ අංක 12.15 යටතේ ප්‍රජා සංවර්ධන නිලධාරි වාර්තාව සමඟ ඉදිරිපත් කිරිමෙන් පසු ප්‍රජා මණ්ඩල ගිණුමෙන් රු.210000/= ක මුදලක් සහා අනුමතියට යටත්ව නිදහස් කර දීම සම්බන්ධයෙන් සහා අනුමතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව මේ සඳහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**03.05 අම්බලන්ගොඩ දිසා රෝහලේ සුභ සාධක සංගමයට අධාර පිණිස දකුණු පළාත් රාජ්‍ය සේවා සය සමාජික ක්‍රිකට් තරගාවලිය 2019.03.31 දින පැවැත්වීමට පොල්වත්ත පියසේන ළමා ක්‍රිඩාංගනය නොමිලේ ලබා දිම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

දිස්ත්‍රික් රෝහල , අම්බලන්ගොඩ. අම්බලන්ගොඩ සුභ සාධක සංගමමයට අධාර පිණිස සය සමාජික ක්‍රිකට් තරගාවලියක් 2019.03.31 දින පැවැත් විමට තිරණය කර ඇත. ඒ සඳහා පියසේන ළමා ක්‍රිඩාංගණය නොමිලේ ලබා දෙන ලෙස ඉල්ලිමක් කර ඇත. ඔබ ආයතනයේ කැනපි 10 ක් හා පුටු 50 ක් ද නොමිලේ ලබා දෙන ලෙස දිස්ත්‍රික් වෛද්‍ය නිළධාරිතුමා විසින් ඉල්ලිමක් කර ඇත.

**තීරණය -**

අම්බලන්ගොඩ දිසා රෝහලේ සුභ සාධක සංගමයට අධාර පිණිස දකුණු පළාත් රාජ්‍ය සේවා සය සමාජික ක්‍රිකට් තරගාවලිය 2019.03.31 දින පැවැත්වීමට පොල්වත්ත පියසේන ළමා ක්‍රිඩාංගනය පොල්වත්ත පියසේන ළමා ක්‍රිඩාංගනය නොමිලේ ලබා දිමටත්,කැනපි 10 ක් හා පුටු 50ක් ලබාදිම සඳහා අනුමතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**03.06 අම්බලන්ගොඩ කුලරත්න විද්‍යාලයේ ක්‍රිඩා උත්සවය සඳහා වර්ණ ධජ හා කොඩිකණු 30 ක් නොමිලේ සභා අනුමතියට යටත්ව ලබා දිමේ ලිපිය සභා ගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

ගා / පි. ද එස් කුලරත්න විද්‍යාලයේ විදුහල්පතිවරයා විසින් ඉල්ලිමක් කර තිබෙනවා. කොඩි කණු සහ කොඩි ලබා ගැනිම සඳහා. අප විද්‍යාලයේ මළල ක්‍රිඩා උත්සවය 2019.02.17 වන දිනට යෙදි ඇත. එයට සභාවේ වර්ණ ධජ හා කණු 30 බැගින් නොමිලේ ලබා දෙන ලෙස කාරුණික ඉල්ලිමක් කර ඇත.එය අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.

**තීරණය -**

අම්බලන්ගොඩ බස්නැවතුම්පොල භුමිය පිරිසිදු කිරීමේ කාර්ය භාරව කටයුතු කළ එච්.එම්.සුමතිපාල මහතා විශ්‍රාම යාම හේතුවෙන් එම කටයුතු අඩාල වෙමින් පවතින බැවින් එය විධිමත්ව පවත්වාගෙන යාම සඳහා ටෙන්ඩර් කැඳවිමට අනුමතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**03.07 අම්බලන්ගොඩ බස්නැවතුම්පොල භුමිය පිරිසිදු කිරීමේ කාර්ය භාරව කටයුතු කළ එච්.එම්.සුමතිපාල මහතා විශ්‍රාම යාම හේතුවෙන් එම කටයුතු අඩාල වෙමින් පවතින බැවින් එය විධිමත්ව පවත්වාගෙන යාම සඳහා ටෙන්ඩර් කැඳවිමේ ලිපිය සභා ගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

අම්බලන්ගොඩ බස්නැවතුම්පොල භුමිය පිරිසිදු කිරීමේ කාර්ය භාරව කටයුතු කළ එච්.එම්.සුමතිපාල මහතා විශ්‍රාම යාම හේතුවෙන් එම කටයුතු අඩාල වෙමින් පවතින බැවින් එය විධිමත්ව පවත්වාගෙන යාම සඳහා ටෙන්ඩර් කැඳවිමට සහා අනුමතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර ඇත.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, එය ලබා දෙන්න. මේ වන විට ඒ මහතා විශ්‍රාම ගොස් ඇත. ටෙන්ඩරයක් කැඳවා මෙම මහතාටම මෙය ලබා දීමට හැකිනම් මෙම කාර්ය ඔහු විසින් නිසියාකාරව කරනු ලබයි.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ගරු මන්ත්‍රීවරුන්ට දැන ගැනිමට ප්‍රකාශ කළ යුතුයි එච්.එම් සුමතිපාල කියන සේවකයා මෙම බස්නැවතුම්පොළ භූමිය පෙරවරු 3.00 ට පැමිණ සම්පූර්ණම සුද්ද කළා. දැන් මොහු වයස අවුරුදු 60 ඉක්මවා යාම නිසා විශ්‍රාම ගොස් ඇත. නමුත් මෙම සේවකයාගේ සේවය ලබා ගැනිම සඳහා ගරු සභාව මඟින් තීරණය කර පළාත් පාලන කොමසාරිස්තුමා දන්වා යවා තිබුණත් ඒ සඳහා අනුමතිය ලැබී තිබුණේ නැහැ මොහුට වයස අවුරුදු 60ට වැඩි නිසා. මේ නිසා මෙය ටෙන්ඩර් මඟින් ඉදිරිපත් කර එම ටෙන්ඩරය ලබා දී මෙය පිරිසිදු කිරිමේ කටයුතු සිදු කළ යුතුයි. සමහර විට අඩු මුදලකට මෙම සේවකයාම යොදවා ගැනිමට පුළුවන් වුණොත් එය ඉටුකර ගත හැකිය.

**තීරණය -**

අම්බලන්ගොඩ බස්නැවතුම්පොල භූමිය පිරිසිදු කිරීමේ කාර්ය භාරව කටයුතු කළ එච්.එම්.සුමතිපාල මහතා විශ්‍රාම යාම හේතුවෙන් එම කටයුතු අඩාල වෙමින් පවතින බැවින් එය විධිමත්ව පවත්වාගෙන යාම සඳහා ටෙන්ඩර් කැඳවිමට අනුමතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.

- **පෙරවරු 9.45 ට පමණ මිළ ගණන් විවෘත කරන ලදී**

**03.08 නගර සභා නිලධාරින්ගේ ක්‍රීඩා හා සුබ සාධක සංගමයට ආධාර පිණිස පවත්වනු ලබන අධ්‍යාපන හා වෙළඳ සැණකෙළිය සඳහා මාර්තු මස 15,16,17,18 හා 19 දිනයන්හි පොල්වත්ත පියසේන ක්‍රිඩාංගනය නොමිලේ ලබා ගැනීමටත්, එම සැණකෙළියේ ප්‍රවේශ පත්‍ර විනෝද බද්දෙන් නිදහස් කිරිම හා ප්‍රචාරක පුවරු ප්‍රදර්ශන ගාස්තු නිදහස් කර දෙන ඉල්ලා ඇති 2019.02.21 දිනැති ලිපිය සභා කරන ලදී**

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අම්බලන්ගොඩ නගර සභා නිලධාරින්ගේ ක්‍රීඩා හා සුබ සාධක සංගමයට ආධාර පිණිස පවත්වනු ලබන අධ්‍යාපන හා වෙළඳ සැණකෙළියක් මාර්තු මස 15,16,17,18 හා 19 යන දිනයන්හි පොල්වත්ත පියසේන ක්‍රිඩාංගනයේදි පැවැත් වීමට කටයුතු යොදා ඇත. පොල්වත්ත පියසේන ක්‍රිඩාංගනය මාර්තු මස 15,16,17,18 හා 19 යන දිනයන්හි නොමිලේ ලබා දීමට කටයුතු කරන මෙන් ඉල්ලා ඇත. එසේම සැණකෙළියේ ප්‍රවේශ පත්‍ර විනෝද බද්දෙන් නිදහස් කරන ලෙසත්, ප්‍රචාරක පුවරු ප්‍රදර්ශන ගාස්තු නිදහස් කර දෙන ලෙසත් ඉල්ලා ඇත. අප සංගමයට ඔබතුමා සහ සභාවෙන් දෙනු ලබන සහාය අඟය කොට සලකන අතර මේ සඳහා ඔබතුමාලාගේ සහාය සහ පැමිණිම ගෞරවයෙන් අපේක්ෂා කරන බව එහි සභාපති වශයෙන් ලේකම්තුමියත් එම සංගමයේ ලේකම් විසින් අත්සන් කර ඇත.

**ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මේ නගර සභා නිලධාරින් කරනු ලබන මෙහෙය ඉතා අගය කළ යුතුයි. සත්‍ය වශයෙන්ම ඔවුන් විවිධ අංශවල අනරතල අරගලයක නිරත වෙනවා මේ නගර වැසියන් සතුටු කිරිමට. නමුත් කිසිම විටක තුටු පහටු වෙන විදියක් නම් පෙනෙන්නට නැහැ. ඇතැම් වෙලාවට නායකත්වයේ ගෙරහුම් වලට , ඇණුම් බැණුම් වලට ඔවුන් මුහුණ දි රෝගි වු අවස්ථා පසුගිය කාලයේ අප දුටුවා. එමනිසා මොවුන්ගේ චිත්ත සංතාපය පිනවිය යුතුයි. එවගේම ගීතයකින් වෙනත් රසාස්වාදයක් උදාකර දිමට අවස්ථාව සලසා දිය යුතුයි. එමනිසා ඔබතුමා මේ පිළිබඳ විශේෂ අවධානය යොමු කර විනෝද බද්ද කිසිසෙත්ම අය නොකර ඔවුන් සිත්සේ තුටු පහටු ලෙස මෙම සංගමය ගොඩ නගා ගැනිමට අවස්ථාව සලසා දෙන්න. මෙම සැණකෙළි නිසා බොහෝ විද්‍යාල ඉතාමත් සාර්ථක ලැබුවා. ඒ අනුව

යමින් නගර සභා නිලධාරින්ගේ මේ එකමුතුව ගෙනයනු ලබන මෙම කටයුක්තට අපගේ සහාය ලබා දිය යුතුයි. මෙය විනෝද බද්දෙන් නිදහස් කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්දා අයිරාංගනි මහත්මිය කතා කරමින්**

මේ සඳහා සභාවේ අනුමතිය ලබා දෙන්න.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මේ සඳහා අනුමතිය ලබා දෙන්න.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

මෙම සංගම් දෙකම එකතු වෙලා නේද තිබෙන්නේ. උඩයි පහතයි දෙකක් නැහැ නේද?

**තීරණය -**

නගර සභා නිලධාරින්ගේ ක්‍රීඩා හා සුබ සාධක සංගමයට ආධාර පිණිස පවත්වනු ලබන අධ්‍යාපන හා වෙළඳ සැණකෙළිය සඳහා මාර්තු මස 15,16,17,18 හා 19 දිනයන්හි පොල්වත්ත පියසේන ක්‍රිඩාංගනය නොමිලේ ලබා දිමටත් , එම සැණකෙළියේ ප්‍රවේශ පත්‍ර විනෝද බද්දෙන් නිදහස් කිරිමටත් හා ප්‍රචාරක පුවරු ප්‍රදර්ශන ගාස්තු අයකිරිමේ ගාස්තු නිදහස් කර දීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් ඒකමතිකව සහා සම්මත විය.

**03.09 අම්බලන්ගොඩ, පනියන්දුව, ඇවෙන්ජස් ක්‍රීඩා සමාජය සිංහල අවුරුද්ද වෙනුවෙන් පවත්වන ලද සැහැල්ලු පන්දු ක්‍රිකට් තරඟය 2019 මාර්තු මස 02,03,සහ 2019 අප්‍රේල් මස 13,15 හා 16 යව දිනයන් සඳහා මානාන ක්‍රිඩාංගනය නොමිලේ ලබා ගැනිම සඳහා ඉදිරිපත් කර ඇති 2019.02.10 දිනැති ලිපිය සභාගත කරන ලදී.**

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

අම්බලන්ගොඩ, පනියන්දුව, ඇවෙන්ජස් ක්‍රීඩා සමාජය සිංහල අවුරුද්ද වෙනුවෙන් පවත්වන ලද සැහැල්ලු පන්දු ක්‍රිකට් තරඟය 2019 මාර්තු මස 02,03,සහ 2019 අප්‍රේල් මස 13,15 හා 16 යව දිනයන් සඳහා මානාන ක්‍රිඩාංගනය නොමිලේ ඉල්ලා ඇත.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මෙය 15,16 වෙනිදාට අවශ්‍යයි නේද ?

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

මෙම අප්‍රේල් මස 15,16 දිනවල ගරු නගර සභා මන්ත්‍රි ජගත් කුමාර මහතාගේ ඉල්ලීම පරිදි ගිය සභාවේදි එය වෙන්කර ඇත. එම සභාවේ තින්දුවට හානි නොවන අන්දමින් මෙය ලබා දිමට තින්දු කරන ලදී.

**තීරණය -**

අම්බලන්ගොඩ, පනියන්දුව, ඇවෙන්ජස් ක්‍රීඩා සමාජය සිංහල අවුරුද්ද වෙනුවෙන් පවත්වන ලද සැහැල්ලු පන්දු ක්‍රිකට් තරඟය 2019 මාර්තු මස 02,03,සහ 2019 අප්‍රේල් මස 13, යන දිනයන් වලදී නොමිලේ ලබා දිය හැකි බවත්, අප්‍රෙල් මස 15 හා 16 වෙනි දින සඳහා මානාන ක්‍රිඩාංගනය ලබා දිය නොහැකි බවත්, නොමිලේ ලබා ලබා දීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් ඒකමතිකව සහා සම්මත විය.

**03.10 පී. නන්දසිරි මහතාගේ ආදහන කටයුතු සඳහා ගෙවන ලද මුදලින් සමෘද්ධිලාභියකු බව සනාථ කර ඇති බැවින් වැඩිපුර ගෙවන ලද රු.2000/= මුදල නැවත වැල්ලගේ බෙබී මහත්මියට නැවත ලබා දීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ආදාහනාගාරය වෙන්කිරීමේදී පී. නන්දසිරි මහතා සමෘද්ධිලාභියකු බව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ නිලධාරියෙකු විසින් සනාථ කර ඇත. එය සිදු කිරිමේදි ලිපිය ඉදිරිපත් කිරිමට නොහැකි නිසා එම සමෘද්ධිලාභියාට අඩුකරන රු.2000/= ක මුදල මිය ගිය තැනැත්තා වෙනුවට ලබා දෙන ලෙස ඉල්ලීමක් කර ඇත. මෙහිදි මේ සඳහා අපි ලබා ගනු ලබන්නේ 2 / 3 ක මුදලකි. මොවුන් සම්පූර්ණ මුදලම ගෙවා ඇති අතර ඔවුන් සමෘද්ධිලාභියකු බවට තල්ගස්ගොඩ සමෘද්ධි කළමණාකරු විසින් තහවුරු කර ඇති බැවින් එම රු.2000/= මුදල එම තැනත්තාට ගෙවිමට අනුමතිය ඉල්ලා සිටිනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

මෙය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙනුත් අනුමත කළ යුතුයි නේද ?

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ මුලස්ථාන කළමණාකරු විසින් අනුමත කර ඇත.

**තීරණය -**

මියගිය පී. නන්දසිරි මහතා සමෘද්ධිලාභියකු බව සනාථ කර ඇති බැවින් අදාහන කටයුතු සඳහා වැඩිපුර ගෙවන ලද රු.2000/= මුදල නැවත වැල්ලගේ බෙබී මහත්මියට නැවත ලබා දීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව මේ සඳහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**03.11 රත්නවල්ලි නර්ථන ප්‍රසංගයෙහි විනෝද බදු නිදහස් කර ගැනීම සඳහා ජනත් ගුණරත්න මහතා විසින් කරන ලද ඉල්ලිම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ජනත් ගුණරත්න කලායතනය , හල්වතුර , විලෝගොඩ . රත්නවල්ලි නර්ථන ප්‍රසංගයෙහි විනෝද බදු නිදහස් කර ගැනීම සම්බන්ධයෙනි. 2019.02.24 දින පැවැත්වෙන රත්නවල්ලි නර්ථන ප්‍රසංගයෙහි මූලික අරමුණ වන්නේ ප්‍රදේශයේ දූවා දරුවන්ගේ නර්ථන හැකියාවන් ප්‍රදර්ශනය කිරිමයි. මෙවැනි කලායතනයකට කලා කරුවන්ට අතහිත දීම සඳහා අනුග්‍රහක හවතුන් සොයා ගැනීම අපහසුය. මෙහි පිරිවැය සොයා ගැනීම සඳහා දෙමාපියන්ට හිතවතුන්ට ප්‍රවේශපත්‍ර අලෙවි කිරීමට නියමිතය. ගරු සභාව ප්‍රචාරක පුවරු ප්‍රදර්ශනයට අනුමතිය ලබා දිම පිළිබඳව ගරු සභාපතිතුමා හා ගරු නගර සභා මන්ත්‍රිවරු සියළු දෙනාටම කෘතඥ වෙමි. ඒ සඳහා මෙම ප්‍රසංගයේ අලෙවි වන ප්‍රවේශපත්‍ර විනෝද බද්දෙන් නිදහස් කර දෙනමෙන් ඉල්ලා ඇත.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

ගිය සභාවත් මේ සඳහා තීරණයක් ගනු ලැබුවා නේද?

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ගිය සභාව තීරණයක් ගනු ලැබුවේ ප්‍රචාරක පුවරු ප්‍රදර්ශන ගාස්තු නිදහස් කර දීමට.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, මෙය ලබා දෙන්න.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේ සඳහා සභාවේ විරුද්ධත්වයක් තිබෙනවාද ?

**තීරණය -**

රත්නවල්ලි නර්ථන ප්‍රසංගය සඳහා  විනෝද බදු නිදහස් කර දීමට වනත් ගුණරත්න මහතා විසින් කරන ලද ඉල්ලීමට අනුව ඒ මහතා නගර සභාවේ සියළු උත්සව කටයුතු සඳහා නොමිලේ නර්තන කණ්ඩායම් ලබා දෙන බැවින් එම ගාස්තු නිදහස් කිරීම සුදුසු බවට  ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව මේ සඳහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**03.12 අම්බලන්ගොඩ , පොල්වත්ත , බුද්ධදත්ත මාවත , නො 22/16 හි පදිංචි එම්.ජී. හෙලාන් රසින්ත මහතා විසින් 1% ගාස්තු නිදහස් කිරිම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ATD අයදුම්පත්‍රයේ  1% ගාස්තු වශයෙන් රු.28500/= ක මුදලක් අයකිරිමක් සිදු කර ඇත. අනුබෙදිමකදි එම 1% ගාස්තු අය නොකිරිම සම්බන්ධ යි. එහිදි වාර්තා කර තිබෙනවා ආදායම් පරිපාලක .එම වාර්තාවට අනුව 1% ගාස්තු නිදහස් කිරිම පිළිබඳ දැන්වීමෙන් පසුව ඉදරිපත් කරන ලද ලිපියට අනුව එම දේපල විකිණිමක් සිදු නොවන බවට දිවුරුම් ප්‍රකාශයත් ඔප්පුවේ පිටපතකුත් ඉදිරිපත් කර ඇත.එම්.ජී. හෙලාන් රසින්තට පිය උරුමයෙන් ලද තෑග්ගක් ලෙස ඔහුගේ කිනිටු සහෝදරයාට B2 කොටස ලබා දිමට කටයුතු කරන බවත් ඉදිරිපත් කර ඇති දිවුරුම් ප්‍රකාශයෙන් 1% ගාස්තු නිදහස් කිරිමට සභා අනුමති ලබා දිම සුදසු බවට වාර්තා කර ඇත. ඒ අනුව තෑගි ඔප්පුවකින් පොල්වත්ත ශ්‍රී බුද්ධදත්ත 22/16 හි පදිංචි මකුන්දාගමගේ හෙලාන් රසින්ත විසින්  මකුන්දාගමගේ ඔෂාන් ලසන්තට තෑගි ඔප්පුවක් වශයෙන් ලබා දී ඇති නිසා ගාස්තු නිදහස් කරන ලෙස ඉල්ලා සිටි.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ  මහතා කතා කරමින්**

මෙය විකිණිමක් සිදු නොවි තෑගි ඔප්පුවකින් නේද ලබා දී ඇත්තේ.එය ලබා දෙන්න.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේ සඳහා විරුද්ධත්වයක් නැහැ නේද? මේ සඳහා සභාවේ එකමතික අනුමතිය ලබා දෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

මේ පිළිබඳව කලින් දන්නේ නැද්ද මෙය අකරන බව

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**
1% ගාස්තු නිදහස් අයකරන්නේ ලිපිය ගියාට පසුවයි වාර්තා කරනු ලබන්නේ. නමුත් වරිපණම් ලේඛණයේ සඳහන් කළ යුතුයි මෙම කියන නමින් තොරව වෙනත් නමකින් ඉදිරිපත් වුවහොත් 1% ගාස්තු අයකර ගන්නා බව.

**තීරණය -**

එම්.ජී. හෙලාන් රසින්ත මාහට සිය පිය උරුමයෙන් ලද නො 22/16 බුද්ධදත්ත මාවත පොල්වත්ත , අම්බලන්ගොඩ යන ඉඩම තම කනිටු සහෝදරයා වන ඔෂාන් ලසන්ත මයාට තෑග්ගක් වශයෙන් පවරා ඇති බැවින් හා විකිණිමක් සිදුවි නොමැති බැවින් 1% ගාස්තු මුදල රු.28500/= නිදහස් කිරිම සුදුසු බවටත්, විකිණිමක්  සිදු වුවහොත් 1% ගාස්තු අයකිරීම සුදුසු බවටත් ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව මේ සඳහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

## 03.13 2019 ගම්පෙරළිය සංවර්ධන යෝජනා යටතේ ළමා ක්‍රීඩාංගන දෙකක් ඉදිකිරිම සම්බන්ධයෙන් 2019.01.04 දිනැති ලිපිය සභා ගත කරන ලදී.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මේජර් ( විශ්‍රාමික) ඩෙනට් පනියන්දුවගේ මහතා , ප්‍රාදේශිය සංවර්ධන කමිටු සමසභාපතිතුමා විසින් 2019 ගම්පෙරළිය සංවර්ධන යෝජනා යටතේ ළමා ක්‍රීඩාංගන දෙකක් ඉදිකිරිම සම්බන්ධවයි. මෙවර ගම්පෙරළිය වේගවත් කිරිමේ වැඩ පිළිවල යටතේ ළමා උද්‍යාන ඉදිකිරිම සම්බන්ධව එක් උද්‍යානයකට රු3000000/= කට බැගින් එම වැය ශිර්ෂය අනුව

1. කරිත්ත කන්ද ග්‍රාමසේවා වසමේ හල්වතුර යෝජනා ක්‍රමයේ ඇති ඉඩම මා වසර දෙකක් ලක්ෂ දහයක් බැගින් වෙන්කර ආරක්ෂිත වැටක්ද ඉදිකර ඇත. එසේ කරනු ලැබුවේ ළමා ළමා උද්‍යානයක් ඇති ඇතුලත් කිරිමේ අරමුණෙනි.

2. මහ අම්බලන්ගොඩ පාරේ මිට පෙර ළමා උද්‍යානය තිබු ස්ථානය (ගැස් අලෙවිසැල අසල )

මෙම ස්ථාන දෙකට ළමා උද්‍යාන ඉදිකිරිමට ලක්ෂ 60 ක් ගම්පෙරළිය වේගවත් සංවර්ධන යෝජනා යටතේ ඉදිකිරිමට අවශ්‍ය ඉඩම් දෙක ලබා දිම සඳහා අනුමතිය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**
ගරු සභාපතිතුමනි , ඉහත ළමා ක්‍රිඩාංගණ දෙකක් සමඟ බැරිද පොල්වත්ත ළමා ක්‍රිඩාංගනයත් කැඩි ඇත. එහි අළුතින් ඉදිකළ යුතුයි. පොල්වත්තේ පෙර පාසලට එහා පැත්තේ තිබෙන ළමා උද්‍යානයයි. එය කැඩි ගොස් කැලේ වී ඇත.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මේ සඳහා විරෝධතාවයක් නැද්ද ? විරෝධතාවයක් නොමැතිනම් මේ සඳහා අනුමතිය ලබා දෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම් නිලානි මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මහ අම්බලන්ගොඩ ළමා උද්‍යානය ඉදිකිරිමට නියමිත ස්ථානයේ ප්‍රධාන මාර්ගයේ විශාල කුණු ගොඩක් තිබෙනවා. ඒ අසල නිවාස වලින් වෙන්නැති මෙය සිදු කරනු ලබන්නේ. ගරු නගර සභා මන්ත්‍රි ඩෙනට් පනියන්දුවගේ මහතාට ස්තුතිය පුද කර සිටිනවා මේ සම්බන්ධව ඉතා ඉක්මනින් මෙම කාර්ය ඉෂ්ඨ කරන ලෙස ඉල්ලා සිටිනවා.

**තීරණය -**

ගරු නගර සභා මන්ත්‍රි ඩෙනට් පනියන්දුවගේ මහතා විසින් 2019 ගම්පෙරළිය සංවර්ධන යෝජනා යටතේ ළමා ක්‍රීඩාංගන දෙකක් ඉදිකිරිම සඳහා කරන ලද ඉල්ලීම අනුව කරිත්තකන්ද ග්‍රාමසේවා වසමේ හල්වතුර යෝජනා ක්‍රමයේ ඇති ඉඩම හා මහ අම්බලන්ගොඩ පාරේ මිට පෙර ළමා උද්‍යානය තිබු ඉඩම යන ඉඩම් දෙක ඒ සඳහා ලබා දිම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව මේ සඳහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

## 03.14 නිල පියස ඉදිකිරිම අංක 86 ඕකන්ද ග්‍රාම නිලධාරි වසමේ නිල පියස ඉදිකිරිම සම්බන්ධ 2019.02.20 දිනැති ලිපිය සභාගත කරන ලදී.

ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

නගර සභා මන්ත්‍රී ඊ. ඉන්දා අයිරාංගනී මහත්මිය විසින් ඉල්ලීමක් කර තිබෙනවා. නිල පියස ඉදිකිරීම අංක 86E ඕකන්ද ග්‍රාම නිලධාරි වසම. අම්බලන්ගොඩ නගර සීමිවේ අංක 86E ඕකන්ද ග්‍රාම නිලධාරි වමේ නිල පියසක් ඉදිකිරීම සඳහා අප සභාවේ වෙන්කර දි ඇති ඉඩම් වල විරෝධතාවයක් ඇති බැවින් එම ගොඩනැගිල්ල සඳහා පහත සඳහන් යෝජනා ඉදිරිපත් කර ඇත.

1. ඕකන්ද ප්‍රදේශයේ දැනට ප්‍රජා ශාලා ගොඩනැගිල්ල ඇති බිමෙහි ජයබෝධි විහාරයට ඉදිරිපසට වන්නට භූමි ප්‍රදේශයේ මෙම ගොඩනැගිල්ල ඉදිකිරීමට සුදුසු බවට යෝජනා කර තිබීම
2. මෙම ගොඩනැගිල්ල ඉදිකිරීමට යෝජිත ස්ථානයේ බුළු ගසක් ඇති බැවින් ගරු සභාවේ අනුමැතිය ඇතිව සභාවේ වියදමෙන් ජනතා සේවය සඳහා ඉදිකරනු ලබන නිල නිවස වෙනුවෙන් එම ගස ඉවත් කර දීම.

ඉහත යෝජනා ඉදිරිපත් කරන අතර මෙම නිල නිවස ඕකන්ද ග්‍රාමයේ ම ඉදිකිරීමට අවශ්‍ය යෝජනාකර ඇති බිම් කොටසවත් ලබා දෙන ලෙස කාරුණිකව ඉල්ලා ඇත.

ගරු නගර සභා මන්ත්‍රිනි ඊ.ඉන්දා අයිරාංගනි මහත්මිය කතා කරමින්

ගරු සභාපතිතුමනි, අම්බලන්ගොඩ නගර සීමිවේ අංක 86E ඕකන්ද ග්‍රාම නිලධාරි වමේ නිල පියසක් ඉදිකිරීම ඉදිකිරීම සඳහා අප සභාවේ වෙන්කර දි ඇති ඉඩම් වල විරෝධතාවයක් ඇති වූ බැවින් එම ගොඩනැගිල්ල ඉදිකිරීමට මට මහත් ගැටළුවක් ඇති වුවා. රජයේ නිල නිවසක් ඉදිකිරීම සම්බන්ධව අම්බලන්ගොඩ නගරයේ ප්‍රධාන පුරවැසියා වශයෙන් ඔබතුමාත් ගරු නගර සභා මන්ත්‍රිවරුන් වශයෙන් ඕකන්ද ප්‍රදේශයේ මෙම නිල නිවස ඉදිකිරීම පිළිබඳ විරෝධතා මතුවීම ගැන මා බොහෝසෙයින් කනගාටුවට පත් වෙනවා නගර සභා මන්ත්‍රිවරියක් වශයෙන් . ජනතාවට සේවයක් කිරීමට ගිය සෑම අවස්ථාවකම ප්‍රශ්න ගොඩකට මැදිවෙලා තිබෙනවා.සමහර වේලාවට වැඩ කිරීමට ගරු මන්ත්‍රිවරියක් වශයෙන් වැඩ කිරීමට නොහැකි වීම ගැන කනගාටුවට පත් වි තිබෙනවා. මෙම නිල නිවස ඕකන්ද ග්‍රාම නිලධාරි වසමේ ඉදිකිරීම සඳහා 2018.05.02 දින පැවති සභා වාරයේදී ඕකන්ද පෙර පාසල හා පුස්තකාලය පිහිටි භූමියේ ඉදිකිරීම සඳහා අවසර ලබා දුන් අතර ඊට ගම්වාසින්ගේ දැඩි විරෝධතාවයක් මතුවිය. ගම්වාසින්ගේ අත්සන් සහිත විරෝධතා කිහිපයක් ගරු දකුණු පළාත් ප්‍රධාන අමාත්‍ය ශාන් විජයලාල් මහතාටත් අම්බලන්ගොඩ ප්‍රාදේශිය ලේකම්තුමියටත්, ගරු සභාපතිතුමාටත් යවා ඇති බව ප්‍රාදේශිය ලේකම්තුමිය විසින් ප්‍රකාශ කර සිටි අතර එම ස්ථානයේ මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම තුල ප්‍රාදේශිය ලේකම්කාර්යාලයේ තාක්ෂණික නිලධාරිතුමිය විසින් මැනිම් කටයුතු කිරීමෙන් පසු අඩි 2 ක පළල අඩුවක් සිදු කිරීමට සිදුවන බවත් , නිල නිවස ඉදිකිරීම සඳහා වැසිකිළි පද්ධතියට යාමට සිදු වන්නේ පුස්තකාලය හා පෙර පාසල පිහිටි ප්‍රධාන දොරටුවෙන් බවත් එම ස්ථානයේ මෙම ගොඩනැගිල්ල ඉදිකිරීමේදි මෙවැනි අපහසුතා වලට ලක්වන බව මා හට දැනුම් දෙන ලදී. නමුත් මා මෙම නිල නිවස ඉදිකරනු ලබන්නේ ගම්වාසින්ගේ ප්‍රයෝජනය සඳහා. ගම්වාසින්ගේ යම්කිසි විරෝධතාවයක් ඇති වෙනවා නම් එම ගමේ එය ඉදිකිරීම පිළිබඳව බොහෝ සෙයින් සැලකිලිමත් විය යුතු වෙනවා. සේවාව සපයනවා සේම එම අයගේ ඉල්ලීමත් ඉටු කළ යුතු වෙනවා. ගමේ සියළු දෙනා එකතු වී ඕකන්ද ප්‍ර දේශයේ දැනට තිබෙන ප්‍රජා ශාලා ගොඩනැගිල්ල ඇති බිමෙහි ජයබෝධි විහාරයට ඉදිරිපිට ඇති බිමෙහි මෙම නිල නිවස ඉදිකිරීමට සුදුසු බවට සියළු දෙනාම ඒකමතිකව ඒකඟ වුණා. එම නිසා මෙම ගොඩනැගිල්ල ඉදිකිරීමට අපහට ලොකු ප්‍රශ්නයක් තිබෙනවා . එම බුළු ගස කපා ඉවත් කළ යුතුයි. ගස කපා ඉවත් කළහොත් දැන් සාදා ඇති ගොඩනැගිල්ලට මෙහා පැත්තෙන් එම ගොඩනැගිල්ල සෑදිය හැකියි.ගැටළුව විසඳා දෙන්න කටයුතු කර දෙන ලෙස මා ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. මෙම මුදල් වෙන් කර ඇත්තේ ඕකන්ද ග්‍රාමයට නිසා දැනටත් ගරු ස්වදේශ කටයුතු අමාත්‍යතුමාට පවසා ඇත්තේ දැනටත් ඕකන්ද ප්‍රදේශයේ මෙම ගොඩනැගිල්ල ඉදිකරමින් පවතින බවයි. ප්‍රාදේශිය ලේකම්තුමියත් මාත් එම වගකිම භාර ගෙන තිබෙනවා. මෙම ස්ථානයේ මෙම නිල නිවස ඉදිකිරීම සඳහා මෙම මුදල ගරු සභාවෙන් වියදම් කිරීමෙන් හරි මා මේ සත්භාවයෙන් කරනු ලබන කාර්ය සාර්ථකව ඉටු කර ගැනීමට සහායෝගය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා. සැමදෙනාගෙම ගැටළුවලට මුහුණ දී නතර කරගෙන නතර කරගෙන පැමිණ තිබෙනවා. මේ දැන් මාර්තු මාසයත් වි ඇත. මෙම මුදල් රඳවා තබා ගැනීම නිසා මාත් ප්‍රාදේශිය ලේකම්තුමියත් විශාල ගැටළුකට මැදිවි ඇත. එම නිසා මා ගරු සභාපතිතුමනි, ඔබතුමාගෙන් මා ඉල්ලීමක් කර සිටිනවා මේ සඳහා ගරු සභාවේ අනුමතිය ලබා දෙන ලෙස.

ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්

ගරු සභාපතිතුමනි, මෙම ගරු මන්ත්‍රිතුමියට මෙය වසරකට වත් මේ ටික කර ගැනීමට ලැබෙන්නේ නැහැ. මොකද මේ ගසක් කැපීමට අප නගර සභාවට වසරක පමණ කාලයක් ගත වෙනවා. මොකද එය පැහැදිලිව සනාථ වි තිබෙනවා . අනතුරුදායක ගසක් ඉවත් කිරීමට ඉල්ලීම කර වසරකට වැඩි කාලයක් ගත වි තිබෙනවා. මහා

මාර්ගයේ ඇති අඹ ගසක් ඉවත් කිරිමට පවසා වසරකට වැඩි කාලයක් ගත වී තිබේ. එම නිසා ඔබතුමියට කනගාටුවෙන් වුවත් ප්‍රකාශ කර යුතු වෙනවා මෙම වැඩය කිරිමට තව වසරක පමණ කාලයක් බලා සිටිය යුතු බව.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මෙය ගරු නගර සභා මන්ත්‍රිනි අයිරාංගනී මහත්මිය ඕකන්ද ප්‍රදේශයේ නිල නිවසක් ඉදිකිරිම ස්ථානය කිහිප වතාවක්ම ඉවත් කරනු ලැබුවා . එතුමිය විසින් ප්‍රකාශ කරනු ලැබුවා ඕකන්ද ගම් ප්‍රදේශය පිළිබඳව කනගාටු වන බව. ඇත්තටම ගම ගැන කනගාටු විය යුතු නැහැ. ගමේ හොඳ තත්වයක් තිබෙනවා. එකමුතු බව ආදි සියළුම දේ එහි තිබෙනවා. එතුමිය ගමේ නැති නිසා තමයි එම අදහස තිබෙන්නේ.මෙය ඉදිකිරිමට එතුමියට හයියක් අවශ්‍යයි. එතුමියට හයියක් නැහැ. ඔබතුමාට මතකයි අපි අදාහනාගාරයේ සදන්න කිව්වා. ඔබතුමාට කොපමණ විරෝධතාවයන් පැමිණියා ද? අපි එක හෙලාම හිටියා මෙය සැදිය යුතුයි කියන මතයේ. ජනතාව තමයි විරුද්ධ වුයේ. නමුත් ඒ සඳහා ඔබතුමා කමිටුවක් පත් කළා. කමිටුව මඟින් නිර්දේශ කලා තැනක් . ගමේ ජනතාව කොපමණ විරුද්ධ වුණත් අපි කමිටුව එම තිරණයේ හිටියා. එම තින්දුව සිට එය ඉදිකරන්න කියා අප පැවසුවා. නමුත් ඔය නිල නිවස ඉදිකරන්න යන ස්ථානයේ ප්‍රජා ශාලාවක් තිබෙනවා. ප්‍රාදේශිය ලේකම්තුමියට ඕන ඕන තැන්වල එහෙම ඉදිකරන්න දෙන්න බැහැ. එහෙම කොහොමද කරන්නේ. මහජනතාවට යම් දෙයක් දිය යුත්තේ ඔවුන්ට ප්‍රයෝජනවත් වන විදියට මුදල් අපතේ නොයන විදියට. මෙය ඉදිකරන්න එපා කියා නැහැ කවුරුවත්.මෙය සැදිමට ස්ථානයක් ලබා දී තිබෙනවා. දැන් ගම්වල උදවිය විරුද්ධ වෙනවා. ඒ සඳහා සාකච්ජා කර අවශ්‍ය පරිදි කටයුතු කළ යුතුයි. ගිය සභාවේදි ඔබතුමා ප්‍රකාශ කර සිටියා නගර සභාවෙන් හරි මුදල් ලබා දෙන්න එහි තිබෙන ප්‍රජාශාලාවටම කාමර දෙකක් ඉදිකරන ලෙස. එහි දිග පළල කොහොමද කියා මා දන්නේ නැහැ. මෙය ඉදි කළහොත් ක්‍රිඩාංගණයෙන් කාලක් හෝ ඊටත් වඩා වැඩි ප්‍රමාණයක් යනවා. ඔබතුමා ලිපිය සම්බන්ධව තාක්ෂණසේවා නිලධාරිගෙන් වාර්තාවක් ලබා ගත්තා ද දන්නේ නැහැ. ඔය ගසා කපා ඉවත් කර ඉදිකිරිමට යාමෙන් ඊටත් වඩා විරෝධතාවයක් ක්‍රිඩා සමිති මගින් පැමිණිමට පුළුවනි. ඔවුන් ක්‍රිඩා කරන භූමිය. ඊට එහායින් ඇති හිස් භූමියේ සැලසුම වෙනස් කර මෙය ඉදිකර ගත හැකිය.නමුත් ඔය කියන විදියට පන්සලේ තිබෙන බුදු පිළිමය පෙන තත්වය නැති වෙනවා. මා පොල්වත්තේ දුටුවා මෙය ඉදිකර තිබෙනවා. තවම මුදලුත් ලැබී නැහැ එම පුද්ගලයාට. තාක්ෂණසේවා නිලධාරි වාර්තාවක් ගෙන බලන්න. නැතිනම් මෙතුමිය විසින් ගොස් පවසාවි මා සැම දෙයකටම විරුද්ධ වෙනවා කියා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ප්‍රජා ශාලාව ඉදිකර ඇති භූමියට පහළ කොටසේ මෙය ඉදිකිරිමට බැරිද ?

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

එහි තිබෙන්නේ ත්‍රිකෝණාකාර බිම් කොටසකි. ඊට මෙහාට පොඩි කැල්ලකුත් තිබෙනවා. එහෙත් මෙම සැලසුම අනුව එය ඉදිකිරිමට නොහැකිය. එම සැලසුමේ ඇති ආකාරයට මෙය දිගට තිබෙන්නේ. ඔය විදියට කරන්න බැහැ. නමුත් ඔබතුමිය ගම පිළිබඳව වැරදි වචන දෙන්න එපා. ඔබතුමියට මා පවසා සිටින්නේ තමනුත් මෙම වැඩ කටයුත්තට බැසිය යුතුයි. එමෙ නැතිව කොළඹ සිට බැහැ. සාකච්ජා කර මෙය විසඳා ගත යුතුයි. ඒකතමතිකව තිරණය කරන එක නෙමේ ඔය ක්‍රිඩා සංගම් වලිනුත් අසන්න. මට කිසි ගැටළුවක් නැහැ. ඔය ක්‍රිඩා භූමිය ඉදිකරනු ලැබුවේ ජනතා විමුක්ති පෙරමුණේ ගරු නගර සභා මන්ත්‍රි සරත් චන්ද්‍ර මහතාගේ අයියා වන සැම්සන් මහතා.ඔහු සිරගෙදර සිට නිදහස් වී පැමිණ තරුණ පිරිසත් සමඟ මෙම ක්‍රිඩාංගණය ඉදිකිරිමට කටයුතු කළේ. ගොඩනැඟිලි ඕනම ස්ථානයක ඉදිකළ හැකියි. නමුත් ක්‍රීඩාංගණ එහෙම ඉදිකරන්න බැහැ. එයට හානි වෙනවා නම් අපි කැමති නැහැ. හානියක් සිදු නොවන්නේ නම් ඒ සඳහා කැමතියි. ඔය ප්‍රජා ශාලාව ඉදිකර ඇති ගොඩනැගිල්ලෙම තව කාමර දෙකක් ඉදිකළානම් ඔය ප්‍රශ්නය විසඳෙනවා. අපි කරනු ලබන වැඩවල නමවත් ගසන්නේ නැහැ. මොකද ජනතා මුදල් . වැරදි මත්යක් දෙන්න එපා. ගමේ කට්ටියගේ අකමැත්ත නෙමේ තියෙන්නේ.ඔබතුමිය එය ඉටු කරන්න කටවත් හානියක් නොවන විදියට. ගැටළු සහගත නොවන විදියට. මෙම ප්‍රශ්නය නැවත වතාවක් සභාවට යොමු කරන්න එපා ගරු සභාපතිතුමනි. මෙහි තාක්ෂණ වාර්තාවක් ලබා ගෙන විරෝධතාවයක් නොවන අයුරින් ක්‍රියාත්මක කරන ලෙසඉල්ලා සිටිනවා.තමන් ශක්තිමත් වෙන්න. ක්‍රිඩා සමිති සම්ගම් වලින් අනුමතිය ලබා ගෙන කරන්න.

**ගරු නගර සභා මන්ත්‍රිනි ඊ.ඉන්දා අයිරාංගනි මහත්මිය කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මා හොඳ ශක්තිමත් කාන්තාවක්. මට ශක්තිය උගන්වන්න අවශ්‍ය නැහැ ගරු මන්ත්‍රිතුමා.ගරු මන්ත්‍රිතුමාට පණ නැති එකයි මෙහි වෙලා තිබෙන්නේ. ඔබතුමාට මා සමඟ තිරණය ගන්න බැහැනේ තවම

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

අපි තීරණයක් ගත්තානේ ගරු මන්ත්‍රීතුමිය

**<u>ගරු නගර සභා මන්ත්‍රීනි ඊ.ඉන්දා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

ඔබතුමා තමයි සෑම විටම බාධා කරන්නේ. යමුනා මහත්මිය , අධිකාරි මහත්මියලා ඔබතුමාට වැඩ කර නිසා එතැන පුස්තකාලය පිහිටි භූමියේ සාදන්න කියනවා. අවංකම මෙතැන සිදු වී තිබෙන්නේ දේශපාලන හැපිල්ලකි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

දේශපාලන කිසිම හැපිල්ලක් නැහැ ඕතන

**<u>ගරු නගර සභා මන්ත්‍රීනි ඊ.ඉන්දා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

ගරු නගර සභා මන්ත්‍රී ධම්මික මහතා දන්නවා ඇති. කී දෙනෙක් විරුද්ධ වුවාද කියා පුස්තකාල භූමියේ ඉදිකරන්න එපා කියා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

කවුරුවත් හදන්න එපා කියන්නේ නැහැනේ . කමිටුව මඟින් තිරණය කලානේ පුස්තකාල භූමියේ ඉදිකරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රීනි ඊ.ඉන්දා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

මා දකුණේ හොඳ ශක්තියක් තියෙන කොන්ද කෙලින් ගැහැණියකි. මට පුළුවන් හෙට දිනයේ බැකෝ යන්ත්‍රයක් ගෙනවිත් කපන්න. මෙය ඉදිකරන්න. බලෙන් හරි මෙය ඉදිකරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ඉතිං එය ඉදිකරන්න කියා තමයි කියන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රීනි ඊ.ඉන්දා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

නමුත් එහෙම බලෙන් සාදා වැඩක් නැහැ. ගමේ ජනතාව ඕන

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ඔයාට ඕන විදියට නම් වැඩේ කර ගන්න බැහැ. එහෙම කරන්නේ කොහොමද ? ඔබතුමිය කොහොමද එහෙම සෙල්ලම් දන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රීනි ඊ.ඉන්දා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

ඔබතුමාට යමක් කරන්න බැරි වුණා කියා ඔබතුමා දුක්වෙන්න එපා. ඔබතුමා උප සභාපති වෙලා ඉඳ තිබිලා තියෙනවා. වැඩ කලේ නැහැ කියා මේ සොච්චම් මා කරනවා කියා මාව අවතක්සේරු කරන්න එපා. මා කොළඹ සිටියත් ගමේ කරන්න ඕන වැඩ හරියට කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

වැඩ කරන්නඇවිත් ඕක ඕච්චර කල් යනවාද?

__ගරු නගර සභා මන්ත්‍රිනි ඊ.ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්__

ඔබතුමා තමයි මේ සියළු ස්ථාන වලට විරුද්ධ වුණේ. සුසාන භූමියේ ඉදිකරන ප්‍රශ්නයටත් මෙතුමා තමයි විරුද්ධ වුණෝ. ගමේ ජනතාව 86ක් 90 ක් අත්සන් කර දෙනවා. මා එයට බොහොම අකමැතියි ගරු මන්ත්‍රීතුමා. මෙය පොදු වැඩකි . ඔබතුමා දැන් කියනවා ශාලාවේ මෙහා පැත්තෙන් සාදන එකත් පිට්ටනියට බලපාන බව. එතකොට කොහොද ගරු නගර සභා මන්ත්‍රී රාහුල මහත්මයාණෙනි, ඔබතුමාගේ නිවසේද මෙය ඉදිකරන්නේ.

__ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්__

මගේ ගෙදර හදන්න දෙයක් නැහැ ඕයි. නිකං වැරදි මත දෙන්න එපා.

__ගරු නගර සභා මන්ත්‍රිනි ඊ.ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්__

එහෙම කතා කරන්න එපා . මට හොඳ ශක්තියක් තිබෙන හොඳ ගැහැණියකි . මෙතුමා මෙහෙම ප්‍රකාශ කළාට ගම් වාසින් ගරු සභාපතිතුමනි , ඔබතුමාටත්, ගරු ප්‍රධාන අමාත්‍යතුමාටත්, ප්‍රා දේශීය ලේකම්තුමියටත් ලිඛිතව ලියා තිබෙනවා. ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතාටත් දුරකථනයෙන් කතා කර අවුලක් ඇති වූ මොහොතේ ගමේ පෙර පාසලේ දේවල් ගලවා දමා කරන්න එපා කියා කියන වේලාවේ මාත් කාන්තාවක්, මාත් අම්මා කෙනෙක්. මට හිතුනා මං මෙවා ගලවා දමා ළමයි සෙල්ලම් කරන තැන නිකං අනවශ්‍ය ප්‍රශ්නයක් ඇති කරගන්න බැහැ ගමේ. අතනට කිසිම බලපෑමක් වෙන්නේ නැහැ. දැන් ඔබතුමලා ප්‍රජා ශාලාවට කැල්ලක් ගන්න ලක්ෂ 3 , 4 ක් වියදම් කරනවාට වඩා නරකද මට මෙම ගස ඉවත් කර දුන්නාම. පන්සල වැහෙන්නේ නැහැ. බෝධිය වැහෙන්නේ නැහැ. මොකද එය සාදන කෙනා මහින් මැනිමෙන් පසු තමයි එහි තීරණය ගනු ලැබුවේ. ගමේ අය සමඟ ගොස් මා එය බැලුවා. මා විරුද්ධ වුණා. ඊට පසු ගමේ ජනතාව පවසා සිටියා මෙම ගස කපා දැමූ පසු කිසිම ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. බුදු හාමුදුරුවෝ වැහෙන්නෙත් නැහැ. පන්සල වැහෙන්නෙත් නැහැ.ප්‍රජ ශාලාව අසළමයි එය ඉදිවන්නේ. මරණධාර සමිතියට වෙන කැල්ලක් ගන්න කියා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඕතන මරණධාර සමිතියට වෙනම කැල්ලක් සෑදීමට අවශ්‍ය නැහැනේ මෙම ප්‍රජා ශාලාව ඉදිකලාම.වයසක කෙනෙකුට ඉහලට නැගීම අමාරුයි. සමිති ගොඩනැගිල්ල තිබෙන්නේ ඉහළ මාලයේ. දැන් සාදන නිල නිවසේ සමිති ගොඩනැගිල්ලේ සමිති ශාලාව තිබෙන්නේ පහල මහලයේ ඕන වයසක කෙනෙකුට ගිහින් මෙම සමිති පැවැත්විය හැකිය. මෙහි අර උඩ නගින්න එපායි. අර මරණාධාර සමිතියේ බඩු ඇත්තේ එහි. අපි අවංකව කතා කරන්න එපායි.දැන් එතනටත් තැනක් අවශ්‍යයි. දැන් නිල නිවස සෑදුවාම අර ප්‍රජා ශාලාවේ මරණධාර සමිති වැඩිහිටි සමිති වැනි අපගේ පොදු වැඩ කටයුතු සියල්ලම කළ හැකියි. එය කරන්න අවස්ථාව උදා කර දෙන්න. ගස කපා ඉවත් කර දෙන්න සභාවේ අය විරුද්ධ වෙන්නේ නැහැනේ . පොදු වැඩකට ඔබතුමන්ලා උදවු කරන්නකෝ.

__ගරු උප සභාපති කමල් වැල්ලගේ  මහතා කතා කරමින්__

ගරු සභාපතිතුමනි , මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා ගරු සභාවේ මන්ත්‍රීවරුන්ට එක දෙයකට කතා කරන්න එක අවස්ථාවක් ලබා දෙන ලෙස. නැතිනම් මේ සභාව ගෙනයාමට නොහැකි වෙනවා. කරුණාකර ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

__ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්__

දැන් මෙතුමියගේ අදහස් අනුවත් ගරු නගර සභා මන්ත්‍රී රාහුල මහතාගේ අදහස් අනුවත් සමාන වෙන්නේ නැහැ. අදහස් පරස් පරයි. මෙතුමා ප්‍රකාශ කර සිටිනවා ක්‍රිඩාංගණය හා පන්සල අවහිර වන බව. ස්ථානිය පරික්ෂාවක් කර එහි ක්‍රිඩාංගණයත් අවහිර වෙන්නේ නැතිනම් විහාරස්ථානයේ බුදු පිළිමයත් නොපෙන්නේ නැතිනම් ගරු මන්ත්‍රීතුමිය කියන විදියට එම ස්ථානයේ හරි මෙය ඉදිකරන්න . නැතිනම් මෙය ඉවරයක් වෙන්නේ නැහැ. හැමදාම සභාවේ කතා කරනවා විතරයි. ගමේ ජනතාව සමඟත් රැස්වීමක් තබා එම ස්ථානයේ සෑදීමට කටයුතු කරන්න. ගස කැපීමට මුදල් නොමැතිනම් මාගේ මේ මස වැටුප හරි ලබා දෙන්නම්. එම ගස කපා ඉවත් කිරිමට. නැතිනම් කවදාවත් මෙය විසඳෙන්නේ නැහැ.

__ගරු නගර සභා මන්ත්‍රිනි ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්__

ගරු සභාපතිතුමනි , ගරු නගර සභා මන්ත්‍රිනි අයිරාංගනී මහත්මිය එම ප්‍රදේශයේ සිටින ජේෂ්ඨතම මන්ත්‍රීවරයකු ලෙස කටයුතු කරන ගරු නගර සභා මන්ත්‍රී රාහුල මහතා සමඟ ආරවුලක ස්වරූපයෙන් ප්‍රශ්නය විසඳා ගැනීමට අවශ්‍ය වන්නේ නැහැ. එතුමා මෙවර පළාත් පාලන ඡන්දයේදි ඕකන්ද ප්‍රදේශයේ වැඩිම ජනතා ප්‍රසාදයක් ලබා ගත්

මන්ත්‍රීවරයා. මෙවැනි ගැටළුවක් පැමිණි මොහොතක මා ගරු මන්ත්‍රීතුමියට සහෝදරත්වයෙන් ප්‍රකාශ කර සිටිනවා එතුමා සමඟත් පොල්වත්ත ඕකන්ද ප්‍රදේශයේ ගරු මන්ත්‍රීතුමන්ලාගේ අදහස් ගෙන සාකච්ඡා කර ප්‍රාදේශිය ලේකම්තුමියත් කැඳවා එම ස්ථානය පරික්ෂා කර බලා මෙම ගැටළුව විසඳා ගන්න. අපි ජනතාව වෙනුවෙන් සේවය කරන්න තමයි බැඳී සිටින්නේ. ඒ අනුව කටයුතු කරමින් අනවශ්‍ය ලෙස අපි අතර ප්‍රශ්න ඇති කර ගන්නේ නැතිව ක්‍රියාත්මක වන ලෙස මා එතුමියට විශේෂයෙන්ම ප්‍රකාශ කර සිටිනවා.ගරු සභාපතිතුමනි, ඔබතුමා මෙම ප්‍රශ්නයට මැදිහත් වි මෙම ප්‍රශ්නය නිරාකරණය කර ගැනිමට පියවර ගන්නා ලෙස ඉල්ලා සිටිනවා. එසේම එම ගරු මන්ත්‍රිවරු සියළු දෙනාගෙන්ම ඉතා සමකාමිව මෙම ප්‍රශ්නය නිරාකරණය කර ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රි ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මෙම ගැටළුවෙදි අපට හෙලිවන්නේ මෙම ජන නායකයින් දෙදෙනා අතර සමපාත බවක් නොමැති බවයි. නමුත් අපි සියළු දෙනාගෙම අභිප්‍රාය මේ ජන සමාජයට කළහැකි යමක් උපරිමයෙන් කිරිමයි. මේ ගරු නගර සභා මන්ත්‍රි අයිරාංගනි මහත්මිය තම රජය යටතේ ලැබෙන ප්‍රතිපාදන තමන්ගේ කඩිසර කම නිසා ඇගේ තිබෙන ඒ පිරිමි ගති ලක්ෂණ නිසා ඇය බොහොම පහසුවෙන් එම මුදල් අපගේ නගර සභාවට රැගෙන විත් ඇත. එසේම ගරු නගර සභා මන්ත්‍රි රාහුල මහතාත් පරිණතයෙකි. එතුමාගේ දැනුමත් සුළු පටු නොවේ. මේ අනුව ගරු නගර සභා මන්ත්‍රි කොඩිකාර මහතගේ යෝජනාව පරිදි මුදල් වියදම් කිරිමට නොහැකි නම් අප සියළු දෙනා මේ සඳහා සහභාගි වි මෙම ගස කපා ඉවත් කර මෙම කටයුත්ත නිම කරන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , මෙය දිගින් දිගටම ගෙන යා යුතු කාරණයක් නොවේ. මේ සභා වාර තුනකදි පමණ මෙම කාරණය කතා වුණා. ගරු සභාපතිතුමාත් මැදිහත් වී මෙම ස්ථානය බලා ගරු නගර සභා මන්ත්‍රි රාහුල මහත්මා පවසන ආකරයට ගැටළුවක් පවතිනම් තාක්ෂණසේවා නිලධාරිතුමාත් සමඟ ගොස් අවශ්‍ය කරන තින්දුව ගන්න කියා ප්‍රකාශ කර සිටිනවා. මෙය දිගින් දිගටම ගියෝත මෙම කරුණ නිසාම මෙම සභාව හැල්ලුවට ලක්වේ. ඉතා ඉක්මනින්ම ගොස් මේ සඳහා තින්දුවක් ගන්න.මේ සඳහා ගරු සභාපතිතුමාට බලය පවරා ගරු රාහුල මන්ත්‍රීතුමා කියන විදියට ක්‍රිඩා කටයුතු වලටත් බාධාවක් සිදු නොවන ආකාරයට තාක්ෂණසේවා නිලධාරි මහතා සමඟ ගොස් ස්ථානය පරික්ෂා කිරිමට.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මා සිතනවා මෙම කටයුත්ත සිදු කළ යුත්තේ එම ප්‍රදේශයේ සිටින ගරු මන්ත්‍රිවරුන් විසිනි. මා පුද්ගලික පවසන්නම් ඕකන්ද විහාරස්ථානය ඉදිකර ඇත්තේත් අපගේ සුසාන භුමියේ . පොඩි අඩි 10 ක විතර ඉදිකිරිමක් කර මිට වසර කිහිපයකට ඉහතදිත් එම විහාරස්ථානය විසින් ඉතා විශාල කොටසක් අල්ලා ගනු ලැබුවා. එම පන්සලේම නායක ස්වාමින් වහන්සේම මනාන විහාරස්ථානයේම ඊළඟ භුමිය ඇල්ලිමට පටන් ගෙන තිබෙනවා. අපි ප්‍රාදේශිය ලේකම්තුමියට පැවසුවා නඩු දමා මෙය ඉවත් කර දෙන ලෙස. මෙම ප්‍රශ්නය ඇත්තටම විසඳිය යුත්තේ අපි නෙමේ. අපි පටබැඳිමුල්ල ප්‍රදේශයේ ප්‍රජා ශාලාවක් සාදා තිබුණා. ගරු නගර සභා මන්ත්‍රි පේෂලා මහත්මිය පැමිණ කියා සිටියා මෙම නිල නිවස ඉදිකළ යුතු බව . මා වැසිකිළියත් කඩා මෙම නිල නිවස අලුතින් සැදිමට කටයුතු කළා. මා ඒ ආකාරයට ඉඩ සලසා දි තිබෙනවා. එසේම ගරු නගර සභා මන්ත්‍රි රාහුල මහත්මා කියන්නේ ගමේ වැඩිම මනාප දිනාගත් පුද්ගලයා. ඔබතුමාගේ වගකිමක් තිබෙනවා ප්‍රධාන වශයෙන්ම මේ සියළු වරප්‍රසාදයන් ගමේ පුද්ගලයන්ට ලබා දෙන්න. මා පවසා සිටින්නේ ගරු නගර සභා මන්ත්‍රි කොඩිකාර මහතා, ගරු නගර සභා මන්ත්‍රි රාහුල මහතා, ගරු නගර සභා මන්ත්‍රි එස්.එම් සරත් චන්ද්‍ර මහත්මාත් ගරු නගර සභා මන්ත්‍රිනි ඉන්දා අයිරාංගනි මහත්මියත් එකතු වි තීරණය ගන්න. පක්ෂ සියල්ලෙන්ම එවිට සිටිනවා. විවාහරස්ථානය වැහෙනවා කියන එකේ ප්‍රතිවරුද්ධව තමයි මා සිටින්නේ. විහාරස්ථානය විසින් සුසාන භුමියත් වටලපු ස්ථානයක් තමයි ඕකන්ද කියන්නේ. එතැන කරන්න කියා වැඩය කතා කර මෙතැන අවිත් සුද්ද වෙන උදවියත් මෙතැන සිටිනවා. එම නිසා ඔය මන්ත්‍රිවරුම තින්දුව ගන්න. අපි මෙයට සම්බන්ධ වන්න අවශ්‍ය වන්නේ නැහැ. අවශ්‍ය නම් තියා ගන්න. අනවශ්‍ය නම් අයින් කර දමන්න.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ගරු නගර සභා මන්ත්‍රි රාහුල මහතා කියන ප්‍රකාශයෙත් යම් සත්‍යයක් තිබෙනවා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ගමේ සිටින ගරු මන්ත්‍රීවරු 4 ට ලබාදුන් පසු ඔවුන් තීරණය කරයි ඒ පිළිබඳව. අපි මොකටද සම්බන්ධ වෙන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

ඔබතුමා මේ සඳහා මුලිකත්වය ගන්න. මේ ට්‍රක් ලෙවල් වලින් ඇවිත් නම් මා මෙය කරන්න දෙන්නේ නැහැ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ගරු මන්ත්‍රීතුමා , ඔය ට්‍රක් ලෙවල් එක පටන් ගනු ලැබුවේ ඕකන්ද විහාරස්ථානයෙන්මයි. එම නිසා මා මෙයට සහභාගි වෙන්නේ නැහැ. සහභාගි වුණොත් අම්බලන්ගොඩ නගර සභාවට අයත් සියළුම අයිතින් ලබා ගත යුතුයි. එසේ නම් මුලින්ම විහාරස්ථානය අයින් කළ යුතුයි. එතරම් සම්පූර්ණ වැරදි වැඩක් කර තිබෙන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

ඒ වෙච්ච දේවල් ඔබතුමාත් මාත් සහභාගි වුණානේ. මා කියන්නේ මෙම ප්‍රශ්නය විසඳන්න ඕන නිසා ඔබතුමා ඊට මැදිහත් වෙන්න. මැදිහත් වී කරන්න පුළුවන් නම් ගිහින් බලා එය විසඳා දෙන්න. මාගේ ගැටළුවක් නැහැඒ පිළිබඳව

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඔබතුමලා හතර දෙනා තීන්දු කරන්නකෝ.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

තාක්ෂණසේවා නිලධාරි මහත්මයින් රැගෙන ගොස් මෙය බලන්න. සෑදීමට ගොස් මෙය සෑදුවායින් පසු අන්තිමට ගැටළුවක්නේ. එම නිසා ඒ විදියට බලා මෙය ඉටු කරන්න. මෙතුමිය කියන විදියට මාගේ අකමැත්තක් නැහැ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ගරු මන්ත්‍රීතුමිය, ඔබට අවශ්‍ය මෙය ඉදි කිරිමට තව කොටසක් මා නගර සභා වියදමින් සාදා දෙන්නම්. ඕක අතහැර දමන්න. එකඟතාවයක් නැතිව කර වැඩක් නැහැ.

**ගරු නගර සභා මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, නිල නිවසේ සැලැස්ම අනුව එසේ කාමර වෙන්කර ගොඩනැඟිල්ල ඉදිකළ නොහැක.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

නැහැ. ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ මුදල් අවශ්‍යම නැහැ. අපේ මුදල් වලින් දෙන්නම්. අපි සාමාන්‍යයෙන් ප්‍රතිපත්තියක් ඇති කර ගෙන ගියා. මේ මෑත තමයි නිල සෙවණ කියන සංකල්පය පැමිණියේ. ඊට ඉහත මේ සභාවේ සංකල්පය තමයි අපේ ඉන්න ග්‍රාමසේවක මහතා , සමෘද්ධි නියාමක මහතා , ආර්ථික සංවර්ධන නිලධාරි මහතා ගමේ එකම ස්ථානයක සිටිය යුතුයි කියා. ඒ සෑම ඉදිකරනු ලැබු ප්‍රජා ශාලාවකම කාමර වෙන්කර තිබෙනවා.මේ සියළු නිලධාරින් මෙයට පැමිණියේ නැත්තේ රජය මගින් බදු මුදලක් දෙනු ලැබුවා ග්‍රාම සේවක මහත්වරුන්ට තම කාර්යාලය පවත්වාගෙන යාමට. එම්නිසා නගර සභාවෙන් ඉදිකරනු ලැබු කාමර වලට මේ අය පැමිණියේ නැහැ. අර බදු මුදල් සාක්කුවට ගන්න ඕන නිසා. ඒ අය කටයුතු කළා. එයයි සිදු වුයේ. මේ අපගේ ප්‍රතිපත්තියට ග්‍රාමසේවක මහත්වරු අනුගත වුයේ නැහැ. නමුත් අපගේ කාර්ය අපි ඉටු කළා. නමුත් දැනට එහෙම සිටින තැන් තිබෙනවා. උදාහරණයක් ලෙස පනියන්දුව කොට්ඨාශයේ ග්‍රාමසේවක මහතා , සමෘද්ධි නියාමක මහතා , ආර්ථික සංවර්ධන නිලධාරි මහතා ඒ සියළු දෙනාම සිටින්නේ අපගේ ප්‍රජා ශාලාවේ. අපි එපා කියා නැහැ . මේ සඳහා මුදල් ඉල්ලා නැහැ. මෙහි ජල ගාස්තුව , විදුලි ගාස්තුව අපි ගෙවනවා.අපගේ ජනතාව සේවය ලබා ගන්නවා. අපි අපේක්ෂා කළේ එයයි. දැනට ඕකන්ද ප්‍රදේශයේ තිබෙන ප්‍රජා ශාලාවේ ග්‍රාමසේවක මහතා , සමෘද්ධි නියාමක මහතා සිටිනවා . තව කාමර දෙකක් පමණයි අවශ්‍ය වන්නේ. එම කාමර දෙක සභාවෙන් ඉදිකර දෙන්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනි ඊ.ඉන්දා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, නිල පියසෙන් අදහස් කරන්නේ අවශ්‍ය පරිගණක ලබා දී ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සිට තම අනු කාර්යාල වලින් තමන්ට අවශ්‍ය උප්පැන්න සහතික ආදිය ලබා ගැනීමේ වැඩ පිළිවළක් තමයි යන්නේ. එක තමයි සැලසුම . ගමේ අය කැමති නැත්නම් මට කරන්න දෙයක් නැහැ. එවැනි දෙයක් තමයි සිදු කරනු ලබන්නේ.ගරු ස්වදේශිය කටයුතු අමාත්‍යතුමා සමඟ සාකච්ඡාවක් තිබුණා. මගේ ඉලක්කය මෙයයි. ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සිට පරිගණක ගත කර එම කටයුත්ත සිදු කිරිමටයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මෙම රැස්විම අවසන් විමෙන් පසු කාර්මික නිලධාරි මහතුන් සමඟ මෙම මන්ත්‍රිවරු 4 නා එකග ද මෙම ස්ථානය පරික්ෂා කර බලන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මා වෙනුවට ඔබතුමා යන්න

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ඒ කියන්නේ වැඩේ වෙන්නැහැ කියලා.මා එය භාර ගන්න කැමති නැහැ. මා ඔනනම් එන්නම් ඔය කියන නිසා. හැබැයි ගරු මන්ත්‍රිවරු 4 එන්න ඕන. නැතිනම් බැහැ කරන්න. එවිට අපේ පොදුජන පෙරමුණේ, එක්සත් ජනතා නිදහස් පක්ෂයේ , එක්සත් ජාතික පක්ෂයේ , ජනතා පෙරමුණේ වශයෙන් පක්ෂ 4ම මන්ත්‍රිවරු සිටිනවා. සියළු අදහස් නියෝජනය වෙනවා.හැබැයි මේ රැස්විමෙන් පසුව. අදම මෙය නිම කරන්නම්. සභාව මේ ගරු මන්ත්‍රිවරු 4 ට බලය පවරන්න මෙය ඉදිකරන ස්ථානය තින්දු කරන්න.එම තින්දුව පරිදි එම ස්ථානය ලබා දෙන්න මට අවසර ලබා දෙන්න.

**(04)** යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න — නැත

**05.01** **ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන යෝජනා**

**05.01.01** **අම්බලන්ගොඩ නගර සභාවේ මාර්ග තලනය සඳහා භාවිතා කර තිබු බැටරි වසර 5ක් පමණ පැරණි බැවින් එම බැටරි කල් ඉකුත් වී ඇති බවත් එබැවින් මාර්ග තලනය ක්‍රීයා කිරිමට නොහැකි වී ඇති බවත් ඒ සඳහා අළුතින් ඇම්පියර් 90 සිල් ටයිප් බැටරි 2 ක් ඉක්මණින් ලබා දෙන ලෙස වැඩ පරිපාලක මහතා විසින් කරන ලද ඉල්ලිම තාක්ෂණසේවා නිලධාරි මහතා නිදේශ කර ඇත. මෙය කඩිනමින් ඉටුකල යුතු බැවින් මාගේ උපදෙස් පරිදි ඉක්මණින් මිල ගණන් කැඳවා ලේකම් , තාක්ෂණසේවා නිලධාරි , අභ්‍යාන්තර විගණන නිලධාරි , ගිණුම් අංශ ප්‍රධානි හා විෂය නිලධාරිගෙන් සැදුම්ලත් කමිටුවක් මගින් සභා අනුමතියට යටත්ව එම බැටරි මිලදි ගැනිම තීරණය කිරිම සඳහා බලය ලබාදීම සම්බන්ධයෙන් සභා අනුමතිය ලබාදිම සුදුසු බව යෝජනා කරමි.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

සාමාන්‍යයෙන් අප නගර සභාවට භාණ්ඩයක් ලබා ගැනිමෙදි අපි අනුගමනය කරනු ලබන්නේ ටෙන්ඩර් මණ්ඩලය මගින් එය මිලදි ගැනිමට. එම ටෙන්ඩර් මණ්ඩලය නියෝජනය කරනු ලබන්නේ අපගේ පත් කරනු ලැබු මන්ත්‍රිවරු කණ්ඩායමකි. නගර සභා ගල් රෝල ක්‍රියා කිරිමේදි එකවරම ප්‍රශ්නයක් ඇති වුවා. මෙහි බැටරි 2 ක් තිබුණා. එම බැටරි දෙක කල් ඉකුත් විම නිසා ගල් රෝල ස්ටාට් කරගත නොහැකි වුවා. එම බැටරි දෙක නොමැතිව ගල්රෝල මේ සභාව වෙනකම් ස්ටාට් කරන්න බැරිව වැඩ නවත්වන්න වෙනවා. මෙය සිදුවුයේ 2019.02.07 දින . ඒ අනුව 2019.03.05 දිනට අදවනතුරු මාර්ග සංවර්ධනය කරන එක පැච් කරන එක නවත්වන්න වෙනවා. ඒ අවස්ථාවේ මා

සභා අනුමතියට යටත්ව ලේකම් , තාක්ෂණසේවා නිලධාරි , අභ්‍යාන්තර විගණන නිලධාරි , ගිණුම් අංශ ප්‍රධානි හා විෂය නිලධාරිගෙන් 5 සමන්විත කමිටුවක් පත්කර ටෙන්ඩර් කැඳවා එය මිලදි ගැනිමට තීරණය කළා කිසිම අතපසු විමකින් තොරව. එම අවස්ථාවේ කරනු ලබන ක්‍රියා වලිය නිත්‍යානුකුල විය යුතු නිසායි මෙම සභාවට ඉදිරිපත් කරනු ලැබුවේ. මෙම කටයුත්ත සිදු නොකලේ නම් සභාවේ ප්‍රශ්න උද්ගත වෙනවා මීට වඩා. මෙය සිදු වුයේ 2019.02.07 දින. අපි සභාව පවත්වා අවසන්. අම්බලන්ගොඩ නගර සභාවේ මාර්ග තලනය සඳහා භාවිතා කර තිබු බැටරි වසර 5ක් පමණ පැරණි බැවින් එම බැටරි කල් ඉකුත් වී ඇති බවත් එබැවින් මාර්ග තලනය ක්‍රියා කිරිමට නොහැකි වී ඇති බවත් ඒ සඳහා අළුතින් ඇම්පියර් 90 සිල් ටයිප් බැටරි 2 ක් ඉක්මණින් ලබා දෙන ලෙස වැඩ පරිපාලක මහතා විසින් කරන ලද ඉල්ලිම තාක්ෂණසේවා නිලධාරි මහතා නිදේශ කර ඇත. මෙය කඩිනමින් ඉටුකල යුතු බැවින් ගරු සභාපතිතුමාගේ උපදෙස් පරිදි ඉක්මණින් මිල ගණන් කැඳවා ලේකම් , තාක්ෂණසේවා නිලධාරි , අභ්‍යාන්තර විගණන නිලධාරි , ගිණුම් අංශ ප්‍රධානි හා විෂය නිලධාරිගෙන් සැදුම්ලත් කමිටුවක් මගින් සභා අනුමතියට යටත්ව එම බැටරි මිලදි ගැනීම සම්බන්ධයෙන් සභා අනුමතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

<u>**නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

යෝජනාව නොදමා කියන්න ඕන.

<u>**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

මෙසේ කරනු ලැබුවේ නිත්‍යානුකුල විය යුතු නිසායි.සභාව මෙයට විරුද්ධ වෙනවාද කවුරු හරි

<u>**නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

නැහැ විරුද්ධ නැහැ.

**තීරණය :-**

අම්බලන්ගොඩ නගර සභාවේ මාර්ග තලනය සඳහා භාවිතා කර තිබු බැටරි වසර 5ක් පමණ පැරණි බැවින් එම බැටරි කල් ඉකුත් වී ඇති බවත් එබැවින් මාර්ග තලනය ක්‍රියා කිරිමට නොහැකි වී ඇති බවත් ඒ සඳහා අළුතින් ඇම්පියර් 90 සිල් ටයිප් බැටරි 2 ක් ඉක්මණින් ලබා දෙන ලෙස වැඩ පරිපාලක මහතා විසින් කරන ලද ඉල්ලිම තාක්ෂණසේවා නිලධාරි මහතා නිදේශ කර ඇත. මෙය කඩිනමින් ඉටුකල යුතු බැවින් ගරු සභාපතිතුමාගේ උපදෙස් පරිදි ඉක්මණින් මිල ගණන් කැඳවා ලේකම් , තාක්ෂණසේවා නිලධාරි , අභ්‍යාන්තර විගණන නිලධාරි , ගිණුම් අංශ ප්‍රධානි හා විෂය නිලධාරිගෙන් සැදුම්ලත් කමිටුවක් මගින් සභා අනුමතියට යටත්ව එම බැටරි මිලදි ගැනීම සම්බන්ධයෙන් සභා අනුමතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා</u>

**05.01.02** **අම්බලන්ගොඩ කුලරත්න පාරේ, අතුරු මාර්ගය ( නවාරා පංතිය ) පාර සංවර්ධනය කිරිමේ කර්මාන්තය සභා අරමුදලින් සිදු කිරිම සුදුසු බව යෝජනා කර සිටිනවා.**

**තිරණය :-**

අම්බලන්ගොඩ කුලරත්න පාරේ, අතුරු මාර්ගය ( නවාරා පංතිය ) පාර සංවර්ධනය කිරිමේ කර්මාන්තයට අදාළ යෝජනාව පිළිගැනිම සුදුසු බවටත්, එම කර්මාන්තය සභා අරමුදලින් ඉටු කිරිම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.03** **අම්බලන්ගොඩ නගර සභාව සතු පහත අංක දරණ ජංගම ගිණුම්වල ශේෂය වැඩියෙන් පවතින අවස්ථාවන්හිදි ස්ථාවර තැන්පත් වල මුදල් ආයෝජනය කිරීම සඳහා සභාවේ සභාපති , ලේකම් හා ගණකාධිකාරිට ( ගණකාධිකාරි පුරප්පාඩු පවතින අවස්ථාවල ගිණුම් අංශ ප්‍රධානි ) බලය පැවරිම සුදුසු බවට යෝජනා කර සිටිමි.**

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

1) 035-1-001-2 , 6295234 දරණ පොදු ගිණුම

2) 035100180002102 ප්‍රජා

3) 0351001-0-6295876 ප්‍රාග්ධන

ඉහත ගිණුම් වල ශේෂය වැඩියෙන් පවතින අවස්ථාවන්හිදි ස්ථාවර තැන්පත් වල මුදල් ආයෝජනය කිරිම සඳහා සභාවේ සභාපති , ලේකම් හා ගණකාධිකාරිට ( ගණකාධිකාරි පුරප්පාඩු පවතින අවස්ථාවල ගිණුම් අංශ ප්‍රධානි ) බලය පැවරිම සඳහා සුදුසු බවට යෝජනා කර ඇත. මේ සඳහා සභා අනුමතිය ඉල්ලා සිටිනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

සමහර වෙලාවට අපට ගෙවීම් සඳහා පළාත් සභාවෙන් හා ආණ්ඩුවෙන් හෝ වෙනත් ක්‍රමවලින් මුදල් ලැබෙනවා. එම ගෙවිම් කිරිමට සිදු වන්නේ තව මාසයක පමණ කාලයකින්. නමුත් එම මාසයේම අපගේ සාමන්‍ය ගිණුමේ මෙම මුදල් තබා ගෙන සිටිනවා. එම මාසය සඳහා යම්කිසි මුදලක් ස්ථාවර තැන්පතු දමා යම්කිසි පොළියක් උපයා ගැනිම සඳහා තමයි මෙම යෝජනාව ගෙන එනු ලැබුවේ. මේ අවස්ථාවේ බලය සභාවෙන්ම කිරිමට නොහැකි නිසා සභාපති , ලේකම් හා ගණකාධිකාරිට ( ගණකාධිකාරි පුරප්පාඩු පවතින අවස්ථාවල ගිණුම් අංශ ප්‍රධානි ) බලය පවරන ලෙස තමයි මෙම ඉල්ලිම කර ඇත්තේ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා, අපි කලින් භාණ්ඩාගාර බිල්පත් ගනු ලැබුවා නේද?

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අපි භාණ්ඩාගාර බිල්පත් ගත්තා. එය ඉදිරියට කරන්න බලන්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා, මුදල් ලැබෙනවා නේද?

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මුදල් ලැබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගැටළුවකි නැහැ. මුදල් හරියට බලා ගෙවන්න. මුදල් ලැබෙන්නේ නැහැ කියපු නිසායි මා විමසුවේ.

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අපි මුදල් ලැබෙන අවස්ථාවේ ලැබෙනවා කියනවා. නොලැබෙන අවස්ථාවේ නොලැබෙනවා කියනවා. එහෙම අපි දෙපැත්ත සිදුවන වැඩ කරන්නේ නැහැ.

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාව සතු පහත අංක දරණ ජංගම ගිණුම්වල ශේෂය වැඩියෙන් පවතින අවස්ථාවන්හිදී ස්ථාවර තැන්පත් වල මුදල් ආයෝජනය කිරීම සඳහා සභාවේ සභාපති , ලේකම් හා ගණකාධිකාරිට ( ගණකාධිකාරි පුරප්පාඩු පවතින අවස්ථාවල ගිණුම් අංශ ප්‍රධානි ) බලය පැවරීම සුදුසු බවට ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

1) 035-1-001-2 , 6295234 දරණ පොදු ගිණුම

2) 035100180002102 ප්‍රජා

3) 0351001-0-6295876 ප්‍රාග්ධන

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා**

**05.01.04** **අම්බලන්ගොඩ හෙප්පුමුල්ල අයිඩියල් සිටි මාර්ගය තාර දැමීම සහා අරමුදලින් සිදු කිරිම සුදුසු බවට යෝජනා කර සිටිනවා.**

**තිරණය :-**

අම්බලන්ගොඩ හෙප්පුමුල්ල අයිඩියල් සිටි මාර්ගය තාර දැමීමේ කර්මාන්තයට අදාළ යෝජනාව පිළිගැනිම සුදුසු බවටත්, එම කර්මාන්තය සභා අරමුදලින් ඉටු කිරිම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා**

**05.01.05** **අම්බලන්ගොඩ අතුරු මාර්ගය ( කරුණාසේන මහතාගේ නිවසට යන මාර්ගය ) ගල් ඇල්ලිම සභා අරමුදලින් සිදු කිරිම සුදුසු බවට යෝජනා කර සිටිනවා.**

**තිරණය :-**

අම්බලන්ගොඩ අතුරු මාර්ගය ( කරුණාසේන මහතාගේ නිවසට යන මාර්ගය ) ගල් ඇල්ලිම සුදුසු බවටත්, එම කර්මාන්තය සභා අරමුදලින් ඉටු කිරිම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා**

**05.01.06** **අම්බලන්ගොඩ ධම්මකුසල මාවත (ඒ.ජී.අයි. ද සිල්වා මහාතාගේ නිවස අසල කාණුව සහා අරමුදලින් සිදු කිරිම සුදුසු බවට යෝජනා කර සිටිනවා.**

**තිරණය :-**

අම්බලන්ගොඩ ධම්මකුසල මාවත (ඒ.ජී.අයි. ද සිල්වා මහාතාගේ නිවස අසල කාණුව සුදුසු බවටත්, එම කර්මාන්තය සහා අරමුදලින් ඉටු කිරිම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රි ඒ.ඩබ්.ජගත් කුමාර මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සහා සම්මත විය.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා</u>

**05.01.06** **අම්බලන්ගොඩ එඬේරමුල්ල වටරවුම් පාර සපත්තු කාණුව සහා අරමුදලින් සිදු කිරිම සුදුසු බවට යෝජනා කර සිටිනවා.**

**තිරණය :-**

අම්බලන්ගොඩ එඬේරමුල්ල වටරවුම් පාර සපත්තු කාණුව ඉදිකිරිමේ කර්මාන්තය ඉදිකිරිම සුදුසු බවටත්, එම කර්මාන්තය සහා අරමුදලින් ඉටු කිරිම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රි ඒ.ඩබ්.ජගත් කුමාර මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සහා සම්මත විය.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා</u>

**05.01.07** **අම්බලන්ගොඩ එඬේරමුල්ල වටරවුම් පාර සපත්තු කාණුව සහා අරමුදලින් සිදු කිරිම සුදුසු බවට යෝජනා කර සිටිනවා.**

**තිරණය :-**

අම්බලන්ගොඩ එඬේරමුල්ල වටරවුම් පාර සපත්තු කාණුව ඉදිකිරිමේ කර්මාන්තය ඉදිකිරිම සුදුසු බවටත්, එම කර්මාන්තය සහා අරමුදලින් ඉටු කිරිම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රි ඒ.ඩබ්.ජගත් කුමාර මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සහා සම්මත විය.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා</u>

**05.01.08** **අම්බලන්ගොඩ , මහ අම්බලන්ගොඩ අතුරු මාර්ගය ( ජල සම්බන්ධය ලබා ගැනීමට කැනීම් කළ පාර ) ඉදිකිරිමේ කර්මාන්තය සහා අරමුදලින් සිදු කිරිම සුදුසු බවට යෝජනා කර සිටිනවා.**

**තිරණය :-**

අම්බලන්ගොඩ , මහ අම්බලන්ගොඩ අතුරු මාර්ගය ( ජල සම්බන්ධය ලබා ගැනීමට කැනීම් කළ පාර ) ඉදිකිරිමේ කර්මාන්තය ඉදිකිරිම සුදුසු බවටත්, එම කර්මාන්තය සහා අරමුදලින් ඉටු කිරිම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනි ඒ.පී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සහා සම්මත විය.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා</u>

**05.01.09** **සුදුවැල්ල දෙවන අතුරු මාර්ගය කොන්ක්‍රිට් කිරිමේ කර්මාන්තය සහා අරමුදලින් සිදු කිරිම සුදුසු බවට යෝජනා කර සිටිනවා.**

**තිරණය :-**

සුදුවැල්ල දෙවන අතුරු මාර්ගය කොන්ක්‍රිට් කිරිමේ කර්මාන්තය  කර්මාන්තය ඉදිකිරිම සුදුසු බවටත්, එම කර්මාන්තය සහා අරමුදලින් ඉටු කිරිම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින්  ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සහා සම්මත විය.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා</u>**

**05.01.10** **සුදුවැල්ල පෙර පාසලේ  සිවිලිම සහා අරමුදලින් සිදු කිරිම සුදුසු බවට යෝජනා කර සිටිනවා.**

**තිරණය :-**

සුදුවැල්ල පෙර පාසලේ  සිවිලිම ඉදිකිරිම සුදුසු බවටත්, එම කර්මාන්තය සහා අරමුදලින් ඉටු කිරිම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින්  ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සහා සම්මත විය.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා</u>**

**05.01.11** **අම්බලන්ගොඩ එල්. සී. ද සිල්වා මාවතේ කාණුවේ කොටසක්  සහා අරමුදලින් සිදු කිරිම සුදුසු බවට යෝජනා කර සිටිනවා.**

**තිරණය :-**

අම්බලන්ගොඩ එල්. සී. ද සිල්වා මාවතේ කාණුවේ කොටසක්  ඉදිකිරිම සුදුසු බවටත්, එම කර්මාන්තය සහා අරමුදලින් ඉටු කිරිම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින්  ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සහා සම්මත විය.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා</u>**

**05.01.12** **අම්බලන්ගොඩ පින්නදූව 4 වන හරස් පාර තාර දැම්ම  සහා අරමුදලින් සිදු කිරිම සුදුසු බවට යෝජනා කර සිටිනවා.**

**තිරණය :-**

අම්බලන්ගොඩ පින්නදූව 4 වන හරස් පාර තාර දැම්ම සුදුසු බවටත්, එම කර්මාන්තය සහා අරමුදලින් ඉටු කිරිම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රි ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින්  ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සහා සම්මත විය.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා</u>**

05.01.13 අම්බලන්ගොඩ කෙරමිණිය දූව වත්ත පාර තාර දැම්ම  සහා අරමුදලින් සිදු කිරිම සුදුසු බවට යෝජනා කර සිටිනවා.

**තිරණය :-**

අම්බලන්ගොඩ කෙරමිණිය දූව වත්ත පාර තාර දැම්ම සුදුසු බවටත්, එම කර්මාන්තය සහා අරමුදලින් ඉටු කිරිම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රි ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින්  ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සහා සම්මත විය.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා</u>**

05.01.14 අම්බලන්ගොඩ මානාන ක්‍රිඩාංගණයට පස් දැම්මේ කර්මාන්තය  සහා අරමුදලින් සිදු කිරිම සුදුසු බවට යෝජනා කර සිටිනවා.

**තිරණය :-**

අම්බලන්ගොඩ මානාන ක්‍රීඩාංගණයට පස් දැමීමේ කර්මාන්තය සිදු කිරිම සුදුසු බවටත්, එම කර්මාන්තය සහා අරමුදලින් ඉටු කිරිම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ් ජගත් කුමාර මහතා විසින් ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා</u>

05.01.15 අම්බලන්ගොඩ, පොල්වත්ත ආදාහනාගාරය අළුත්වැඩියා කිරීමේ කර්මාන්තය සහා අරමුදලින් සිදු කිරිම සුදුසු බවට යෝජනා කර සිටිනවා.

**තිරණය :-**

අම්බලන්ගොඩ, පොල්වත්ත ආදාහනාගාරය අළුත්වැඩියා කිරීමේ කර්මාන්තය සිදු කිරිම සුදුසු බවටත්, එම කර්මාන්තය සහා අරමුදලින් ඉටු කිරිම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා</u>

**05.01.16 මහජන ක්‍රීඩාංගණයේ කාණුව ඉදිකිරිමේ කර්මාන්තය සහා අරමුදලින් සිදු කිරිම සුදුසු බවට යෝජනා කර සිටිනවා.**

**තිරණය :-**

මහජන ක්‍රීඩාංගණයේ කාණුව ඉදිකිරිමේ කර්මාන්තය සිදු කිරිම සුදුසු බවටත්, එම කර්මාන්තය සහා අරමුදලින් ඉටු කිරිම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා</u>

**05.01.17 අම්බලන්ගොඩ උස්වැල්ල පාර කොන්ක්‍රිට් කිරිමේ කර්මාන්තය සහා අරමුදලින් සිදු කිරිම සුදුසු බවට යෝජනා කර සිටිනවා.**

**තිරණය :-**

අම්බලන්ගොඩ උස්වැල්ල පාර කොන්ක්‍රිට් කිරිමේ කර්මාන්තය සිදු කිරිම සුදුසු බවටත්, එම කර්මාන්තය සහා අරමුදලින් ඉටු කිරිම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා</u>

**05.01.18 අම්බලන්ගොඩ උස්වැල්ල පාර කොන්ක්‍රිට් කැපිමේ කර්මාන්තය සහා අරමුදලින් සිදු කිරිම සුදුසු බවට යෝජනා කර සිටිනවා.**

**තිරණය :-**

අම්බලන්ගොඩ උස්වැල්ල පාර කොන්ක්‍රිට් කැපිමේ කර්මාන්තය සිදු කිරිම සුදුසු බවටත්, එම කර්මාන්තය සහා අරමුදලින් ඉටු කිරිම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

**05.01.19** **අම්බලන්ගොඩ පී.එච්.ආර්. සුමනදාස මාවත අතුරු පාර කොන්ක්‍රිට් කාණුව ඉදිකිරීමේ කර්මාන්තය සහා අරමුදලින් සිදු කිරිම සුදුසු බවට යෝජනා කර සිටිනවා.**

**තිරණය :-**

අම්බලන්ගොඩ පී.එච්.ආර්. සුමනදාස මාවත අතුරු පාර කොන්ක්‍රිට් කාණුව ඉදිකිරීමේ කර්මාන්තය සිදු කිරිම සුදුසු බවටත්, එම කර්මාන්තය සහා අරමුදලින් ඉටු කිරිම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සහා සම්මත විය.

ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

**05.01.20** **අම්බලන්ගොඩ බස්නැවතුම්පොළ ඉහළ කොටසේ සින්ක් එකක් සවි කිරිම සහා අරමුදලින් සිදු කිරිම සුදුසු බවට යෝජනා කර සිටිනවා.**

**තිරණය :-**

අම්බලන්ගොඩ බස්නැවතුම්පොළ ඉහළ කොටසේ සින්ක් එකක් සවි කිරිම සුදුසු බවටත්, එම කර්මාන්තය සහා අරමුදලින් ඉටු කිරිම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සහා සම්මත විය.

ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද සංවර්ධන යෝජනා

**05.01.21** **අම්බලන්ගොඩ නගර සභාවේ නගර සභා ක්‍රීඩාංගනයේ විසිරි ජල පද්ධතිය ස්ථානගත කිරීමට හා ක්‍රීඩාංගනයේ වැඩි දියුණු කිරිම් සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ දඩු මුදල් වෙනුවෙන් නගර සභාව පවත්වාගෙන යන ජාතික ඉතිරි කිරිමේ බැංකුවේ ගිණුම් අංක 10033-02-4462 යටතේ පවතින රු.3700000/= ක මුදලක් යොදා ගැනිම සඳහා යෝජනා කර සිටිනවා.**

ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්

අම්බලන්ගොඩ නගර සභාවේ නගර සභා ක්‍රීඩාංගනයේ විසිරි ජල පද්ධතිය ස්ථානගත කිරීමට හා ක්‍රීඩාංගනයේ වැඩි දියුණු කිරිම් සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ දඩු මුදල් වෙනුවෙන් නගර සභාව පවත්වාගෙන යන ජාතික ඉතිරි කිරිමේ බැංකුවේ ගිණුම් අංක 10033-02-4462 යටතේ පවතින රු.3700000/= ක මුදලක් යොදා ගැනිම ට තමයි මෙය ඉදිරිපත් කර ඇත්තේ. මෙම යෝජනාව ස්ථිර කරන්න.

ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්

එම යෝජනාව ස්ථිර කරනවා.

ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්

මෙම ගිණුමේ තිබෙන්නේ අනවසර ඉදිකිරිම් සඳහා නගර සභාව විසින් මහජනතාවට අයකරනු ලැබු දඩ මුදල් . එම මුදල් අද වන විට රු.3700000/= ක මුදලක් තිබෙනවා. දැනට නගරික සංවර්ධන අධිකාරිය මඟින් එකඟ වි තිබෙනවා එම මුදල් විසිරි ජල පද්ධතිය සැදිමට යොදා ගන්නා ලෙස. ඒ එකඟතාවය සහා අනුමතියකින් ඉදිරිපත් කරන ලෙස ප්‍රකාශ කර සිටියා. ඒ සඳහා මෙය ඉදිරිපත් කර ඇත.

ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්

මෙය හොඳයි. මෙම මුදල් ගෙවිවාද? මෙය ඉක්මනට සැදිය යුතුයි. සැදුවේ නැහැනේ. දැන් පරක්කුයිනේ ගොඩක්.

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

දැනට මෙහෙම ප්‍රශ්නයක් සිදු වී තිබෙනවා. මෙම බට පද්ධතිය යෙදූවට පස්සේ අපගේ පළාත් පාලන දිස්ත්‍රික් ඉංජිනේරු මහතා පැමිණ මෙය බලා තිබෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමා , මෙය කාලයක සිට වසා දමා දැන් සැදිමට පටන් ගෙන මාස ගණනක් වෙනවා. මෙය ඉක්මනින් නිම කරන්න. දැන් වසර ගණනාවක් ක්‍රිකට් තරඟ පැවැත්විමට නොහැකි වුණා. දැනටත් ඔවුන් බට පද්ධතිය එලන එක ප්‍රමාදයි. අපි ඉල්ලා සිටිනවා නගර සභාවෙන් හරි මේ ටික කර ඉක්මනින් නිම කර දෙන්න. ඉංජිනේරුතුමාගේ ඒ වැනි ප්‍රශ්න නිසා මෙය පරක්කු වෙන්න පුළුවන්.ඉංජිනේරුතුමාගෙන් මොනවා හරි කෙරෙන්න ඕන දෙයක් තිබෙන වා නම් කියන්න.

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

ගරු මන්ත්‍රිතුමා, ඉංජිනේරුතුමාගේ අධික්ෂණයෙන් පසු තමයි මෙහි ගෙවිම සිදු කරනු ලබන්නේ. එය පැහැදිලි කර ගත යුතුයි සමාගම විසින්. රු.3700000/= ක මුදලක් අපගේ කාර්මික නිලධාරි මහතාට අත්සන් කළ නොහැක.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

ඔබට අත්සන් කරන්න පුළුවන් නේද , අත්සන් කළ හැකි සීමාවක් තිබෙනවා නේද? මේ සඳහා බොහෝ පිරිස් දෝෂාරෝපණය කරනවා. මෙහි පයිප්ප අතුරා බලාගෙන සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මෙම සමාගමට මෙය භාර දී කොපමණ කලක් වෙනවාද? මෙම කාරණය නිම කිරිමට දින කියක් ගත වෙනවාද? සම්පූර්ණ ව්‍යාපෘතිය නිම කරන්න කොපමණ කාලයක් ගතවෙනවාද කියා නෙමේ මා විමසන්නේ. බට දමා වැලි දමා ඔය කාර්ය නිම කිරිමට කොපමණ කාලයක් ගත වෙනවාද? නැතිනම් ලබන මාසයෙත් මෙකමනේද කතා කරන්නේ. මෙය විශාල සමාගමක්නේ. සමාන්‍යය සමාගමක් නෙමේනේ. මා විමසා සිටින්නේ වැලි දමා ප්‍රේෂර් ටෙස්ට් එක කිරිමට කොපමණ කාලයක් ගතවේද? නැතිනම් කැන්සල් කරන්න මෙම ටෙන්ඩරය. සතිය ද දෙකද ඒ කාලය ඇතුලත නිම විය යුතුයි.

**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**

මෙම කාර්ය නිම කිරිම සඳහා ගත වන්නේ දින තුනක් වැනි කාලයකි. මෙය කාණුව ඇර ප්‍රේෂර් ටෙස්ට් කරන්නේ නැහැ. වැලි දමා වසා ප්‍රේෂර් ටෙස්ට් කිරිමට පුළුවන. එහි කිසිම ගැටළුවක් නැහැ.

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

දිස්ත්‍රික් ඉංජිනේරුතුමාත් , අදාල සමාගමත් ගෙන්වා සකච්ඡාවක් පවත්වා යම් එකඟතාවයකට පැමිණෙන්නම්.නැතිනම් මෙය කරන්න බැහැ. අන්තිමට කොපමණ හොඳට කරත් අපිට තමයි දෝෂාරෝපණය එන්නේ. මෙහි දිස්ත්‍රික් ඉංජිනේරුතුමා සහතිකය ලබා දෙන්නේ නැතිනම් අපිට මේ සඳහා මුදල් ගෙවිය නොහැකිය.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

දිස්ත්‍රික් ඉංජිනේරුතුමා දකින්නේ නැතිව ඇති. මෙහි යටටම ඇත්තේ වැලි. වැලි නැතිව පලමුව පස් ටික වැටෙන්න ඇති. මෙහි තනිකරම වැලි පමණයි ඇත්තේ.ඉංජිනේරු මහතා සහ සමාගම සමඟ තිබෙන ප්‍රශ්නයට මෙම කර්මාන්තය නැවතිය නොහැක. සමාගමත් දැන ගත යුතුයි ඉංජිනේරු මහතාගේ අනුමතිය නැතිව මෙය ගෙවීමට නොහැකි බව. මෙතැන වැලි මදියි කියනවා නම් අපි වැලි ගෙනල්ලා හරි මෙම කාර්ය කරන්න. ජනතාව දොස් කියනවා. අනෙක් කාරණය ලංකාවේ හොඳම සමාගමට මෙය ලබා දී තිබෙන්නේ. ජිනසේන සමාගමට. මෙය සමාගමටත් හොඳ නැහැ මාධ්‍ය ගියාම . මෙය ඉතා ඉක්මනින්ම කර දෙන්න.

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

මේ සඳහා සමාගමත් , දිස්ත්‍රික් ඉංජිනේරු මහතාත් ගෙන්වා යම්කිසි එකඟතාවයකට එන්නම්.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

බට ඔක්කොම දමා නේද තියෙන්නේ.

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

බට ඔක්කොම දමා තියෙන්නේ.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතාට කියා මේ ප්‍රේෂර් යන්ත්‍රය ලබා ගත හැකියි. සමාගම මෙය ගෙන එන්නේ නැතිනම්. මෙය වැසුවාත් ටෙස්ට් කරන්න ප්‍රශ්නයක් නැහැ. ගරු නගර සභා මන්ත්‍රී ධම්මික මහතා අපට එම වැඩය කර දෙන්න. මෙය සකච්ජා කර ඉක්මනින් නිම කර දෙන්නම්.

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

හොඳයි අපි සකච්ජා කර ඉක්මණින්ම තිරණය කරන්නම්.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, ඉතාම හොඳයි එතුමා ඉදිරිපත් විම . නමුත් වගකිම කොහේද ? නිත්‍යානුකුල තත්වයක් තිබෙනවාද ? සමාගම විසින් ඕන අපට මෙය සිදු කර වාර්තාව ලබා දෙන්න .

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි , මෙය එම සමාගමට ලිඛිතව දන්වා යැවිමට බැරිද ? මේ පිළිබඳව මේ සභාවේ මෙහෙම කතා කළා . මේ සඳහා මුදල් ගෙවා තිබෙනවා. මෙම වගකිමෙන් මේ පිළිබඳව ලිඛිතව අපට ලබා දෙන්න. දැන් අපිනේ මෙම ප්‍රශ්නයට මැදි වෙන්නේ. අපිට තමයි ජනතාව බනින්නේ. ලිඛිතව දෙන්න කියන්න.

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

දැනට දිස්ත්‍රික් ඉංජිනේරුතුමා විසින් ලබා දි ඇති උපදෙස් ලිඛිතව අපි දන්වා ඇත. එසේම කර්මාන්ත්‍රය සඳහා 20% ක ප්‍රමාණයක් අපි සමාගම වෙත ගෙවා තිබෙනවා. සමාගම විසින් තම රාජකාරිය හරියට කළ යුතුයි. අපිට කිසි ගැටළුවක් නැහැ. මා පැහැදිලි ව ප්‍රකාශ කර සිටියා සමාගම විසින් මෙය සිදු කරන්නේ නැතිනම් ගිවිසුම අවලංගු කරන බවට. මේ සඳහා සිල්ලර වශයෙන් කිරිමට යම් යම් පුද්ගලයන් ඉදිරිපත් වුණා. අඩුවට කරන්නත් තිබුණා. නමුත් මේ සමාගමේ තිබෙන වගකිම සමාගම කෙරෙහි තිබුණ විශ්වාසය පිළිබඳව සැහිමකට පත් වී තමයි මේ සභාව එය මේ අයට ලබා දුන්නේ.

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාවේ නගර සභා ක්‍රීඩාංගනයේ විසිරි ජල පද්ධතිය ස්ථානගත කිරීමට හා ක්‍රීඩාංගනයේ වැඩි දියුණු කිරිම් සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ දඩු මුදල් වෙනුවෙන් නගර සභාව පවත්වාගෙන යන ජාතික ඉතිරි කිරිමේ බැංකුවේ ගිණුම් අංක 10033-02-4462 යටතේ පවතින රු.3700000/= ක මුදලක් යොදා ගැනිම සඳහා සුදුසු බවට ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

**05.02 ගරු මන්ත්‍රිවරු 4කු විසින් අත්සන් කරන ලද ගරු නගර සභා මන්ත්‍රි ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව**

**ගරු නගර සභා මන්ත්‍රි ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්**

හිරු නාලිකාව ඔස්සේ විකාශනය කරන ලද සුපර්ස්ටාර් තරඟාවලියේ ජයග්‍රහණය හිමිකරගත්තේ අම්බලන්ගොඩ මැතිවරණ බල ප්‍රදේශයේ බටපොළ කහටපිටිය ග්‍රාමයේ මංගල ඩේනිස් නම් වූ තරුණ ගායන ශිල්පියායි.සුවිශාල පොදුජන හරසර ලැබූ ඔහුට මේ සභාවේද සුහපැතුම් එක් කළ යුතු බවට යෝජනා කර සිටිනවා. ගරු සභාපතිතුමනි , ගීතයකට අපගේ හද සුවපත් කළ හැකියි. රෝගී වුවත් නීරෝගී කළ හැකියි.ඒ මහා හාස්කමක් මේ කළා නිර්මාණයට තිබෙනවා. මේ තත්වය යටතේ ඉතා විශාල පිරිසක් මේ තරඟාවලියේ නියලෙන අයුරු අප දුටුවා.අවසානයේ අප බල ප්‍රදේශයේ මෙම තරුණයා විජයග්‍රහණයට පත් වුණා. මේ අවස්ථාවේ එදා අපේ දෙවැනි පරාක්‍රමබාහු රජුගේ අමාත්‍යවරයා වශයෙන් හිටපු දේවපතිරාජ අමාත්‍යවරයාගේ හටයෝ රදවපු ගම බටේපොල හයටයින්ගේ පොළ අද බටපොළ වශයෙන් වහරට ගැනෙන මෙම ගමේ අහිංසක පවුලකින් මතු වූ මෙම තරුණයා අපි කවුරුත් විශ්මයට පත් කරමින් ඒ ජයග්‍රහණය උදා කර ගත් මේ මොහොතේ අපේ ආසනයේන් නැගුණු ඔහු වෙනුවෙන් එදා කොළඹ සිට අපේ කලා පුරවරය හරහායි ගමන් කළේ. ඔහු මහජන හරසර මධ්‍යයේ තමන්ගේ ගම් පියසට ගියා. මේ අවස්ථාවේ අපේ ගරු සභාවේ ඔහුට අපේ උත්තමාචාරය ප්‍රණාමය පුද කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රි ඊ. ඉන්දා අයිරාංගනී මහතා කතා කරමින්**

මෙම වැඩසටහනට නෙළුම් පොකුණ රඟහලට මාත් එදා ගියා. අම්බලන්ගොඩ බටපොළ කිව්වාම මාත් එතැනට සහභාගි වුණා. ඇත්තටම පුදුම ආඩම්බරයක් ඇති වුණා අපිට. එතුමා එතැන තරඟ වැදිලා අම්බලන්ගොඩ එම කුසාලානය ලැබුණා කිව්වාම. එතැන තිබුණ තරඟය දිහා බැලුවාම විශේෂයෙන්ම අපි ආඩම්බර විය යුතුයි. ගරු නගර සභා මන්ත්‍රිවරුන් වශයෙන් එතුමා ලබා ගත් එම කුසලානය පිළිබඳව අපිට ආඩම්බරයක් ඇති වෙනවා.මා ආදරණීය අම්මා කෙනෙකු වශයෙන් එම පුතණුවන්ට දීර්ඝායුෂ ප්‍රාර්ථනා කරනවා ඉදිරි අනාගතය සාර්ථක වේවා කියා. එතුමාට තවත් හැකියාව ලැබේවා අම්බලන්ගොඩට කීර්තියක් ලබා දීමට.

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

එම සුභාෂිංශන කටයුතු යොමු කර ඒ මහතා හට යවන්න.

**(06) කාරක සභා වාර්තා සලකා බැලීම**

**6.01 2019.02.08 දින පැවති මුල්‍ය කමිටු වාර්තාව සභා ගත කරන ලදි**

**මූල්‍යකමිටුව**

**2019-02-08 දින ප.ව.2.30**

සහභාගීත්වය

| | | |
|---|---|---|
| 1. | ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා | ගරු සභාපති, අම්බලන්ගොඩ නගර සභාව |
| 2. | ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා | ගරු නගර මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව |
| 3. | ඇම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා | ගරු නගර මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව |
| 4. | එම්.අතුල ප්‍රියන්ත මහතා | ගරු නගර මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව |
| 5. | ඩබ්.ඒ .සෝභිත රංජිත් මහතා | ගරු නගර මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව |
| 6. | බී.ඒ.ධම්මිකා මිය | ලේකම්, අම්බලන්ගොඩ නගර සභාව |

පිළිගැනීම

ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා මුල්‍යා කමිටුව සඳහා පැමිණි ගරු නගර සභා මන්ත්‍රීවරුන් , නගර සභා ලේකම්, ඇතුලු සියලු නිලධාරී මහත්ම මහත්මීන් ඉතාමත් ගෞරවයෙන් පිළිගන්නා ලදී.

අනතුරුව එදිනට කමිටුව සඳහා ඉදිරිපත් කරන ලද පහත විස්තර ඇතුලත් ගෙවීම් වවුචර් පත් සඳහා කමිටු සාමාජිකයින් විසින් අනුමැතිය ලබා දෙන ලදී.

| **ගෙවීම් ලබන්නාගේ නම** | **මිලදීගෙන ඇති භාණ්ඩ පිලිබඳ** | |
|---|---|---|
| | **විස්තර** | **මුදල රු.** |
| 01.එස්.එච්.එන්.ඒ.එස් ද සිල්වා (ඇ.අ. 2016 ) | කි.ග්‍රෑ. 37.5 ගෑස් සිලින්ඩර් 08 (6050*8) | 48400.00 |
| 02.මත්ලුබ් පුඩ් වෙයාර් (ඇ.අ. 1989/1990/ හා 2015) | නිල ඇඳුම් සඳහා අදාල සපත්තු හා මේස් ගැනීම සපත්තු 3399*6/මේස් 170*6 | 21414.00 |
| 03. බිටු මික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (ඇ.අ. 2021 ) | මාර්ග ප්‍රතිසංස්කරණය සඳහා අදාල තාර මිලදී ගැනීම (80/100 ප්‍රමාණය රු.16500*30) | 495000.00 |
| 04.කග්ගොඩ ආරච්චි මෝටර්ස් | සභාව සතු එල්එල් -7286 වතුර බවුසරය සේවාව හා අලුත්වැඩියාව | 35290.00 |
| 05.අ.න.ස. -ගි.අ.0351001126295234 බැර | ජාතික කියවීමේ මාසය සඳහා ලද අනුග්‍රහ මුදල් ඉතිරිවීම් ආදායමට ගැනීම | 32355.00 |
| 06. දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් | ජනවාරි 1-15 දක්වා වැට් මුදල් ගෙවීම | 207467.35 |
| 07.ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | 2018 දෙසැ .නගර සභා ආයතනයන්හි ජල බිල් | 22545.01 |
| 08. දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් | 2019 ජනවාරි 16-31 දක්වා වැට් ගෙවීම් | 45107.12 |
| 09.කළමනාකරු හජන බැංකුවඅම්බලන්ගොඩ. | සභා තීරණ අංක 12:14 (2019-02-05)අනුව සභා පොදු ගිණුමේ වැඩිපුර පවතින මුදල් ස්ථාවර තැන්පතු දැමීම | 16000000.00 |
| 10.සභාපති අ.න.ස ගි.අ. 035100106295- -876 බැර | නගර සභා ප්‍රතිපාදන යටතේ අනුමත කර්මාන්ත සඳහා ගෙවීමට ප්‍රාග්ධන ගිණුමට මුදල් මාරු කිරීම | 4000000.00 |
| 11. දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් | 2019 ජනවාරි එන්බීටී කොටසක් ගෙවීම | 35000.00 |
| 12.සී/ස ලංකා විදුලි පුද්ගලික සමාගම | 2018 ඔක්තෝබර් විදුලි බිල් | 113793.80 |
| 13. සී/ස ලංකා විදුලි පුද්ගලික සමාගම | 2018 නොවැම්බර් විදුලි බිල් | 96563.55 |
| 14. කග්ගොඩ ආරච්චි මෝටර්ස් | 49-9436 ට්‍රැක්ටරය අලුත්වැඩියාව | 21850.00 |

| | | | |
|---|---|---|---|
| 15.දීපාල් මෝටර්ස් | | 252-0730කැබ් රථයේ තිරිංගපද්ධතිය අලුත් වැඩියාව | 56280.00 |
| 16. කග්ගොඩ ආරච්චි මෝටර්ස් | | ආර්ජ් 8796 ට්‍රැක්ටරය අලුත්වැඩියාව | 16250.00 |

17. මේ යටතේ ඉදිරිපත් වූ වවුචරය එදින කමිටුවේ අනුමත වී නැත.

| | | | |
|---|---|---|---|
| 18.සමාරා ප්ලාස්ටික් | (ඇ.අ.1943) | 6*4 ප්‍රමානයේ සමරු තිළිණ 17(රු.600/- බැගින් ) | 10200.00 |
| 19.ලුමිනෙක්ස් බුක්ෂොප් | (ඇ.අ.2005) | ශාසනාරක්ෂ බලමණ්ඩල තරග සඳහා ලබා දිමට රු.700,500 හා 300 බැගින් වූ තිළිණපත් 41 ක් | 61500.00 |
| 20.සක්වා ප්‍රින්ටර්ස් | (ඇ.අ.1945) | ජාතික කියවීමේ මාසයේ සහතිකපත් (67.50*200), ලිපිගොනු කවර (73.75*200), ආරාධනා පත්‍ර (33.75*200) | 35000.00 |
| 21.පොල්වත්ත ප්‍රජා මුල සංවිධානය | | හිරේවත්ත විජේ මහතාගේ නිවස අසල කානුව ඉදි කිරීමේ කර්මාන්තයේ 10% රැඳවුම නිදහස් කිරීම | 106196.83 |

පැමිණි සැමට ස්තුති කරමින් ප.ව.3.15 ට පමණ කමිටුවේ කටයුතු නිම කරන ලදී.

| | | |
|---|---|---|
| ...................................... | ............................................. | ................................................ |
| සකස් කලේ | ලේකම්, | ගරු සභාපති, |
| | බී.ඒ. ධම්මිකා , | ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් |
| | නගර සභාව , අම්බලන්ගොඩ | නගර සභාව , අම්බලන්ගොඩ |

**තීරණය -**

2019.02.08 දින පැවැති මුල්‍ය කමිටු වාර්තාව සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**06.02 2019.02.18 දින පැවති පරිසර , සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව සභා ගත කරන ලදී**

**<u>පරිසර , සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටුව</u>**

**2019.02.18 ප.ව.2.30**

**<u>සහභාගීත්වය</u>**

1. ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප්. ගරු සභාපති, අම්බලන්ගොඩ නගර සභාව.
2. ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව.

3. ඒ.ඩබ් ජගත් කුමාර. ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව
4. ධනසේන මාදුවගේ ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව
5. ග්‍රේෂන් කෙරමිණියගේ ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව.
6. ජී.ජී රුවිනි පේෂලා ගරු නගර සභා මන්ත්‍රීනී, අම්බලන්ගොඩ නගර සභාව.
7. ඊ.එම්.ඉන්ද්‍රා අයිරාංගනී ගරු නගර සභා මන්ත්‍රීනී, අම්බලන්ගොඩ නගර සභාව
8. එම්.චම්පා සුමුදු කුමාරි ගරු නගර සභා මන්ත්‍රීනී, අම්බලන්ගොඩ නගර සභාව
9. එච්.පී.මිහිරි ද සිල්වා ප්‍රධාන කළ.සහකාර,අම්බලන්ගොඩ නගර සභාව.
10. පී.එච්.ඒ.කේ.ද සිල්වා පර්යන්ත පරිපාලක,වරාය,අම්බලන්ගොඩ.
11. පී.එම්. විජයසිංහ තාක්ෂණ සේවා නිලධාරී, අම්බලන්ගොඩ.
12. ඒ.කේ.පාලිත සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය, අම්බලන්ගොඩ
13. වෛද බී.ජී.එල්.ජීවනී . පශු වෛද්‍ය නිලධාරී, අම්බලන්ගොඩ.
14. එම්.පී.බී.ඩබ්.යු.කුමාරි ආයුර්වේද වෛද්‍ය නිලධාරී,අම්බලන්ගොඩ.
15. එච්.බී.පී.නදීල් හංසික මහජන සෞඛ්‍ය පරීක්ෂක ,අම්බලන්ගොඩ උතුර.
16. ඩී.එස්.ඊ ගමගේ. පවුල් සෞඛ්‍ය සේවිකා, සෞ.වෛ.නි කාර්යාලය.
17. පී.එච්.කුමාර ද සිල්වා ග්‍රාම නිලධාරී,86,පොල්වත්ත,අම්බලන්ගොඩ.
18. ආර්.එම්.ඩබ් බන්දුල. උප පොලිස් පරික්ෂක, පොලිස් ස්ථානය,අම්බලන්ගොඩ.
19. එච්.එම්.ටී.එච්.ද සිල්වා. ග්‍රාම නිලධාරී,86ඊ,ඕකන්ද,අම්බලන්ගොඩ.
20. ටී.ඒ.සී.කුමාරි ග්‍රාම නිලධාරී,83ඒහෙප්පුමුල්ල,අම්බලන්ගොඩ.
21. සුජීව එගොඩගේ ග්‍රාම නිලධාරී, 84 ඒ,පනියන්දුව,අම්බලන්ගොඩ.
22. විමා ආර්.ගාල්ලගේ ග්‍රාම නිලධාරී,83,කරිත්ත කන්ද,අම්බලන්ගොඩ.
23. පී.එච්.එල්.සී පුෂ්පරාණි සංවර්ධන සහකාර.අම්බලන්ගොඩ නගර සභාව
24. ඊ.අජන්තා සිරිමලී කළමණාකරන සහකාර.අම්බලන්ගොඩ නගර සභාව
25. ඒ.අයි සාරංග සෞඛ්‍ය පරිපාලක.අම්බලන්ගොඩ නගර සභාව

පිළිගැනීම

ගරු සභාපති ඇම්.ඩබ් අරුණ ප්‍රදීප් මහතා සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටුව සඳහා පැමිණි ගරු නගර සභා මන්ත්‍රීවරුන් ඇතුළු සියළු නිලධාරී මහත්ම මහත්මීන් හා නගර සභා ලේකම් ඇතුළු කාර්ය මණ්ඩලය ඉතාමත් ගෞරවයෙන් පිළිගනු ලබන බව පවසන ලදි.

| මාතෘකාව | ප්‍රකාශය කවුරුන් විසින් ද යන වග. | සාකච්ඡා වූ කරුණු. | තීරණය. |
|---|---|---|---|
| **2019.02.18 දින පැවති රැස්වීමේ සාකච්ඡා වූ කරුණු සමාලෝචනය.** | | | |
| නොදිරන කසළ අලවිය සම්බන්ධව<br>. | ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා | ආරම්භක සති 02 ඇතුලත කසළ අලවි කිරීමෙන් රු.7000/- පමණ මුදලක් උපයාගත් බව | කසල අලවිය පිළිබඳ වාර්තාවක් සභාවට ඉදිරිපත් කල යුතු බව |

| | | | |
|---|---|---|---|
| නොදිරන කසල එකතු කරන ලද ටැක්ටරයේ ස්ටිකරයක් ඇලවීම | ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා | නොදිරන කසල එකතු කරනු ලබන තැඹිලිපාට ආලේප කරන ලද ටැක්ටරයේ නොදිරන කසල යනුවෙන් ස්ටිරයක් යෙදිය යුතු බව | ස්ටිකරය ඇලවීම සම්බන්ධව සැපයුම් නිලධාරී දැනුවත් කිරීම |
| නව ටේලරයක් මිළදී ගත යුතු බව | සෞඛ්‍ය පරිපාලක ඒ.අයි.සාරංග මහතා | ටේලරයක අවශ්‍යතාවය තදින් දැනෙන බැවින් කඩිනමින් ටේලරයක් මිළදී ගැනීමට කටයුතු කළ යුතු බව | මේ සඳහා සභාව සතු ටේලරයක් අලුත්වැඩියා කර යොදා ගැනීමට කටයුතු කරන ලෙස තා.සේ.නි.දැනුවත් කිරීම |
| කසළ අංගනයේ දුගඳ හමන බව | ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා | කසළ අංගනයේමැස්සන් බෝවීම හා දුගඳ හමන බව හා එහි ඇති අප්‍රසන්න බව නැති කිරීම සඳහා වට්ටක්කා,පුහුල් වැනි ශාකයන් වගා කිරීමට කටයුතු කරන ලෙස | . |
| | ම.සෞ.ප.පී.බී.නදිල් හංසික මහතා | මැස්සන් සඳහා කෘමිනාශකයක් ඇති බවත් එය ගෙන්වා ගැනීමට කටයුතු කරන බවත් | මෙහි ඇති අප්‍රසන්න බව නැති කිරීම සඳහා වට්ටක්කා,පුහුල් වැනි ශාකයන් වගා කිරීමට කටයුතු කිරීම හා දුර්ගයන්ධය නැතිකිරීම සඳහා රසායනික ද්‍රව්‍ය යෙදීම |
| අදහස් හා යෝජනා | | . | . |
| කෙරමිණිය පින්නදූව ප්‍රදේශ වල කසල එකතු කිරීම නිසියාකාරව සිදු නොවන බව | කෙරමිණියගේ ශ්‍රේෂන් මන්ත්‍රීතුමා | මෙම  කසල එකතු කිරීම සඳහා ටැක්ටරය පැමිනෙන්නේ ඉඳහිට බැවින් ප්‍රදේශයේ ජනතාව මහත් අපහසුතාවයට පත්ව ඇති බව | මේ සම්බන්ධව සොයා බැලීම සඳහා ප්‍රධාන කළමණාකරන මහත්මිය වෙත පැවරීම |
| පෝරුක් ඇළ අපිරිසිදු වන බව | ග්‍රාම නිලධාරී එච්.එම්.ටී.එච්.ද සිල්වා මහතා | මේ සම්බන්ධව ස්ථානීය පරීක්ෂාවක් ම.සෞ.ප.මහතා විසින් කලද එවැනි දෙයක් දක්නට නොලැබුන බව | පසුගිය දිනකද එවැනි දෙයක් දක්නට ලැබුන බව පැවසීම නිසා නැවත ග්‍රාම නිලධාරී මහතා සමඟ පරීක්ෂා කිරීමට යාමට ම.සෞ.ප.මහතා කටයුතු කරන බව |
| පිස්සුබල්ලන් සඳහා බෙහෙත් විදිය යුතු බව | ගරු නගර සභා මන්ත්‍රිනි ඊ.අයිරාංගනී මන්ත්‍රීතුමිය | පිස්සුබල්ලන් සඳහා එන්නත් විඳ ඇතත් සෑම ප්‍රදේශයක්ම ආවරණය වී නොමැති බව | |
| | සෞඛ්‍ය වෛද්‍ය | බොහෝ ප්‍රදේශ වල සැත්කම් හා එන්නත් | ආවරනය නොවූ |

| | | | |
|---|---|---|---|
| | නිලධාරීවෛද්‍ය හිමාලි විජයසිංහ | කර ඇති බවත් තවත් අවශ්‍ය ස්ථාන ඇත්නම් දැනුම් දෙන ලෙසත් දෙසැම්බර් මාසයේ නැවත එය සිදු කරන බවත් | ප්‍රදේශ සඳහා එන්නත් කිරීමේ මධ්‍යස්ථාන පිළිබඳ විස්තර නගර සභාව මගින් ලබා දීම |
| බොහෝ මාර්ග වල කාණුවල ඇති ස්ලැබ්ස් කැඩී ඇති බව | ගරු නගර සභා මන්ත්‍රී, ග්‍රේෂන් කෙරමිණිය ගේ මහතා. | මේබල් ද වාස් පුස්තකාලය අසළ,පුංචිපොළ අසල හා බොහෝ මාර්ගවල කාණු වල ස්ලැබ්ස් කැඩී ඇති අතර අනතුරුදායත තත්වයක පවතින බැවින් හැකි ඉක්මණින් සැකසිය යුතු බවත් මාර්ග සංවර්ධන අධිකාරියෙන් ස්ලැබ්ස් ලබා ගත හැකි බවත් | ස්ලැබ්ස් අප විසින් සකසා ගැනීම වඩා හොඳ බැවින් කඩිනමින් සකස් කරන ලෙසට තා.සේ.නි.ට දැනුම් දීම |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය අසළ කාණුවට කුණු දමන බව | මන්ත්‍රී, ග්‍රේෂන් කෙරමිණිය ගේ මහතා. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය අසළ කාණුවට කුණු දැමීම නිසා දැඩි දුර්ගන්ධයක් හමන බව | මේ සම්බන්ධව පරීක්ෂා කිරීමට ම.සෞ.පරීක්ෂක මහතා දැනුවත් කිරීම |
| පින්නදූව ඇළ මාර්ගයට අප ජලය හැරවීම | මන්ත්‍රී, ග්‍රේෂන් කෙරමිණිය ගේ මහතා. | පින්නදූව ප්‍රෙද්ශයේ නිවාස කිහිපයකටම අප ජලය බැස්සවීම සඳහා ඉඩකඩ නොමැති බැවින් ඇලට හරවන ලෙස ඉල්ලීම | අප ජලය හා කුණු දැමීමට ගෙවත්තේම වලවල් කපා ගන්නේ නම් සභාවෙන් මුදල් ලබා දිය හැකි බැවින් ඒ සඳහා උනන්දු කරන ලෙස සභාපතිතුමා විසින් පැවසීම |
| ඕකන්ද ප්‍රෙද්ශයේ ජල ගැටළුව | ගරු නගර සභා මන්ත්‍රීනි ඊ.අයිරාංගනී මහත්මිය | මෙහි නිවාස 20 කට පමණ පානීය ජල ප්‍රශ්නය පැන නැගී ඇති බැවින් ජල සම්පාදන මණ්ඩලය සමඟ සාකච්ජාකොට විසඳුමක් ලබාදෙන ලෙස | නගර සභාවේ ජල බවුසරය මගින් ජලය ලබාදිය හැකි බැවින් ඒ පිළිබඳව තීරණයක් ගන්නා ලෙස |
| පටබැඳිමුල්ල කාණුවේ ජලය බැස නොයන බව | . ගරු නගර සභා මන්ත්‍රීනි රුවිනි පේෂලා මහත්මිය | පටබැඳිමුල්ල ආදාහනාගාරය ඉදිරිපිට නගර සභා නිවාස අසළ ඇති කාණුවේ ජලය බැස නොයාම නිසා දුගඳ හමන බව | මේ සම්බන්ධව සොයා බැලීමට තා.සේ.නි. වෙත දැනුම් දීම |
| සුවන රෝහල ඉදිරිපිට කාණුව පිළිසනකර කල යුතු බව | ගරු නගර සභා මන්ත්‍රී රුවිනි පේෂලා මහත්මිය | සුවන රෝහල ඉදිරිපිට කාණුව වතුරව බැස නොයන බැවින් මදුරුපණුවන් බෝවී ඇති බැවින් එය පිළිසකර කර දෙන ලෙස | පරීක්ෂා කරන ලෙස තා.සේ.නි. වෙත දැනුම් දීම |
| බස් නැවතුම්පලේ ඇති කාණුවලට දමා ඇති දැල් දිරාපත්වී ඇති බව | මන්ත්‍රී, ග්‍රේෂන් කෙරමිණිය ගේ මහතා. | බස්නැවතුම්පලේ කාණුවලට දමා ඇති දැල් කැඩී ඇති බැවින් අනතුරු සිදුවිය හැකි බව | මේ සඳහා මාර්ග සංවර්ධන අධිකාරියෙන් මුදල් ලැබෙන බැවින් නොදිරන ආකාරයට දැල් ගැසීම සඳහා ඇස්තමේන්තු සකස් කරන ලෙස තා.සේ.නි.වෙත දැනුම් දීම |

| | | | |
|---|---|---|---|
| බස්නැවතුම්පල උඩ තට්ටුවේ දිරාපත්වී ඇති ආසන නිසා අනතුරු සිදුවන බව | ග්‍රාම නිලධාරී එච්.එම්.ටී.එච්.ද සිල්වා | බස්නැවතුම්පල උඩ තට්ටුවේ ආසන දිරාපත්වී කැඩී ඇති අතර එහි යකඩ බට වලට මගීන්ගේ කකුල් තුවාලවීම. | එම යකඩ කැබලි ඉවත් කරන ලෙස තා.සෙ.නි.වෙත දැනුම් දීම |
| බස් නැවතුම්පලේ උඩ තට්ටුවේ ඇති සින්ක් එක කැඩී ඇති බව | වැඩ පරීක්ෂක ඒ.අයි.සාරංග  මහතා | එහි ඇති සින්ක් එක කැඩී ඇති බැවින් එහි වැඩ කරන අය කසල බඳුනට අතසෝදන අතර  බඳුන දුගඳ හැමීම හා අපිරිසිදු වීම. | |
| | | වැසිකිළියේ සිදුවන ජල කාන්දුව හේතුවෙන් වැසිකිලිය සහ අතසෝදන බේසම වසා දැමීමට සිදු වූ බව | සින්ක් එක හා බාත්රූම් එක අලුත්වැඩියා කිරීමට ඇස්තමේන්තුවක් සකස් කරන ලෙස තා.සේ.නි.දැනුවත් කිරීම |
| ස්තුති කතාව | ගරු නගර සභා මන්ත්‍රී, ජී සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා. | නගරයේ ජනතාවගේ සෞඛ්‍ය හා සනීපාරක්ෂාව වෙනුවෙන් කමිටුවේදී ගන්නා වූ තීරණ ක්‍රියාත්මක කිරිම තුළින් ජනතාව බලාපොරොත්තුවන සේවය ඉටු කිරීමට ගතහැකි ක්‍රියා මාර්ග ගැනීමට නිලධාරීන් ගේ සහාය ලබාදිය යුතු බවට බලාපොරොත්තු වන අතර අද දින කමිටුවට සහභාගී වූ සියළුම මන්ත්‍රී තුමන්ලාට සහ සියළුම නිලධාරී මහත්ම මහත්මීන්ටත් ස්තුතිය පුද කරමි. | |
| නිමාව | | ප.ව 4.00 | |

සකස් කළේ,

කළමණාකරන සහකාර

නිර්දේශ කරමි,

අනුමත කරමි.

ලේකම්,

අම්බලන්ගොඩ නගර සභාව.

සභාපති,

අම්බලන්ගොඩ නගර සභාව.

**තීරණය -**

2019.02.18 දින පැවැති පරිසර , සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව පිළිගත යුතු බවට සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**06.03 2019.02.25දින පැවති ත්‍රීරෝද රථ කමිටු වාර්තාව සභා ගත කරන ලදී.**

<u>ත්‍රිරෝද රථ කමිටු රැස්වීම</u>

**<u>2019.02.25 දින පෙ.ව. 10.30</u>**

<u>සහභාගීත්වය</u>

| | |
|---|---|
| 01.කමල් වැල්ලගේ මයා | - ගරු උප සභාපති, අම්බලන්ගොඩ නගර සභාව |
| 02.ඩබ්.ඒ. සෝභිත රංජිත් මයා | - ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව |
| 03.දිනයාදුර ධර්මදාස මහතා | - ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව |
| 04.එම්.චම්පා සුමුදු කුමාරි මිය | - ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව |
| 05.එච්.පී.මිහිරි ද සිල්වා මිය | - ප්‍රධාන කළමනාකරණ සහකාර , අම්බලන්ගොඩ නගර සභාව |
| 06.එස්.යූ.එස්.ද සිල්වා මිය | - කළමනාකරණ සහකාර |
| 07.මයුමි ප්‍රබුද්ධිකා මෙනවිය | - තාක්ෂණ නිලධාරි |
| 08.ටී.වන්න මයා | - ආදායම් පරීක්ෂක |
| 09.ලකීෂා යසස්වි මිය | - ආදායම් පරීක්ෂක |

<u>කමල් වැල්ලගේ මයා ගරු උප සභාපති</u>

ත්‍රිරෝද රථ කමිටු රැස්වීම සඳහා සහභාගි වීමට පැමිණි ගරු නගර සභා මන්ත්‍රීතුමන් ඇතුළු නිලධාරීන් සියළු දෙනාම ඉතාමත් ගෞරයෙන් පිළි ගන්නා බව ප්‍රකාශ කරමින් ත්‍රිරෝද රථ කමිටුවේ කටයුතු ආරම්භ කරන ලද අතර අනතුරුව
2018.12.27 දින පැවති කමිටුවේදී ගත් තීරණ මේ වන විට ක්‍රියාත්මක කර ඇතිද යන්න පිළිබඳව විමසීමක් සිදු කරන ලදී.

<u>කමල් වැල්ලගේ මයා ගරු උප සභාපති</u>

එක් එක් නැවතුම් ස්ථාන වල නැවැත්වීමට තීරණය කරන ලද ත්‍රීරෝද රථ සංඛ්‍යාව පිළිබඳව අදාල ස්ථාන වල ප්‍රදර්ශණය කිරීම මේ වන විට සිදු කර ඇද්ද.

<u>වන්න මයා- ආදායම් පරීක්ෂක</u>

දැනට එම බෝඩ් සකස් කරමින් පවතින්නේ. අද දින අනුමැතිය ලබාදෙන ත්‍රීරෝද රථවල අංකත් දාලම පුවරු සවි කරන්නම්.

<u>කමල් වැල්ලගේ මයා ගරු උප සභාපති</u>

පාරෙ කොටු සලකුනු කරන්න.ඒක රෑකට කරන්න හිමාල් එක්ක එකතු වෙලා අපිත් එන්නම්.වැට ගැසීම බේරිල්ලට කල දෙයක් විදියට තමයි පෙනෙන්නෙ.ඒ වැට සම්පූර්ණ කරන්න.

<u>සෝභිත මයා - ගරු නගර සභා මන්ත්‍රී</u>

ඔව්.මමත් ඒ වෙලාවට එන්නම්.

කමල් වැල්ලගේ මයා ගරු උප සභාපති

පුංචි පොල පාරේ දැනට සම්පූර්ණයෙන්ම වන්වේ කරල තියෙන එක ගැටළු සහගතයි.ඒ නිසා එය සතියේ දිනවල උදේ 6.30 – 7.30 දක්වාත් සවස 1.00-2.00 දක්වාත් පමණක් සිදු කරමු. ඒ පිළිබඳව මූලස්ථාන පොලිස් පරීක්ෂක දැනුවත් කිරීමට කටයුතු කරන්න.

කමල් වැල්ලගේ මයා ගරු උප සභාපති

ඩබ්.ප්‍රේමලාල් යන අය විසින් බලපත්‍රය ලබාගෙන ඇති අතර නැවතුම් ස්ථානයක් ස්ථිරව ලබා දෙන මෙන් ඉල්ලීමක් කර තිබෙනවා.දැනට නැවතුම් ස්ථාන ලබාදීම සිදු නොකරන බැවින් ඉදිරියේදී මේ පිළිබඳව කටයුතු කරන බවට අදාල අයට ලිපියකින් දැනුම් දීම සිදු කරමු.

පොල්වත්ත වෙළඳ සංකීර්ණය ඉදිරිපිට ත්‍රීවිල් රථ ගාල් කිරීම සම්බන්ධයෙන් ගැටළුවක් ඇතිවී තිබෙනවා.දැනට සිටින අයට වඩා ත්‍රීවිල් ගාල් කිරීමට ඉඩ නොදෙන මෙන් එහි වෙළඳ ව්‍යාපාරික පිරිස ඉල්ලා සිටිනවා.

සෝභිත මයා - ගරු නගර සභා මන්ත්‍රී

අපි නැවතුම් ස්ථාන නම් කරල නැති නිසා ඒ බව ඔවුන්ට දැනුම් දෙමු.

කමල් වැල්ලගේ මයා ගරු උප සභාපති

අම්බලන්ගොඩ මූලස්ථාන පොලිස් පරීක්ෂක තුමා විසින් පොල්වත්ත රථ ගාලේ ඇතිවී තිබෙන ගැටළුවක් පිළිබඳව දන්වා තිබෙනවා.නගර සභාවට මුදල් ගෙවා ලදුපතක් ලබා තිබෙන අයකුට එම රථ ගාලේ ත්‍රීවිලය නවතා තැබීමට ඉඩ ලබා නොදීම ගැන.අපි වාහන නැවතුම් ස්ථාන ලබා දී නොමැති බැවින් පැමිණිළිකරුට අදාල සංගමයට බැඳී කටයුතු කරන මෙන් දැනුම් දෙමු.

ඩී.ධර්මදාස මයා - ගරු නගර සභා මන්ත්‍රී

අපි ස්ටිකරයක් දීල තිබෙන නිසා අපිට වගකීමක් තියෙනව නේද ස්ථානයක් ලබා දෙන්න.

සෝභිත මයා - ගරු නගර සභා මන්ත්‍රී

ගමේ කෙනාට දෙන්න ඒ අය දැනගන්න ඕනෙ.එයාට කියන්න බැහැනෙ මහ වීදියෙ නවත්වන්න කියල.

කමල් වැල්ලගේ මයා ගරු උප සභාපති

සංගමය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙ ලියාපදිංචි කර ඇත්නම් ඒකට බලපෑම් කරන්න අපට බැහැ.පොල්වත්තෙ ස්ටිකර් අරන් නැහැනෙ කවුරුවත්.වන්න මහත්තය බලන්න සියලු දෙනා අරන්ද කියල.

මහ වීදිය ත්‍රීරෝද රථ රියදුරු සංගමය මගින් එහි සියළු දෙනාට ස්ටිකර් ලබා දෙන ලෙස ඉල්ලීමක් කරල තියෙනව.මෙහි 19 ක් පමන ඉන්නව.ගොඩක් ඉන්නෙ නගරයෙන් පිට අය.04 දෙනෙකුට ගන්න පුළුවන්.ඒ 04 දෙනාට අදාල ලියකියවිලි ඉදිරිපත් කර බලපත්‍ර ලබා ගැනීමටත් ඉතිරි අයට කලින් බලපත්‍ර ලබා ගෙන ඇත්නම් ඉදිරිපත් කරන ලෙසත් දන්වන්න.

අම්බලන්ගොඩ සමූපකාර මන්දිරය අසල ත්‍රීරෝද රථ සංගමය මගින් ඉල්ලීමක් කර තිබෙනවා.අවසර නැති අය ත්‍රීරෝද රථ නවත්වා අවහිර කරන බවට

**ඩී.ධර්මදාස මයා - ගරු නගර සභා මන්ත්‍රී**

**මේ පිළිබඳව මට දැනුම් දුන්නා.මොහු හමුදාවේ වැඩ කල අයෙක්.මේ අය ගහගෙන පොලිස් පැමිනිල්ලක් දමා තියෙනවා.**

**වන්න මයා- ආදායම් පරීක්ෂක**

**අපි ඒව ඉවත්කලා.**

**කමල් වැල්ලගේ මයා ගරු උප සභාපති**

**මේ ස්ටිකර් ලබා දුන් පසු ගැටළු විසඳෙයිද.**

**වන්න මයා- ආදායම් පරීක්ෂක**

**එවිට අපට බෝඩ් වල ත්‍රිරෝද ප්‍රමාණය ඇතුලත් කරල ගහන්න පුළුවන්. වැඩි ඒව ඉවත් කරන්න පුළුවන්.**

**සෝභිත මයා - ගරු නගර සභා මන්ත්‍රී**

**අපි ඒ ප්‍රධාන කටයුතු සියල්ල ඉක්මනින් සිදු කරමු.**

**කමල් වැල්ලගේ මයා ගරු උප සභාපති**

**පුංචි පොළ පාර වන්වේ කල වෙලාවන් දාල බෝඩ් ගහන්න.වන්න මහත්තය පොලිසියට ලිපියක් දාන්න එය කලා කියල.**

**ගාල්ලගේ අසන්තගේ ඉල්ලීමට ලිපියක් දාන්න මෙම එකමුතු ත්‍රීරෝද රථ සංගමය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි කර ඇත්නම් එය ත්‍රීරෝද රථ කමිටුවට විසඳිය නොහැකි බැවින් එය සාකච්ඡා කරල විසඳගන්න කියල.**

**මෙම සංගමයේ ව්‍යවස්ථාවේ පිටපතක් වන්න මහත්තය පරීක්ෂා කර බලන්න.**

**තීරණ**

- **පුංචි පොල පාරේ වාහන එක් දිශාවකට පමණක් ගමන් කිරීමට වෙන් කල වේලාවන් ඇතුලත් කර පුවරු සවි කිරීම සුදුසු බවට ද**
- **ත්‍රීරෝද නැවතුම් ස්ථානවල මාර්ගයේ කොටු සළකුණු කිරීම සුදුසු බවටද**
- **හෙප්පුමුල්ලට යාබද ග්‍රාම සේවා වසම වන රන්දොඹේ දකුණ,හිරේවත්තට යාබද ඌරවත්ත ග්‍රාම සේවා වසම,ගොඩහේන,දෙල්දූව,බෝගහවත්ත වසම් 05 හි අයදුම් කරුවන් විසින් ඉදිරිපත් කර තිබූ අයදුම් පත් අදාල ග්‍රාම සේවා නිලධාරින් විසින් සහතික කර තිබුනද මැතිවරන කාර්යාලයෙන් ඡන්ද හිමි නාම ලේඛනවල පිටපත් ලබාගෙන නිවැරදි බව තහවුරු කර ගැනීමෙන් පසු බලපත්‍ර ලබා දීමටද කමිටුව විසින් නිර්දේශ කරන ලදී.**

**ගරු උප සභාපති තුමන් විසින් නාගරික මන්ත්‍රී තුමන්ලාටත් කාර්ය මණ්ඩලයටත් කමිටුවට සහභාගි වීම සම්බන්ධයෙන් ස්තුතිය පල කරන ලදි.**

**සකස් කලේ**

| | | |
|---|---|---|
| **එස්.යූ.එස්.ද සිල්වා මිය** | | **උප සභාපති** |
| **කළමනාකරණ සහකාර** | **ලේකම්** | **කමල් වැල්ලගේ** |
| | **අම්බලන්ගොඩ නගර සභාව** | **අම්බලන්ගොඩ නගර සභාව** |

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

2019.02.26 දින පැවති ත්‍රීරෝද රථ කමිටු වාර්තාව සඳහා සභා අනුමතිය ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ ත්‍රිරෝද කමිටුව පිළිබඳව අපිට යම් ගැටළුවක් තිබෙනවා. ත්‍රීරෝද රථ ස්ටිකර් මුද්‍රණයටත් යවා ඇත. එහි එක එක රථගාල් සඳහා නිර්දේශ කරන ලද රථ සංඛ්‍යාව. අම්බලන්ගොඩ කියන්නේ කුඩා නගරයකි. මෙහි අවශ්‍ය ප්‍රමාණයට වඩා ලබා දුන්නොත් අපිට ගැටළුවක් මතු වෙනවා. කඩහිමියන්ට හා පාරිභොගිකයන්ට විශාල අපහසුතා වෙනවා. මා විශ්වාස කරනවා අවම මට්ටම ත්‍රිවිල් රථ කමිටුවෙන් ලබා දෙන්නැති කියා . ඒ අයට ලබා දීමට කලින් අපගේ දැන ගැනිමට ඉදිරිපත් කරනවා නම් හොඳයි.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලෙගේ මහතා කතා කරමින්</u>**

ගිය වකවානුවේ අපි ත්‍රිරෝද රථ 220 කට වගේ සිමා කර තිබුණේ. අපි මෙවර කමිටුවෙන් 200කට එහා දෙන්න එපා කිව්වා. දැනට 160 ගණනක් දි තිබෙනවා. මේ 160 ගණන පොල්වත්ත, තල්ගස්ගොඩ , දළුක්කන්ද ආදි රථ ගාල් සමඟ තමයි 160 ගණන තිබෙන්නේ. දැන් ඒවා අතහරින්න වෙනවා. ගරු සභාපතිතුමනි, දැන් ඒවා අපිට අතහරින්න වෙනවා. 60,65 ක ප්‍රමාණයක් දීමට හැකි තත්වයක් තමයි තිබෙන්නේ. අපි 220 කට වඩා උපරිම බලපත්‍ර ලබා දෙන්න බලාපොරෝත්තු වෙන්නේ නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මා අදහස් කලේ උප සභාපතිතුමා අදහස් කළ එක නෙමේ. එය හොඳයි. එක ස්ථානයකට ත්‍රීරෝද රථ සංඛ්‍යාවක් නියම කර තිබේනවාද කියා. ඒ ඒ ස්ථාන අනුව .උදාහරණයක් ලෙස ගිවිසුමේ ම තිබෙනවා බස්නැවතුම්පොළ ආසන්නයේ ත්‍රීරෝද රථ 50 හරි 35 හරි එය පුළුවන් කියා.නමුත් අප ගතහොත් සරසවිය හංදිය, මාර්කට් එක හංදියට පොළ ළඟට කොච්චරක්ද කියන එක , උවමනාවට වඩා දෙන්න බැහැනේ. ගරු මන්ත්‍රීවරු සකච්ඡාකර තීරණයකට එළෙඹෙමු කියන අදහසේ මා සිටිනවා. පාරිභොගිකයන්ටත් එක එක ප්‍රශ්න තියෙනවා. කඩ හිමියන්ටත් ප්‍රශ්න තිබෙනවා. ත්‍රීරෝද රථ අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩියි. එකවර ගාල් කිරිමේ අවම සංඛ්‍යාවකට නැතිව ත්‍රීරෝද රථ සංඛ්‍යාව සිමා කිරිම නෙමේ.යම් ත්‍රීරෝද රථ ගාලකට 30ක් ලබා දෙන්න තියෙනවා නම් එම ගණන ලබා දෙන්න. හැබැයි එකවර ගාල් කිරිමට හැකි 5 යි නම් එම 5 පමණයි . අපගේ අවශ්‍යතාවය. 30 ක් ලබා දුන්නාට කමක් නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩී.ධර්මදාස මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අපගේ බස්නැවතුම්පොළට අයත් නගර සභාවට අයත් ඉඩමේ ත්‍රීරෝද රථ ගාල් කරන ස්ථානයේ වැටක් ඉදිකළා. එය අපි කමිටුවේදි තිරණයක් ගත්තේ සම්පූර්ණයෙන්ම මාර්ගයට පිවිසිමට නොහැකි ලෙස වැට ඉදිකිරිමටයි. නමුත් මැදින් වැට කැල්ලක් ගසා තිබෙනවා . දෙපැත්තෙන් ත්‍රීරෝද රථ දෙකක් දැමිය හැකි ඉදිරිපසට . තේරුමක් නැති වැඩකි. ගරු සභාපතිතුමනි, එක්කෝ වැට ගලවා දැමිය යුතුයි. නැතිනම් සම්පූර්ණ ආවරණය පරිදි වැට ඉදිකළ යුතු බවට මා ප්‍රකාශ කර සිටිනවා.

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේ ත්‍රීරෝද රථ කමිටුවේ සිටින්නේ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා, ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා, ගරු නගර සභා මන්ත්‍රී දිනායදුර ධර්මදාස මහතා, එම්.චම්පා සුමුදුකුමාරි මහත්මිය,ආදි අය තමයි ගරු මන්ත්‍රීවරු වශයෙන් එතනට සහභාගි වී තිබෙන්නේ. මේ කියන අදහස් ටික ඊළඟ කමිටුවේදි ගරු මන්ත්‍රීවරුන් විසින් සකච්ජා කර එම වාර්තාව ඉදිරිපත් කරන්න. අවශ්‍ය කරුණු ඔගොල්ලන් තීන්දු කරන්න. ත්‍රීරෝද රථ කමිටුවෙන් අවශ්‍ය සුදුසු තීන්දුව ගන්න. එය නුසුදුසු නම් එය සභාව තිරණය කරන්නම්.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

මෙතැන වැට ගැසීම පිළිබඳව නෙමේ. දැන් වැට ගැහුවාම ත්‍රීරෝද රථ ගන්න වෙන්නේ එහා පැත්තෙනි.එවිට අනික් පැත්තෙන් දමන වාහන සමඟ වාහන තද බදයක් ඇති වන්නේ නැතිද ?

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මෙම වැට ගැසීම සම්බන්ධයෙන් ඉල්ලීම කරනු ලැබුවේ අම්බලන්ගොඩ පොලිසිය විසිනි.ප එයට හේතුව වූයේ කොළඹින් බස් රථයක් පැමිණ නතර කරන විටම එහි ඇති ත්‍රීරෝද රථ 5ක් 6ක් එකපාරටම ගාලුපාරට පැමිණ මෙම බස්රථයෙන් බසින මඟින් දමා ගැනීමට හදනවා. එම නිසා අනතුරු සිද්ධවෙනවා කියන ඉල්ලීම පොලිසිය විසින් අපට දැන්වූවා . ඒ අනුව තමයි එය ඉදිකරනු ලැබුවේ. ඉදි කරනු ලැබූ ප්‍රමාණය මදිනම් අපි ඉතිරි කොටසක් ඉදි කිරිමට කටයුතු කරන්නම්.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

මේ පැත්තට විතරයිනේ යන්න පුළුවන්. පාරණ පාරේ එන වාහන පමණයිනේද? මේහෙන් ඇතුළටනේ දමන්න තියෙන්නේ.

**ගරු උප සභාපති කමල් වැල්ලෙගේ මහතා කතා කරමින්**

කවදාවත් එහෙම කර නැහැ.

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අපි එසේ සිදු කර ඇත්තේ පාසල් අරින වේලාවට විතරයි. ඒ අය ඉල්ලීම කරනු ලැබුවේ පාසල් අරින වේලාවට පමණයි. පොලිසිය සැමදාම ලියනවා.

**ගරු උප සභාපති කමල් වැල්ලෙගේ මහතා කතා කරමින්**

ඔබතුමාට මතක ඇති. ඔබතුමාත් හිටියා ඔය කමිටුවේ ඔය තීරණය ගන්නා විට. වේලාව තිබුණේ උදේ 6.30-7.30 ප.ව.1.00-2.00 දක්වා පමණයි.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

නෑ පොලිසිය අල්ලන නිසා මා විමසා සිටියේ.

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේ ස්ථානයේ අපි ගසනු ලැබූ බෝඩ්වල වේලාව සඳහන් කර තිබුණා. මුලින්ම සිද්ධ වුණේ එම බෝඩ් එක ගලවා දමනු ලැබුවා.

**ගරු නගර සභා මන්ත්‍රිනි ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මා මේ මොහොතේ අදහස් දක්වන්න තීරණය කරනු ලැබුවේ ත්‍රිරෝද රථ සම්බන්ධව නෙමේ. එහි ඉදිකරනු ලැබු වැට පිළිබවයි. මොකද අද අම්බලන්ගොඩ නගරයේ ඇති හොඳම ස්ථානය තමයි අද එම වැඩය සඳහා යොදවා ඇත්තේ. එම නිසා මා ඔබතුමාගෙන් සහ සියළුම ගරු මන්ත්‍රිවරුන්ගෙන් ඉල්ලා සිටිනවා මෙම ත්‍රි රෝද රථ ගාල් කරන එක වෙනස් කරන ලෙස. මා එම යෝජනාව ගරු සභාවට දැම්මට සිටියත් මා හට එය කර ගැනිමට නොහැකි වුණා. අපගේ නගරයේ කෘෂි කර්ම , මල් වගාව වැනි ව්‍යාපාර වල යෙදෙන කාන්තාවන් සිටිනවා. ඒ අයගේ ආර්ථික මට්ටම සවි කර ගැනීම සඳහා නගර සභාව මඟින් යම් ඉදිකිරිමක් කර එම ස්ථානය ප්‍රයෝජනයට ගැනිමට කටයුතු කරන ලෙස ඉල්ලිමක් කර සිටිනවා.නගරයේ ඇති වැදගත්ම ස්ථානයක් වන එම ස්ථානයේ ත්‍රි රෝද රථ ටික ඉවත් කර ප්‍රයෝජනවත් දෙයකට යොදවන ලෙස මා යෝජනා කර සිටිනවා.

**ගරු උප සභාපති කමල් වැල්ලෙගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, එතුමියගේ යෝජනාව මා පිළිගන්නවා. ඔබතුමාත් යම්කිසි මතයක සිටියා. මිට ඉහතදී එම ස්ථානයේ පළතුරු වෙළඳ සැලක් ආරම්භ කරන්න. පළතුරු වෙළෙඳපොළක්. එය අම්බලන්ගොඩට විශාල අඩුපාඩුවකි. එය කලිනුත් අපි යෝජනා කළා. එය බලහත්කාරයෙන් වගේ ඔවුන් අල්ලාගෙන සිටින්නේ. මෙහි සිටින ත්‍රි රෝද රථ වලින් 1% ක්වත් නගර සභාවේ බලපත්‍ර ලබා ගෙන නැහැ. මොවුන් මෙම ස්ථානයේ සිටින්නේ බලහත්කාරයෙන්. මෙය ඉවත් කරන්නම ඕන. මෙමවැට ගසනවා නම් සම්පුර්ණම ගසන්න ඕන. වැට මැදින් ගසා දෙපැත්තෙන් යලි ත්‍රි රෝද රථ දමනවා. වැට ගසනවා නම් සම්පුර්ණම ඇහිරෙන ලෙස ඉදිකළ යුතුයි.

**ගරු නගර සභා මන්ත්‍රි ජී. සරත් ශ්‍රි ලාල් මහතා කතා කරමින්**

අපි සිතුවේ ඔබතුමාලා තමයි මෙය නිර්මාණය කරන්න ඇත්තේ. මෙය කමිටුව මඟින් ක්‍රියාත්මක කරන්න ඇති කියා.

**ගරු නගර සභා මන්ත්‍රි එස්.එම් සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, පොල්වත්ත ත්‍රි රෝද රථ ගාලේ යම්කිසි පුද්ගලයෙකු පැමිණ චෝදනා කළා . ඔහු නගර සභාවෙන් බලපත්‍රය අරගෙන තිබෙනවා. නමුත් ඔහුට එම ස්ථානයේ ත්‍රි රෝද රථය නතර කිරිමට දෙන්නේ නැහැ. නමුත් නගර සභාවෙන් කියා තිබෙනවා කොහොම හරි රථය නතර කරන ලෙස. එවිට අපි කර ඇරියා වෙනවා නේද? නගර සභාවෙන් කියනවා ඔයත් බලහත්කාරයෙන් දමන්න කියලා. නමුත් නගර සභාවෙන් බලපත්‍රය නොගෙන සමිතියෙන් රු15000/= ක් ගෙවා ඕනම කෙනෙකුට ත්‍රි රෝද රථය ගාල් කළ හැක. එවිට එහි පවතින්නේ නගර සභාවේ නිතියද නැතිනම් සමිතියේ නිතිය ද කියා අපිට ගැටළුවක් තිබෙනවා.

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

ඔබතුමා මතුකරන ප්‍රශ්නය ත්‍රි රෝද රථ ගාල් කිහිපයකම තිබෙනවා. උදාහරණයක් ලෙස බස්නැවතුම්පොළ ඇතුලේ තිබෙන ත්‍රි රෝද රත ගාලට අපි බලපත්‍රයක් නිකුත් කරත් එහි තිබෙන සමිතියට රු.50000/= ක මුදලක් ගෙවිය යුතුයි ඒ අය. අම්බලන්ගොඩ පොල්වත්ත ත්‍රි රෝද රථ ගාලේ අයට අපි බලපත්‍රයක් නිකුත් කළත් රු15000/= ක් ගෙවිය යුතුයි. ඒ වගේ තත්වයක් තිබෙන්නේ. ත්‍රී රෝද රථ කමිටුවෙන් මේ ගැන සොයා බලා මේ මාපියාව නැති කළ යුතුයි. ඇත්තටම එම රු15000/= හරි රු.50000/= අම්බලන්ගොඩ නගරයේ සංවර්ධන කටයුත්තකට යොදා ගැනිම කමක් නැහැ. නමුත් මෙය පුද්ගලික සමතියක් මෙහෙයවනු ලබන්නේ. මේ සමිතිය මෙය නිසියාකාරව පාලනය කරන්නේ නැහැ.රු50000/= හරි ලබා දී මේ සිමාව මෙච්චරයි කියා තිබෙනවා නම් අපගේ මැදිහත් විම වැඩක්ම නැහැ. නමුත් මේ 50000/= ලබා දෙනවා. මැර කණ්ඩායම් රාශියක් ක්‍රියාත්මකයි. අර මැර කණ්ඩායමේ කෙනෙක් පැමිණ ත්‍රි රෝද රථය රථ ගාලට දමනවා. නමුත් එම රථ ගාලේ අය කතා කරන්නෙත් නැහැ. සමිතිය කතා කරන්නෙත් නැහැ. මෙය නතර කළ යුතුයි. අද තිබෙන ප්‍රශ්නයකි මේ නගරය තුල තිබෙන.මෙම ප්‍රශ්නය විසඳන්න මෙම කමිටුව බලාපොරෝත්තු වෙයි කියා අපි සිතනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම් සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

මෙම සමිතියට බලයක් තිබෙනවා කියා මට පෙනෙන්නට නැහැ. මෙවැනි ප්‍රශ්නයක් විසඳීමට. අපි විරුද්ධ පක්ෂයේ නායකතුමාගේ අනුග්‍රහය බලාපොරෝත්තු වෙනවා රජයේ අනුග්‍රහය ඇතිව බලය පවිච්චි කරන්න. මෙය නගරයේ තිබෙන බරපතල ප්‍රශ්නයකි.ඒ සඳහා ඔබතුමාගෙත් උදවු අපිට ඉල්ලීමට සිදු වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

මේ සඳහා ගරු උප සභාපතිතුමා අතුළු කමිටුව ගන්නා තීන්දු ක්‍රියාත්මක කිරිමට ගරු සභාපතිතුමා ඉල්ලා සිටින්න. එය ක්‍රියාත්මක කරන්න. ඔබතුමා පොලිසිය දැනුවත් කරන්න. සංවර්ධන කමිටුව හරහා අපිත් පොලිසිය දැනුවත් කරන්නම්. නීතිය ක්‍රියාත්මක කරන්න. අපි නම්කර බෝඩ් ගසා බලපත්‍රය ලබා දි එන පලමු දිනයේම නිතිය කඩන ඕනැම කෙනෙකුට තරා තිරම නොබලා පුද්ගලයා නොබලා නිතිය ක්‍රියාත්මක කරන්න. ඒ සඳහා අපි සැමදෙනාම එකතු වන්න.

**තීරණය -**

2019.02.25 දින පැවැති රථ වාහන හා ත්‍රීරෝද රථ කමිටු වාර්තාව පිළිගත යුතු බවට සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**06.04 2018.12.21 දින පැවැති ටෙන්ඩර් කමිටු වාර්තාව සභා ගත කරන ලදී.**

**ටෙන්ඩර් කමිටුව**

**2019/02/21 දින පෙ.ව. 9.30**

**සහභාගීත්වය**

01. අරුණ ප්‍රදීප් මහතා — ගරු සභාපති, අම්බලන්ගොඩ නගර සභාව
02. කමල් වැල්ලගේ මහතා — ගරු උප සභාපති, අම්බලන්ගොඩ නගර සභාව
03. නන්දන රාජපක්ෂ මහතා — ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව
04. රාහුල ලලිත වික්‍රම මහතා — ගරු නගර සභා මන්ත්‍රිනී, අම්බලන්ගොඩ නගර සභාව
05. බී.ඒ. ධම්මිකා මහත්මිය — ලේකම්, අම්බලන්ගොඩ නගර සභාව
06. එච්.පී. මිහිරි ද සිල්වා මිය — ප්‍රධාන කළමණාකරන සහකාර,අම්බලන්ගොඩ නගරසභාව
07. එම්.පී.බී.ඩබ්.යූ.කුමාරි මිය — ආයුර්වේද වෛද්‍ය නිළධාරී, අම්බලන්ගොඩ නගරසභාව
08. එච්.එල් .ද සිල්වා නිලමුණි මහතා — තාක්ෂණ නිළධාරී,අම්බලන්ගොඩ නගරසභාව
09. ලක්මාලි රුවනි — සං.නිළධාරී ,අම්බලන්ගොඩ නගරසභාව

**කමිටු වාර්තාව**

1.පොලිතින් සීලර් යන්ත්‍රය සඳහා මිල ගණන් ඉදිරි පත් කරන ලද එකම ආයතනය වන පූර්ණා වෙළඳ සැල ඉදිරිපත් කල මිල ගණන් පිළිගැනීම සුදුසු බවට තීරණය කරන ලදී.

| අනු අංකය | අයිතමය | ප්‍රමාණය | වර්ගය | පූර්ණා වෙළඳ සැල අම්බලන්ගොඩ | ස්ටාලයින් හාඩ්වෙයාර් අම්බලන්ගොඩ | සමන් ට්‍රේඩ් අම්බලන්ගොඩ |
|---|---|---|---|---|---|---|
| | | | | එකක් | එකක් | එකක් |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | තොගය | තොගය | තොගය |
| 1 | පොලිතින් සීලර් යන්ත්‍රය අගල්8 | | | 2800.00 | - | - |
| 2 | පොලිතින් සීලර් යන්ත්‍රය අගල්12 | | | 4500.00 | | |

2කොන්ක්‍රීට් ලැලි සෑදීමට අවශ්‍ය ද්‍රව්‍ය සඳහා අංක 01අවම මිල ඉදිරිපත් කල පූර්ණා වෙලද සැල ආයතනයේ මිල ද අංක 2,3 සඳහා ස්ටාලයින් හාඩ්වෙයාර් ආයතනයේ මිල පිලිගැනීම ද සුදුසු බවට තීරණය කරන ලදී

| අනු අංකය | අයිතමය | ප්‍රමාණය | වර්ගය | පූර්ණා වෙලද සැල ආයතන | ස්ටාලයින් හාඩ්වෙයාර් ආයතනය | |
|---|---|---|---|---|---|---|
| | | | | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය |
| | Sls 107 සිමෙන්ති කොට්ට | | පවුර | 970.00 | 1095.00 | |
| | සංස්ථා 12mm කම්බි | | | | 890.00 | |
| | බයින්ඩින් කම්බි | | | 230.00 | 220.00 | |

3.ලිපි දව සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මිල ගණන් පිළිගැනීම සුදුසු බව තීරණය කරන ලදී.

| අනු අංකය | අයිතමය | ප්‍රමාණය | වර්ගය | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය | |
| 1 | සෙලෝටේප් | | | 20.00 | | | | | |
| 2 | නෝට්බුක් | | Fild | 60.0 | | | | | |
| 3 | නිල් පෑන් | | Spc | 9.00 | | | | | |
| 4 | රතුපෑන් | | atlas | 17.00 | | | | | |
| 5 | කැල්කියුලේටර් | | | 1350.00 | | | | | |
| 6 | ස්ටෙප්ලර් | | Kangaru 369 | 300.00 | | | | | |
| 7 | ස්ටෙප්ලර් කටු පැකට් | | 369 | 25.00 | | | | | |
| 8 | ඇල්පෙනෙති පැකට් | | | 30.00 | | | | | |
| 9 | ෆයිල් ටැග් | | 18’ | 3.00 | | | | | |
| 10 | Pad ink බෝතල් | | | 65.00 | | | | | |
| 11 | පන්චර් | | Kangro D.P 600 | 360.00 | | | | | |
| 12 | A4 පැකට් | | Just point | 740.00 | | | | | |
| 13 | හාෆ් ෂීට් | | Spc | 580.00 | | | | | |

.

4.දින මුද්‍රා සැකසීම සඳහා අවම මිල ඉදිරිපත් කර ඇති ඩයමන්ඩ් ඇඩ්වටයිසින් ආයතනයේ මිල ගණන් පිළිගැනීම සුදුසු බව තීරණය කරන ලදී.

| අනු අංකය | අයිතමය | ප්‍රමාණය | වර්ගය | ඩයමන්ඩ් ඇඩ්වටයිසින් ආයතනය | ඩයස් පර්ස් ආයතනය | ශ්‍රීල ආර්ට් ආයතනය |
|---|---|---|---|---|---|---|
| | | | | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය |
| 1 | දින මුද්‍රා | | | 150.00 | 175.00 | 200.00 |

**5.රිම් සඳහා ඉදිරිපත් වී ඇති එකම මිල ගණන් වන සීමාසහිත ඇම්.සෙනෙවිරත්න (පුද්ගලික ) සමාගම විසින් ඉදිරිපත් කර ඇති මිල ගණන් පිළිගැනීමට තීරණය කරන ලදී**

| අනු අංකය | අයිතමය | ප්‍රමාණය | වර්ගය | සීමාසහිත ඇම්.සෙනෙවිරත්න (පුද්ගලික ) සමාගම | පෙරේරා ටයර් සර්විස් | සී ට්‍රේඩර්ස් | ශක්ති ටයර්ස් |
|---|---|---|---|---|---|---|---|
| | | | | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය | |
| 01 | 6.00 x 16 රිම් | 02 | තුර්කි | 5950.00 | - | - | |
| 02 | 13.6 x 28 රිම් | 02 | තුර්කි | 29500.00 | | | |

06.රුධිර පීඩන මානය සඳහා ආයුර්වේද වෛද තුමියගේ නිර්දේශය මත sri laksmie drug stores osu sala (franchise) ආයතනයේ spirit වර්ගයේ මිල පිලිගැනීම සුදුසු බව තීරණය කරන ලදී.

| අනු අංකය | අයිතමය | ප්‍රමාණය | වර්ගය | sri laksmie drug stores | සමන් ෆාමසි ආයතනය | |
|---|---|---|---|---|---|---|
| | | | | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය |
| 01 | රුධිර පීඩන මානය | | Sprit | 9800.00 | 10900.00 | - |
| | | | bokang | 4800.00 | 4500.00 | |

07. සෞඛ්‍ය අංශයට අවශ සබන් සඳහා විවිධ සේවා සමූපකාර සමිතියේ මිල ගණන් පිලිගැනීම සුදුසු බව තීරණය කරන ලදී.

| අනු අංකය | අයිතමය | ප්‍රමාණය | වර්ගය | විවිධ සේවා සමූපකාර සමිතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | ඒකක් තොගය | තොග මිල | ඒකක් තොගය |
| 01 | ලයිෆ්බෝයි සබන් කැට | | | 55.00 | 53.00 | |
| 02 | විම් කැට | | | 23.00 | 22.00 | |

08.මහජන පුස්තකාල වැසිකිලිය සෑදිම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සඳහා ඉදිරිපත්කරන ලද මිල ගණන්අතරින් අංක 1,2,4.5,6,7,8,9 සඳහා ශ්‍රී සිරි ඉන්ඩස්ට්‍රීස් ආයතනයේ ද අංක 3 සඳහා රෝයල් සෙරමික් ආයතනයේ ද මිල ගණන් පිලිගැනීම සුදුසු බව තීරණය කරන ලදී.

| අනු අංකය | අයිතමය | ප්‍රමාණය | වර්ගය | ලංකා ටයිල් ෂෝරූම් ඇම්ලෙන් ගෙඩ | ශ්‍රී සිරි ඉන්ඩස්ට්‍රීස් | රෝයල් සෙරමික් ලංකා |
|---|---|---|---|---|---|---|
| | | | | ඒකක් තොගය | ඒකක් තොගය | ඒකක් තොගය |
| 1 | අගල් 12 x 12 | | Ceramic lanka | 160.00-30% 15% වට්ටම් | 140.00 | 142.00 |
| 2 | අගල් 8 x 12 | | Ceramic lanka | 90.00-30% වට්ටම් | 81.00 | - |
| 3 | කොමඩ් සෙට් | | Ceramic lanka | 33900.00 27500.00 | 21150.00 | 20300.00 |
| 4 | අගල්4 මැජික් බෙන්ඩ් | | | | 500.00 | |
| 5 | අගල් 4 එල්බෝ | | | | 490.00 | |
| 6 | අගල් 4 T | | | | 750.00 | |
| 7 | කොමපඩ් ඇණ පැකට් | | | | 200.00 | |
| 8 | බිඩේ ෂවර් | | | | 690.00 | 4200.00 (rosel) |
| 9 | අගල් 18 ප්ලෙක්සිබල් හෝස්(වෝටර් ටෙක්) | | | | 235.00 | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |

09.කොම්පෝස්ට් බින් සඳහා මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතාගේ නිර්දේශ ලබා ගැනීමට සුදුසු බව තීරණය කරන ලදී.

| අනු අංකය | අයිතමය | ප්‍රමාණය | වර්ගය | [illegible] | [illegible] | [illegible] |
|---|---|---|---|---|---|---|
| | | | | ඒකක් තොගය | ඒකක් තොගය | ඒකක් තොගය |
| 01 | ඇතුලත වායු පෝෂක සිලින්ඩරය හා වැසි ජල පාලක උපාංගය සහිත(සාමාන කොම්පෝස්ට් බඳුන) | | | 4600.00 | | |
| 02 | ඇතුලත වායු පෝෂක සිලින්ඩරය හා වැසි ජල පාලක උපාංගය සහිත | | | 5600.00 | | |
| 03. | Concrete recycle bin | | | | 4850.00 | |

10.ගල් වර්ග සඳහා ප්‍රවාහනය සහිත අවම මිල ගණන් ඉදිරි පත් කරන ලද පී.එච්.සී. ගොඩනැගිලි ද්‍රව්‍ය සපයන්නෝ ආයතනයේ මිල ගණන් පිළිගැනීම සුදුසු බවට තීරණය කරන ලදී.

| අනු අංකය | අයිතමය | ප්‍රමාණය | වර්ගය | සිඹා බ්ලොක් ගල් | බන්දුල මෙටල් වර්ක්ස් | පී.එච්.සී. ගොඩනැගිලි ද්‍රව්‍ය සපයන්නෝ |
|---|---|---|---|---|---|---|
| | | | | ඒකක් තොගය | ඒකක් තොගය | ඒකක් තොගය |
| 1 | 1 ½ කොන්ක්‍රීට් ගල් | | | 6300.00 | | 6150.00 |
| 2 | ¾ කොන්ක්‍රීට් ගල් | | | 6300.00 | | 6150.00 |
| 3 | චිප් ගල් | | | 8000.00 | | 7150.00 |
| 4 | ABC ගල් | | | 6500.00 | | 6150.00 |
| | | | | | | |
| 5 | 1 ½ කොන්ක්‍රීට් ගල් | | | 5500.00 | 5000.00 | |
| 6 | ¾ කොන්ක්‍රීට් ගල් | | | 5500.00 | 5000.00 | |
| 7 | චිප් ගල් | | | 7200.00 | 6000.00 | |
| 8 | ABC ගල් | | | 5700.00 | 5700.00 | |

11.ට්‍රැක්ටර් අලුත්වැඩියාවට අවශ්‍ය තීන්ත සඳහා ඉදිරි පත් කරන එකම මිල ගණන් වන නිව් ජේන්ට් සෙන්ටර් ආයතනයේ මිල ගණන් පිළිගැනීම සුදුසු බවට තීරණය කරන ලදී.

| අනු අංකය | අයිතමය | ප්‍රමාණය | වර්ගය | | | |
|---|---|---|---|---|---|---|
| | | | | ඒකක් තොගය | ඒකක් තොගය | ඒකක් තොගය |
| 1 | ප්‍රයිමර් | | | 1290.00 | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 2 | පිලර් | | | 1135.00 | | |
| 3 | රතු පාට තීන්ත | | | 1270.00 | | |
| 4 | දුඹුරු පාට තීන්ත | | | 1270.00 | | |
| | ලැකර් | | | 1690.00 | | |
| | n.c ටිනර් | | | 290.00 | | |
| | 2k ටිනර් | | | 800.00 | | |
| | 2kg කැට්ලො ටින් | | | 2320.00 | | |
| | වැලි කොල 120 | | | 70.00 | | |
| | වැලි කොල 180 | | | 80.00 | | |
| | වැලි කොල 400 | | | 80.00 | | |
| | මාස්කින් ටේප් අගල්1 | | | 160.00 | | |
| | හිට් බ්ලැක් | | | 1360.00 | | |
| | සිල්ව කලර් | | | 1030.00 | | |
| | කලු පාට තීන්ත | | | 865.00 | | |

.............................................

සකස් කලේ

එල්.ආර්.මිගෙල්හේවා

සංවර්ධන නිළධාරී

අම්බලන්ගොඩ නගර සභාව

...................................................

පරීක්ෂා කලේ

තාක්ෂණ නිළධාරී

අම්බලන්ගොඩ නගර සභාව

.............................................

සකස් කලේ

...................................................

පරීක්ෂා කලේ

.....................................................

ලේකම්

බී.ජ්.ධම්මිකා

අම්බලන්ගොඩ නගර සභාව

.....................................................

සභාපති

ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප්

අම්බලන්ගොඩ නගර සභාව

**තීරණය -**

2019.02.21 දින පැවැති ටෙන්ඩර් කමිටු වාර්තාව පිළිගත යුතු බවට සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු නගර සභා මන්ත්‍රී ජ්.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**06.05 2019.02.21.** දින පැවැති පුස්තකාල කමිටු වාර්තාව සභා ගත කරන ලදී

**<u>2019 පෙබරවාරි මස 21 වන දින පුස්තකාල කමිටු වාර්තාව</u>**

| | |
|---|---|
| • ගරු සභාපති | ඇම්.ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා |
| • ගරු නගර සභා මන්ත්‍රී | නන්දන රාජපක්ෂ මහතා |
| • ගරු නගර සභා මන්ත්‍රී | දිනයාදූර ධර්මදාස මහතා |
| • ගරු නගර සභා මන්ත්‍රී | ධනසේන මාදුවගේ මහතා |
| • ගරු නගර සභා මන්ත්‍රීනි | එච්. ඉනෝකා ක්‍රිෂාන්ති මහත්මිය |
| • කමිටු සාමාජික | එම්.ඒ. ජයවීර මහතා |
| • කමිටු සාමාජික | එන්.එච්. ධන්කන් ද සිල්වා මහතා |
| • කමිටු සාමාජික | ටී.ඩබ්. හරිස්චන්ද්‍ර මහතා |
| • කමිටු සාමාජික | පේමසිරි රතුවඩු මහතා |
| • කමිටු සාමාජික | ජී.ඩබ්. ගුණසිරි මහතා |
| • කමිටු සාමාජික | ටී.ඩබ්. පියසිරි මහතා |
| • ලේකම් | බී.ඒ. ධම්මිකා මහත්මිය |
| • ප්‍රජා සංවර්ධන නිලධාරී | ඩී.වී. තරංගි මහත්මිය |
| • පුස්තකාලයාධිපති | කේ.ඩබ්ලිව්. රංජනී මානෙල් මෙනවිය |
| • පුස්තකාලයාධිපති | ඩී. මහේෂා තාබ්‍රේව් මෙනවිය |
| • පුස්තකාල සහායිකා | ඒ.ජී. ලක්ෂ්මි පෙරේරා මෙනවිය |
| • පුස්තකාල සහායිකා | ඩී.එම්.ජී.එස්. දිල්රුක්ෂි මහත්මිය |
| • පුස්තකාල සහායිකා | එස්. සුසිලා දීපානි මහත්මිය |
| • පුස්තකාල සහායිකා | ජී.එච්.එල්. පියන්ති මෙනවිය |
| • පුස්තකාල සහායිකා | කේ.ඒ. විසුද්ධි රේණුකා මහත්මිය |
| • පුස්තකාල සහායිකා | එම්.ඩබ්ලිව්. ජේ. සුමංගලී මහත්මිය |
| • පුස්තකාල සහායිකා | මාලති සමන්තා ආරියසිංහ මහත්මිය |
| • පුස්තකාල සහායිකා | එස්.එම්. මනෝරි චන්ද්‍රවංශ මහත්මිය |

<u>අම්බලන්ගොඩ නගර සභාවේ ගරු සභාපතිතුමා මූලාසනය දැරූ **2019/02/21** දින පැවති පුස්තකාල කමිටු වාර්තාව</u>

- ගරු සභාපතිතුමා පුස්තකාල කමිටුවට පැමිණීමෙන් පසුව ප.ව. **2.30** ට පමණ පුස්තකාල කමිටුවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදි.
- ගරු සභාපතිතුමා විසින් පුස්තකාල කමිටුවට පැමිණි සියලුම ගරු නගර සභා මන්ත්‍රීවරු, මන්ත්‍රීවරිය, පුස්තකාල කමිටු සාමාජික මහතුන්, ලේකම්තුමිය සහ ප්‍රජා සංවර්ධන නිලධාරීතුමිය, පුස්තකාලයාධිපතිනියන් සහ පුස්තකාල සහායිකාවන් ඇතුලු සියලුම මහත්ම මහත්මීන් පිළිගන්නා ලදි.
- පළමුවෙන්ම ප්‍රගති වාර්තා කමිටුවට ඉදිරිපත් කිරීම සිදුකරන ලදි.

ප්‍රධාන පුස්තකාලයේ ප්‍රගති වාර්තාව පුස්තකාලයාධිපතිනිය විසින්ද ශාඛා පුස්තකාලවල ප්‍රගතිය ඒ ඒ ශාඛා භාර පුස්තකාල සහායිකාවන් විසින් ද විද්‍යුත් පුස්තකාලයේ ප්‍රගති වාර්තාව සහ කෙරමිණිය ශාඛාව භාර පුස්තකාල සහායිකාව පුස්තකාල කමිටුවට සහභාගී නොවන බැවින් එම වාර්තාව ජී.එච්. එල් .පියන්ති මෙනවිය විසින් කමිටුවට ඉදිරිපත් කරන ලදි.

- පොත් බැඳීම (Binding) පිළිබඳ සාකච්ඡා කිරීම.
  පසුගිය කමිටුවේදී තීරණය වූ පරිදි එක් මහතකුගේ නම පොත් බැඳීමට යෝජනා වූ නමුත් ප්‍රධාන හා ශාඛා පුස්තකාලවල මිළදී ගන්නා ලද පොත් බැඳීම සඳහා කෙනෙකු බඳවා ගැනීමට සුදුසු දැයි ගරු සභාපතිතුමා ලේකම්තුමියගෙන් කරුණු විමසන ලදි. එහිදී එතුමිය ප්‍රකාශ කළේ පළාත් පාලන ආයතනයෙන් අනුමැතිය ලබාගත යුතු බවය. දිනකට රු.1000/= පමණ මුදලක් දීමට හැකියාව ඇති බවත් ඒ සඳහා ලියාපදිංචි වියයුතු බවත් දන්වන ලදි. එක පොතක් බැඳීමට අවශ්‍ය වන මුදල පිළිබඳ මිළ ගණන් කැඳවා භාරදෙන ලෙස ගරු සභාපතිතුමා ලේකම්තුමියට උපදෙස් ලබා දෙන ලදි.
  ශාඛා පුස්තකාල භාර සහායිකාවන්ගේ අදහස වූයේ එම ශාඛාවලට භාරදී ඇති පොත් තමන් විසින් බැඳ ගැනීමට හැකි බවත් ඒ සඳහා පුහුණුවක් ලබාදෙන ලෙසත්ය.

- වෙනත් කරුණු පිළිබඳ සාකච්ඡා කිරීම.
  ඕකන්ද ශාඛා පුස්තකාලය සඳහා අවශ්‍ය වී ඇති වතුර ටැංකිය සාදා නිමකර දෙන ලෙස පුස්තකාල කමිටු සාමාජික එම්.ඒ. ජයවීර මහතා පුස්තකාල කමිටුවට දන්වන ලදි. එම ශාඛා පුස්තකාලයේම මුදුන් වහල කැඩී ඇති බවත් එය සාදා දෙන ලෙසත් ඉල්ලා සිටින ලදි.
  ගරු සභාපතිතුමා පවසා සිටියේ තාක්ෂණ නිලධාරී මහතකු යොදා මේ පිළිබඳ සොයා බැලිය යුතු බවය. මේ පිළිබඳ පසු විපරමක් අවශ්‍ය බවත් ගරු සභාපතිතුමාගේ අදහස විය.

- හිරේවත්ත ශාඛා පුස්තකාලයේ වතුර ටැංකිය කැඩීම සඳහා ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ.සෝභිත රංජිත් මහතා කෙනෙකු යොදවන බව දැන්වූ බව එම ශාඛා භාර සහායිකාව පුස්තකාල කමිටුවට දන්වන ලදි.
- හෙප්පුමුල්ල ශාඛා පුස්තකාලයේ වතුර ටැංකිය සාදා නොමැති බවත් වැසිකිලිය සාදා ගත යුතු බවත් ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා පවසන ලදි. සම්පූර්ණයෙන්ම හෙප්පුමුල්ල පුස්තකාලය අළුත්වැඩියා කටයුතු සඳහා ඇස්තමේන්තුවක් ඉදිරිපත් කිරීම සුදුසු බව යෝජනා විය.
- පොල්වත්ත ශාඛා පුස්තකාලය සඳහා වතුර ලබා ගැනීමට එම සහායිකාව අවට නිවසකට යන බැවින් වතුර කරාමයක් ඇතුලතින් සාදා දීම සුදුසු බව පොල්වත්ත ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතාගේ අදහස විය.
- වැඩ පරීක්ෂක මහතා සෑම පුස්තකාලයකටම සහභාගී කරවා අඩුපාඩු පිළිබඳ වාර්තා කිරීම සුදුසු බව පුස්තකාල කමිටු සාමාජික එන්.එච්.ඩන්කන් ද සිල්වා මහතා යෝජනා කරන ලදි.
- මහ අම්බලන්ගොඩ ශාඛා පුස්තකාලයේ ඇති අඩුපාඩු සකස් කර ගැනීමට ඇස්තමේන්තුව අනුමත වී ඇති බැවින් ඒ සඳහා කොන්ත්‍රාත්කරුවකු යොදා එම කටයුතු අවසන් කර ගැනීමට එම ශාඛා භාර සහායිකාවට ගරු සභාපතිතුමා උපදෙස් ලබාදෙන ලදි.
  - ගරු සභාපතිතුමා දන්වා සිටියේ මාධ්‍ය වාර්තාකරුවකු වන එස්. සමරනායක මහතා එම තනතුරෙන් ඉවත් වී ඇති බව මාවෙත දන්වා සිටිය බවය. ලක්බිම පුවත්පත මුද්‍රණය කිරීම අත්හිටුවා ඇති බැවින් එම පුවත්පතට වාර්තා ඉදිරිපත් කිරීමට නොහැකි බව සියලුම පුස්තකාල කමිටු සාමාජික මහතුන්හට දන්වන ලදි.
  - මෙවර 5 ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණය පවත්වන ලෙස ගරු සභාපතිතුමා ප්‍රජා සංවර්ධන නිලධාරීතුමිය දැනුවත් කරන ලදි. ජනප්‍රිය ගුරුවරයකු තෝරා ගන්නා ලෙසද සියලුම වියදම් නගර සභාව විසින් දරන බවත් ගරු සභාපතිතුමා විසින් පුස්තකාල කමිටුවට දන්වන ලදි.

වෙනත් කරුණු ඉදිරිපත් නොවූ බැවින් ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා ස්වෙච්ඡාවෙන් කමිටුවට පැමිණි සියලුම මහත්ම මහත්මීන්ට ස්තූතිය ප්‍රකාශ කරමින් පුස්තකාල කමිටුවේ වැඩ කටයුතු අවසක් කරන ලදි.

.....................................

කමිටු ලේකම්

නගර සභාව අම්බලන්ගොඩ

.......................................                                   ..................................

**ලේකම්**                                                                   **අත්සන් කළේ සභාපති**

**නගර සභාව අම්බලන්ගොඩ**                                              **නගර සභාව අම්බලන්ගොඩ**

තීරණය -

2019.02.21 දින පැවැති පුස්තකාල කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**06.06 2019.02.21. දින පැවැති ක්‍රීඩා කමිටු වාර්තාව සභා ගත කරන ලදී.**

<u>ක්‍රීඩා කමිටු වාර්තාව</u>

**<u>2019.02.21</u>**

**සහභාගිත්වය-**

| | |
|---|---|
| ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා | -ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව. |
| ඩබ්ලිව්.කමල් ද සිල්වා මහතා | -ගරු උපසභාපති,අම්බලන්ගොඩ නගර සභාව. |
| ඒ.ඩබ්ලිව්.ජගත් කුමාර මහතා | -ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගර සභාව. |
| එච්.ඉනෝකා ක්‍රිෂාන්ති මිය | -ගරු නගර සභා මන්ත්‍රිණී,අම්බලන්ගොඩ නගර සභාව. |
| ඩබ්ලිව්.එම්.නිලානි මෙ.වි | - ගරු නගර සභා මන්ත්‍රිණී,අම්බලන්ගොඩ නගර සභාව. |
| ඩී.එච්.ඩී.එස්.කරුණාරත්න මහතා | -ක්‍රීඩා නිලධාරී,ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,අම්බලන්ගොඩ. |
| ආර්.එම්.ආර්.නිරෝෂන මහතා | -දිස්ත්‍රික් මළල ක්‍රීඩා පුහුණුකරු |
| ඊ.චමින්ද රොෂාන් මහතා | -ගා/පී.ද.එස්.කුලරත්න විද්‍යාලය,අම්බලන්ගොඩ. |
| ඒ.කේ.එස්.ඩී.ශ්‍යාමලී මිය | -ගා/ග්‍රාමණී විද්‍යාලය,අම්බලන්ගොඩ. |
| ටී.සරත් ශාන්ත මහතා | -සිංහ ක්‍රීඩා සමාජය,අම්බලන්ගොඩ. |
| එස්.කේ.පත්මසිරි මහතා | -ඩොල්පින් ක්‍රීඩා සමාජය, අම්බලන්ගොඩ. |
| එම්.ජී.දිලිප් ඉන්ද්‍ර මහතා | -ජල ක්‍රීඩා සංගමය,අම්බලන්ගොඩ. |
| මහේන්ද්‍ර වික්‍රමසිංහ මහතා | -ක්‍රීඩා කමිටු සාමාජික,පෝරඹ, අම්බලන්ගොඩ. |
| එච්.එල්.ද සිල්වා නිලමුණි මහතා | -තාක්ෂණ සේවා නිලධාරී ,අම්බලන්ගොඩ නගර සභාව. |
| ජී.අශෝක කුමාර මහතා | -ක්‍රීඩා භූමි උපදේශක,අම්බලන්ගොඩ නගර සභාව. |
| ඉඳුනිල් එදිරිවික්‍රමසූරිය මහතා | -දකුණු පළාත් පා පන්දු පුහුණුකරු. |
| ඩී.වී.තරංගි මිය | -ප්‍රජා සංවර්ධන නිලධාරී,අම්බලන්ගොඩ නගර සභාව. |

**පිළිගැනීම.-ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

අද දින ක්‍රීඩා කමිටුව සඳහා සහභාගිවන ගරු උපසභාපතිතුමා, ගරු මන්ත්‍රීතුමන්ලා,මන්ත්‍රීතුමියන්ලා, ගුරු මහත්ම මහත්මීන්, ක්‍රීඩා සමාජ නියෝජනය කරමින් පැමිණි මහත්ම,මහත්මීන් ඇතුළු සියළුම නිලධාරි මහත්ම,මහත්මීන් පිළිගනිනමින්, ක්‍රීඩා කමිටුවේ කටයුතු ආරම්භ කරන ලදි.

**ලැබී ඇති ලිපි ඉදිරිපත් කිරීම.**

අම්බලන්ගොඩ බැඩ්මින්ටන් සංගමයේ ලේකම් එගොඩගේ ජයසේන මහතා විසින් අද දින ක්‍රීඩා කමිටුවට සහභාගි වීමට අපහසුතාවයක් පවතින බැවින් කමිටුවට සහභාගිවීමට නොහැකි බව දන්වා එවන ලද ලිපිය ඉදිරිපත් කරන ලදි.

<u>**පසුගිය කමිටුවේ දී සාකච්ඡා කරන ලද කරුණු සමාලෝචනය**</u>

❖ කළුවඩුමුල්ල දූර පනිනවල සෑදීම.

**ඒ.කේ.එස්.ඩී.ශ්‍යාමලී මිය-ගා/ග්‍රාමණී විද්‍යාලය,අම්බලන්ගොඩ.**

අද දින අශෝක මහතා දූර පනින වල සකස් කරන්න පැමිණියා.එම අවස්ථාවේ එතැනට පැමිණි අයෙක් පැවසුවා.එම ස්ථානයේ දූර පනින වළක් හදන්න ඉඩ දෙන්න බැහැ. එතැන සේවා පියසක් හදන්න යනවා කියලා.

ක්‍රීඩාංගණයේ Track ඇන්දාම Sports meet වලදි අපි නිවාස හදන්නෙත් එතැන, සේවා පියසක් හැදුවොත් ක්‍රීඩාංගණයේ සෙල්ලම් කරන්න හොඳටම ඉඩ මදිවෙයි.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

රජයෙන් සේවා පියසි හදන්න ප්‍රතිපාදන දෙනවා. ප්‍රාදේශීය ලේකම්තුමියගේ ඉල්ලීමකට අනුව සේවා පියසි හදන්න ඉඩම් ලබා දෙන්න සභාවේ එකඟතාවය පළවුනා. ඒ අනුව තමයි කළුවඩුමුල්ල සේවා පියස හදන්න පිට්ටනියේ කොටසක් දෙන්න කැමති වුනේ. අපි විශ්වාස කරනවා රජයේ නිලධාරින් සිව් දෙනාම එකම ස්ථානයක සිටිමෙන් ප්‍රදේශවාසීන්ට තම කටයුතු කරගැනීමට පහසුවක් කියලා. ක්‍රීඩාංගණයේ ක්‍රීඩා කටයුතු කරන්න බාධාවක් නොවන තැනක් කියල තමයි පැවිලියන් එක පිටුපස කොටස හදන්න සභාවේ අනුමැතිය ලබා දුන්නේ. ඔබතුමිය අද පවසනකම් අපි මේ ගැන දැනුවත් වෙලා සිටියේ නැහැ. එම ස්ථානයේ සේවා පියස හැදීම ක්‍රීඩා කටයුතුවලට බාධාවක් නම් අපි ඒක වෙන ස්ථානයක හදන්න සභාවේ එකඟතාවය ගන්න බලන්නම්.

❖ මාදම්පා ගඟ පිහිනුම් තටාකයේ ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳව.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

මම දැක්කා ගිවිසුම් අත්සන් කරල තියෙනවා.ඉක්මනට වැඩ පටන්ගන්න කියන්න.

❖ මානාන ක්‍රීඩාංගණය ශුද්ධ පවිත්‍ර කිරීම හා වතුර tap එකක් සවි කිරීම.

**ජී.අශෝක කුමාර මහතා,ක්‍රීඩා භූමි උපදේශක,අම්බලන්ගොඩ නගර සභාව.**

වැඩ කරගෙන යනවා.ඊට පස්සේ පස් දාන්න තමයි තියෙන්නේ.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

To මහත්තයා පස් දාන්න ඇස්තමේන්තුව හදල දෙන්න. මීටර් 400 ට්‍රැක් එක හදන්න පුළුවන්ද කියල බලන්න එදා ගියා නේද? මොකක්ද තත්වය.

**ආර්.එම්.ආර්.නිරෝෂන මහතා,දිස්ත්‍රික් මළල ක්‍රීඩා පුහුණුකරු**

මීටර් 400 ට්‍රැක් එක හදන්න පළල මීටර් 100 හා දිග මීටර් 185 ක ඍජුකෝනාස්‍රයක ඉඩ ප්‍රමාණයක් අවශ්‍යයි. මානාන පිට්ටනියේ ඉඩ මදිකමක් තියෙනවා.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
මානාන පිට්ටනියෙ මීටර් 400 ට්‍රැක් එක හදන්න.අවශ්‍ය ඉඩම් පවරගන්න වුනත් අපි කැමතියි.

**ආර්.එම්.ආර්.නිරෝෂන මහතා,දිස්ත්‍රික් මළල ක්‍රීඩා පුහුණුකරු**
මුලින් Survey කෙනෙකුට කියල පිට්ටනිය මන්නල,පිට්ටනියේ සැලැස්මේ මීටර් 400 ට්‍රැක් එක එලලා ඉඩ මදිවෙන තැන් බලමු.ඊට පස්සේ ඉඩම් පවර ගන්න බලමු.

**අශොක කුමාර මහතා,ක්‍රීඩා භූමි උපදේශක,අම්බලන්ගොඩ නගර සභාව.**
මානන පිට්ටනියේ ගේට්ටු හදන වැඩේ කෙරුනේ නැහැ. එකත් කරල දෙන්න.

**ඒ.ඩබ්ලිව්.ජගත් කුමාර මහතා ,ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගර සභාව.**
පිට්ටනියට කොන්ක්‍රීට් බංකු 8ක් හදල දෙන්න. Practice එන ළමයි වගේම හවසට සෙල්ලම් කරන්න එන ළමයිගේ මාපියන් වාඩි වෙන්නේ පොඩි අයට සෙල්ලම් කරන්න තියෙන සෙල්ලම් උපකරණ වල.

**එම්.ජී.දිලිප් ඉන්ද්‍ර මහතා,ජල ක්‍රීඩා සංගමය,අම්බලන්ගොඩ.**
ඒ වගේම බංකු ටිකක් මාදම්පා තොටුපොලටත් දාගන්න පුළුවන්නම් හොඳයි.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
මානාන පිට්ටනියේ ගේට්ටුව හදන්න. Po මිස් මානාන පිට්ටනියට කොන්ක්‍රීට් බංකු 8යි මාදම්පා තොටුපොළට බංකු 02, බංකු 10ක් මිලදී ගන්න Quotation කරන්න.

- **ඇවිදින මංතිරුව සඳහා විදුලි පහන් සවිකිරිමට ඇස්තමේන්තුවක් සකස් කිරීම.**
  **ඇම්.ඩබ්ලිව්.අරුණ ප්රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
  නිලානි මන්ත්‍රීතුමිය පැවසුවා පළාත් සභාවෙන්ම ඒ වැඩය කරනවා කියල. ඒ නිසා අපි ඇස්තමේන්තු සකස් කිරීමෙන් වළකිනවා.

- **ස්වභාවික පිහිණුම් තටාකය සංරක්ෂණය සඳහා වෙරළ සංරක්ෂණ නිලධාරිගෙන් උපදෙස් ලබා ගැනීමට ලිපියකින් දැනුවත් කිරීම.**
  **ඩී.වී.තරංගි මිය,ප්‍රජා සංවර්ධන නිලධාරි,අම්බලන්ගොඩ නගර සභාව.**
  ලිපියකින් දැනුවත් කළා.

  **ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
  ගාල්ලටත් ලියුමක් දාන්න . ඉදිරි ක්‍රීඩා කමිටුවකට එම නිලධාරි කෙනෙක් සම්බන්ධ කරගන්න බලන්න.

- **මාදම්පා ගඟේ යකඩ කණු ඉවත් කිරීමට කටයුතු කරන ලෙසට දුම්රිය දෙපාර්තමේන්තුව දැනුවත් කිරීම.**

  **ඩී.වී.තරංගි මිය,ප්‍රජා සංවර්ධන නිලධාරි,අම්බලන්ගොඩ නගර සභාව.**
  ලිපියකින් දැනුවත් කළා.

  **ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
  ඒ වැඩය කරන එක ඉතා වැදගත් නැවත මතක් කිරීමක් කරන්න.

- **බැඩ්මින්ටන් ක්‍රීඩාංගණය ඉදිරිපිට ඇති රොසෙත් රෝහල් වාහන නවතා තැබීමේ ස්ථානයේ වාහන නැවැත්වීමට ක්‍රමවත් වැඩපිළිවෙළක් ඇති කිරීමට රොසෙත් රෝහල් කළමනාකාරිත්වය දැනුවත් කිරීම.**
  **ඩී.වී.තරංගි මිය,ප්‍රජා සංවර්ධන නිලධාරි,අම්බලන්ගොඩ නගර සභාව.**
  දැනුවත් කරන ලද බව දන්වන ලදි.

<u>අදහස් හා යෝජනා</u>

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
අපේ Badminton Code එක තියෙන තැන දැනට අවුරුදු 20කට කලින් දමන ලද Foundation එක තාම හොඳට තියෙනවා.ඒ Foundation එකේම උඩට කණු ගිහිල්ලා ජාතික මට්ටමේ Badminton Code එකක් හදන්න මම යෝජනා කරනවා. මොකද කියන්නේ?

**ඩබ්ලිව්.කමල් ද සිල්වා මහතා,ගරු උපසභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
ඒ යෝජනාව හොඳයි.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
අදියර වශයෙන් කරමු. TO මහත්තයා ඇස්තමේන්තුව හදල දෙන්න.

**ඒ.කේ.එස්.ඩී.ශ්‍යාමලී මිය-ගා/ග්‍රාමණී විද්‍යාලය,අම්බලන්ගොඩ**
කළුවඩුමුල්ල ක්‍රීඩාංගණයට ගේට්ටුවක් දාල දෙන්න පිට්ටනිය මැදින් වාහන යනවා. තව දරුවන්ට සෙල්ලම් කරල මුහුණ ටිකක්වත් හෝද ගන්න Tap එකක් හදල දෙනවනම් හොඳයි.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව**
ඒ වැඩටික කරල දෙන්න.ගේට්ටුව දාල යතුරක් පාසලට දෙන්න. හවසට ගමේ ළමයින්ට සෙල්ලම් කරන්න යන්න පුළුවන් විදියට එක පැත්තක කැරකෙන ගේට්ටුවකුත් දාන්න.

**මහේන්ද්‍ර වික්‍රමසිංහ මහතා,ක්‍රීඩා කමිටු සාමාජික,පෝරඹ, අම්බලන්ගොඩ.**
දැන් කොහොමද සභාපතිතුමා අපේ මේ ක්‍රීඩාංගණයේ වැඩකටයුතු.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
අපි විසිරි ජල සැපයුම් පද්ධතිය හදන වැඩේ පටන් අරගෙන තියෙන්නේ බට එළමින් පවතිනවා. දිස්ත්‍රික් ඉංජිනේරුතුමා උපදෙස් දීල තියෙනවා බට එලන විට වැලි දාන්න කියල.මොකද ගලකට හරි බටයක් Damage වුනොත් ඒක පද්ධතියටම බලපාන නිසා. මම ජිනසේන එකට කථාකරල කිව්වා ඒ විදියට කරන්න කියල.මොකද නියම ප්‍රමිතියට වැඩේ කෙරුනේ නැති වුනොත් ගෙවීම් කරද්දි ප්‍රශ්න වන නිසා.ගෙවීම් කරද්දි දිස්ත්‍රික් ඉංජිනේරුතුමාගේ අනුමැතිය අවශ්‍ය වනනිසා. වාචිකව තමයි කිව්වේ ලිඛිතවත් දැනුවත් කරන්න.

**ඩබ්ලිව්.කමල් ද සිල්වා මහතා,ගරු උපසභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
සභාපතිතුමා මේ කොන්දේසිය මේ කොන්ත්‍රාත් එක ජිනසේන එකට දෙන කොට දාලද තිබුනේ. නැහැනේ. ඉංජිනේරුතුමාගේ අනුමැතියත් ඇතිව තමයි දුන්නේ. එතකොට ඔය උපදෙස් දෙන්න තිබුණනේ. දැන් කියල කරයි ද? අපට එහෙම සමාගමට දැන් කරන්න කියල බල කරන්න පුළුවන්ද? ඔය
වැඩ වලින් වෙන්නේ පිට්ටනිය හදන එක තවත් පරක්කු වෙන එක.ඊට වැඩිය ලේසි නැද්ද අපි ඔය වැඩය කරන එක.අපේ වාහන තියනවා.බළපිටියෙන් මුහුදු වැලි ගන්න පුළුවන්.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
බට එලන කොට ඒ ප්‍රමිතියට අනුව කරන්න කියලයි අපි කියන්නේ.මේ වැඩයට ලක්ෂ 38 ගෙවනවානේ.බටවලට ලක්ෂ 10ත් යන්නේ නැතිව ඇති. අපි ගැටුම් ඇති කරගන්න යන්නේ නැහැ. මුළින් කථාකරල බලමු.
Cricket Board එකෙනුත් ලියුමක් ඇවිල්ලා තියෙනවා.ක්‍රීඩාංගණයේ ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳව.
එච්.එල්.ද සිල්වා නිලමුණි මහතා(තාක්ෂණ සේවා නිලධාරි -අම්බලන්ගොඩ නගර සභාව) විසින් ලිපිය කියවන ලදි.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
එම ලිපියෙන් පස් දමා පිටිය සකස් කර තණ කොල සිටුවීමත් ටර්ෆ් විකට් 03 හා මැට්න් විකට් 01 සෑදීම Cricket Board එකෙන් කරන බවට දැනුම් දීල තිබෙනවා.එයට අපේ අනුමැතිය ඉල්ල තියෙනවා.අපි අනුමැතිය ලබා දෙනවා.මීට කළින් Side Screen 02, Score Board එකත් හදල දෙනවා කියල තිබුනා.අපි ඒකටත් ඉල්ලීමක් කරමු.

**මහේන්ද්‍ර වික්‍රමසිංහ මහතා,ක්‍රීඩා කමිටු සාමාජික,පෝරඹ, අම්බලන්ගොඩ.**
පැවිලියන් එකේ කාමරවල වැඩේ කෙරුනේ නැහැ.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
අදට ගැළපෙන විදියට පැවිලියන් එකේ කාමර හදල දෙන්න.අනෙක් අඩුපාඩු හදන්න ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරන්න. එක කාමරයක් Machinery දාන්න පුළුවන් විදියට සකස් කරල දෙන්න.

**ටී.සරත් ශාන්ත මහතා ,සිංහ ක්‍රීඩා සමාජය,අම්බලන්ගොඩ.**
පිට්ටනියේ නඩත්තු කටයුතු කරගෙන යන්න කවුරුහරි Training කරනවනම් හොඳයි.

**ආර්.එම්.ආර්.නිරෝෂන මහතා,දිස්ත්‍රික් මළල ක්‍රීඩා පුහුණුකරු**
ඒවගේම Gym එකටත් වයස අඩු, ක්‍රීඩා කරපු අපේ සේවක මහත්වරු දෙන්නෙක්වත් පුහුණු කරල දානවනම් හොඳයි. ශ්‍රීලංකා පදනම් ආයතනයෙන් හෝ ජාතික ක්‍රීඩා විද්‍යාතනයෙන් පුහුණුවීම් ඉල්ලන්න පුළුවන් සුළු මුදලක් ගෙවන්න වෙයි.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
අපි අවශ්‍ය පුහුණුවීම් ලබා දෙන්නම්.

**ඩි.එච්.ඩී.එස්.කරුණාරත්න මහතා,ක්‍රීඩා නිලධාරි,ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,අම්බලන්ගොඩ.**
පොල්වත්ත පියසේන ක්‍රීඩාංගණයේ තමයි දැන් ළමයි හැමෝම පුහුණුවීම් කරන්නේ.ඒ ක්‍රීඩාංගණයේ මීටර 100ධාවන පථය හදන්න පුළුවන් විදියට පිටිය සකස් කරල දෙනව නම් හොඳයි.දැනට මීටර් 80 යි තියෙන්නේ.

**එච්.එල්.ද සිල්වා නිලමුණි මහතා,තාක්ෂණ සේවා නිලධාරි ,අම්බලන්ගොඩ නගර සභාව**
මීට කලිනුත් මෙම ඉල්ලීම කරල තිබුණා.වොලි බෝල් පිටිය සකස් කරන්නත් එක්ක. අපි වොලිබෝල් පිටියට ඇස්තමේන්තුව හැදුවා.වොලි බෝල් පිටිය හැදෙනවනම් මීටර් 100 ධාවන පථය ඉබේම හැදෙනවා.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
වොලි බෝල් පිටිය සකස් කරන්න ලක්ෂ 10 ඇස්තමේන්තුව. ඒක මේ වෙලාවේ කරන්න අමාරුයි.මීටර් 100 ධාවන පථය හදල දෙන්න. පිට්ටනිය ශුද්ධ කරල පස් පුරවල හදන්න .

**එස්.කේ.පත්මසිරි මහතා ,ඩොල්ෆින් ක්‍රීඩා සමාජය, අම්බලන්ගොඩ.**
මමත් ඉල්ලීමක් කරන්න කැමතියි. 1926 පටන් ගත් නගර සභාවට අයත් මාදම්පා ගඟ පිහිණුම් පරිශ්‍රයේ තිබෙන නාන තොටුපොළ ප්‍රතිසංස්කරණය කරල දෙන්න කියල.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
රුහුණු සංචාරක කාර්යාංශය දැනුවත් කලොත් ඒ අය හදල දෙයි. තොටුපොල දැන් භාවිතයට ගන්නවද?

**එස්.කේ.පත්මසිරි මහතා ,ඩොල්ෆින් ක්‍රීඩා සමාජය, අම්බලන්ගොඩ.**
ඔව් සභාපතිතුමා අපි නානවා. මේක නගර සභාවේම තැනක් නිසා නගර සභාවම මැදිහත්වෙලා කරනවනම් හොඳයි.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
To මහත්තයා මේ ස්ථානය බලල අපට ඇස්තමේන්තුවක් ලබා දෙන්න.

**ඒ.ඩබ්ලිව්.ජගත් කුමාර මහතා ,ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගර සභාව.**
සභාපතිතුමනි, අපේ ගමේ අයට ක්‍රීඩා කරන්න අප්‍රෙල් මස 14,15,16,17 මානන පිට්ටනිය නොමිලේ වෙන් කරල දෙන්න කියල ඉල්ලීමක් කරනවා.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
අපි ලබා දෙන්නම්.

**ආර්.එම්.ආර්.නිරෝෂන මහතා,දිස්ත්‍රික් මළල ක්‍රීඩා පුහුණුකරු**
ඇවිදින මංතීරුවේ වැඩ දැන් අවසන් අපට එළිමහන් Gym එකක් හදන්න භූමිය ලබා දෙන්න පුළුවන්නම් අපි උපකරණ සොයා ගන්න බලන්නම්. ඒ වගේම අපේ නගරයට අත්‍යාවශ්‍යමයි Pool එකක් වෙනදා පිහිණුම් කිව්වාම නම කියවෙන්නේ අම්බලන්ගොඩ. නමුත් දැන් ඒ තත්වය වෙනස් වෙලා දිගින් දිගටම අපි අසාර්ථක වෙලා තියෙනවා. මීටර් 50 Pool එකකට ඉඩ ලබාදෙන්න පුළුවන්නම්,අපි ක්‍රීඩා අමාත්‍යාංශය එක්ක කථා කරල මුදල් වෙන් කර ගන්න බලන්නම්.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
Gym එකට අපි අවශ්‍ය බිම් ප්‍රමාණය ලබා දෙන්නම්. මම කළිනුත් කිව්ව වගේ මානාන පිට්ටනියේ Pool එක හදන්න ඉඩ දෙන්න පුළුවන්.

**එස්.කේ.පත්මසිරි මහතා ,ඩොල්ෆින් ක්‍රීඩා සමාජය, අම්බලන්ගොඩ.**
Pool එකට හොඳම තැන තමයි හල්වතුරේ නගර සභාවට අයත් ඉඩම් කොටස.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
අපි එතැනට අපේ වාහන ගෙනයන්න තමයි ඉන්නේ .අපි ඒ ගැන පසුව බලමු.

**ඩබ්ලිව්.කමල් ද සිල්වා මහතා,ගරු උපසභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
තල්ගස්ගොඩ පිට්ටනියත් හදන්න පටන්ගන්න පුළුවන්නම් හොඳයි.

**ආර්.එම්.ආර්.නිරෝෂන මහතා,දිස්ත්‍රික් මළල ක්‍රීඩා පුහුණුකරු**
පිට්ටනියේ හැඩය අනුව මම හිතන්නේ මීටර් 400 ට්‍රැක් එක හදන්න හොඳම තැන තමයි තල්ගස්ගොඩ.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
තල්ගස්ගොඩ පිට්ටනියේ මුලින් අඩියක් හරලා පස් තල්ලු කරන්න ඕනේ.ඒකට ඇස්තමේන්තුවක් දෙන්න.

**ඉඳුනිල් එදිරිවික්‍රමසූරිය මහතා,දකුණු පළාත් පා පන්දු පුහුණුකරු.**
සභාපතිතුමනි,නගර සභා පාපන්දු සංචිතයට අවශ්‍ය උපකරණ මිලදි ගැනීමට අදාළ ඇස්තමේන්තුව ගිය සභාවේ දී අනුමත වුනා.ඒ උපකරණ මිලදි ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
සැපයුම් නිලධාරි මගින් මිලදී ගන්න.

**ස්තුති කථාව**

**ස්තුති කථාව- ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

අද දින ක්‍රීඩා කමිටුව සඳහා සහභාගී වූ උප සභාපතිතුමාටත්, සියළුම නගර සභා මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලාටත්, විශේෂයෙන්ම පාසල් නියෝජනය කරමින් පැමිණි ආචර්ය මණ්ඩලයේ සියළු දෙනාටත් ,ක්‍රීඩා සමාජ නියෝජනය කරමින් පැමිණි සියළුම මහත්වරුන්ටත් නිලධාරි සියළු දෙනාටත් ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් දක්වන කැපවීම වෙනුවෙන් ස්තුතිය පුද කර සිටිමින් කමිටුවේ වැඩ අවසන් කරන ලදි.

සකස් කළේ,

.........................................
ප්‍රජා සංවර්ධන නිලධාරි,
නගර සභාව- අම්බලන්ගොඩ.

| | |
|---|---|
| ......................................... | ......................................... |
| ලේකම්, | සභාපති, |
| නගර සභාව- අම්බලන්ගොඩ. | නගර සභාව-අම්බලන්ගොඩ. |

**ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්**

මා ගිය සභාවේදි අප්‍රේල් මස 15 හා 16 වෙනිදින මානාන ක්‍රිඩාංගණය ඉල්ලා ඇත. ගමේ බක්මහ උළෙල පවැත්විමට.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

අපි ඔබතුමාගේ ඉල්ලිම ලබා දෙනවා. ඒ ඉල්ලා ඇති ඉල්ලිම ලබා දෙන්නේ ඔබතුමාගේ ඉල්ලිමට හානියක් නොවන පරිදි.

තීරණය -

2019.02.21 දින පැවැති ක්‍රීඩා කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**(07)** **ටෙන්ඩර් හා මිළ ගණන්**

**07:01 ටෙන්ඩර් :-**

**07:02 මිළ ගණන් :-**

07.02.01 අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය පරිගණක යන්ත්‍ර මිලදි ගැනීම

| ආයතනයේ නම | අයිතමය | එකක් තොගය |
|---|---|---|
| K.E Office Automation (PVT) Ltd | Dell Optiplee<br>Ups Dip 650 | රු.109500.00<br>රු. 3950.00 |

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය පරිගණක යන්ත්‍ර මිලදී ගැනීම සඳහා මිළ ගණන් ඉදිරිපත් කර තිබුණේ එක් ආයතනයක් බැවින් නැවත ටෙන්ඩර් කැඳවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ග්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව මේ සඳහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

07.02.02 අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය ඡායා පිටපත් යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා මිළ ගණන්

| ආයතනයේ නම | අයිතමය | එකක් තොගය |
|---|---|---|
| K.E Office Automation (PVT) Ltd | Tk 2200<br>Tk 2201 | රු.115950.00<br>රු.160950.00 |
| Gestener of Ceylon PLC | Sp MP 2501<br>Sp MP 2555<br>Sp MP 3525 | රු.317400.00<br>රු.383755.00<br>රු.553380.00 |
| Metropolitan offline (PVT) LTD | 3245 Rimex<br>iR | රු.390000.00<br>රු.495000.00 |

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය පරිගණක යන්ත්‍ර මිලදී ගැනීම සඳහා මිළ ගණන් ඉදිරිපත් කර තිබුණේ එක් ආයතනයක් බැවින් නැවත ටෙන්ඩර් කැඳවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ග්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව මේ සඳහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

7.03 ට්‍රැක්ටර් ටේලරය සඳහා මිළ ගණන් ඉදිරිපත් කිරිම සභාව විසින් ප්‍රතික්ෂේප කරන ලදී

<u>ගරු නගර සභා මන්ත්‍රි ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>

අපේ ට්‍රැක්ටර් ටේලරයක ටෙන්ඩරයක් දමා තිබෙනවා. මා දන්නේ නැහැ මෙහි විස්තර නිලධාරින්ට ලැබී තිබෙනවාද කියා. ප්‍රශ්නය තිබෙන්නේ ට්‍රෙලරයේ යකඩ පිළිබඳ මුකුත් නැහැ. ඝනකම කොහොමද , තහඩු මොනවාද, තහඩු වර්ගය මොනවාද ? ඕන ට්‍රෙලරයක් ගසා එවිය හැකියි. එහෙම එකක්ද කියා මා දන්නේ නැහැ. මේ යකට තහඩුවෙන් , මේ වර්ගයෙන් , මෙම ඝනකමින් මෙම ට්‍රෙලරය නගර සභාවට සාදා එවිය යුතුයි කියා. මෙහි එහෙම සඳහනක් නැහැ. මෙය එහෙම වෙන්න බැහැනේ මෙය වැරදියි. ටෙන්ඩරය භාර දෙන්න කලින් මෙය සොයා බැලිය යුතුයි.

<u>ගරු නගර සභා මන්ත්‍රි ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>

ඔබතුමාලා කොහොමද? ටෙන්ඩරයක් කැඳ වන්නේ. ඝනකම කියද , තහඩු වර්ගය මොනවාද ? එහි වටේ යන පටිය කොහොමද? ඒවා දන්නේ නැතිව කොහොමද ටෙන්ඩරය කැඳවන්නේ. එහි දිග පළල උස පමණයි යවා තිබුණේ. ගරු නගර සභා මන්ත්‍රි සරත් ශ්‍රිලාල් මහතා කතා කළ සිද්ධියටයි මා කතා කරන්නේ. ටෙන්ඩර් එක ලැබුණු පසු බලන්නම්. මිළ ගණන් කැඳවන්න එපා. අපි අත්සන් කරන්නේ නැහැ.

ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්

ගරු මන්ත්‍රීතුමා නගර සභාවට අත්‍යවශ්‍යතාවයක් තිබෙනවා මෙම ට්‍රෙලර් එක. එහෙත් ඔබතුමාලා කරන්න කැමති වර්ගය , සනකම ආදි විස්තර වලට අනුව මෙය සිදු කිරිමට මෙම ටෙන්ඩර්කරු කැමති නම් ඔබතුමාලාට මේ සඳහා නිර්දේශ දි තිබෙනවා නම් අනුමතිය ලබා දෙන්නම්. මේ සභාවේ අවශ්‍යතාවය මත.

මෙම මිළ ගණන් සභාව විසින් ප්‍රතික්ෂේප කරන ලදී.

**(08)** ගෙවීම්

08.01 ත්‍රිවිල් බලපත්‍ර සඳහා අදාල ස්ටිකර් මුද්‍රණය කිරිම වෙනුවෙන් රු13125/= ක මුදලක් සඳහා ඩබ්.ඩී.ජේ. සෝමරත්න කොමර්ෂල් බද්දේගම වෙත සභා අනුමතියට යටත්ව ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.02 කැනපි රෙදි මැසිම වෙනුවෙන් රු.105000/= ක මුදලක් කේ.කේ. ක්‍රිෂාන්ත මහතා ( පුන්සිල කුෂන් වර්ක්ස් ) ලේකම්ගේ නිර්දේශය පරිදි සභා අනුමතියට යටත්ව ගෙවීම සම්බන්ධයෙන් සභා අනුමතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.03 කාර්යාලයට අවශ්‍ය ලී උපකරණ හා කබඩ් ලබා ගැනීම වෙනුවෙන් රු.182800/= = ක මුදලක් සමගි ලි බඩු වෙළඳ සැල වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි සභා අනුමතියට යටත්ව ගෙවීම සම්බන්ධයෙන් අනුමතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.04 මානාන ක්‍රීඩාංගනය සඳහා රතුපස් කියුබ් 10ක් සැපයීම වෙනුවෙන් රු.27000/= ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි සභා අනුමතියට යටත්ව පී.එච්.සී. ගොඩනැඟිලි ද්‍රව්‍ය සපයන්නෝ වෙත ගෙවීම සම්බන්ධයෙන් සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.05 අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය විදුලි උපාංග ලබා දිම වෙනුවෙන් රු.33345/= ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි සභා අනුමතියට යටත්ව ශෂි ඉලෙක්ට්‍රික්ට්‍රෝනික් ඇන්ඩ් ඉලෙක්ට්‍රිකල් වෙත ගෙවීම සම්බන්ධයෙන් සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.06 ගබඩාව සඳහා අවශ්‍ය ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් රු.72500/= ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි සභා අනුමතියට යටත්ව රජයේ මුද්‍රණ නිතිගත සංස්ථාව වෙත ගෙවීම සම්බන්ධයෙන් සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.07 මාර්ග තලනයට අවශ්‍ය සඳහා ඇම්පියර් 90 බැටරි 02ක් මිලදී ගැනීම වෙනුවෙන් රු.37040/= ක මුදලක් ජයසිංහ බැටරි සෙන්ටර් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි සහා අනුමතියට යටත්ව ගෙවීම වෙනුවෙන් සහා අනුමතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.08 මාර්ග සංවර්ධනය සඳහා ගල් ගෙන එම වෙනුවෙන් රු.218200/= ක මුදලක් පී.එච්.සී. ද සිල්වා වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි සහා අනුමතියට යටත්ව ගෙවීම වෙනුවෙන් සහා අනුමතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.09 මුද්දර ගාස්තු වලට අදාල මුද්දර උපලේඛන සකස් කිරිම වෙනුවෙන් කාර්ය මණ්ඩල දිමනා වශයෙන් රු.32200/= ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි සහා අනුමතියට යටත්ව ගෙවීම සම්බන්ධයෙන් සහා අනුමතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.10 ප්‍රධාන දුම්රිය ගණකාධිකාරි වෙත 2018 සැප්තැම්බර් මස දුම්රිය බිල්පත් නිරවුල් කිරිම වෙනුවෙන් රු.14675= ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි සහා අනුමතියට යටත්ව ගෙවීම වෙනුවෙන් සහා අනුමතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.11 ප්‍රධාන දුම්රිය ගණකාධිකාරි වෙත 2018 ජුලි මස දුම්රිය බිල්පත් නිරවුල් කිරිම වෙනුවෙන් රු.33110= ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි සහා අනුමතියට යටත්ව ගෙවීම වෙනුවෙන් සහා අනුමතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.12 ප්‍රධාන දුම්රිය ගණකාධිකාරි වෙත 2018 ජුනි මස දුම්රිය බිල්පත් නිරවුල් කිරිම වෙනුවෙන් රු.20590= ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි සහා අනුමතියට යටත්ව ගෙවීම සම්බන්ධයෙන් සහා අනුමතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.13 2019 ජනවාරි මස පුස්තකාල සඳහා පුවත්පත් ලබා ගැනිම සඳහා රු.49020/= ක මුදලක් ලේකම්ගේ නිර්දේශය අනුව එම්.එස් වීරසිංහ මහතාට ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.14 ඉඩම් අංක 3310 නඩුව සඳහා නගර සභාව වෙනුවෙන් පහත දිනයන්හි පෙනි සිටිම වෙනුවෙන් සහා අනුමතියට යටත්ව ගෙවන ලද නඩු ගාස්තු රු.50000/= සඳහා සහා අනුමතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

දින

| | | | |
|---|---|---|---|
| 2016.03.01 | 2016.06.28 | 2016.11.15 | 2016.03.21 |
| 2017.06.20 | 2017.03.21 | 2017.10.19 | 2018.03.08 |

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මෙය ඇත්තටම ඉඩම් නඩුවක් නෙමේ. එම ගමේ ජනතාවගේ ඉල්ලීම පරිදි අප මෙය කොන්ක්‍රීට් කරන ලදී.එම කොන්ක්‍රීට් කිරිමේදි ඒ අයගෙන් දශම ගණනක් අල්ලා කොන්ක්‍රීට් කර ඇති බවට තමයි මෙම නඩුව දමා ඇත්තේ.අපේ නිලධාරින්ට මෙම නඩුව දමා ඇත. ඉතිං මෙය මහ හරින්න බැහැ .

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මෙය සමාදාන වෙන්න බැරිද ? අපි වැරදියිනේ.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ගරු නගර සභා මන්ත්‍රී ලක්ෂ්මී මන්ත්‍රීතුමියනි , මේ ගැන පොඩ්ඩක් කතා කරන්න බැරිද ? දැන් මේ නඩුව අවසන් වී මට නඩු තින්දුව පමණයි දිමට ඇත්තේ.

08.15 Mazda Hardware and power tools වෙත ගලිරථයේ හොස් එක සඳහා ගෙවීම වෙනුවෙන් රු.142600= ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි සභා අනුමතියට යටත්ව ගෙවීම සම්බන්ධයෙන් සභා අනුමතිය ලබා දිම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මෙය රු.142600/= ක මුදලක්. මේ අයගෙන් විතර ද මිළ ගණන් කැඳවා ඇත්තේ. 08.17 තිබෙන්නෙත් එකම තමයි.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

08.17 තිබෙන්නේ ජල බවුසරයේ හොස් එකයි.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**

මේ දෙකම ලබා ගෙන ඇත්තේ එකම ආයතනයෙනි. හොස් හදන ඕනතරම් තැන් තියෙනවා. මෙවාගේ එකතැනකින් විතරක් මිළ ගණන් ගත්තාම ඔවුන් දෙනු ලබන මිළ ගණන් ගෙවීමට සිදු වෙනවා. මෙහි මුදල වැඩියි . මෙය ප්‍රශ්නයකි.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මෙය ටෙන්ඩර් කමිටුව විසින් ගනු ලැබු තින්දුවකි.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

හරි මේ සඳහා මිළ ගණන් 3 ක් තිබෙනවාද කියා බලන්න. තව ආයතන තියෙනවා මිළ ගණන් කැඳවන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ සඳහා අපි මිළ ගණන් 3 ක් අපි සභාව පිළිගෙන තිබෙනවා. මේ අරගෙන ගෙවීම් කරන එක්ක තමයි මේ තියෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මෙය වරදක් නැහැ .

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නැහැ වරදක් නැහැ. ඉදිරිපත් වූ දෙයට මේ කියන්නේ.

08.16 2019.01.01දින සිට 2019.01.31 දක්වා ආරක්ෂක සේවාව සැපයීම වෙනුවෙන් ලේකම්ගේ නිර්දේශය අනුව රු.277707.43/ = ක මුදලක් LRDC Services (PVT)LTD ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.17 Mazda Hardware and power tools වෙත ජල බවුසරයේ හොස් එක සඳහා ගෙවීම වෙනුවෙන් රු.27000= ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි සභා අනුමතියට යටත්ව ගෙවීම සම්බන්ධයෙන් සභා අනුමතිය ලබාදිම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.18 පරිඝණක සඳහා නව H61Mother Board .Cpu Cooler Fan එකක් සවි කර අලුත්වැඩියා කිරිම වෙනුවෙන් රු.10250/= ක මුදලක් Tulip Computers වෙත ගෙවීම සම්බන්ධයෙන් සභා අනුමතිය ලබාදිම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.19 Lanka Technology Appliances (PVT) LTD වෙත මුද්‍රණ යන්ත්‍රය සඳහා Toner ලබා ගැනීම වෙනුවෙන් රු.21850/= ක මුදලක් ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.20 ශෂි ඉලෙක්ට්‍රිකල් වෙත ක්‍රිඩා මණ්ඩපය වයරින් කිරිම සඳහා අවශ්‍ය විදුලි උපකරණ වෙනුවෙන් රු.54790/= ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීමට සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රිනි ඊ. අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.21 එස්.එච්.එන්.ඒ. එස්. ද සිල්වා වෙත අදාහානාගාරය වෙත ගෑස් ලබා ගැනීම වෙනුවෙන් රු.48400/= ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රිනි ඊ. අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.22 හල්වතුර කසල බැහැරලන ඒකකයේ කසල තුනිකිරීම වෙනුවෙන් රු.497000/= ක මුදලක් පී.එච්.සී.සී. ද සිල්වා මහතා වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි සහා අනුමතියට යටත්ව ගෙවීම සම්බන්ධයෙන් සහා අනුමතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි , මෙම 08.22

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ඔබතුමා හැමදාම විරුද්ධ වෙන එකක්. චම් මහතාගේ විරුද්ධ වෙන එක

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, ගරු නගර සභා මන්ත්‍රී කෙනෙක් ප්‍රශ්නයක් ඇහුවාම සමාච්චලයට ලක් කරන්න එපා ප්‍රශ්නයක් ඇසුවිට . මෙතැන රු.497000/= ක ගෙවීමකි. ගිලිනුත් මේ පිළිබඳව කතා කළා. මෙම මුදල ගෙවනු ලබන්නේ කසළ තුනි කරනු ලබන යන්ත්‍රයටයි. එවිට රු.497000/= ක මුදලක් කියන්නේ පොඩි මුදලක් නෙමේ. එතුමා කියන එකේ අර්ථයක් තිබෙනවා. අපි මීට ඉහතදිත් සභාවලදී කතා කළා මෙම යන්ත්‍රයක් මිලදී ගැනිමට. මෙච්චර මුදලක් යන්නේ නැතිව ඇති ලිසිං එක ගෙවිමට.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ගරු මන්ත්‍රිතුමා, මිට ඉහත සභා වාර කිහිපයකදිම සාකච්ඡා කර තිබෙනවා. අපි දන්නවා මෙම කොන්ත්‍රාත්කරුවන් පවිච්චි කරන්නේ නැවත අළුත්වැඩියා කරන ලද වාහන තමයි මෙහි දුවන්නේ

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>

රු.10000000/= වුණත් බලන්න. මෙතැනම දැන් රු.497000/= ක් කියන්නේ රු.500000/= වෙනවා එම වාහනයක් අපට රු.1500000/= ක් 2000000/= වන විට ගැනීමට පුළුවනි. අපි වසරක් ඇතුලත මේ වගේ ගෙවීම් කරනවා. අපි ගරු දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යතුමාගෙනුත් මේ සඳහා අනුමතිය ඉල්ලා සිටියා. එහෙත් කිසිම දිනක පළාත් පාලන අනුමතිය දෙපාර්තමේන්තුවෙන් ලැබි නැත. අලුත් වාහනයක් රු.10000000/= පමණ වෙනවා. ඔක තමයි තත්වය.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

අපි මෙය ගෙවනවාට විරුද්ධ නැහැ. වැඩ ගත්තානම් මෙම මුදල ගෙවිය යුතුයි. මෙහි මුලින් වැඩ කරපු වේලාවේ මුලින්ම මැෂන් එකේ වේලාව වැඩ කළේ නැහැ. එවිට දින ගණනක් වැඩ කර තිබෙනවා එම මීටරය නැතිව. එය තක්සේරු කළේ කොහොමද ? එම ගෙවිම කළේ කොහොමද කියන එකයි අපට තියෙන ගැටළුව. මා විමසා සිටින්නේ එයයි.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා</u>

ගරු සභාපතිතුමනි, ලක්ෂ 100 ක් වනවා නම් මා යෝජනා කර සිටිනවා මෙම යන්ත්‍රය ලංකාවට ගෙන්වන ආයතන වලින් මිළ ගණන් ලබා ගෙන සභාවට ඉදිරිපත් කරන්න. අප ගරු නගර සභා මන්ත්‍රිවරු සියළුදෙනාම එකඟ වෙයි. සභාවේ මුදල් යොදා මෙම යන්ත්‍රය ලබ ගැනිමට. එවිට වසරකට රු.6000000/= ක් විතර යනවා. වසර 1 ½ යනවිට මෙම ලිසිං එක අවසන් වෙයි. එවිට මෙය සභාවට අයිති වෙනවා. එවිට මෙහෙම කාටවත් ගෙවන්න ඕන වෙන්නේ නැහැ. එය සභාවේ දේපලක් වෙනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි සියළු දෙනාම ස්ථිර කර මෙම යෝජනාව කර තිබෙනවා.සභාව සඳහා මෙම යන්ත්‍රයක් මිලදී ගැනිමට. අපිට අනුමතිය ලබා දී නැහැ. මේ සඳහා පළාත් සභාවෙන් අනුමතිය අවශ්‍යයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා</u>**

අපි මේ සදහා අලුත් එකක් මිලදී ගන්න. අලුත් එකක් ගන්න විට විරුද්ධ වෙන්න බැහැනේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගරු මන්ත්‍රීතුමා, මේ සඳහා අලුත් එකක් ගන්න එක තේරුමක් නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මෙය නිතරම වැඩ කරන්නේ නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි වැඩ කරන්නේ වැඩිම වුණොත් මාස 5කට 6කට විතර පස්සේ. වසරකට දෙපාරක් විතර.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

පාවිච්චි කරන යන්ත්‍රයකට ලිපිය සකස් කර ලබා දෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා</u>**

මෙහෙම මුදලක් ගෙවන එක අපරාදයක්. මේ නගරයේ මුදල් නාස්ති කරන්නේ. අපි යෝජනා කරනවා අළුත් එකක් හරි පාවිච්චි කරන ලද යන්ත්‍රයක් හරි ගන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතාට එම වගගිම භාර දෙන්නම්. දැන් කවුරුහරි ගරු මන්ත්‍රීවරයෙක් යෝජනා කරන්න මෙම යන්ත්‍රයක් මිලදී ගැනිමට.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා</u>**

මා යෝජනා කළා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ  මහතා කතා කරමින්</u>**

එම යෝජනාව මා ස්ථිර කර සිටිනවා. අපි මේ සභාව භාර ගන්නා අවස්ථාවේ රු.1300000/= පමණ බිලක් පැමිණ තිබුණා. මෙම කසළ තල්ලු කිරීම සඳහා. අපි මේ ගරු සභාවේ කතා කර පළාත් පාලන කොමසාරිස්තුමට ම ගෙවන්න කියා යැව්වා. දැන් මෙය රු.497000/= ක මුදලක බිලක් ලැබී තිබෙනවා. ගරු සභාපතිතුමා මේ සඳහා පුද්ගලයකු යොදවා තිබුණා. සමාන්‍යයෙන් ඔරලෝසු පැය වැඩ කරන විට අපිට වාසියක් තිබෙනවා. මෙම යන්ත්‍ර සූත්‍ර වල. සාමාන්‍යයෙන් විනාඩි 53 ක් යනවිට මැෂින් පැය වැටේ. ඔරලෝසු පැය වැඩ කරන විට අපිට වාසියි. එයින් සිදුවන්නේ ටෙන්ඩර් කළ පුද්ගලයාට වාසි වන එක පමණයි. පැය 8ක් විතර වැඩ කර පැය භාගයක් විතර නිකම්ම යනවා. නමුත් ඔරලෝසු පැය වැඩ කරන විට විනාඩි 60 ම ගෙවනවා.මේ පිළිබඳ කාර්මික නිලධාරි මහතාගෙන් විමසන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

දැන් මෙය දින 3ක් විතර යනතුරු මෙය කැඩී තමයි තිබ් ඇත්තේ. ඊට පසු තමයි මෙම නිලධාරියා දමනු ලබන්නේ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

මා ඒ පිළිබඳව දැනගෙන හිටියේ නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

අපිටත් මේ එක එක්කෙනා කියන දේවල් . මෙම ගෙවීම නිත්‍යානුකූල විදියට යා යුතුයි. මෙහි නිලධාරිත් අපි ආරක්ෂා කළ යුතුයි.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

මැෂින් පැය දමා කරන විට අයිතිකරුට වාසියි. එහෙම මීටර් පැය වැටෙනවා නේද ? එම නිසා ඔරලෝසු පැය වැඩ කරන එක ලභායි අපිට.මීට කලින් අපි රු.1300000/= පමණ බිලක් පැමිණ තිබුණා. විස්කම් එකට ගෙවන්න තිබුණා. අපි එය හරවා යවනු ලැබුවා. දැන් එය රු.497000/= ක මුදලකට අඩු කර ගෙන තිබෙනවා. ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා දැන් ඒ ගැන සතුටු වෙන්න ඕන. දැන් මේ එම කාර්යයම කළා. සභාව දැන් ගොඩක් වාසියක් ලබා ගෙන තිබෙනවා. දැන් මේ පහර ගැසිම හොඳයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

නැහැ පහර ගැසිමක් නෙමේ. ඔබතුමා වැරදි විදියට අර්ත කථනය කරන්න එපා. අපි යම් ප්‍රශ්නයක් විමසා සිටින්නේ යම්කිසි හේතුවක් නිසා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ගරු උපසභාපතිතුමා ඉදිරිපත් කළ ආකාරයට පැය ගණන වැඩ කරන එක හොඳයි. නගර සභාවට ලභායි. නමුත් පැය ගණන වැඩ කළාද කියා කවුද දන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ සඳහා අපි වැඩ පරිපාලක මහතෙකු යොදවා තිබුණා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ඔහු පැය 8ම ඕතන සිටියාද කියා කවුද දන්නේ. පැය 8 ම වැඩ කළාද කියා කවුද දන්නේ. පැය 8 ම වැඩ කළ බව දැනගත හැකියි වැඩ පරිපාලක කෙනෙකු යෙදෙව්ව නිසා. ඊට කලින් මෙය සිදු කර තිබෙනවා. මෙම ප්‍රශ්නය ඇති වූ අවස්ථාවේ තමයි ඒ සඳහා යොමු කර ඇත්තේ. දින 2ක 3 ක් වැඩ කර ඇත්තේ මීටර් කටුව නැතිව. වැඩ පරික්ෂක මහතා යොදවනු ලැබුවේ ඊට පසුවයි. එක තමයි ඇත්ත කතාව. ඒ පිළිබඳව තමයි ගරු නගර සභා මන්ත්‍රී රාහුල මහතා ඉදිරිපත් කරන ලද්දේ. වැඩ පරික්ෂක මහතා පැය 8 ම සිටිනවාද බලන්න තවත් වැඩ පරිපාලක කෙනෙකු යෙදවිය යුතුයි. නමුත් මීටරය ඇත්නම් කවුරුත් අවශ්‍ය නැහැ. මීටරය වැඩ කරලා නම් වැඩ කරලා නේ. දිවා ආහාරයහට නැවැත්වුවත් මීටරය නවතිනවා. වැඩ කළොත් මීටරය වැඩ. මීටරයෙන් අයින් වෙන්න එපා. දෙවැනි කාරණය මා ගරු දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යවරයාට ලිපියක් ඉදිරිපත් කළා මෙම යන්ත්‍රයක් ලබා දෙන්න කියා.අපගේ උනන්දුවක් එකමුතුකමක් නොමැති නිසා තමයි අදටත් අපට මෙම යන්ත්‍රය නොලැබ් තිබෙන්නේ.ඔබතුමාඋපදෙස් දි තිබෙන්නේ මාස 3කට සැරයක් මෙම කුණු තුනි කළාම ඇති කියා. ඉතාමත්ම කනගාටු වෙනවා. මෙම තින්දුව ගැනිමට උසාවි ගිය පුද්ගලයා විදියට මා කනගාටු වෙනවා. මෙම ස්ථානයේ කුණු දැම්මට අවසර දි තිබෙන්නේ ටික කාලයකට. එම ප්‍ර දේශයේ ජිවත්වන පුද්ගලයන් පිඩා විදිනවා මේ නිසා. ඇළ දුෂණය වෙනවා මේ නිසා.පුරුද්දක් ලෙස මාස 3 කට සැරයක් කසළ තුනි කළාට පරිසර අමාත්‍යාංශයෙන් මේ සඳහා අනුමතිය දි ඇත්තේ කසළ දමන විටම තුනි කිරිම සඳහායි. එම නිසා යන්ත්‍රයක් තිබිම අපිට අත්‍යවශ්‍යායි.එය දමා

වැසිය යුතුයි. එවිට තමයි මැසි මදුරු කැළි කසළ ප්‍රශ්නය අවම වෙන්නේ. 100% ම නිවැරදි වෙන්නෙත් නැහැ.එවිට තමයි ඇළ දූෂණය වන එක නවතින්නේ. එම නිසා මෙම යන්ත්‍රයක අවශ්‍යතාවය දැඩිලෙස තිබෙනවා. එම නිසා තමයි මෙම යෝජනාව ගරු ප්‍රධාන අමාත්‍යතුමාට යොමු කරනු ලැබුවේ. මා ඉල්ලා සිටිනවා ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා නියෝජනය කරනවා ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ පක්ෂය එතුමා සමඟ සාකච්ඡාවක් පවත්වා ගරු සභාවේ සියළු මන්ත්‍රීවරුන්ට ගරු ප්‍රධාන අමාත්‍යතුමා සමඟ සාකච්ඡාවක් ලබා දෙන්න. අපිට සභාවේ විශාල සංඛ්‍යාවක් ප්‍රශ්න තිබෙනවා සකච්ජා කරන්න. එම නිසා මා ඉල්ලීමක් කරනවා පක්ෂ විපක්ෂ භේදයකින් තොරව ගරු ප්‍රධාන අමාත්‍යතුමා මූණ ගැසි සාකච්ජාවක් පවත්වා මෙම ප්‍රශ්නයට විසඳුමක් ලබා ගන්නා ලෙස.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම් නිලානි මෙනවිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි,ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් මහතාගේ යෝජනාව සම්බන්ධයෙන් මා ස්තුතිවන්ත වෙනවා.ගරු දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යතුමා සමඟ ඔබතුමාත් සභාවේ ගරු මන්ත්‍රීතුමන්ලා සියළු දෙනා සමඟ නගරයේ තිබෙන සියළු ප්‍රශ්න සම්බන්ධව සාකච්චා කිරිම කලෝචිත යෝජනවාකි. අම්බලන්ගොඩ නගර සභාව සම්බන්ධයෙන් යම්කිසි ප්‍රශ්න තිබෙනවානම් සාකච්ජාවක් කර ඉක්මනින් විසදිමට සියළුම දෙනගේ සහායෝගය ලබා ගැනීමට කටයුතු ලබා ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ජී. නිලානි මෙනවිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් මහතා, ගරු නගර සභා මන්ත්‍රී නිලානි මෙනවිය ප්‍රකාශ කළ ආකාරයට අපගේ ගරු සංවිධායකතුමා ගරු ෂාන් විජයලාල් ද සිල්වා මැතිතුමා , ගරු ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමා ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා හා ගරු මන්ත්‍රිවරු සියළු දෙනා සමඟ සාකච්ජාවක් පවත්වා මේ නගරය වෙනුවෙන් යම් දෙයක් කිරිමට තමයි මේ ජනතාව අප පත්කර එවා ඇත්තේ. එම නිසා නගරයට දෙයක් කිරිමට කතිකාවක් ඇති කර ගැනීමට ඒ සම්බන්ධව ලේකම්තුමිය මඟින් ලිඛිතව දිනයක් වේලාවක් ඉල්ලිමක් කරන්න. එම නිසා අපට තිබෙන ගැටළු සම්බන්ධව එහිදි විසඳා ගැනිමට හැකිවෙනවා. ඒ සඳහා මාත් ඉල්ලිමක් කර සිටිනවා ලේකම්තුමිය මඟින් ඉල්ලිමක් කර තිබෙනවා. පළාත් සභා විසිරිමට කලින් ඉතා ඉක්මනින් දිනයක් ලබා දෙන්න. ගරු ප්‍රධාන අමාත්‍යතුමා හා ගරු මන්ත්‍රිවරු 20 සමඟ සාකච්ජාවක් නගරයේ සංවර්ධනය වෙනුවෙන් සාකච්ජාවක් ලබාදෙන ලෙස ඉල්ලා සිටිනවා.

08.23 පී පාට කොඩි 100 සඳහා නගර සභා පොදු ලංජනය මුද්‍රණය කිරිම වෙනුවෙන් එච්.එම්.ඩී. ද සොයිසා මහතාට රු.15000/=ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි සභා අනුමතියට යටත්ව ගෙවිම සම්බන්ධයෙන් සභා අනුමතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.24 සුදුවැල්ල පාර අළුත්වැඩියා කිරීම වෙනුවෙන් තල්ගස්ගොඩ ග්‍රාම සංවර්ධන සමිතිය වෙත රු.999420.84ක මුදලක් දිස්ත්‍රික් ඉංජිනේරුතුමාගේ අනුමතිය ලබා ගැනීමෙන් පසු ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.25 පී.එච්.සී.සී. ද සිල්වා මහතා වෙත මාර්ග ප්‍රතිසංස්කරණය සඳහා අවශ්‍ය ගල් ලබා දිම වෙනුවෙන් රු.190000/= ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවිම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**(09)** ගිණුම්

**09.01** 2019 ජනවාරි මාසයට අදාළ පොදු ගිණුම් - වියදම් විශ්ලේෂණය හා 2019 ජනවාරි මාස වියදම් වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය .

**(10)** ඇස්තමේන්තු

**10.01 කරිත්තකන්ද වසමේ පිරිස් වෙද මාවත සහ කුලරත්න පාර යාකරන හරස් පාර , නවාරා , පුද්ගලික පංතිය අසලින් උතුරට අංක8/සී/1 කොඩිකාර මහතාගේ නිවසට යන මාර්ගය සකස් කිරීම සඳහා තාක්ෂණසේවා නිළධාරි විසින් පිළියෙල කරන ලද රු.500000/= ක ඇස්තමේන්තුව සභා ගත කරන ලදී.**

**තීරණය**

කරිත්තකන්ද වසමේ පිරිස් වෙද මාවත සහ කුලරත්න පාර යාකරන හරස් පාර , නවාරා , පුද්ගලික පංතිය අසලින් උතුරට අංක8/සී/1 කොඩිකාර මහතාගේ නිවසට යන මාර්ගය සකස් කිරීම සඳහා පිළියෙල කරන ලද රු.500000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් , මෙම මුදල සභා අරමුදලින් ගෙවීමට සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ජී. සරත් ශ්‍රී ලාල් මහතාගේ විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

**10.02 අම්බලන්ගොඩ හෙප්පුමුල්ල අයිඩියල් සිටි මාර්ගය තාර දැමීමේ කර්මාන්තය සඳහා තාක්ෂණසේවා නිළධාරි විසින් පිළියෙල කරන ලද රු.1,000,000/= ක ඇස්තමේන්තුව සභා ගත කරන ලදී.**

තීරණය :-

අම්බලන්ගොඩ හෙප්පුමුල්ල අයිඩියල් සිටි මාර්ගය තාර දැමීමේ කර්මාන්තය සඳහා රු.1,000,000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් , මෙම මුදල සභා අරමුදලින් ගෙවීමට සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ජී. සරත් ශ්‍රී ලාල් මහතාගේ විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

**10.03 අම්බලන්ගොඩ පනියන්දුව අතුරු මාර්ගය ( කරුණාසේන මහතාගේ නිවසට යන මාර්ගය ) ගල් ඇල්ලිම සඳහා තාක්ෂණසේවා නිළධාරි විසින් පිළියෙල කරන ලද රු.500000/= ක ඇස්තමේන්තුව සභා ගත කරන ලදී.**

තීරණය:-

අම්බලන්ගොඩ පනියන්දුව අතුරු මාර්ගය ( කරුණාසේන මහතාගේ නිවසට යන මාර්ගය ) ගල් ඇල්ලිම සඳහා රු.500000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් , මෙම මුදල සභා අරමුදලින් ගෙවීමට සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ඒ.ඩබ්. ජගත්කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

**10.04 අම්බලන්ගොඩ ධම්මකුසල මාවතේ (ඒ.ජී.අයි. ද සිල්වා මහාතාගේ නිවස අසල) කාණුව ඉදිකිරීමේ කර්මාන්තය සඳහා තාක්ෂණසේවා නිළධාරි විසින් පිළියෙල කරන ලද රු.500000/= ක ඇස්තමේන්තුව සභා ගත කරන ලදී.**

තීරණය

අම්බලන්ගොඩ ධම්මකුසල මාවතේ (ඒ.ජී.අයි. ද සිල්වා මහාතාගේ නිවස අසල) කාණුව ඉදිකිරීමේ කර්මාන්තය සඳහා රු.500000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් , මෙම මුදල සභා අරමුදලින් ගෙවීමට සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ඒ.ඩබ්. ජගත්කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

**10.05 අම්බලන්ගොඩ එඬේරමුල්ල වටරවුම් පාර සපත්තු කාණුව ඉදිකිරීමේ කර්මාන්තය සඳහා තාක්ෂණසේවා නිළධාරි විසින් පිළියෙල කරන ලද රු.500000/= ක ඇස්තමේන්තුව සභා ගත කරන ලදී.**

**තීරණය :-**

අම්බලන්ගොඩ එඬේරමුල්ල වටරවුම් පාර සපත්තු කාණුව ඉදිකිරීමේ කර්මාන්තය සඳහා රු.500000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් , මෙම මුදල සභා අරමුදලින් ගෙවීමට සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ඒ.ඩබ්. ජගත්කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

**10.06 අම්බලන්ගොඩ , මහ අම්බලන්ගොඩ අතුරු මාර්ගය ( ජල සම්බන්ධය ලබා ගැනීමට කැනීම් කළ පාර ) ඉදිකිරීමේ කර්මාන්තය සඳහා තාක්ෂණසේවා නිළධාරි විසින් පිළියෙල කරන ලද රු.500000/= ක ඇස්තමේන්තුව සභා ගත කරන ලදී.**

**තීරණය:-**

අම්බලන්ගොඩ , මහ අම්බලන්ගොඩ අතුරු මාර්ගය ( ජල සම්බන්ධය ලබා ගැනීමට කැනීම් කළ පාර ) ඉදිකිරීමේ කර්මාන්තය සඳහා රු.500000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත්, මෙම මුදල සභා අරමුදලින් ගෙවීමට සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රිනි ඒ.පී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

**10.07 සුදුවැල්ල දෙවන අතුරු මාර්ගය කොන්ක්‍රිට් කිරිමේ කර්මාන්තය සඳහා තාක්ෂණසේවා නිළධාරි විසින් පිළියෙල කරන ලද රු.500000/= ක ඇස්තමේන්තුව සභා ගත කරන ලදී.**

**තීරණය :-**

සුදුවැල්ල දෙවන අතුරු මාර්ගය කොන්ක්‍රිට් කිරිමේ කර්මාන්තය සඳහා රු.500000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් , මෙම මුදල සභා අරමුදලින් ගෙවීමට සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

**10.08 සුදුවැල්ල පෙර පාසලේ සිවිලිම සහා අරමුදලින් සිදු කිරිම සඳහා තාක්ෂණසේවා නිළධාරි විසින් පිළියෙල කරන ලද රු.300000/= ක ඇස්තමේන්තුව සභා ගත කරන ලදී.**

**තීරණය:-**

සුදුවැල්ල පෙර පාසලේ සිවිලිම සහා අරමුදලින් සිදු කිරිම සඳහා රු.300000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් , මෙම මුදල සභා අරමුදලින් ගෙවීමට සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

**10.09 අම්බලන්ගොඩ එල්. සී. ද සිල්වා මාවතේ කාණුවේ කොටසක් ඉදිකිරීම සඳහා තාක්ෂණසේවා නිළධාරි විසින් පිළියෙල කරන ලද රු.400000/= ක ඇස්තමේන්තුව සභා ගත කරන ලදී.**

**තීරණය:-**

අම්බලන්ගොඩ එල්. සී. ද සිල්වා මාවතේ කාණුවේ කොටසක් ඉදිකිරීම සඳහා රු.400000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් , මෙම මුදල සභා අරමුදලින් ගෙවීමට සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

**10.10 පින්නදූව 4 වන හරස් පාර තාර දැමීම සඳහා තාක්ෂණසේවා නිළධාරි විසින් පිළියෙල කරන ලද රු.440000/= ක ඇස්තමේන්තුව සභා ගත කරන ලදී.**

**තීරණය :-**

පින්නදූව 4 වන හරස් පාර තාර දැමීමේ රු.440000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් , මෙම මුදල සභා අරමුදලින් ගෙවීමට සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු ගරු නගර සභා මන්ත්‍රි ග්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

**10.11 අම්බලන්ගොඩ කෙරමිණිය දූව වත්ත පාර තාර දැමීම සඳහා තාක්ෂණසේවා නිළධාරි විසින් පිළියෙල කරන ලද රු.400000/= ක ඇස්තමේන්තුව සභා ගත කරන ලදී.**

**තීරණය :-**

අම්බලන්ගොඩ කෙරමිණිය දූව වත්ත පාර තාර දැමීමේ රු.400000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් , මෙම මුදල සභා අරමුදලින් ගෙවීමට සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු ගරු නගර සභා මන්ත්‍රි ග්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

**10.12 අම්බලන්ගොඩ මානාන ක්‍රිඩාංගණයට පස් දැමීම සඳහා සඳහා තාක්ෂණසේවා නිළධාරි විසින් පිළියෙල කරන ලද රු.500000/= ක ඇස්තමේන්තුව සභා ගත කරන ලදී.**

තීරණය :-

අම්බලන්ගොඩ මානාන ක්‍රිඩාංගණයට පස් දැමීම සඳහා රු.500000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් , මෙම මුදල සභා අරමුදලින් ගෙවීමට සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු ගරු නගර සභා මන්ත්‍රි ග්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

**10.13 අම්බලන්ගොඩ පොල්වත්ත ආදාහනගාරය අළුත්වැඩියා කිරිමේ කර්මාන්තය සඳහා සඳහා තාක්ෂණසේවා නිළධාරි විසින් පිළියෙල කරන ලද රු.50000/= ක ඇස්තමේන්තුව සභා ගත කරන ලදී.**

තීරණය:-

අම්බලන්ගොඩ පොල්වත්ත ආදාහනගාරය අළුත්වැඩියා කිරිමේ කර්මාන්තය සඳහා රු.50000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් , මෙම මුදල සභා අරමුදලින් ගෙවීමට සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු ගරු නගර සභා මන්ත්‍රි නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

**10.14 අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගණයේ කාණුව ඉදිකිරීම සඳහා සඳහා තාක්ෂණසේවා නිළධාරි විසින් පිළියෙල කරන ලද රු.1000000/== ක ඇස්තමේන්තුව සභා ගත කරන ලදී.**

**තීරණය:-**

අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගණයේ කාණුව ඉදිකිරීම සඳහා රු.1000000/== ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් , මෙම මුදල සභා අරමුදලින් ගෙවීමට සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු ගරු නගර සභා මන්ත්‍රි නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

**10.15 අම්බලන්ගොඩ උස්වැල්ල පාර කොන්ක්‍රිට් කිරිම සඳහා සඳහා තාක්ෂණසේවා නිළධාරි විසින් පිළියෙල කරන ලද රු.270000/== ක ඇස්තමේන්තුව සභා ගත කරන ලදී.**

**තීරණය:-**

අම්බලන්ගොඩ උස්වැල්ල පාර කොන්ක්‍රිට් කිරිම සඳහා රු.270000/== ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් , මෙම මුදල සභා අරමුදලින් ගෙවීමට සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු ගරු නගර සභා මන්ත්‍රි නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

10.16 පි.එච්.ආර්. සුමනදාස මාවත අතුරු පාර කොන්ක්‍රිට් කිරිම සඳහා තාක්ෂණසේවා නිළධාරි විසින් පිළියෙල කරන ලද රු.235000/== ක ඇස්තමේන්තුව සභා ගත කරන ලදී.

**තීරණය :-**

පි.එච්.ආර්. සුමනදාස මාවත අතුරු පාර කොන්ක්‍රිට් කිරිම සඳහා රු.235000/== ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් , මෙම මුදල සභා අරමුදලින් ගෙවීමට සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු ගරු නගර සභා මන්ත්‍රි ග්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

**10.17 අම්බලන්ගොඩ බස්නැවතුම ඉහළ මාලයේ අත සේදුම් බේසම (සින්ක් එකක්) සවිකිරිම කිරිම සඳහා තාක්ෂණසේවා නිළධාරි විසින් පිළියෙල කරන ලද රු.8500/== ක ඇස්තමේන්තුව සභා ගත කරන ලදී.**

**තීරණය :-**

අම්බලන්ගොඩ බස්නැවතුම ඉහළ මාලයේ අත සේදුම් බේසම (සින්ක් එකක්) සවිකිරිම කිරිම සඳහා රු.8500/== ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් , මෙම මුදල සභා අරමුදලින් ගෙවීමට සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු ගරු නගර සභා මන්ත්‍රි ග්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

.

**(11) වෙනත් කරුණු**

**11.01 2019 ජනවාරි මස නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ මාසික වාර්තාව සභාගත කරන ලදී**

ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

2019 ජනවාරි මස නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ මාසික වාර්තාව . ආයතනය පවත්වන ලද දින ගණන22 , පැමිණි රෝගීන් සංඛ්‍යාව 218කි . රෝගීන් පැමිණි දෛනික සාමාන්‍ය ගණන 10 කි. මාසය සඳහා වැයවූ ඖෂධ සඳහා ගිය වියදමරු.21434.63කි එක් රෝගියකු සඳහා ගිය මුදල රු.98.32 ක් වශයෙන් වාර්තාව ඉදිරිපත් කර ඇත.

**තීරණය**

**අම්බලන්ගොඩ නගර සභාවේ නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ 2018 නොවැම්බර් මස සඳහා වාර්තාව සභාවේ දැන ගැනිම සඳහා ඉදිරිපත් කරන ලදි**

## (12) න්‍යාය පත්‍රයට ඇතුලත් නොවූ වෙනත් කරුණු

**12.01 ජනමාධ්‍යවේදී , එස්. සමරනායක මහතා විසින් සභා වාර්තා ලක්බිම පුවත්පතේ පළ කිරීම තාවකාලිකව නතර කිරීම සම්බන්ධ 2019.02.08 දිනැති ලිපිය සභා ගත කරන ලදී.**

ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

ජනමාධ්‍යවේදී , එස්. සමරනායක මහතා විසින් ලිපියක් ඉදිරිපත් කර ඇත. මුද්‍රණ කඩදාසි මිළ ඉහළ යාම හේතුවෙන් ලක්බිම දිනපතා පුවත් පත මුද්‍රණය කිරීම මේ වන විට තාවකාලිකව නතර කර ඇත. එබැවින් සභා වාර්තා ලක්බිම පුවත් පතේ පළ කිරීමට මා හට දුෂ්කරය. නැවත මුද්‍රණය ආරම්භ කළ පසු සභා වාර්තා පළ කිරීම ආරම්භ කරනු ඇත. එතෙක් රැස්වීම් ලිපි ආවරණය කිරීමේ කැඳවීම් ලිපි මා වෙත නොඑවන ලෙස දන්වා සිටි. එතෙක් ලිපි එවීම පිළිබඳව ස්තුතිය පුද කරන අතර මේ පිළිබඳව සභාව දැනුවත් කරන ලෙස ඉල්ලා ඇත.

**තීරණය -**

ජනමාධ්‍යවේදී , එස්. සමරනායක මහතා විසින් මුද්‍රණ කඩදාසි මිල ඉහළයාම හේතුවෙන් සභා වාර්තා ලක්බිම දිනපතා පුවත්පතේ පළ කිරීම තාවකාලිකව නතර කර ඇති බව දන්වා සිටිම සම්බන්ධව ඉදිරිපත් කරන ලිපිය ගරු සභාවේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.

**12.02 අම්බලන්ගොඩ ,තුඩුවමුල්ල , එක්සත් බෞද්ධ සුභ සාධක සමිතිය සඳහා ඉදිකරනු ලබන ගොඩනැගිල්ලේ ප්‍රයෝජනය සඳහා ජල පහසුකම් ලබා ගැනීම සම්බන්ධයෙන් 2019.02.25 දැනැති ලිපිය සභාගත කරන ලදී.**

ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

එක්සත් බෞද්ධ සුභ සාධක සමිතිය , තුඩුවමුල්ල , අම්බලන්ගොඩ. එක්සත් බෞද්ධ සුභ සාධක සමිතිය මඟින් ඉදිකරනු ලබන ගොඩනැගිල්ලේ ප්‍රයෝජනය සඳහා ජල පහසුකම් ලබා ගැනීමට ජල සම්පාදන මණ්ඩලයෙන් අයදුම් කර ඇත. යෝජිත ගොඩනැගිල්ල සඳහා දෙනු ලබන ජල පහසුකම එක්සත් බෞද්ධ සුභ සාධක සමිතියට ලබා දීම පිළිබඳව අම්බලන්ගොඩ නගර සභාවේ විරුද්ධතාවයක් නොමැති බවට ලිපියක් ඉදිරිපත් කරන ලෙස එම සමිතියේ සභාපති වුක්වාඩු හරිස්චන්ද්‍ර මහතා හා ලේකම් ආර්.ටී. විශාකා මහත්මිය විසින් ඉල්ලීම් කර ඇත. මෙය සභා අනුමතියට යටත්ව නිකුත් කර ඇත. එය අනුමත කරන ලෙස ඉල්ලා ඇත.

**තීරණය -**

අම්බලන්ගොඩ කරෝලිස් වෙද මාවත නො.01 , එක්සත් බෞද්ධ සුභ සාධක සමිතිය සඳහා ඉදිකරනු ලබන ගොඩනැගිල්ලේ ප්‍රයෝජනය සඳහා ජල පහසුකම් ලබා දීම පිළිබඳව නගර සභාවේ විරුද්ධත්වයක් නොමැති බවට සභා අනුමතියට යටත්ව ලිපියක් ලබා දීම සම්බන්ධයෙන් සභා අනුමතිය ලබා දිම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මි හේමන්තා මෙනවිය විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.

## 12.03 ඉන්දියාවේ බැංගලෝර්හි පවත්වනු ලබන නාගරික අපද්‍රව්‍ය කළමනාකරනය පිළිබඳ සම්මන්ත්‍රණය සඳහා සහභාගි වීමට අනුමතිය ලබා නොදිම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.

ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්

පළාත් පාලන කොමසාරිස්තුමිය විසින් ලිපියක් එවා ඇත. ඉන්දියාවේ බැංගලෝර්හි පවත්වනු ලබන නාගරික අපද්‍රව්‍ය කළමනාකරනය පිළිබඳ සම්මන්ත්‍රණය සඳහා සහභාගි වීම සඳහා නගර සභාවේ මහජන සෞඛ්‍ය පරික්ෂක එච්.පී.බී.හංසක නදිල් මහතා. උක්ත කරුණ වෙනුවෙන් මා අමතන ලද අම්/නස/01/06 හා 2019.02.15 දිනැති ලිපිය හා බැදේ. එකී ලිපිය මඟින්, යාර්ල් රයිසින් පුද්ගලික සමාගම සංවිධානය කරනු ලබන පවත්වනු ලබන නාගරික අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ සම්මන්ත්‍රනය සඳහා ඉන්දියාවේ බැංගලෝර්හි පවත්වනු ලබන නාගරික අපද්‍රව්‍ය කළමනාකරනය පිළිබඳ සම්මන්ත්‍රණය සඳහා අම්බලන්ගොඩ සෞඛ්‍ය නිලධාරි කාර්යාලයේ සේවයේ නියුතු ඔබ නගර සභාවේ වැඩ බලන මහජන සෞඛ්‍ය පරික්ෂක එච්.පී.බී.හංසක නදිල් මහතා සහභාගි කර විමට හා වියදම් සහා අරමුදලින් දැරිමට සභාව විසින් ගන්නා තීරණය සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු අනුව අනුමැතිය ලබා දීමට හැකියාව නොමැති බව දන්වා සිටිමි.

- දකුණු පළාත් ප්‍රධාන ලේකම් විසින් අංක CSS/2/81/Common හා 2015.09.07 දිනැතිව සියළුම අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානින් අමතා ඇති ලිපිය මඟින් දන්වා ඇති පරිදි දකුණු පළාත් රාජ්‍ය සේවයේ නිලධාරින්ට අදාල වීදේශ පුහුණු වැඩසටහන් හා විදේශ ශිෂ්‍යත්ව පිළිබඳ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හෝ අදාල රේඛිය අමාත්‍යාංශය මඟින් කැදවනු ලබන වැඩසටහන් සඳහා ප්‍රධාන ලේකම් කාර්යාලය , ප්‍රධාන අමාත්‍යාංශය , පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් දැනුවත් කරනු ලබන වැඩ සටහන් සඳහා පමණක් පළාත් රාජ්‍ය සේවයේ නිලධාරින් සහභාගී කරවීම.
- පුද්ගලික සමාගමක් මඟින් අදාල සම්මන්ත්‍රණය සංවිධානය කිරීම.

ආදි ලෙස දන්වා ඇත. මේ සඳහා සහභාගි කරවිය නොහැකි බව දන්වා ඇත.

**තීරණය -**

අම්බලන්ගොඩ නගර සභාවේ වැඩ බලන මහජන සෞඛ්‍ය පරීක්ෂක එච්. පී.බී. හංසක නදිල් මහතා ඉන්දියාවේ බැංගලෝර්හි පවත්වනු ලබන නාගරික අපද්‍රව්‍ය කළමනාකරනය පිළිබඳ සම්මන්ත්‍රණය සඳහා සහභාගි කරවිමට හා එහි වියදම් සහා අරමුදලින් දැරිම සඳහා අනුමතිය ලබා දිමට හැකියාව නොමැති බව දන්වා පළාත් පාලන සහකාර කොමසාරිස් - ගාල්ල මගින් එවන ලද ලිපිය ගරු සභාවේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.

## 12.04 පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය මගින් ගාල්ල දිස්ත්‍රික් මිල නියම කිරිමේ කමිටු වාර්තාව( 2019 පළමු භාගය) 2019.02.25 දිනැති ලිපිය සභාගත කරන ලදී.

ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්

ගාල්ල දිස්ත්‍රික් මිල නියම කිරිමේ කමිටු වාර්තාව 2019 පළමු භාගයේ වාර්තාව එවන ඇත. අවශ්‍ය කෙනෙකු සිටි නම් ලේකම්තුමිය මඟින් ලබා ගන්න.

**තීරණය -**

පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය මගින් ගාල්ල දිස්ත්‍රික් මිල නියම කිරිමේ කමිටු වාර්තාව( 2019 පළමු භාගය ) ගරු සභාවේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කරන ලදී.

## 12.05 අම්බලන්ගොඩ , තරුණ බෞද්ධ සංගමය 2019 වර්ෂයේ වෙසක් කලාපය සාර්ථක කර ගැනීම සඳහා අම්බලන්ගොඩ නගර සභාවේ අනුග්‍රහය ලබා ගැනිම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.

ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්

අම්බලන්ගොඩ , තරුණ බෞද්ධ සංගමය විසින් 2019 වර්ෂයේ වෙසක් කලාපය සාර්ථක කර ගැනීම සඳහා අම්බලන්ගොඩ නගර සභාවේ අනුග්‍රහය ඉල්ලා ඇත. ඔවුන් විසින් පහත දේවල් ඉල්ලා ඇත.

01. 2019.0519-2019.05.22 දක්වා යකඩ කණු හා කොඩි කණු 50 ක්

02. 2018.05.17-2019.05.20 දින දක්වා බෞද්ධ චිත්‍රපටි ප්‍රදර්ශනය සඳහා ප්ලාස්ටික් පුටු 150 ක්

03. 2019.05.20-2019.0522 දින දක්වා සැදැ ගී ප්‍රසංගය සඳහා ප්ලාස්ටික් පුටු 500 ක්

04. භක්ති ගීත ප්‍රසංගය සඳහා පොලිස් මුරපොල පිහිටි ස්ථානය අසල (ශ්‍රී ලංගම කාර්යාලය ඉදිරිපිට ) හිස් භූමිය මැයි මස 20 සහ 21 දෙදින තුල ලබා දීම

05. 2019 මැයි මස 14 වන දින පෙ.ව 8.00 ට කොඩි කණු 100 ක් ගාලු පාරේ සිටුවා ගැනිම සඳහාත් සිටුවා සඳහාත් 2019 මැයි මස 22 වන දින පෙ.ව 8.00 ට කොඩි කණු ගලවා ගැනීම සඳහා ප්‍රවාහන පහසුකම් සමඟින් අම්බලන්ගොඩ නගර සභාවේ සේවක මහතුන් යොදවා ගැනීම

06. , 2019 මැයි මස 19 වන දින දහවල් පෙරහැර ගමන් කිරිම සඳහා මාර්ගය තෙතමනය කිරිම සඳහා පෙ.ව.1.30-6.00 දක්වා පෙරහැරේ ඉදිරියෙන් ගමන් කිරිම සඳහා නගර සභාවේ ජල බවුසරය ජලය සහිතව රියදුරු මහතෙකු සමඟ

07. 2019. මැයි මස 17 වන දිට සිට 21 දින දක්වා සභාව සතු පිත්තල පහනද

08. 2018 මැයි මස 18 සිට මැයි මස 21 දක්වා කාලය තුළ නගර සභාව සතු අඩි 10 10 රෙදි කුඩාරම් අටක් හා දැන්වීම් ප්‍රදර්ශන පුවරු 15 ක් අම්බලන්ගොඩ නගරයේ ප්‍රදර්ශනය කිරිමට අනුමතිය ඉල්ලා ඇත.

<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩකාර මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, පුටු 500 ක් පමණයි නේද අප සතුව පවතින්නේ.එවිට එම පුටු 500 ම ලබා දුන්නොත්.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

මොනවා වුණත් මරණයක් සිදු වුවහොත් එක මරණයට පුටු 100 ක් ලබා දෙනවා. මරණ 5 ක් සිදු වුවහොත් ඒ තිබෙන අවස්ථාව අනුව ලබා දෙනවා.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

මෙම සේවකයන් ලබා දීම පිළිබඳ ගැටළුවක් තිබෙනවා නේද ?

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

මේ සඳහා සේවකයින් 3 කු ලබා දෙන්න. ඒ වගේම ජල බවුසරයට ජලය පුරවා ගත යුතුයි. කාටවත් නිකං දෙන්නේ නැහැ ජලය ජල සම්පාදන මණ්ඩලයෙන්. එම මුදල් ඔවුන් විසින් ගෙවන්න . බවුසරය පමණක් අපි ලබා දෙන්නම්.

**තීරණය -**

අම්බලන්ගොඩ , තරුණ බෞද්ධ සංගමය 2019 වර්ෂයේ වෙසක් කලාපය සාර්ථක කර ගැනීම සඳහා 2019 මැයි මස 14 -22 දක්වායකඩ පයිප්ප (කොඩි කණු 50 ) ද, 2019 මැයි මස 14 වන දින පෙ.ව 8.00 ට කොඩි කණු සිටුවා ගැනීම සඳහාත් 2019 මැයි මස 22 වන දින පෙ.ව 8.00 ට කොඩි කණු ගලවා ගැනීම සඳහා අම්බලන්ගොඩ නගර සභාවේ සේවකයන් 3කු ලබා දීමටත් , අවශ්‍ය පුටු මරණයක් සිදු වුවහොත් සපයා දීමට නොහැකි බවත් භක්ති ගීත ප්‍රසංගය සඳහා පොලිස් මුරපොල පිහිටි ස්ථානය අසල (ශ්‍රී ලංගම කාර්යාලය ඉදිරිපිට ) හිස් භූමිය මැයි මස 20 සහ 21 දෙදින තුල ලබා දීමටත් , 2019 මැයි මස 19 වන දින දහවල් පෙරහැර සඳහා නගර සභාවේ ජල බවුසරය රියදුරු මහතෙකු සමඟ ලබා දිමටත් , ඊට අදාල ජලය මුදල් ගෙවා ඔවුන් විසින් සපයා ගත යුතු බවත් , 2019. මැයි මස 17 වන දිට සිට 21 දින දක්වා සභාව සතු පිත්තල පහනද ,2018 මැයි මස 18 සිට මැයි මස 21 දක්වා කාලය තුළ නගර සභාව සතු අඩි 10 10 රෙදි කුඩාරම් අටක් හා දැන්වීම් ප්‍රදර්ශන පුවරු 15 ක් අම්බලන්ගොඩ නගරයේ ප්‍රදර්ශනය කිරිම සඳහා සහා අනුමතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**12.06 ගරු හිටපු සභාපති ජී.එම්.ඒ. ද සිල්වා මහාතාගේ අවමංගල්‍යා උත්සවය සම්බන්ධයෙන් විශේෂ ස්තුතිය පිරිනැමීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී**

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ගරු හිටපු සභාපති ජී.එම්.ඒ. ද සිල්වා මහාතාගේ අවමංගල්‍යා උත්සවය විශේෂ ස්තුතිය පිරිනැමීම. අප ආදරණීය පියාණන් වූ ජී.එම්.ඒ. ද සිල්වා මහාතාගේ හදිසි අභාවය සිදු වූ මොහොතේම සිට අප නිවසට පැමිණ අවමංගල්‍යා උත්සවයේ කටයුතු තම කර මතට ගනිමින් පවුලේ සමීපතම ඥාතින් හා එක්ව අවමංගල්‍යා උත්සවයේ සියලු කටයුතු කිසිදු අඩුපාඩුවකින් තොරව ඉතා ගෞරවාන්විතව සිදු කිරීම සඳහා නායකත්වය ලබා දීම පිළිබඳව අප සියලු දෙනාගේ ගෞරවනිය ස්තුතිය ප්‍රථමයෙන් ඔබතුමාට පුද කර සිටි. මෙම අවමංගල්‍යා උත්සවයට අදාලසැම කටයුත්තක්ම නිරතුරුව සොයා බලමින් සුළු හෝ අඩුපාඩුවන් නොවන අයුරින් සියලු කටයුතු සිදු කිරීම සඳහා දායකත්වය සැපයූ නගර සභාවේ උප සභාපතිතුමා විපක්ෂ නායකතුමා , ප්‍රමුඛ සමස්ත මන්ත්‍රී කණ්ඩායම නගර සභාවේ ලේකම්තුමිය ප්‍රධාන සමස්ත සේවක මණ්ඩලයට අප පවුලේ ගෞරවනීය ස්තුතිය පුද කිරීමට මෙය අවස්ථාවක් කර ගෙන ඇත. අභාවය දැනගත් මොහොතේ සිට නගරය අවශ්‍ය ආකාරයට සරසමින් ශෝක ප්‍රකාශ බැනර ප්‍රදර්ශනය කරමින් , තොරණ ඉදි කරමින් , පොදු සුසාන භූමිය ගෞරවාන්විත අවමංල්‍යා අවස්ථාවකට සරිලන සේ පිළිසකර කරවමින් , ආදාහන කටයුතු සභාවේ අනුග්‍රහය මත සිදු කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කර දීමෙන් නිවසේ ගෙවත්තට මැසි මදුරු උවදුරෙන් වලක්වා පැමිණි පිරිසගේ ආරක්ෂාව සහතික කිරීම උදෙසා බෙහෙත් ගැල්වීම වැනි කටයුතු ඉටු කරමින් ඉටු කල මෙහෙය ඉතා ප්‍රසංසනීය වේ. අවමංගල නිවසට පැමිණෙමින් දේහයට ගෞරව දක්වමින් , නගර සභා ප්‍රවිශ්ට මාවත පරිශ්‍රෙද්දි දේහයට විශේෂ පිළිගැනීමක් කරමින් , පුෂ්පෝහාර දක්වමින් කරන ලද ගෞරව කිරීම අම්බලන්ගොඩ නගර සභා ඉතිහාසයේ හිටපු සභාපතිවරයෙකුට නොලැබූ ආකාරයට ගෞරවාන්විත තත්වයක් ලබා දුන් බව මාගේ විශ්වාසයි. ඒ සඳහා නායකත්වය දුන් ඔබතුමා ප්‍රමුඛ සියළු දෙන වෙත නැවත වරක් අප පවුලේ ගෞරවනීය ස්තුතිය පුද කර සිටිනවා.2019 වසර ඔබ සැමට සුභ නව වසරක් වේවා යි සුභ පතනවා කියා නිර්මලි ද සිල්වා මහත්මිය ලිපියක් එවා ඇත.

**තීරණය -**

ගරු හිටපු සභාපති ජී.එම්.ඒ. ද සිල්වා මහාතාගේ අවමංගල්‍යාය සඳහා විශේෂ ස්තුතිය පිරිනැමීම සම්බන්ධයෙන් එතුමාගේ බිරිඳ වන නිමර්ලි ද සිල්වා මහත්මිය විසින් එවන ලද ලිපිය සභාවේ දැන ගැනිම පිණිස ඉදිරිපත් කරන ලදි.

**12.07 අම්බලන්ගොඩ , පොල්වත්ත, යුනයිටඩ් ක්‍රීඩා සමාජය මඟින් 26 වන වරටත් පවත්වනු ලබන බක්මහ උළෙල හා සංගිත රාත්‍රිය සඳහා 2019 අප්‍රේල් මස 20 වන දින පොල්වත්ත පියසේන ළමා ක්‍රිඩාංගනය නොමිලේ ලබාගැනිම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදි.**

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

පොල්වත්ත පියසේන ළමා ක්‍රිඩාංගනය නොමිලේ ලබා ගැනිම සඳහා ලියා පදිංචි ක්‍රිඩා සමාජයක් වන අම්බලන්ගොඩ , පොල්වත්ත, යුනයිටඩ් ක්‍රීඩා සමාජය මඟින් 26 වන වරටත් පවත්වනු ලබන බක්මහ උළෙල හා සංගිත රාත්‍රිය සඳහා 2019 අප්‍රේල් මස 20 වන දින පොල්වත්ත පියසේන ළමා ක්‍රිඩාංගනයේදි සංවිධානය කිරිමට බලාපොරෝත්තුවෙන් සිටි. ඒ සඳහා වසර ගණනාවක් ඔබතුමාගේ ආශිර්වාදයෙන් පිහිටි ක්‍රිඩා සමාජයක් වන අප ක්‍රීඩා සාමාජයට නොමිලේ පියසේන ක්‍රීඩාංගණය නොමිලේ ලබා දුන් බව ප්‍රකාශ කර සිටිනවා. එසේම මේ වසරේදිත් අප්‍රෙල් මස 19 වන දින හා 20 දෙදින අප ක්‍රිඩා සමාජයට පොල්වත්ත පියසේන ක්‍රීඩා සමාජය වෙත නොමිලේ ලබා දෙන ලෙස එහි සභාපතිතුමා විසින් ඉල්ලිමක් කර තිබෙනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා කතා කරමින්**</u>

19 වන දිනට තමයි පෝය තිබෙන්නේ. නමුත් බක්මහ උළෙල සඳහා අවශ්‍ය භූමිය සකස් කර ගැනීම සඳහා තමයි ක්‍රිඩා පිටිය 19 දිනට ඉල්ලා සිටින්නේ.

**තීරණය**

අම්බලන්ගොඩ , පොල්වත්ත, යුනයිටඩ් ක්‍රීඩා සමාජය මඟින් 26 වන වරටත් පවත්වනු ලබන බක්මහ උළෙල හා සංගිත රාත්‍රිය සඳහා 2019 අප්‍රේල් මස 20 වන දින පොල්වත්ත පියසේන ළමා ක්‍රිඩාංගනය නොමිලේ ලබාගැනිම අනුමතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සහා සම්මත විය.

**12.08 පුස්තකාල සහායක තනතුර සඳහා පත්කල කමිටුවේ වාර්තාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

පුස්තකාල සහායක තනතුර සඳහා පත්කල කමිටුවේ වාර්තාව . පුස්තකාල සහායක තනතුර සඳහා සම්මුඛ පරික්ෂණ පැවැත්වීම පසුගිය දා සභා වාරයේදි කමිටුව ගත් තින්දුවක් ඉදිරිපත් කරන ලදි.සභා තින්දුව අංක 03.05 2019.01.08 දින එම කමිටුව 2019.01.22 එම කමිටුව රැස්වූ අතර පහත සඳහන් කරුණු අනුව තිරණයකට එළඹෙන ලදි.නිවේදනය පල කිරිමෙන් පසුව ඒ අනුව ලැබුණු අයදූම්පත් සංඛ්‍යාව 3161කි.එම තනතුරේ පවතින පුරප්පාඩු 01 ක් පමණි. එමනිසා මෙය විශාල අයදුම්පත් සංඛ්‍යාව අතරින් අවම අයදුම්පත් සංඛ්‍යාව තෝරා ගත යුතු බැවින් අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශය තුල පදිංචි අයුදම්කරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවීම සුදුසු බවට කමිටුව තීරණය කරන ලදී. ප්‍රදේශය තුල ලැබි ඇති අයදුම්පත් සංඛ්‍යාව 113කි.බඳවා ගැනිමේ පටිපටියට අනුව ප්‍රදේශයේ පදිංචිකරුවන්ට පමණක් ලකුණු ලකුණු 45ක් ලැබෙන බව ද එයද සැලකිල්ලට ගනිමින් අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශය තුල ඇති අයදුම්පත් 113 සම්මුඛ පරික්ෂණයට කැඳවිම සුදුසු බවට අවසාන වශයෙන් තීරණය කරන ලදි.මේ අනුව ඉදිරි කටයුතු කරගෙන යාම සුදුසු බවට කමිටුවේ සභාපති නගර සභා ලේකම් බී.ඒ. ධම්මිකා , කමිටු සමාජික ප්‍රධාන කළමනාකරණ සහකාර එච්.ජී. මිහිරි කාන්ති ද සිල්වා කමිටු සමාජික ප්‍රජා සංවර්ධන නිලධාරි ඩී.වාසනා තරංගි ද සිල්වා මහත්මිය ලිපියක් ඉදිරිපත් කර ඇත. සභාවේ අනුමතිය ඉල්ලා ඇත.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඕක ගැටළුවක් වන්නේ නැද්ද ? ඕක කමිටුවකින් තීරණය කරයි කියා කවුරු හරි ප්‍රශ්න කළොත්

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

නැහැ සභාවේ අනුමතිය ඉල්ලා සිටින්නේ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

මටනම් මේ සඳහා අනුමතිය ලබා දෙන්න බැහැ. ඕකට කවුරුහරි නඩුවක් දැම්මොත් එහෙම .

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මේ සම්බන්ධව දකුණු පළාත් සභාවේ සකච්ජා කර අම්බලන්ගොඩ අයදුම්කරුවන්ට පමණක් කැඳවන්න කියා යෝජනාවක් සම්මත වී ඇත.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එහෙනම් මෙය කලින් සම්මත කර ගත යුතුයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මෙය කලින් සම්මත කරගෙන ඇත.මට ආවා පිටපතක්. මගේ නිවසේ ඇති එහි පිටපතක් . ගරු අශෝක ධනවංශ ද සිල්වා මන්ත්‍රිතුමා විසින් ඉදිරිපත් කර තිබෙනවා. මෙම තනතුර සඳහා අම්බලන්ගොඩ පදිංචිකරුවන්ගෙන් පමණක්

තෝරාගෙන අයදුම්පත්‍ර කැඳවන ලෙසට. එය සම්මත වෙලා එම යෝජනාව ගරු අශෝක ධනවංශ ද සිල්වා මන්ත්‍රීතුමා එහි පිටපතක් මා හට එවා තිබුණා.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමා , දැන් මෙයට පත්තර දැන්වීමක් එහෙම දැම්මේ නැහැනේ. මුළු ලංකාවෙන්ම පැමිණියේ එකනේ.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

නැහැ. පත්තර දැන්වීමේ ලකුණු දෙන ක්‍රමය දමා තිබෙනවා. බල ප්‍ර දේශයේ පදිංචිකරුවන් නම් ලකුණු 45ක් හිමි වෙනවා. පිට කෙනෙකුට දෙනවා නම් ලකුණු 45 නැති වෙනවා.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

එක දමන්න සම්මුඛ පරීක්ෂණයට කැඳවන්න ඕන නේද සියළුම දෙනා. එය කලින්ම දමන්න තිබුණා.ලකුණු මට්ටම දැම්මා කියා හරියන්නේ නැහැනේ. සමහර විට ලකුණු 45 දුන් විට අපගේ අය ඉතිරි වෙයි.මා නම් මේ සඳහා එකඟ වෙන්නේ නැහැ. එක්කෝ පළාත් සභාවෙන් තිරණයක් ගන්න කියන්න . අපි බේරිලා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

එහෙම කරන්න බැහැ.

<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>

එහෙනම් කරන්නේ අපි මේ සඳහා ක්‍රමවේදයක් හදනවා. දැන් ඔය ලකුණු 45 හදලා සියළුම දෙනාට ලකුණු දමනවා.එම කමිටුව මඟින් අයදුම්පත් 3461 ක සඳහාම ලකුණු දමනවා. ලකුණු මට්ටම උඩම සිටින 100 දෙනා හරි 200 හරි කැඳවන්න තීරණය කරනවා. ඒක කරන්න පුළුවන්. එම ක්‍රම වේදය තිබිය යුතුයි. කවුරුහරි විමසා සිටියත් අපි ලකුණු දැමුවේ මේ විදියට කියා කියන්න. ජලසම්පාදන මණ්ඩලයට පැමිණෙනවා එක තනතුරකට ගෝනි 4 ක විතර අයදුම් පත්‍ර. ඒ වට කැඳවන්න ගියොත් කරන්න බැහැනේ.හැබැයි එය ක්‍රමවේදයට තිබිය යුතුයි.

<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි , එහි ලකුණු 100න් ලකුණු 90 ක් තමයි අයදුම්පත්‍රයේ සුදුසුකම් වලට දෙනු ලබන්නේ.ලකුණු 10 ක් ඉතිරි කර ගන්නවා. එම ලකුණු 10 පුද්ගල පෞරුෂය සඳහා. එම ගන්න 10ට මුලිකත්වය ගෙන එය පුරවා ගැනීමට.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

දැන් මේ සභාවේ කියන විදියට ඔය තුන්දෙනා රැස්වෙලා 3461 ම ලකුණු දමා කැඳවිය යුතු 100කු තෝරා ගන්න.ඊට පසු එම 100 සම්මුඛ පරීක්ෂණයට කැඳවන්න. ඒ සඳහා සභාව එකඟයි නේද ? විරුද්ධ නැහැනේද ?

**තීරණය -**

පුස්තකාල සහායක තනතුර සඳහා අයදුම්පත් ඉදිරිපත් කර ඇති සියළුම අයදුම්කරුවන්ට නම් කරන ලද කමිටුව මඟින් ලකුණු ලබාදී ඉන් වැඩිම ලකුණු හිමිකරගත් සුදුසු අයදුම්කරුවන් ප්‍රමාණයකට සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට අනුමතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**12.09 අම්බලන්ගොඩ නගර සභාවේ 2019/02/05 දින සභාවේ තීරණ අංක 05.02.01 අනුව දැනට ඡන්ද කොට්ඨාශ 12 කට බෙදී ඇති එක් එක් ඡන්ද කොට්ඨාශයට නගර සභා කර්මාන්ත අංශයෙන් හා සෞඛ්‍ය අංශයෙන් ඉටු විය යුතු සේවාවන් පිළිබඳ විස්තර ඇතුලත් ලිපිය සභා ගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ නගර සභාවේ 2019.02.04 දින පැවති මාසික සභාවේ සභා තීරණ අංක 05.02.01 අනුව ඡන්ද කොට්ඨාශ අනුව කොට්ඨාශ 12 කට බෙදී එක් ඡන්ද කොට්ඨාශයකට නගර සභා කර්මාන්ත අංශයෙන් හා සෞඛ්‍ය අංශයෙන් ඉටුවිය යුතු සේවාවන් සතියකට එක් කොට්ඨාශය බැගින් නම්කර සතියෙන් සතිය සෑම කොට්ඨාශයක්ම ආවරණය වන පරිදි ක්‍රියාත්මක කිරීමට අනුමතිය ලැබී ඇති බැවින් 2019.03.11 දින සිට එක් කොට්ඨාශයකට දින 5 බැගින් කොට්ඨාශයේ අංක 01 සිට 12 දක්වා කර්මාන්ත අංශයේ හා සෞඛ්‍ය අංශයේ සේවකයන් යෙදවීම සිදු කිරීමටත් යම් ස්වාභාවික විපතක් හෝ යම් අත්‍යවශ්‍ය කටයුත්තක් නිසා එක් සතියකට අදාල කොට්ඨාශයේ සේවයේ යෙදවීම අපහසු වුවහොත් ඊළඟ දිනයේ හෝ සතියේ යෙදවීමට ගරු මන්ත්‍රීතුමන්ලා දැනුවත් කිරීමට සභාවට ඉදිරිපත් කර ඇත. කොට්ඨාශ අංක 01 2019.03.11 සිට 2019.03.15 දක්වා. කොට්ඨාශ අංක 2 2019.03.18 සිට 2019.03.22 දක්වා, කොට්ඨාශ අංක 03 2019.03.21.2019.03.25 දක්වා. මෙසේ අඛණ්ඩව අනෙක් කොට්ඨාශ වලට බෙදී යනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

දින 5 ඇතුලත කරන්න බැරි වුණොත් මොකක්ද කරන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඉතිං ඔබතුමාලා යෝජනා කර තිබෙනවා. ඒ අනුව කටයුතු කරන්න.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එහෙම භාගෙට දාලා එන්න බෑනේ. කර්මාන්තයක් කරන්න ගත්තාම. මා පවසන්නේ මාර්ගයක් සෑදීමට ගතහොත් දින 5 කින් නිම කිරීමට බැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මෙම යෝජනාව ඉදිරිපත් කළ පුද්ගලයා ලෙස මා අදහස් ඉදිරිපත් කිරීමට කැමතියි. මෙතුමා ඉදිරිපත් කළා දින 5 කින් කර්මාන්තයක් කිරීමට බැහැ කියා. මා අදහස් කරනු ලැබුවේ මීන් කර්මාන්ත කිරීම නෙමේ. මා අදහස් කළේ සෑම කොට්ඨාශයකම ඉතාම සරල කරුණු නොවිසඳී තිබෙනවා. කාණුවක් සුද්ද කිරීම, ගසක් කැපීම , කුණුටිකක් අස් කිරීම ආදී එදිනෙදා කටයුතු කිසි දෙයක් සමහර ගම්වල සිදු වෙන්නේ නැහැ. සමහර වේලාවට අපි අපහසුතාවයට පත්වෙනවා. මේ දින 5 ඇතුලත බැනර් එකක් ප්‍රදර්ශනය කරන්න. මා ඉල්ලා සිටිනවා කොට්ඨාශ 12 ටම එම බැනර් සකස් කරන්න කියා. එවිට එම සතිය තුල එම ගමේ ජනතාව දැනුවත් වෙනවා වතුවල තිබෙන සියළුම කුණු අස්කරන්න ඕන දේවල් පාරට ගෙනවිත් තබන්න. මේ සඳහා ට්‍රැක්ටර් , ට්‍රක් එක යොදවා එම සියළුම කුණු ඉවත් කර එම ගම් ප්‍රදේශ පිරිසිදු කිරීම. කාණු සුද්ද පවිත්‍ර කිරීම. මෙතුමා අදහස් කළ පරිදි කර්මාන්තයක් කිරීම සඳහා මෙය මාසයක් කල් දමා මෙය ගත්තාත් කමක් නැහැ. මෙය නතර කිරීමට කිසිම අවශ්‍යතාවයක් නැහැ. මීන් ගරු මන්ත්‍රීවරු අදහස් කරන්නේ නෑ අයවැය යෝජනා යටතේ ඇති කර්මාන්ත කරගෙන යාමට පුළුවනි. එයට කිසිම බාධාවක් නැහැ. එය කරගෙන යන ගමන් ඉවර කර නැවත එම කොට්ඨාශයට පැමිණීමට පුළුවනි. අපි අදහස් කරන්නේ සමහර ආසන වල කිසිදු වැඩක් සිදු වෙන්නේ නැහැ. මෙතුමා කියන කාරණයම තමයි සිද්ධ වෙන්නේ. මෙම පාර සෑදීමට තිබෙනවා. මෙය උප සභාපතිතුමාගේ , මෙය සභාපතිතුමා උපදෙස් දී තිබෙනවා. එතැනින් එහාට නිලධාරීන් යන්නේ නැහැ. එතනින් එහාට මාර්ගයේ සමාන්‍ය කාණුවක් සුද්ද කර ගන්න විදියක් නැහැ. පාරේ කැඩුණු තැන් සකස් කිරීමට දින 5ක් අවශ්‍යද ? කොයි පාරද කැඩුණු තැන් සදන්නේ.සම්පූර්ණ පාරවල් දලා මේ කැඩුණු තැන් එක දෙක තිබෙන තැන් වැසෙන්නේ නැහැ. එවිට නැවත මුල සිටම මාර්ගයක සකස් කළ යුතුයි. එවිට නැවත කොට්ඨාශයකට යන්නේ මාස 6 -7 කට පසුවයි. එයයි මා අදහස් කළේ. මහ ලොකු දෙයක් නෙමේ. මෙය ජනතාවට දැනෙන අපි ගරු මන්ත්‍රීවරු විදියට පිළිගන්නා ආකාරයකි මා යෝජනා කර ඇත්තේ. නගර සභාවේ සේවය පිළිබඳ වාද කිරීමක් නෙමේ. ඔබතුමාලාගේ අයවැය යෝජනා යටතේ අවශ්‍ය මාර්ගය සකස් කිරීමට , සංවර්ධනය කිරීමට අවශ්‍ය නම් එය කරන්න. එය කර අවසන් වූ පසු නැවත අදාල කොට්ඨාශයේ නැවත වැඩ පටන් ගන්න. මෙය මාස 1 ½ වරක් නැවත සෑම කොට්ඨාශයකටම පැමිණෙනවා. එවිට

ගරු මන්ත්‍රීතුමාලාත් දැනුවත් , ජනතාවත් දැනුවත්. විශාල පිරිසිදු කමක් සිදු වෙනවා. මේ පවතින ක්‍රමය යටතේ අපි මොන තලෙන් ඔබතුමා ප්‍රකාශ කළත් නිලධාරින්ගෙන් එම සේවය අපට ලබා ගන්න බැහැ. එතුමන්ලා සියළු දෙනා අනුගත වි ඇත්තේ සභාපති කියන නිතියට විතරයි. ගරු මන්ත්‍රිවරුන්ට මෙහි නිතිමය ආවරණයක් නැහැ. එයයි මෙහි ඇත්ත කතාව. ගරු මන්ත්‍රිවරුන්ට තියා උප සභාපතිට වත් මේ පණතේ බලයක් නැහැ. එම නිසා නිලධාරින්ට නිදහසට කරුණු තිබෙනවා. අපිට කියන්න පුළුවන්. එතුමන්ලා කිසිම දිනක අපිව ප්‍රතික්ෂේප කර නැහැ. මාස 2 ක් ගියත් හා... ගරු මන්ත්‍රිතුමා කරන්නම්. එතුමන්ලාට මතක් වුණොත් කරනවා. මෙතැන සභාපතිතුමා හරි කවුරු හරි නියෝග කළ දෙය එයයි ක්‍රියාත්මක වන්නේ. අපිත් ඡන්දෙන් ඉදිරිපත් වු ගරු මන්ත්‍රිවරු.සෑම ආසනයකටම මෙය සිදු විය යුතුයි. එයයි අප අදහස් කළේ. කර්මාන්තයක් හෝ යම්කිසි කොන්ක්‍රිට් එකක් හරි ඉදිවෙනවා නම් මෙම කරණාව නවත්වා එය සිදු කළාට කමක් නැහැ. නමුත් දැන් දිගින් දිගටම සිදු වන්නේ කර්මාන්ත විතරයි. මේ සුළු දේවල් සිද්ධ වෙන්නේ නැහැ. එවිට එම අදාල කොට්ඨාශයට JCB එකද මේඅවශ්‍ය යන්ත්‍ර සුත්‍ර සියල්ලම ඒ සඳහා යෙදිවිය හැකිය. උදාහරණයක් ලෙස සෞඛ්‍ය අංශයෙන් කාණු ගොඩ දැමු විට මාසයකට විතර පසුව තමයි ඒවා රැගෙන යන්නේ. ඒ සම්පත් තිබෙන විදියටනේ. අපි අදහස් කළේ අඩුම තරමේ එම දින 5 සේවයේදිවත් ඒ අවශ්‍ය කටයුතු ටික සිදු කර එම ගම පිරිසිදු කිරිමයි. මා ඉල්ලා සිටිනවා ගරු සභාපතිතුමනි, මේ සඳහා බැනර් එකක් ප්‍රදර්ශනය කර අපගේ ප්‍රචාරක අංශයෙන් ඒ අවශ්‍ය ප්‍රචාරක කටයුතු සිදු කර ජනතාව දැනුවත් කර ඒ අදාල ගරු මන්ත්‍රිවරයාට කල් ඇතිව දැනුම් දෙන්න. හදිස්සියේදිවත් මෙය වෙනස් කරනවා නම් අදාල ගරු මන්ත්‍රිවරයාට මෙය කල් ඇතිව දැනුම් දෙන්න. ඒ ජනතාව දැනුවත් කරන්න. එම යෝජනාවෙන් මා අදහස් කළේ එයයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රි ග්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි,මෙම ගරු නගර සභා මන්ත්‍රි ජී.සරත් ශ්‍රී ලාල් මහතාගේ යෝජනාවට අනුව මා පලමු මන්ත්‍රිවරයා වෙනවා ගරු නගර සභා මන්ත්‍රි චම්පා සුමුදු කුමාරි මහත්මියද ඇතුළුව මෙම යෝජනාව ක්‍රියාත්මක කොට්ඨාශය නියෝජනය කරන. අපගේ බල ප්‍ර දේශයටයි ප්‍රථම සහනය ලැබෙන්නේ. මේ වන විට ගරු සභාපතිතුමනි, අපගේ තණකොළ කපන යන්ත්‍ර නිරෝගිව තිබෙනවාද කියා. මේ සමඟම අපගේ තාර බොල්ලේරුව දිවිමට පුළුවන් තත්වයේ තිබෙනවාද ? එම යන්ත්‍ර සුත්‍ර අපි යහපත් අතට පත් කර ගත යුතුයි එම දිනට පෙර. මා භාරයේ ඔවුන්ට සංග්‍රහ කටයුතු , මෙම දින 5 තුල කරනු ලබන වැඩ සටහන් පිළිබඳ විස්තරයක් මා ඔබතුමාට ලබා දෙනවා. මහ විශාල කර්මාන්ත නෙමේ. අපේ ජනතාවට සහන සැලසෙන වැඩ සටහනක් ඊට පෙර ඔබතුමාට ලබා දෙනවා. එසේම මෙම බැනර් ප්‍රදර්ශනය අපි ගරු මන්ත්‍රිවරු විසින්ම කර ගත්තොත් හොඳයි. නගර සභාවට තවත් බරක් නොදි. ගරු සභාපතිතුමනි, මේ ගැන ඔබතුමාගෙත් යම් අදහසක් තිබෙනවා නම් පිළිතුරු සිතින් කියන්න. අපි පිළි ගන්නම්.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

රෝගි ද නැද්ද කියා රෝහලෙන් දැන ගත් පසු කියන්නම්. දැනට සති 3-4 කට කලින් ගරු මන්ත්‍රිතුමාගේ වැඩ කොටස් බොහොමයක් ඉවර කරනු ලැබුවා.දැන් නැවත වරක් මේ බොනස් එක ඔබතුමාට ලැබුණා. මෙය මා සැදුවේ නැහැ. මේ අපේ නිලධාරින් විසින් සකස් කරනු ලැබු දෙයකි. දැනට පනියන්දුව කොට්ඨාශයේ වැඩ කෙරෙමින් පවතින්නේ. පනියන්දුව කොට්ඨාශයේ වැඩ නිම වු පසු ඊළඟට යන්නේ මහ අම්බලන්ගොඩ කොට්ඨාශයට. මහ අම්බලන්ගොඩ කොට්ඨාශය නිම වු පසු හිරේවත්ත කොට්ඨාශයේ වැඩ කරනවා. ඊළඟට පටබැදිමුල්ලට. ඉන්පසු කන්ද ප්‍රදේශයට. ඉන්පසු හෙප්පුමුල්ල ප්‍රදේශයට. මගේ ක්‍රමය විදියට ගියා නම් නැවත ඔබතුමාට පැමිණෙන්නේ තව සති 4 කින් විතර තමයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඔබතුමා මාගේ කොට්ඨාශයේ පාරක් කළා. එහි දෙවැනි වරට නැවත තාර දමා ගත නොහැකිද ?

**<u>ගරු නගර සභා මන්ත්‍රි දිනයාදුර ධර්මදාස මහතා කතා කරමින්</u>**

අංක අනුව කොහොමද වැටෙන්නේ. හෙප්පුමුල්ල කොට්ඨාශයට අංක 7 ද

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මා දන්නේ නැහැ. අංක අනුව 1 සිට දි තිබෙනවා. ඔබතුමාගේ අංකය කියද දැන්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා කතා කරමින්</u>**

දිලා නැහැ . මෙතැන කොට්ඨාශ 3 ක් පමණයි දි තිබෙන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

දැන් මගේ කොට්ඨාශයේ අංකය 8 . මා දන්නවා මගේ කොට්ඨාශයට පැමිණෙන්නේ තව මාස 3 කිනි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින</u>**

ගරු සභාපතිතුමනි, මෙතුමා කියන ආකාරයට එම අම්පන්න නිරෝගිව තිබිය යුතුයි. නැතිනම් ගත නොහැකි වෙනවා.

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාවේ 2019/02/05 දින සභාවේ තීරණ අංක 05.02.01 අනුව දැනට ජන්ද කොට්ඨාශ 12 කට බෙදි ඇති එක් එක් ජන්ද කොට්ඨාශයට නගර සභා කර්මාන්ත අංශයෙන් හා සෞඛ්‍ය අංශයෙන් ඉටු විය යුතු කාර්යයන් එක් සතියකට එක් කොට්ඨාශය බැගින් නම් කර සතියෙන් සතිය සෑම කොට්ඨාශයක්ම ආවරණය වන පරිදි 2019/03/11 සිට ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

**12.10 ගම්පෙරළිය වේගවත් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන -2019 වර්ෂය සම්බන්ධව ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා විසින් එවන ලද ලිපිය සභාගත කරන ලදි.**

**<u>ගරු සභපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මේජර් ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා විසින් ලිපියක් ඉදිරිපත් කර ඇත. ගම්පෙරළිය වේගවත් කිරිමේ ග්‍රාමීය වැඩ සටහන යටතේ සංවර්ධන වැඩ සටහන් 2019 වර්ෂයේ. උක්ත වැඩ සටහනට මා විසින් ග්‍රාම සේවා වසම් කොට්ඨාශ සඳහා ග්‍රාමීය මාර්ග ලේඛණය ඔබලේ දැන ගැනීම සඳහා මෙයට අමුණා ඇත. මෙම මාර්ග ප්‍රතිසංස්කරණය මා විසින් කරන අතර සභාව විසින් ප්‍රතිසංස්කරණ කටයුතු සිදු නොකරන ලෙස ඉල්ලා ඇත. ඉතාමත් හොඳ යෝජනාවකි. දැනට කරන්න තිබෙන සමහර මාර්ග මෙහි තිබෙනවා. මහ අම්බලන්ගොඩ එස්.එම් රෝෂාන් මහතාගේ නිවස අසළ සිට තුඩුවමුල්ල පාරට සම්බන්ධ වන ස්ථානය දක්වා මිටර් 800 . ඒ සහා රුපියල් මිලියන 1.5 ක මුදලක් වෙන් කර තිබෙනවා. අපගේ සැලසුම් අධ්‍යක්ෂකතුමා සමඟ සාකච්ජා කර මෙම මාර්ගය සාදා නිමකර ඉවරයි. නමුත් නැවත ප්‍රතිසංස්කරණයක් කරන්න. එවිට වසර 5ක් යනතුරු මෙම මාර්ගය පවතිනවා. , අංක 82 ඒ හිරේවත්ත කොට්ඨාශය.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , ඔබතුමා කිව්වා මෙම මහ අම්බලන්ගොඩ පාර සාදා ඉවරයි කියා. නමුත් ඇත්තටම පාර කැඩී තිබෙනවා.

**<u>ගරු සභපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

නැහැ මෙම මාර්ගය නැවත කඩා අලුතින් ගල් දමා සකස් කිරිමට තමයි මේ හදන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>**

ගොඩක් ස්තුති වන්ත වෙන්න ඕන එම පාර නැවත සකස් කිරිම පිළිබඳ

**<u>ගරු සභපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අපගේ විරෝධතාවයක් නැහැ. ඊළඟට 82ඒ බවානි එක ලඟ පාර අද හදනවා. 82ඒ හිරේවත්ත හිරිකැටිය හරස් පාර පෝය සිමාව පාර දක්වා ප්‍රතිසංස්කරණය කිරිම මිටර් 125 පළල අඩි 12 කි. මෙම මාර්ගය සාදා නිමකර ඉවරයි. හිරිකැටිය පාර පටන් ගන්නේ මහ අම්බලන්ගොඩ පාර පටන් ගන්න තැන ඉදලා . ඔබතුමා කියන්නේ සිග්නල් කණුව ලඟ ඉදලා . එය මහ අම්බලන්ගොඩ පාර . මෙම මාර්ගයේ නම වැරදියි එහෙනම්. අංක 83 විද්‍යාල මාවත භූමිචන්ද්‍ර මහතා ඇතුළු නිවැසියන් පාවිච්චි කරන මාර්ගය කොන්ක්‍රිට් කිරිම. දුර මිටර් 180 කි. ඒ සඳහා ලක්ෂ 7 ක් වෙන්කර ඇත.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

මා ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතාගෙන් විමසිමට කැමතියි විද්‍යාල මාවත සම්බන්ධ වෙනවාද මෙම මාර්ගයට. ධර්මාශෝක පැසි පන්දු එක ලඟට

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

විද්‍යාල මාවත, කොහොමද දන්නේ නැහැ .

**<u>ගරු සභපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මමත් එය ඇසිමට සිටියේ. අපි සැලසුම් මහතාට කියා සිටියා. භූමින් මහතාගේ ඉල්ලීමට තමයි අපි එය කරනු ලැබුවේ. එතැන සිටිනවා බුවනක මහතා , ත්‍රිවිල් එකක් අයිති මනුස්සයෙක්. ඔය නිවෙස් තුන එකඟත්වය ගන්නවානම් විද්‍යාල මාවතට සම්බන්ධ කළ හැකියි. හදිස්සියක් වුණොත් විද්‍යාල මාවතෙන් එන වාහනයක් මෙතනින් එළියට යා හැකියි. සාකච්ඡා කර මෙය සිදු කරන්න. මෙම මාර්ගය හොද මාර්ගයකි. මාර්ගයේ එකඟතාවය දුම්රිය සේවයෙන් ලබා ගෙන තිබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

එසේ නම් මේ තිබෙන මුදල් මදි වුණොත් එහෙම

**<u>ගරු සභපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අපි මුදල් දෙන්නම්

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

නැහැ තව මුදල් වගයක් ඊළඟට ලැබිමට තිබෙනවා.

**<u>ගරු සභපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මෙම මුදලට මෙම මාර්ගය කිරිමට මුදල් මදි වුණොත් අපි නගර සභාවෙන් මුදල් දෙන්නම්. අංක 83ඒ හෙප්පුමුල්ල , ආර්.ටි. ඊ. ද සිල්වා මාවත සපත්තු කාණුව සහිතව දුර මිටර් 300 කි. මේ සඳහා මිලියන 1.2 මුදලක් වෙන්කර ඇත.ඊළඟට අංක 5 84 ඒ විලේගොඩ එස්.ඩී ද සිල්වා 1 වන පටුමග හල්වතුර ඇළට සම්බන්ධ පාර දුර මිටර් 90 කි. පළල අඩි 4කි. වටරවුම ඇතුල කොන්ක්‍රාට් කිරිම . ලක්ෂ 7කි . මේ ගෞරි මහත්මියගේ නිවසට යන මාර්ගය නේද?අංක 84ඒ පනියන්දුව අමිල මහතාගේ නිවස අසළ මාර්ගය දුර මිටර් 200. මුදල ලක්ෂ 7කි. මහ අම්බලන්ගොඩ ඇන්කර් එජන්සිය පිටුපස මාර්ගය ලක්ෂ 6 කි. අංක 85 පටබැඳිමුල්ල පොලිස් නිවාස වලට යන පාර දුර මිටර් 100 පළල අඩි 10 කි ලක්ෂ 5කි. මෙය හෙප්පුමුල්ල කොට්ඨාශයට අයිති මාර්ගයකි. අංක 86 පොල්වත්ත, පොල්වත්ත පුර නිවාස ක්‍රම යෝජනා ක්‍රමයට යන මාර්ගය දුර මිටර් 320 පළල අඩි 13කි. මිලියන 1.1 ක මුදලක් වියදම් කරයි.අංක 86ඊ. ඕකන්ද කොඩිකාර පෙදෙස කාණු පද්ධතිය සමඟ ප්‍රතිසංස්කරණය කිරිම දුර මිටර් 100කි. පළල අඩි 10. ලක්ෂ 5කි. මෙම මාර්ගය සාදා නිම කර ඇත.කාණුව සාදන්න. අංක 86ඒ කළුවඩුමුල්ල පඤ්ඤාලෝක මාවත අතුරු මාර්ගය අබලන් කොටස ප්‍රතිසංස්කරණය කිරිම .යසරාල් ගිනිගේ මහතාගේ නිවස

අසළ මාර්ගය දුර මීටර් 260 කි. පළල 12 කි මුදල මිලියන 1.2 කි.86බී කෙරමිණිය 1 වන හරස් මාර්ගය පැති කාණු යෙදිම හා ප්‍රතිසංස්කරණ කටයුතු කිරිම හා තාර දැමීම දුර මීටර් 200 කි මුදල මිලියන 1.3 කි. 86 සී පොල්වත්ත , පෝරඹ වලව්වත්තට මුහුණලා තිබෙන අතුරු මාර්ගය මීටර් 150 පළල අඩි 8 . මුදල ලක්ෂ 5කි. 86 ඩී. තල්ගස්ගොඩ අශෝක උයන මාර්ගය දුර මීටර් 350 ක් හා පළල අඩි 16 කි මුදල මිලියන 1.3 කි. මෙම මාර්ගය අපි කර අවසන්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

මා එය සංශෝධනය කළා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

මා විපක්ෂ නායකතුමාගෙන් ඉල්ලා සිටිනවා. සුදුවැල්ල පාර කියා දමා තිබෙනවා නම් අපි නතර කර තැන සිට දළුක්කන්ද පාරට වැටෙන තැනට වනකම් කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, සංශෝධන යවා අවසන්. නැවත සංශෝධන ඇතුලත් කළ නොහැක මේ 2000ට . තව 1000 ක් තිබෙනවා. එම 1000 ට පුළුවනි තව මොනවා හරි ඇතුලත් කරන්න. අපගේ කොට්ඨාශ 12 ම ආවරණය වන පරිදි ප්‍රමුඛතාවයක් ඇති මාර්ග මට දෙන්න . ඉදිරියේදි ලැබෙන ප්‍රතිපාදන වලින් මේ වසරේදිම මුදල් දෙන්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ ගම්පෙරළිය යටතට වැටුණු මාර්ගයකට අපේ මේ දින 5 සුළු සහනය ලබා ගැනිමට පුළුවනිද? මොකද අපේ කෙරමිණිය 1 හරස් මාර්ගය සඳහා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නැහැ මෙයට නම්කරන කිසිම මාර්ගයකට අපි නැවත තාර දැම්මට යන්නේ නැහැ. මොකද මේ සඳහා අපිත් මුදල් වියදම් කරනවා. ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙනුත් මුදල් වියදම් කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මෙය කලි කාලයක් යයිද දන්නේ නැහැ

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

මා ඉල්ලා සිටිනවා. ඔබතුමාගේ අවධානය යොමු කරන්න. මා කලිනුත් මේ සභාවේදි ප්‍රකාශ කර සිටියා. කළුවඩුමුල්ල ප්‍රදේශය පිළිබඳ. අපිට වැදගත් වෙනවා මාර්ග සාදනවා මෙන්ම කාණු පද්ධතියත් සකස් කර ගැනිම. කළුවඩුමුල්ලේ කාණු ප්‍රශ්නය නිසා කොච්චර මාර්ග හැදුවත් කැඩෙනවා. කාණු ප්‍රශ්නය නිසා. කළුවඩුමුල්ලේ කඳු නිසා මාර්ග කැඩි යනවා. එම නිසා කාණු පද්ධතිය පුළුවන්නම් සකස් කරන්න. කණු ටික සාදා ඉන්පසු මාර්ග ටික සංවර්ධනය කරන්න. දැන් මේක කරන්න දෙයක් නැහැ. ඉදිරියේදි එන ඒවගේ කාණුටික තමයි ප්‍රධාන.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්දා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

ගරු මන්ත්‍රිතුමනි, කළුවඩුමුල්ලේ මාර්ග වල කාණු සමඟ තමයි මා යෝජනාව දමා ඇත්තේ . කොඩිකාර මාර්ගය , පඤ්ඤාලෝක මාවත ඒ වගේ කාණු සකස් කර තමයි මාර්ගය හදන්න යෝජනා කර ඇත්තේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මාර්ග නම් හදනවා. එම මාර්ග හදන එක බොහොම හොඳයි. නමුත් මාර්ගයක මා දන්නා තරමින් නම් පලවෙනි අයිතිය ඇත්තේ පයින් ගමන් කරන්නන්ට. එහෙත් නොසලකා හැර ඇත්තේත් එයයි.මාර්ගයේ මැද හදනවා මාර්ගයේ පයින් ගමන් කරන අයගේ අයිතිය නොසලකා. අද වන විට වාහන වැඩියි.

සුදු ඉර ගසා තිබෙනවා හරියටම අයිනට වෙන්න. එතැනටම බස්රථ නතර කරනවා. එහෙත් පයන් ගමන් කරන අයගේ ප්‍රදේශයේ කැලේ වැව් ඇත. එය නොසලකා හැර තිබෙනවා. මාර්ග හදනවිට එය සැලකිල්ලට භාජනය වෙයි කියා මා සිතනවා. මා ඉල්ලා සිටිනවා එය සිදු කරන ලෙස.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ගරු මන්ත්‍රීතුමා ගෙන එන ලැබුවේ හොඳ වැදගත් යෝජනාවකි. මේ කාලයේ ඇත්තටම වසර 3 කට වැඩි කාලයක් මහජන නියෝජිතයන් කවුරුවත් නොසිටි වකවනුවක් පසු කිරිමෙන් පසු තමයි අප වැඩ කරනු ලබන්නේ.වෙනදා නම් අපි මාර්ගයක් හැදිමට යනවා නම් මුළුන්ම පාර අයින් සුද්ද කිරිමට යවනවා. එසේ යවා තමයි ඔය තාර වැඩ කටයුතු කරන්නේ. මේ පාර අපට එහෙම කරන්න වෙලාවක් හම්බ වෙන්නේ නැහැ. සියළුම මාර්ග අබලන් වෙලා තිබුණේ. දැන් අද වන විට 80% වගේ හොඳ මට්ටමකට ඇවිත් තිබෙන්නේ. දැන් එම කටයුත්ත කරගෙන යනවා. ඉදිරියට තව මාසයකින් දෙකකින් ඔය කියන කාරණය කිරිමට හැකියි. එවිට මේ වැඩ අඩු වෙනවා අපිට.

**තීරණය -**

ගම්පෙරළිය වේගවත් ග්‍රමීය සංවර්ධන වැඩසටහන -2019 වර්ෂයේ ග්‍රාමසේවා වසම් සඳහා යෝජනා කළ ග්‍රාමීය මාර්ග ලේඛනයේ සඳහන් මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූව මහතා විසින් සිදු කරන බව ගරු සභාවේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කරන ලදී.

**12.11 2019 වෙසක් උත්සවය නිමිත්තෙන් අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සංගමය සංවිධානය කරනු ලබන බැති ගී සංදර්ශනයේ සංවිධානය කටයුතු වෙනුවෙන් වේදිකාව සහ ශබ්ද විකාශන පහසුකම් ලබා දීම සම්බන්ධ වියදම් ඇස්තමේන්තුව සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

2019 වෙසක් උත්සවය නිමිත්තෙන් අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සංගමය විසින් සිදු කරනු ලබන පුණ්‍ය කටයුත්ත වෙනුවෙන් ප්‍රජා සංවර්ධන නිලධාරි විසින් ඉදිරිපත් කරනවා. උක්ත කරුණට අදාලබෞද්ධ සංගමේ සභාපති හා ලේකම් විසින් ගරු නගර සභාවේ සභාපතිතුමාට යොමු කරන ලද ලිපිය 2019.02.04 වෙනි දින පැවති සභාගත කරන ලද අතර තිරණ අංක 3:3 මඟින් වෙසක් උත්සවයේ බැති ගි සංදර්ශනයේ බැති ගි ගායනය සම්බන්ධයෙන් වේදිකාව සහ ශබ්ද විකාශන පහසුකම් ලබා දිමට අනුමතිය ලබා දී ඇත. ඒ අනුව පහත පරිදි අනුමතිය ඉල්ලා ඇත.

| | |
|---|---|
| 32*20 වේදිකාවට | රු. 70000/= |
| ශබ්ද විකාශන යන්ත්‍ර සඳහා | රු. 70000/= |
| | ----------------- |
| මුළු මුදල | රු.140000/= ක මුදලක් ඉල්ලා සිටිනවා. |
| | ========= |

මෙච්චර මුදලක් අවශ්‍ය වන්නේ මොකද? මේ ශබ්ද විකාශන වලට රු.70000/= ක් . ඇත්තටම අපරාදයකි. කොහොමද ඇස්තමේන්තු වුණේ. සාමාන්‍යයෙන් වේදිකාවක් රු.30000-රු.40000/= ක් පමණනේ වෙන්නේ.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>

මේ සඳහා මුදල් තිබෙනවා නේද තරුණ බෞද්ධ සමිතියේ. එම මුදලුත් ඒ අය පාවිච්චි කළ යුතුයි.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

නැහැ මේ ඇස්තමේන්තුව මෙච්චර වැඩි වුනේ ඇයි. ගරු මන්ත්‍රීවරුන්ට ප්‍රකාශ කළ යුතුයි මෙම කරණා දෙක සැම වසරකදිම අපි ලබා දී තිබෙනවා. ගණන වැඩි එක විතරයි මට ප්‍රශ්නය වි තිබෙන්නේ. මෙම රු.70000/= වන විට අපිට වේදිකාවක් ඉදිකළ හැකියි. දැනට නගර සභා සතු ශබ්ද විකාශන යන්ත්‍ර ඇයි මෙයට යොදා ගැනීමට බැරි. මෙම තත්වයට එමට තව මොනවාද අවශ්‍ය . අවශ්‍ය බඩු ටික මෙම මුදලින් ගතහැකියි. එය අඩුම ගානේ සභාවට ඉතිරි වෙනවානේ.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, ඔය වෙසක් කලාපයට එය සංගිතය සපයන කට්ටිය එම භාණ්ඩ උවමනා නම් එම භාණ්ඩය අරගෙන යන්නේ. එම තබ්ලාව ගහන පුද්ගලයා ඒය රගෙන යන්නේ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

ගරු මන්ත්‍රිතුමා ඒ අය ඉල්ලා සිටින්නේ ශබ්ද විකාශන යන්ත්‍ර හා වේදිකාව පමණයි.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්**

ගරු සභාපතිතුමනි, යම්කිසි මුදලක් වියදම් කළ මෙය ගතහොත් එය අපගේ සභාවට තියෙනවානේ. මා නම් එසේ කිරිමට කැමති බවට යෝජනා කර සිටිනවා. කවුරුහරි එය ස්ථිර කරන්න. එය සභාවේ වත්කමකි. මෙම රු140000/= ක් දුන්නාම එය සභාවේ වත්කමක් වෙන්නේ නැහැ. එය සභාවේ මුදල් පිට විමක් විතරයි සිදු වන්නේ. යෝජනාවලට නොතිබුණත් දැන් යෝජනාවක් කරනවා එසේ කරන ලෙසට.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**

ගරු ලක්ෂ්මි මන්ත්‍රිතුමිය ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.
**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

අපට සභාවට ලබා දෙන්න වාර්තාවක් . තව අවශ්‍ය ශබ්ද විකාශන වල අඩුපාඩු මොනවාද කියා. දැන් මේ ඇස්තමේන්තුව සම්බන්ධයෙන් ගරු මන්ත්‍රිවරු මොකද කියන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්**

ගරු සභාපතිතුමනි, දැන් සැම වර්ෂයකම මෙය ලබා දෙනවා නේ. මෙම භක්තිගිත අසන්නේ අම්බලන්ගොඩ අවට සිටින ජනතාවනේ. එහි බබල් 6ක් දැම්මත් 10 ක් දැම්මත් එකම දෙයයි සිදු වන්නේ. ඔතනට පැමිණ මිසක නිවෙස් වල සිට භක්ති ගී අසන්නේ නැහැ. එහෙම වෙන්න ඕනේ නැහැ. අවමය දෙකක් හරි යොදා අඩු කරන්න. එහෙම වුණාම ලබන පාරට තව දෙකක් ගත හැකිය. අපි එහි පියවරෙන් පියවර යන්න. දැනට දෙකක් අරගෙන දි එයින් කොටසක් . ලබන වසරේ ඉල්ලන විට එයට අඩුපාඩුවක් තිබෙනවා නම් අරගෙන දෙන්න . බලපිටිය , මාදම්පේ ජනතාව නිවෙස් වල සිට භක්ති අසන්නේ නැහැ. එය ඇසිමට කැමති අය මෙතැනට පැමිණ භක්ති ගිත සංදර්ශනය නරඹා යනවා. දරුවන්ගේ දෙමාපියනුත් පැමිණ. මා ප්‍රකාශ කරන්නේ මෙහි අඩක් අරගෙන දෙන්න. එය වත්කමක් ලෙස තබා ගන්න. නගර සභාවේ උත්සවයකට වුණත් එය පාවිච්චි කළ හැකියි.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

ඔබතුමියගේ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රි සරත් ශ්‍රී ලාල් මහතා ස්ථිර කළා. වේදිකාව සම්බන්ධව මොකද කියන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්**

වේදිකාව සාදාගත හැකිය. ඉතා විශාල මුදලක් වැය නොවේ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

මට ලංකාවේ තිබෙන විශාලම වේදිකාවටත් ඉල්ලා සිටියේ රු.100000/= පමණ මුදලකි. අඩි 60*40 පළල . පැමිණ මගේ වැඩක් නම් එම මුදලට සවිකර දෙන්නම් කිව්වා.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්**

මා පවසන්නේ මිළ ගණන් කැඳවා මෙය අපි සදා ගන්න. 40*20 වේදිකාවක් සාදා ගන්න.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

දැන් මෙහි තින්දුව ශබ්ද විකාශන යන්ත්‍ර සඳහා අඩුපාඩු නගර සභාව මඟින් ම සපුරා දිමටත් , වේදිකාවත් නගර සභාවෙන් සාදා දිමටත් වේදිකාවක් සුදාකම් තර දිමටත් එම කාල සිමාවට කිරිමට නොහැකි වුවහොත් එය ලබා දීමට දැනට මෙය අනුමත කරන්න.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**

ඔය කාල සිමාව තුල කිරිමට පුළුවනි. එය මහා ලොකු දෙයක් නෙමේ වේදිකාවක් ඉදිකරන එක. එම බඩු ටික ගන්නා එකත් යෝජනා කර ඉටු කරන ලෙස ඉල්ලා සිටිනවා. සතියකින් ගැසිය හැකියි වේදිකාව.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

වියදම කියක් විතර වෙයිද

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**

එම වේදිකාවට දිනකට බදු මුදල කියක් ඉල්ලා සිටිනවාද?

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

දිනකට රු35000/= කි

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**
දින කියක්ද

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

දින දෙකකි.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ  මහතා කතා කරමින්**

වේදිකාවේ ප්‍රමාණය කියද ? මා වේදිකාවක් හැදුවා අඩි 20*10 මා හට වියදම් වු මුදල එක්ලක්ෂ ගණනකි.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**

ඕව් රු.100000/= විතර යයි. මෙම මුදලට වේදිකාවක් දින 5ක් ලබා ගන්නේ නම් වේදිකාව ඉදිකරන මුදලට වඩා යනවා.
**ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්**

ගරු සභාපතිතුමනි, ගරු නගර සභා මන්ත්‍රි සරත් චන්ද්‍ර මහතා මේ පිළිබඳව දන්නවා. මොකද එක් එක් පුද්ගලයා දන්න ශිල්ප තිබෙනවා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඔබතුමාලාගේ මෙම අදහසට මා එකගයි. කොහොමත් වේදිකාවක් නගර සභාවට තිබිය යුතුයි.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්**

ගරු මන්ත්‍රිතුමාට උපදෙස් දිමට හැකියාව තිබෙනවා මේ පිළිබඳව

**තීරණය -**

2019 වෙසක් උත්සවය නිමිත්තෙන් අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සංගමය සංවිධානය කරනු ලබන බැති ගී සංදර්ශනයේ සංවිධානය කටයුතු වෙනුවෙන් වේදිකාව සහා අරමුදලින් සකසා දීමටත් , ශබ්ද විකාශන පහසුකම් වලට අවශ්‍ය උපකරණ ලබා ගැනිම සුදුසු බවත් ඊට අදාල කාලයට එය සකසා ගැනිමට නොහැකි වුවහොත් එය ඇස්තමේන්තු කර ඇති රු.140000/= ක මුදලට ලබා දිම සඳහා සහා අනුමතිය ලබා දීම සුදුසු බවටත් , ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු නගර සභා මන්ත්‍රිනි ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් ඒකමතිකව සහා සම්මත විය.

**12.12 නගර සභා පෙර පාසල්වල සේවය කිරිම සඳහා සහයක ගුරුවරියකගේ සේවය ලබා ගැනිම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ නගර සභා පෙර පාසල්වල සේවය සඳහා සහයක ගුරුවරියගගේ සේවය ලබා ගැනීම. අම්බලන්ගොඩ නගර සභාව මගින් පෙර පාසල් හතක් පවත්වා ගෙන යනු ලබන අතර, ඉන් පොල්වත්ත පෙර පාසල පන්ති 04 කින් සමන්විත දරු දැරියන් 100 පමණ අධ්‍යායන කටයුතු සඳහා පහසුකම් ඇති ස්ථානයකි. නමුත් පොල්වත්ත පෙර පාසලේ මානෙල් පන්තියේ සේවය කරන ලද චන්ද්‍රසිලි මිය 2014 වසරේ විශ්‍රාම යාම හේතුවෙන් 2015 වසරේ සිට එම පන්තිය වසා ඇත. එමෙන්ම පෙර පාසල් හතෙහි ස්ථිර ගුරුවරු පමණක් සේවය කරනු ලබන අතර , පෞද්ගලික අවශ්‍යතාවයක් හෝ රාජකාරි අවශ්‍යතාවයක් මත එම ගුරුවරුන්ට නිවාඩු ලබා ගැනීමට සිදුවුවහොත් එදිනට එම පෙර පාසල් වසා දැමීමට සිදුවේ. විශේෂයෙන්ම ගුරුවරුන්ට පුහුණු පාඨමාලා වැඩමුළුවලට සහභාගී විමට සිදුවිමේදි සමහර අවස්ථාවල දි සතියට දින 02ක් හෝ ඊට වැඩි දවසක් පෙර පාසල් වසා තැබිමට සිදුවන අවස්ථා ද වේ. මෙය පෙර පාලස් කටයුතුවලට විශාල බාධාවක් හා ගැටළුසහගත තත්වයන් ඇති වීමට හේතු වි ඇත. මෙම පෙර පාසල් කටයුතු විධිමත්ව පවත්වාගෙන යාමට හා සම්පත් වඩාත් ඵලදායි ලෙස යොදා ගැනීමට පෙර පාසල් සහයක ගුරිවරියක් බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු සලකා දෙන මෙන් ඉල්ලා ඇත

**<u>ගරු නගර සභා මන්ත්‍රිනි ඩබ්.එම් . නිලානි මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රිවරුනගෙත් අවධානය යොමු කළ යුතුයි මේ පෙර පාසල් සම්බන්ධයෙන්. මා හිතනා විදියට පෙර පාසල් සහායක ගුරුවරියක් බඳවා ගන්නවා කිව්වතා පොල්වත්ත පෙර පාසලේ දැනට ඇත්තේ ළමුන් 100 ටත් අඩු ප්‍රමාණයකි. දැනට පෙර පාසල් වල සිටින සිසුන් සංඛ්‍යාව සලකා බලන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

පොල්වත්ත පෙර පාසලේ පන්ති කාමර 4 ක් තිබෙනවා. ගුරුවරු ඉන්නේ 3 යි. එක පන්තියක් වසා ඇත.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනි ඩබ්.එම් . නිලානි මෙනවිය කතා කරමින්</u>**

ගුරුවරු නෙමේ මෙහි ළමයින් සිටින්නෙත් අඩුවෙනි. සියළුම පෙර පාසල් වල ළමුන් ප්‍රමාණය අඩු වී තිබෙනවා. එම නිසා සහායිකාවක් අවශ්‍ය වන්නේ ළමුන් ප්‍රමාණය වැඩි නම්. ළමුන් 10 ක් 15ක් සිටිනවා නම් එම ගුරුතුමියට පෙර පාසල කරගෙන යාමේ හැකියාව තිබෙනවා. මා ප්‍රජා සංවර්ධන නිලධාරි මහත්මියගෙන් හා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා මේ සම්බන්ධව අවධානය යොමුකර අවශ්‍ය තැනට පමණක් යොදවා මේගැන සොයා බැලිමට කටයුතු කරන ලෙස.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනි ඊ.ඉන්දා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, පුහුණු පාඨමාලා ,වැඩමුළු වැනි දේවල් පවත්වන විට ඇත්තටම පෙර පාසලක් වසා තැබිය නොහැකිය. එම නිසා සහායිකාවක් සිටිය යුතුයි. එක් පෙර පාසලක ගුරුවරියක් නැති අවස්ථාවක එම පෙරපාසලටද මෙම සහායිකාව යැවිය හැකිය. මෙම යෝජනාවට එකඟ වෙනවා.

ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්

මාත් මෙම යෝජනාවට එකඟ වෙනවා.

ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

දැනට අපි මෙම සේවාව පවත්වාගෙන යනු ලබන්නේ පුහුණු සඳහා පැමිණ තිබෙන පෙර පාසල් ගුරුවරියන් යොදවා ගෙනයි. මේ සඳහා එම පුහුණු පෙර පාසල් ගුරුවරියන්ගෙන් හොඳම කෙනෙකු හරි මේ සඳහා බඳවා ගන්න බලන්නම්.

**තීරණය -**

නගර සභා පෙර පාසල්වල සේවය කිරිම සඳහා සහයක ගුරුවරියකගේ සේවය ලබා ගැනිම සඳහා පළාත් පාලන කොමසාරිස්තුමා වෙත ඉදිරිපත් කිරිමට සහා අනුමතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**12.13 පෙර පාසල් නිළ ඇඳුම් මැසීම සඳහා මැහුම් කුළිය ලබා දීම පිළිබඳව ලිපිය සභාගත කරන ලදී.**

ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

පෙර පාසල් නිල ඇඳුම් මැසිම සඳහා මැහුම් කුලි ලබා දීම පිළිබඳව. නගර සභා දැරියන් 150 ක් සඳහා රෙදි ලබා දීම 2019.02.25, 26.27 යන දෙදින තුල ගරු සභාපතිතුමා, ගරු නගර සභා මන්ත්‍රිවරුන්ගේ ප්‍රධානත්වයෙන් පෙර පාසලේදි පැවැත්විණි. එම උත්සව අවස්ථාවේදි නිල ඇඳුම් මැසිමට යන කුලිය ලබා දෙන ලෙස කරන ලද ඉල්ලිමට අනුව මුදල් ලබාදෙන ලෙස ගරු සභාපතිතුමාගෙන් වාචික උපදෙස් ලැබිණි. එම මුදල් ලබා ගැනිමට අනුමතිය හා නිර්දේශ ඉදිරිපත් කර ඇත.

- පොල්වත්ත පෙර පාසලේ ළමයි 43 ක් සඳහා රු10750.00
- ඕකන්ද පෙර පාසලේ ළමයි 11 ක් සඳහා රු. 2750.00
- කෙරම්ණිය පෙර පාසලේ ළමයි 28 ක් සඳහා රු. 7000.00
- තල්ගස්ගොඩ පෙර පාසලේ ළමයි 20 ක් සඳහා රු. 5000.00
- කැටන්තොට පෙර පාසලේ ළමයි 18 ක් සඳහා රු. 4500.00
- හෙප්පුමුල්ල පෙර පාසලේ ළමයි 11 ක් සඳහා රු. 2750.00
- හිරේවත්ත පෙර පාසලේ ළමයි 19 ක් සඳහා රු. 4750.00

මැහුම් කුලි ලෙස මුළු මුදල ලෙස රු.35400/= ක මුදලක් ගෙවිම සඳහා සභාවේ අනුමතිය ඉල්ලා සිටිනවා.

**තීරණය -**

අම්බලන්ගොඩ නගර සභා පෙර පාසල් සඳහා නිළ ඇඳුම් මැසිම වෙනුවෙන් පහත පරිදි මැහුම් කුළි රු.37500 ලබාදිම සඳහා අනුමතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් ඒකමතිකව සභා සම්මත විය.

- පොල්වත්ත පෙර පාසලේ ළමයි 43 ක් සඳහා රු10750.00
- ඕකන්ද පෙර පාසලේ ළමයි 11 ක් සඳහා රු. 2750.00
- කෙරම්ණිය පෙර පාසලේ ළමයි 28 ක් සඳහා රු. 7000.00
- තල්ගස්ගොඩ පෙර පාසලේ ළමයි 20 ක් සඳහා රු. 5000.00
- කැටන්තොට පෙර පාසලේ ළමයි 18 ක් සඳහා රු. 4500.00
- හෙප්පුමුල්ල පෙර පාසලේ ළමයි 11 ක් සඳහා රු. 2750.00
- හිරේවත්ත පෙර පාසලේ ළමයි 19 ක් සඳහා රු. 4750.00

මුළු එකතුව රු.37500.00

## 12.14 නගර සභාව සතු වාහන වල ඉන්දන අඩුවීම හා 2018.11.30 සිදුවීම සම්බන්ධ පරීක්ෂණ වාර්තාව සභාගත කරන ලදි

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

නගර සභාවේ ඉන්ධන සොරකම් කිරිම පිළිබඳව පරීක්ෂණයක් සිදු වුණා. එහි පරීක්ෂණ වාර්තාව ඉදිරිපත් කර ඇත.මෙහි පිටපත් සෑම ගරු මන්ත්‍රීවරයෙකුටම ලබා දී තිබෙනවා. එහි යෝජනා හා නිර්දේශ පමණක් මා කියවනවා.

1. මේ සිද්ධිය සම්බන්ධව කරුණු පිළිබඳ කරුණු විමර්ශනය කිරීමේදි , තෙල් ලීටර් 4 ½ ක ප්‍රමාණය කවුරුන් විසින් තබා ඇති දැයි ඇසින් දුටු සාක්ෂි නොමැති බැවින් නිශ්චිතව ප්‍රකාශ කළ නොහැකි වුවත්, නිරීක්ෂණ අංක 01,03,10 අනුව හා පෙර සිද්ධින් පිළිබඳව කරුණු සලකා බැලිමේදි ඩබ්ලිව්. ඒ බන්දුසිරි මහතා ( වේරගොඩ ) ට විරුද්ධව නිතිමය ක්‍රියා මාර්ග ගැනීම සුදුසු බව යෝජනා කර තිබිම.

2. ආරක්ෂක නිලධාරින් විසින් ආයතන සංග්‍රහයේ 11 පරිච්ඡේදයේ XLVIII හි පළමු උප ලේඛනය යටතේ ඇති වරදවල් අතුරින් අංක 8,15,16 වරදවල් එකක් හෝ කිහිපයක් සිදු කර ඇති බව අනාවරණය වේ. ඒ සම්බන්ධව ආරක්ෂක සේවා ආයතනය දැනුවත් කර ඔවුන්ට විරුද්ධව නීත්‍යානුකූල ක්‍රියා මාර්ග ගැනිම සුදුසු බව යෝජනා කර තිබීම.

3. එමෙන්ම ගිවිසුමේ කොන්දේසි අංක 04 හි සඳහන් පරිදි වයස අවුරුදු 18-60 අතර වයස් සීමාවේ මනා පෞරුෂයකින් යුත් තරුණ නිලධාරින් සේවයේ යොදවන ලෙස දැනුම් දී ඇතත් මෙම චෝදනාවට ලක් වී ඇති පුද්ගලයා අවුරුදු 60 ඉක්මවූ අයෙකුවේ. එමෙන්ම එම වයස ඉක්ම වූ තවත් පුද්ගලයින් දෙදෙනෙකු සිටින බව නිරීක්ෂණය වි ඇත. මෙම අංක 04 දරන කොන්දෙසිය කඩ කර ඇත. ඒ අනුව මෙම කොන්දේසියට අනුව නිලධාරීන් යොදවන ලෙස අදාළ ආයතනය දැනුවත් කිරීම සුදුසු බව යෝජනා කර ඇත.

4. නිරික්ෂණ අංක 01,03,05,07,08,10 කරුණු අධ්‍යයනය කිරීමේදි මෙම ගිවිසුම් කාල සිමාව තුළ සිදු වී ඇති සිද්ධින් හේතුවෙන් මුල්‍ය වශයෙන් පාඩුවක් සිදු වි ඇති අතර , නිරික්ෂණ අංක 05 සිද්ධිය මාධ්‍ය වල පළ විම නිසා නගර සභාවේ කිර්ති නාමයට කැළලක් සිදු වී ඇත. එබැවින් එම අලාභය අයකර ගැනීම සඳහා ගිවිසුමේ අංක 06 යටතේ කටයුතු කිරිම සුදුසු බව යෝජනා කර ඇත.

5. ඉහත නිරීක්ෂණ අංක 1,3,5,7,8,10 අනුව කරුණු අධ්‍යයනය කිරීමේදි ආරක්ෂක සේවය සම්බන්ධ තිබෙන විශ්වාසය පළුදුවී ඇති අතර එම ආරක්ෂක සේවා ආයතනය සමඟ ඇති කර ගන්නා ලද සේවා ගිවිසුමේ අංක 2,4,6,9 වගන්ති උල්ලංඝනය කර ඇත. ඒ අනුව ගිවිසුමේ 16 වන වගන්තිය අනුව ක්‍රියා කිරීම සුදුසු බව යෝජනා කර ඇත. ( අදාළ ගිවිසුම - අංක 18 )

6. 2019.11.24 දින සිද්ධිය සම්බන්ධව මුරකරු සුමුදු මහතා විසින් තමන්ගේ රාජකාරිය පැහැර හැර ඇති බව මාගේ හැඟිමයි. ඒ අනුව ආයතන සංග්‍රහයේ 11 පරිච්ඡේදයේ XLVIII හි පළමු උප ලේඛනය යටතේ ඇති වරදවල් අතුරින් අංක 8,15,16 වරදවල් එකක් හෝ කිහිපයක් සිදු කර ඇති බව අනාවරණය වේ. ඒ සම්බන්ධව මින් ඉදිරියේදි මෙවැනි වැරදි සිදු නොකරන ලෙසට අවවාද කර ලිපියක් නිකුත් කිරීම සුදුසු බව යෝජනා කර ඇත.

7. නගර සභාවේ රියදුරු මහතුන් විසින් ඉන්ධන අඩුවීමක් සම්බන්ධව ස්ථානභාර නිලධාරිට පැමිණිල්ලක් කර ඇතත් විෂයභාර නිලධාරි දැනුවත් කර නැත. එමෙන්ම ඔවුන්ගේ දෛනික ධාවන සටහන් පොත් වලදි කිසිදු ඌනතාවයක් පෙන්න්නේද නැත. ඉන්ධන අඩු වුවත් ඔවුන් පොත් නියම පරිදි යාවත් කාලින කරයි. ඒ අනුව යම් ඌනතාවයක් ඇති වුයේ නම් විෂයභාර නිලධාරි දැනුවත් කර එය තම ලෝග් සටහන් පොතේ ලිඛිතව සටහන් තබන ලෙසට ඔවුන්ට දැනුවත් කිරිම සුදුසු බවට අභ්‍යාන්තර විගණන නිලධාරි නිර්දේශ කර ඇත.

ඒ අනුව ස්ථාන භාර නිලධාරි රනිල් විජේරත්න මහතාගේ ලොග් සටහන් පොතට අනුව පැමිණීමේ වේලාව පිටවීමේ වේලාව සටහන් තැබීමේ වේලාව එකිනෙකට වෙනස්ය. එනම් තමා සේවයට වාර්තා කළ යුතු වේලාව පෙරවරු 7.00 සිට පස්වරු 7.30 ලෙස සටහන් කරන අතර අත්සන් ලේඛණයේ 6.00 ලෙස සටහන් කර ඇත. එම සේවය අවසන් කරන වේලාව අත්සන් ලේඛණයේ 18 ලෙස සටහන් කර තිබෙන අතර අයි බි එකේ 18.30 ලෙස සටහන් කර ඇත. එය එසේ විය නොහැක. අත්සන් ලේඛනයේ අත්සන් නැවත අයි බි එකේ සටහන් විය යුතුය. සමහර වේලාවට අත්සන් ලේඛනයේ නිලධාරින්ගේ අත්සන් වල වෙනසක් පවතින බව අනාවරණය විය. සුබ්‍රමනියම් යන පුද්ගලයාගේ නම දෙයාකාර වේ කියා වාර්තා කර සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමා , අපි මසකට දෙලක්ෂ ගණනක් ගෙවා තමයි මේ ආරක්ෂක සේවය ලබා ගෙන තිබෙන්නේ. ආරක්ෂක සේවයේ නිලධාරින්ගේ යම්කිසි අඩුපාඩුවක් තිබෙනවා නම් අත්සන් කරන ලද ගිවිසුම අනුව නගර සභාවට යම් යම් ක්‍රියා මාර්ග ගත හැකිය. මෙම ආරක්ෂක සේවය පිළිබඳ අධීක්ෂණය සඳහා නගර සභාව මඟින් යම්කිසි නිලධාරියෙක් නම් කර තිබෙනවා. ඔහුගේ වගකීමක් තමයි මේ ආරක්ෂක සේවාව පාවිච්චි කරන පොත්පත් ලිපි ලේඛණ පරික්ෂා කර බලා යම් විෂමාකාරී ක්‍රියා තිබෙනවානම් ඒවාට විසඳුම් ගැනීම. ආරක්ෂක සේවා නිලධාරින්ගේ යම් යම් ප්‍රශ්න තිබෙන්නට පුළුවනි. නමුත් ස්ථානභාර නිලධාරියා තමන්ගේ වගකීම ඉතා හොඳින් කර තිබෙනවා. එතුමා විසින් මෙම නගර සභා සේවකයන් අයථා ලෙස හැසිරුනු ආකාර , බීමත්ව හැසිරීම් ආදිය පොත්පත් වල සටහන් කර තිබෙනවා. නමුත් නගර සභාව පැත්තෙන් ඒ පිළිබඳව කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නැහැ. ඒ පිළිබඳව මාගේ බලවත් කනගාටුව ප්‍රකාශ කර සිටිනවා. අපි නැවත ටෙන්ඩර් දමා ආරක්ෂක සේවයක් ලබා ගත්තාත් ඔය විදියට නම් ක්‍රියාත්මක වෙන්නේ කිසිදු නිලධාරියෙකුට රාජකාරිය නිසියාකාරව කර නොහැකි වෙනවා. ඔවුන් රාජකාරිය අතහැර දමනවා. නගර සභාවේ යම්කිසි සිද්ධියක් සිදුවුවා නම් පරිපාලන නිලධාරින්ගේ වගකීම තමයි මාස ගණන් ගත වීමට නොදී ඒ පිළිබඳ සත්‍ය සොයා බලා සභාව දැනුවත් කර ඒ පිළිබඳ ක්‍රියා මාර්ගයක් ගැනීම. කිසි දෙයක් වහන්න බැහැ. දැන් හොරා අල්ලපු පුද්ගලයා එලවන්න හදනවා නම් නැවත එන කෙනා හොරා අල්ලන්නෙත් නැහැ. අයතා වැඩ නතර කිරීමට උත්සාහ දරන්නෙත් නැහැ. මෙම වාර්තාව දැන් ලැබුණත් මා මේ සම්පූර්ණම වාර්තාව කියෙව්වා. මොකද මෙය පත්තර වල පලවුවා. එය නගර සභාවට හොඳ නැහැ. එවිට ගිවිසුම කඩ කර තිබෙනවා වයස අවුරුදු 60 ඉක්මවූ පුද්ගලයන් යොදවා. මෙය අධීක්ෂණය කරන නිලධාරියාගේ වගකීම. ඇයි මේ නිලධාරින් මෙය පරික්ෂා නොකලේ. එය නිලධාරිගේ ගැටළුවකි. නිලධාරින් දැන ගත යුතුයි තමන්ගේ වගකීම නිසියාකාරව ඉටු කරන්න. නිගමන යටතේ ඔබතුමා කියෙව්වා එ අයගෙන් වාර්තාවක් ඉල්ලා. මා ඉල්ලා සිටිනවා මේ සිද්ධිය පිළිබඳ දින 14 ක් ඇතුළත විමර්ශන වාර්තාවක් ලබා දෙන ලෙස ෆැක්ස් පණිවිඩයකින් යවන්න. එවිට දින 14ක් ඇතුළත විමර්ශන වාර්තාවක් ලබා ගෙන ලබන සභාවට ඉදිරිපත් කරන්න. විමර්ශන වාර්තාවක් ලබා දුන්නාම ඔය ලොග් සටහන් පොතේ තිබෙන සියළුම දේවල් ඡායා පිටපත් කර ඉදිරිපත් කරනවා. එවාට සිදු වුනේ කුමක්ද ? ගත් ක්‍රියා මාර්ග ආදිය ඒ සිද්ධි පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් ඔබතුමාට ලැබෙනවා. ඒ අනුව ඉදිරි ක්‍රියා මාර්ග අපට ගත හැකියි. මේ ගිවිසුම් කඩ කිරීම පිළිබඳව පැහැදිලිව මෙන්න මේ ගිවිසුම් කඩ කර ඇති බවත් ඒවාට හේතු කරුණු ඉල්ලා සිටින්න. ඒවා නිවැරදි කරන්න කියන්න. මේවාටත් දෙන්න දින ගණනක්. මෙන්න මේ කරුණු ඒ අය සිදු කරන්නේ නැතිනම් අපිට පුළුවනි ඊළඟ සභා වාරයේදී මෙයට ක්‍රියා මාර්ගයක් ගැනීමට.ගරු උප සභාපතිතුමා ප්‍රකාශ කළ ආකාරයට මේ වගේ වාර්තාවක් ඉදිරිපත් කරන විට අප නිලධාරින් දෙදෙනෙකුත් , ගරු මන්ත්‍රීවරු දෙදෙනෙකුත් සම්බන්ධ වී මෙම පරික්ෂණය සිදු කළා නම් හොඳ පරික්ෂණයක් විදියට දකින්න තිබුණා. මා අද යෝජනා කර සිටිනවා නගර සභාවේ කුමන හෝ අයතා වැඩක් නීතිවිරෝධී වැඩක් , විනය කඩකිරීමේ වැඩක් සිදු වෙනවා නම් මේ සියළු පාර්ශවයන් නියෝජනය වන පරිදි ගරු මන්ත්‍රීවරුන් තිදෙනෙකු නම් කර නිලධාරින් කිහිප දෙනෙකු සමඟ එම පරික්ෂණය සිදු කොට වාර්තාව සභාවට ඉදිරිපත් කරන ලෙස. මේ සඳහා ගරු මන්ත්‍රීවරු කිසි කෙනෙකු විරුද්ධ නොවන බව මා විශ්වාස කරනවා. මේ තුලින් නගර සභාවේ අයතා වැඩ , නීතිවිරෝධී වැඩ , විනය කඩකිරීමේ වැඩ පාලනය කරගත හැකි වේ. ඔබතුමාට මීට කලින් මා ප්‍රකාශ කර සිටියා. බීමත්ව JCB යන්ත්‍රය පුරුදු කර තිබෙනවා. සභා වාර්තාවල ඇති. මේ සියළු විස්තර දෛනික සටහන් පොත් වල ස්ථාන භාර නිලධාරියා සටහන් කර තිබෙනවා. එවිට රාජකාරිය කරන පුද්ගලයා එලවා දැම්මාම ප්‍රශ්නයක් පැන නැගෙනවා .මේවා නතර වීමට ඔය ක්‍රියා මාර්ග ගන්න . මේ සියළු දේවල් පාලනය

වෙයි. ඔබතුමාට කරදරයකුත් නැහැ. නගර සභාවේ සියළු දේවල් අයතා ලෙස පරිහරණය වන්නෙත් නැහැ. ඒ පිළිබඳ විමර්ශන වාර්තාවක් ඉල්ලා තින්දුවක් ගන්න.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි , මා හටත් මෙය කියවන විට හැඟුනේ එක පාර්ශික තින්දුවක් ලෙසයි. ආරක්ෂක අංශයේ යම්කිසි වැරදි ඇති. මේ අපේ නිලධාරි තමන්ගේ ඇඟ බේරා ගැනිමට මෙම වාර්තාව සාදා ඇති බවයි මට හැඟි යන්නේ. මීට ඉහතදීත් මෙහි සිදුවී ඇති වංචා පිළිබඳ තින්දුවක් ගනු ලැබුවේ නැහැ. පසුව මුදල් වගයක් අයකරගෙන තිබුණා. මේ වාර්තාව අනුව මා ඔබතුමා කියවන විට අසාගෙන හිටියා. විනය විරෝධි කටයුතු සිදු වී තිබෙනවානම් එයට පියවර ගත්තාට කිසි ගැටළුවක් නැහැ. නමුත් හොරු ඇල්ලීමට ගිය පුද්ගලයින්ට වැරුද්ද පටවන එක කිසිසෙත්ම සැහිමකට පත්විය නොහැක. විශේෂයෙන්ම කිව යුතුයි JCB යන්ත්‍රය පුරුදු කළ බවට ඔබතුමා ගිය සභාවේත් කතා කළා. මා ඊට පසුදිනම ගොස් බැලුවා . එම පොත් ගෙන පරික්ෂා කර බැලුවා. එහෙම සිද්ධියක් වී නැහැ. ගරු සභාපතිතුමා නම් අවශ්‍ය වේලාවට වාහනයක් ගෙන්වා ගෙන තිබෙනවා. එය පොතේ ලියා තිබුණා. ගරු සභාපතිතුමා දුරකථනයෙන් දැනුම් දුන් පසු තමයි වාහනය ගෙන්වා ගෙන ඇත්තේ. ඔබතුමා කිව්වේ කැබ් රථය කියා. නමුත් ත්‍රි රෝද රථය තමයි ගෙන්වා ගෙන ඇත්තේ. JCB එක පුරුදු කරපු එක සම්පූර්ණ අසත්‍යයකි. ආරක්ෂක අංශයත් ස්ථාන භාර නිලධාරියාත් කැඳවා සියළු පොත් බැලුවා. එය අසත්‍යයකි. මෙම වාර්තාව සම්බන්ධව අපට ආරක්ෂක අංශයේවත් කිසිම කෙනෙකු ආරක්ෂා කිරිමට අවශ්‍ය නැහැ. මේ වාර්තාව අනුව කියවෙන්නේ මෙය එකපාර්ශිකව ගනු ලැබූ තින්දුවක් හැටියටයි. ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ ආකාරයට මෙහි සිටින ගරු නගර සභා මන්ත්‍රීවරු කිහිපදෙනෙකු සහභාගි කර මෙම පරික්ෂණය සිදු කළානම් හොඳයි කියන මතයේ මා සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, අපේ උප සභාපතිතුමාත්. නියෝජ්‍ය නායකතුමාත් හරි හරියට අදහස් දැක්වූවා. මා හිතනවා සැබෑ මධ්‍යස්ථ මතය මේ පරික්ෂණ මණ්ඩලය ලබා දි තිබෙනවා කියා. මෙම ආරක්ෂක සේවය පිළිබඳ සමහර විට ඔබතුමාත් දකිනවා ඇති එක පුද්ගල ප්‍රසංගයක් යන ලෙස තමයි මට පෙනෙන්නේ. ඒ රනිල් විජේරත්න කියන හමුදා නිලධරයා එතුමන්ගේ පෞරුෂ ගති ලක්ෂණ වල වාග් විලාසයෙන් ආදි සියල්ලෙන්ම අණුණයි. එම සේවාවේ එකම රහන්නා ඔහු පමණයි. එම නිසා මා ප්‍රකාශ කර සිටිනවා මේ ආරක්ෂක නියාමකයින් බල ප්‍රදේශය ගැන මේ අපේ පරිශ්‍රය ගැන කිසිදු දැනුවත් බවින් තොරයි. එසේම මේ රනිල් විජේරත්නයන්ගේ ක්‍රියා කලාපය ගැනත් මෙ පරික්ෂණ මණ්ඩලය ප්‍රකාශ කර ඇත. ඔහු ඒ අත්සන් ව්‍යාජව යෙදිම ගැනත් සඳහන් වේ. මේ අපේ නිලධරයන්, මධ්‍යස්ථ මතධාරි විමර්ශකයන් ඔවුන්ගේ මතය නිවැරදිව ලබා දී ඇති බව. කොයි කොයි අප්පුහාමි අතිනුත් පොඩි පොඩි වැරදි සිදු වෙනවා. ගරු සභාපතිතුමනි, විපක්ෂනායකතුමනි, අපි මේ ගැන තවදුරටත් මධ්‍යස්ථ බැලිය යුතුයි.මා ඉල්ලා සිටින්නේ අපගේ මේ ධනය පිටස්තර සමාගමකට යට නොකර අපේ නගරයේ සිටින දැනුම ඇති තරුණ පිරිස මෙම පරිශ්‍රය ගැන දන්න සවිමත් පිරිස සිටිනවා. මෙවැනි බලකායක් සාදා සැබෑ ආරක්ෂක සේවාවක් ලබා ගැනිමටත් තවත් මෙම පරික්ෂණයක එල්ලී නොසිට ඔබතුමාට විඥානය පහල වේවා යි ප්‍රර්ථනා කර සිටිනවා.සමහර නිවෙස් වල රැකියා නොමැතිව ඇතමුන්ගේ ලිප් පත්තු වෙන්නේ නැහැ. කොච්චර ගම්පෙරළි පැමිණියත් අපේ සමහරු පරිප්පුවයි බතයි කන්න බැරිව සිටිනවා. මේ ගැන නැවතත් සිතන ලෙස මා මතය පල කර සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

මේ නගර සභාවේ ඉන්ධන සොරකම පිළිබඳව මුළු ලංකාව පුරාම පැතිර ගියා. මා හට මේ වාර්තාව හරියට කියවන්න වුයේ නැහැ. මේ පරික්ෂණය ඉල්ලා සිටියෙත් මේ ගරු සභාවෙන්. එය හරිද වැරදි ද කියා වාර්තාව කියවා තමයි තේරුම් ගැනිමට වෙන්නේ. නමුත් මා හිතන්නේ කුමක් හෝ වරදක් සිදු වී තිබෙනවා. අපි විසින්ම තමයි ගිවිසුම් අත්සන් කර මේ ආරක්ෂක සේවාව ලබා ගෙන ඇත්තේ. එහි ප්‍රධාන ස්ථානභාර නිලධාරියා යම් වාර්තාවක් ලබා දි තිබෙනවා නම් මෙවැනි සොරකමක් සිදු වෙනවා කියා ඒ ගැන සුළු පටුවෙන් තකන්න බැහැ.මුළු

නගරයේ ජනතාව වෙනුවෙන් පිළිකුලෙන් එම සොරකම හෙලා දකිනවා. මෙය ආයතන මට්ටමින් අභ්‍යාන්තර විගණන නිලධාරි මගින් සිදු කළ විට යම් යම් ප්‍රශ්න ගැටළු පැමිණීමට පුළුවනි. එහෙම පරීක්ෂණයක් පැවැත්වීමට අවශ්‍ය නම් පළාත් පාලන ආයතන වල විමර්ශන නිලධාරි සිටිනවා. ස්වාධීන පරික්ෂණයක් පැවැත්විය හැකියි. ඉදිරියට මේවා පුර්වාදර්ශ විය හැකියි. මෙය ගරු සභාවටත් යොමු කර හැල්ලුවට ලක් කළ නොහැකිය. එම නිසා වරදක් කර තිබෙනවා නම් දඩුවමක් ලබා දෙන්න.අපගේ ගරු උප සභාපතිතුමා කළ ප්‍රකාශ අහක දැමිය නොහැක.ගරු විපක්ෂ නායක නගර සභා මන්ත්‍රි ඩෙනට් පනියන්දුවගේ මහතාත් ආරක්ෂක සේවය පිළිබඳ හොඳ දැනුමක් තිබෙන කෙනෙකි.එතුමා ප්‍රකාශ කළ දෙයත් අහක දැමිය නොහැක. මේ ගැන විධිමත් පරික්ෂණයක් පවත්වන්න. එය කවුද පුද්ගලයා කියන එක නෙමේ. මේ සම්බන්ධව නිවැරදි තින්දුවක් ගන්න. ඉදිරියට තබා කටයුතු කරන්න. මේ සොරකම ගැන හැල්ලුවට ලක් කිරිම ඉතාම හායනක දෙයකි. මේ පිළිබඳ ගැටළු තිබෙ නම් කියවා බලා නැවත පරික්ෂණයක් පවත්වන ලෙස ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රි ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මාත් ගරු උප සභාපතිතුමා හා විපක්ෂ නායක ගරු නගර සභා මන්ත්‍රිතුමා ඉදිරිපත් කළ මතයට එකඟ වෙනවා. මාගේ දැනිමේ හැටියට මේ ආරක්ෂක සේවයේ යම් යම් අඩු පාඩු තිබෙනවා. මා දන්නා විදියට ඔවුන් පුළුවන් විදියට යුතුකම් ඉටු කළ බවයි. මෙම වාර්තාව ගැන මා සැහිමකට පත් වෙන්නේ නැහැ. තනි පුද්ගලයෙකු දෙනු ලැබු වාර්තාවක්. ගරු නගර සභා මන්ත්‍රි රාහුල මහතා ප්‍රකාශ කළ පරිදි මෙය වැඩි දුරටත් බලනවා නම් හොඳයි. මෙය මුළු ලංකාවම දැනගත් ප්‍රශ්නයක් නිසා. මේ ආරක්ෂක අංශයට මේ තිරණය ගනු ලැබුවහොත් මේ ලංකාව පුරාම යන්නේ අර මතයයි. සොරකම් කරන්න අවශ්‍ය නිසා මෙය අයින් කළ බවයි. මෙය ඉදිරියට ක්‍රියාත්මක කරනවා නම් ඉතාමත් කල්පනාකාරිව කළ යුතු වැඩකි. මෙය ඉදිරියට කරන්නේ කොහොමද කියන එක. ඒ සඳහා ඔබතුමාට පුළුවන් කමිටුවක් පත් කර අපගේ ගරු මන්ත්‍රිවරු කිහිප දෙනෙකු පත්කරන්න. ඉක්මනින් මේ යෝජනාව අනුව සිදු කළහොත් අපිට විශාල ගැටළුවකට මුහුණ දිමට සිදුවේ.

<u>ගරු නගර සභා මන්ත්‍රි ඒ.ඩබ් ජගත් කුමාර මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, ඇත්තටම මෙම ආරක්ෂක සේවාව හොඳයි. වැරදි සිදුවෙනවා ඕනම පුද්ගලයෙකු අතින්. එම නිසා අපගේ ගරු නගර සභා මන්ත්‍රි ග්‍රේෂන් කෙරමිණියගේ මහතා යෝජනා කර සිටියා ගමේ පුද්ගලයින් මේ සඳහා බඳවා ගන්නා ලෙස. මා නම් ඊට අකමැතියි. මොකද බස්නැවතුම්පොළේ  මොනවා හරි සිද්ධ වුණොත් බැනර් ප්‍රදර්ශනය කර තිබුණොත් ගරු සභාපතිතුමා නිර්දේශ කර යවනවා වැටුපෙන් කපන ලෙස . අපේ ගමේ උදවිය මේ සඳහා යොමු කළහොත් අපිටත් එය හරි කරදරයක් වෙනවා. මේ සිටින ආරක්ෂක අංශයම තබා ගන්න. ඔවුන් වැරුද්දක් කර තිබෙනවා නම් වැටුපෙන් අඩු කර හරි ඔවුන් තබා ගන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රි ජී. සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, නගර සභාවට ආරක්ෂාව සපයන ආරක්ෂක අංශයෙන් යම්කිසි අධික්ෂණයක් සිදු කර යම්කිසි සොරකමක් පිළිබඳ දැනුම් දී එය ජනමාධ්‍ය මඟින් මුළු ලංකාව දැන ගනු ලැබුවා. අපි මොන පරික්ෂණ තිබ්බත් මොන කතා කළත් දැන් සොරකම සිදු වී අවසන්. එය සත්‍යයකි. මෙය අධිකරණයක් නෙමේ මෙය මෙහෙම සිදු වුයේ මෙසේයි කියන්න. ඉතිං දඩුවම් දෙන විට එය සිදු වෙනවා. එකනේ දැන් සිදු වෙමින් පවතින්නේ. එතකොට සොරකම සිදු වී නැහැ. ඒ වාර්තාවට අනුව සිද්ධ වෙන්නේ මෙයයි. එම නිසා මේ පිළිබඳව අපට සැහිමකට පත්විය නොහැක.මේ සභාවේ සභාපති, ගරු මන්ත්‍රිවරු විදියට, නගර සභාවක් විදියට සැහිමකට පත් විය නොහැක. මේ සභාවේ දූෂණ , වංචා හෝ සොරකම් සිදු වෙනවා නම්  ඒ පිළිබඳව නිසි දඩුවමක් තිබිය යුතුයි. අපි ප්‍රකාශ කර සිටින්නේ ඇසින් දුටු සාක්ෂා නැති වුණොත් නගර සභාවත් රැගෙන යා හැකි බවයි. ඇසින් දුටු සාක්ෂි නැහැ. එහෙම කොහොමද වෙන්නේ ගරු සභාපතිතුමනි. තෙල් හොරෙන් රැගෙන යනවා. ඇසින් දුටු සාක්ෂි නැහැ. කොහොමද හොයන්නේ. JCB යන්ත්‍රය හොරෙන් අරන් යනවා . ඇසින් දුටු සාක්ෂි නැහැ. වාර්තා වෙනවා ඇසින් දුටු සාක්ෂියක් නැත. වාර්තාවෙනවා ඇසින් දුටු සාක්ෂා නැත. එම පිළිතුරම නේද? මෙයට නිසි ක්‍රමවේදයක් හදන්න. ආරක්ෂක අංශයට අපි ඇඟිල්ල දික් කළා එම අයගේ සේවාව හොඳ නැහැ කියා. ඒ අය ඔවුන්ගේ සේවය ඉටු කරන විට අපි එය ඉවතලනවා. එය අහක බලනවා. එසේ නැත්නම් අපි එය අගේ කරන්නේ නැහැ. නැතිනම් එයට වටිනාකමක් දි නැත. එම නිසා මා ප්‍රකාශ කර සිටින්නේ මේ සොරකම ප්‍රථම වතාවට සිදු වුණාද? මේ නගර සභාවේ සිදු වන්නේ

මෙවැනි සොරකම් පමණක් ද ? ඒ වගේ අපට සොයා බලා කටයුතු කරන්න සිදු වෙනවා. මෙය යට ගැසුවොත් මින් ඉදිරියට සියල්ල යට ගැසෙනවා. මින් ඉදිරියට තවත් වැඩි වෙයි. මේ අහිංසක නිලධාරින් සිටිනවා. අහිංසක කම්කරුවන් සිටිනවා. ඒ අයත් මින් බේරිය යුතුයි. අපාක්ෂපාති පරික්ෂණයක් නැවත සිදු කරන්න. අභ්‍යාන්තර විගණන තුමා හෝ තුමිය තමයි මේ පරික්ෂණය සිදු කරනු ලැබුවේ.අපට ඒ අයට උපදෙස් දෙන්න බැහැ . නමුත් ඒ අය සමඟ තර්ක කරන්න බැහැ. එත් අවසානයේ ප්‍රතිඵලය මේ සොරකම යටයැම . මෙය නරක පූර්වාදේශයක් බව ගරු මන්ත්‍රිවරු විදියට විශ්වාස කරනවා.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

මේ සම්බන්ධව විෂය වු කරුණු කිහිපයක් ඉතිරිපත් වි ඇති නිසා මා යෝජනා කර සිටිනවා අම්බලන්ගොඩ නගර සභාව වෙනුවෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් පත් කර සිටින විමර්ශන නිලධාරිත් අපගේ පාර්ශවයෙන් ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතාත් , විපක්ෂ නායක ගරු නගර සභා මන්ත්‍රි ඩෙනට් පනියන්දුවගේ මහතාත් , ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතාත් , ගරු නගර සභා මන්ත්‍රි එස්.එම්. සරත් චන්ද්‍ර මහතාගෙන් සමන්විත කමිටුවකින් එක්රැස් වෙලා මේ ගැන විභාගයක් කර ගත යුතු පියවර සභාවට වාර්තා කරන්න.මේ කියන කරුණු සියල්ලම විශ්ලේෂණය කර වාර්තාවක් සපයන්න.

**තීරණය -**

නගර සභාව සතු වාහන වල ඉන්ධන අඩුවීම සම්බන්ධ පරික්ෂණ වාර්තාව සභාවට ඉදිරිපත් කිරිමෙන් පසු ඒ පිළිබඳ සාකච්ඡා කළ සභාව පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් පත් කර ඇති විමර්ශන නිලධාරි , ගරු උප සභාපතිතුමා ,ගරු නගර සභා මන්ත්‍රි ඩෙනට් පනියන්දුවගේ මහතා , ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා හා ගරු නගර සභා මන්ත්‍රි එස්.එම්. සරත් චන්ද්‍ර මහතා ආදි පිරිසගෙන් සමන්විත පරික්ෂණ කමිටුවක් පත්කර මෙයට අදාල සියළු කරුණු විමර්ශනය කර වාර්තාවක් සකසා ලබන සභාවට ඉදිරිපත් කිරීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු නගර සභා මන්ත්‍රි ඒ.ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රිවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් ඒකමතිකව සභා සම්මත විය.

### 12.15 අභ්‍යාන්තර දුරකථන පද්ධතිය සඳහා 2019 ජනවාරි මසයේ රු.12437.57 ක මුදලක් ලංකා බෙල් සමාගමට ගෙවීම සඳහා නිර්දේශ අනුමතිය ලබා ගැනීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

නගර සභා අභ්‍යාන්තර දුරකථන පද්ධතියේ 2019 ජනවාරි මස ගෙවීම.2019 ජනවාරි මසයේ කාර්යාලයේ අභ්‍යාන්තර දුරකථන පද්ධතිය සඳහා රු.12437.57 ක මුදලක් ලංකාබෙල් සමාගමට ගෙවීම සඳහා අනුමතිය ඉල්ලා සිටිනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රි ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**</u>

මිට ඉහත දුරකථන වලට ගෙවිම් තිබුණෝ කොහොමද ? ලාභය බලාපොරෝත්තුවෙන් නේද මෙය සිදු කළේ. අපට වාර්තාවක් ලබා දෙන්න පුළුවනි ද? මිට කලින් බිල් කොහොමද ගෙව්වේ. මෙය ස්ථාපිත කරනු ලැබුවේ ලාභයක් බලාගෙනයි. ඒ වෙනසක් තිබෙනවා ද කියා බලා ගන්න අවශ්‍යයි.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

දැන් මෙහෙමයි. මිට ඉහත අපි ටෙලිකොම් සමාගමෙන් ලබා ගෙන තිබෙන්නේ. ඒ සඳහා බිල්පත් ගෙවන්න වෙනවා. මෙය අමතර බිලක් තමයි මේ රු 12437.57. මෙහි තිබෙන්නේ එකම දෙයයි . මේ ස්ථාන වලට අපිට පණිවිඩ යැවිය හැකියි. දැන් ඔබතුමාට ගමේ මළගෙදරක් සිදුවුවහොත් කෙලින්ම ආදාහනාගාරයට කතා කර ආදාහනාගාරය වෙන් කර ගත හැකිය. පුස්තකාලයට, බස්නැවතුම්පොළට කතා කළ හැකියි. එම දුරකථන අංක සියල්ලම ගරු මන්ත්‍රිවරු සියළුම දෙනාට ලබා දෙන්න.

**තීරණය -**

අභ්‍යාන්තර දුරකථන පද්ධතිය සඳහා 2019 ජනවාරි මසයේ රු.12437.57 ක මුදලක් ලංකා බෙල් සමාගමට ගෙවීම සඳහා නිර්දේශ අනුමතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**12.16 ආර්.පී ආතර් ද සිල්වා මාවත ඔස්සේ දොළොස්මහේ තාවකාලික ආවරණයක් ඉදිකිරීම සඳහා අනුමතිය ලබා ගැනීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ආර්.පී ආතර් ද සිල්වා මාවත ඔස්සේ දොළොස්මහේ තාවකාලික ආවරණයක් ඉදිකිරීම සඳහා අනුමතිය ඉල්ලා ලිපියක් ඉදිරිපත් කර ඇත. ලලිත් හැලඹගේ මහතා , අංක 11/09 ජී , ගාලු පාර , අම්බලන්ගොඩ . 2019.03.10 සිට 2019.04.13 දක්වා තාවකාලික ආවරණයක් ටෙන්ට් එකක් ආර්.පී. ද ආතර් ද සිල්වා මාවත ඔස්සේ ඉදි කිරීමට අවසර ඉල්ලා ඇත. එළඹෙන 2019 වසර සඳහා සිය අවශ්‍යතා සපුරා ගැනීම සඳහා අම්බලන්ගොඩ නගරයට දහස් ගණන් ජනයා පැමිණෙනු ඇතැයි බලාපොරොත්තු වෙනවා. එමෙන්ම මේ දොළොස්මහේ රෙදිපිළි වෙළඳසැලට ලංකාවේ නම් දෙසින් ඇදී එන දහස් ගණන් දිනෙන් දින ජනතාව වැඩි වන බව අමුතුවෙන් කිව යුතු නොවේ. නගරයේ සැම ව්‍යාපාරිකයෙකුටම යහපත් වන බව අමුතුවෙන් කිව නොහැකිය. සභාපතිතුමා හා ගරු නගර සභා මන්ත්‍රීවරු මේ සඳහා පසුගිය වසර වල ලබා දුන් සහායෝගය පිළිබඳව ස්තුති වන්ත වන අතර එය අභය කොට සලකනු ලබයි. එහි වාසය කරන නිවැසියන්ට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අවහිරයක් නොවන පරිදි පයිප්ප සම්බන්ධ කොට තාවකාලික සෙවණක් ලබා දීමට අවශ්‍යව ඇත. දැඩි අව් රශ්මිය මධ්‍යයේත් දැඩි වර්ෂා මධ්‍යයේත් දූ දරුවන් සමඟ පිඩා විඳිමින් පෝලිමේ සිර වී සිටිමින් සිටින ජනතාවට සහනයක් වනු ඇත. මෙය පොදු අවශ්‍යතාවයක් ලෙස සලකා මේ ගැන සානුකම්පිතව බලා මෙයට ඉඩකඩ සලසා දෙනමෙන් අවසර ඉල්ලා ඇත. මෙය කල්වේලා ඇති ව සකස් කිරීමට ඔබ ආයතනයට එකඟ වේ යනුවෙන් එච්. ලලිත් මහතා ඉල්ලීමක් කර ඇත. මේ සඳහා ගරු සභාවේ කවුරුත් විරුද්ධ ද ? එකඟතාවය පලකර සිටිනවා.

**තීරණය -**

අම්බලන්ගොඩ දෙළොස්මහේ රෙදිපිළි වෙළඳ සැලට 2019 මාර්තු 10 සිට අප්‍රේල් 13 වන දින දක්වා තාවකාලික ආවරණයක් ( ටෙන්ට් එකක්) ආර්.පී. ආතර් ද සිල්වා මාවත ඔස්සේ ඉදිකිරීමට අනුමතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.

12.17 **ප්‍රාදේශිය ලේකම් කාර්යාලය අම්බලන්ගොඩ .ගම්පෙරළිය ව්‍යාපෘතිය කඩිනම් කිරිමේ වර්තාව සම්බන්ධ ලිපිය සභා ගත කරන ලදී**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ප්‍රාදේශිය ලේකම් කාර්යාලය අම්බලන්ගොඩ .ගම්පෙරළිය ව්‍යාපෘතිය කඩිනම් කිරිමේ වර්තාව . උක්ත වැඩ සටහන අම්බලන්ගොඩ කොට්ඨාශයේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය හරහා සම්බන්ධ කිරිමට යෝජිත ව්‍යාපෘති සම්බන්ධ යෝජනා ඇතුලත් ලේඛණයක් මේ සමඟ අමුණා ඇත. එක ම තමයි . මෙහි සමහර ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා ඉදිරිපත් කර ඇති සමහර දේවල් මෙයින් අයින් වී ඇත.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

අයින් කරනු ලැබුවා සමහර යෝජනා. සංශෝධනය කරනු ලැබුවා ලක්ෂ 12 දමනු ලැබූ තල්ගස්ගොඩ පාර . දැන් ඒ සංශෝධන යටතේ එහි ඇති. පටබැඳිමුල්ල කියන එක හෙප්පුමුල්ල පොලිසියට යන පාර ලෙස සංශෝධනය කළා.

ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

මා ඒවා ඉදිරිපත් කරනවා. ඒවා ක්‍රියාත්මක කිරිමට සභාවේ අනුමතිය ඉල්ලා සිටිනවා. ඇස්තමේන්තු සකස් කර ඇස්තමේන්තු පිටපතක් ඔබ වෙත එවන බවට ප්‍රාදේශිය ලේකම්තුමිය විසින් දන්වා ඇත. මෙහි ඇත්තේ ඔබතුමා කියන ලද කරුණු හා තවත් කරුණු කිහිපයක් තිබෙනවා. . මහ අම්බලන්ගොඩ එස්.එම් රෝෂාන් මහතාගේ නිවස අසළ සිට තුඩුවමුල්ල පාරට සම්බන්ධ වන ස්ථානය දක්වා තිර දැමිම රු.1500000/= කි. හිරේවත්ත හිරිකැටිය හරස් පාර පෝය සිමාව පාර දක්වා ප්‍රතිසංස්කරණය කිරිම සඳහා රු.500000/= කි. හිරේවත්ත නම්බිමුල්ල හරස් පාරේ ජලය බැස යාමට කණු දෙක ප්‍රතිසංස්කරණය කිරිම සඳහා රු.200000/= කි . දේවාලයේ අසළ ජලය බැස යාම සඳහා වම් පැත්තෙන් දකුණු පැත්ත දක්වා කණු ඉදිකිරිම රු.300000/= කි. හිරේවත්ත මහ අම්බලන්ගොඩ පාරේ ගැස් අලෙවි සැල ඉදිරිපිට ළමා උද්‍යානයක් ඉදි කිරිමට රු.2500000/=, කරිත්කන්ද විද්‍යාල මාවත භූමි චන්ද්‍රතිලක මහතාගේ නිවස අසළ මාර්ගය ඉදිකිරිමට රු.700000/= , කරිත්ත කන්ද කන්ද මාවත පාශු වෛද්‍ය කාර්යාලය අසල පැති කාණුව ජලය බැස යන ලෙස අලුත් වැඩියා කිරිම රු.400000/=, කරිත්කන්ද විලේගොඩ හල්වතුර හංදියේ සිට නගරයට එන කුලරත්න පාරේ පැති කාණු බැද කොන්ක්‍රිට් පතුරු දමා පදික වේදිකා ඉදි කිරිම රැ.400000/=, කරිත්ත කන්ද හල්වතුර දැනට ගොඩකරන ලද ඉඩම් කොටසේ ළමා උද්‍යානයක් ඉදිකිරිම සඳහා රු.25000000/=, හෙප්පමුල්ල ආර්.ඊ. ද සිල්වා මාවත තාර දමා සපත්තු කාණු ඉදිකිරිම රු 1200000/=, විලේගොඩ එස්.ඩි ද සිල්වා 1 පටුමග හල්වතුර ඇළ සම්බන්ධ වන ඇළ වටරවුම දක්වා මීටර් 90 කොන්ක්‍රිට් කිරිම රු.700000/=, පනියන්දුව කැටන්තොට අමිල මහතාගේ නිවස අසළ මාර්ගය කොන්ක්‍රිට් කිරිම රු.700000/=. මෙම මාර්ගය මිට කලිනුත් අප සංවර්ධනය කරන්න ගියා. මෙම මාර්ගය තවමත් පෞද්ගලික මාර්ගයක් විදියට තමයි පවතින්නේ. මේ අය නගර සභාවට පැවරිම සිදු කර නැහැ. මුලින්ම රජයට අයත් ඉඩමක් බවට පත්විය යුතුයි. මිට ඉහත ගරු නගර සභා මන්ත්‍රි ඒ.ඩබ්. ජගත් කුමාර මහතා ජාතිය සවිය වැඩ සටහන යටතේ දැම්මාම මුදල් වියදම් කිරිමට බැරි වුණා. පනියන්දුව මහ අම්බලන්ගොඩ ඇන්කර් එජන්සිය පිටුපස මාර්ගය තාර දැමිම රු.600000/=, පනියන්දුව එඬේරමුල්ල සුසිමා මහත්මියගේ නිවස අසළ සපත්තු කාණු ඉදිකිරිම රු.200000/= . පටබැදිමුල්ල ,පොලිස් නිවාස වලට යන මාර්ගය රු500000/=, පටබැදිමුල්ල චන්ද්‍රවාස පාරේ සිට රේණුක මොටර්ස් ඉදිරිපිට කාණු ඉදිකිරිම රු200000/=. මෙය ඉවත් කර ඇත.

ගරු නගර සභා මන්ත්‍රි ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්

මිට ඉහත කියවන ලද්දේ මාර්ග ලැයිස්තුවයි. අපගේ යෝජනා ක්‍රමයේ මුලින්ම තිබෙන්නේ මාර්ග. එක එක විදියට අම්බලන්ගොඩ, ගෝනපිනුවල, බද්දේගම . එවිට මාර්ග තිබෙනවා , කාණු තිබෙනවා. ඒ විදියට.

ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

අම්බලන්ගොඩ, පටබැදිමුල්ල මාර්ගය තාර දැමිම රු1100000/= කි.කෙරමිණිය 1 හරස් මාර්ගයේ කාණුව ඉදිකිරිම හා කොන්ක්‍රිට් කිරිම රු.1300000/= කි. පතිරාජ පාරේ බෝක්කුව යොදා පැති කාණුව ඉදි කිරිම රු.200000/= කි, පෝරඹ පොල්වත්ත පාරට මුහුණලා වලව්වත්ත මාර්ගය සැදිම රු.500000/= , පෝරඹ මංසන්ධියෙන් පටන් ගෙන රණසුරිය මාර්ගයේ හල්වතුර ඇළ දක්වා පැති කාණු පද්ධතිය සැකසිම රු.300000/= වශයෙන් යෝජනා කර තිබෙනවා. ඒ අනුව අවසර ලබා දෙන ලෙස ඉල්ලා ඇත. මේ සඳහා සභා අනුමතියට යටත්ව අනුමතිය ලබා දී ඇත. මෙහි සමහර දේවල් අයින් වී ඇත.

ගරු නගර සභා මන්ත්‍රි ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්

එය සිදුවුයේ 2 ක් විතර සංශෝධනය වු ඒවා තවම ඔතනට ඇවිත් නැහැ. ඊට අමතරව ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා කරුණු කිහිපයක්. එකක් තමයි දේවාලයේ උත්සවයකදිවත් වැසිකිළියක් නැහැ කාන්තාවකටවත් යාමට . එම නිසා දේවාලයට මෙහා පැත්තේ භූමි කොටස ලබා දෙන්න.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

දැනට මෙය සභා අනුමතියට යටත්ව අනුමත කර තිබෙනවා.එය කර ගැනිමට අවස්ථාව තිබෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**

මොකද වැසිකිළි සඳහා රු.1000000/= ක මුදලක් තමයි වෙන්කර ඇත්තේ. කාන්තා වැසිකිළි 3කුත් පිරිමි වැසිකිළි 2කුත් හදන්න. ඇස්තමේන්තුව මදි වුණොත් එය ප්‍රතිපූර්ණය කරනවා තව මාස 2 කින් ලැබෙන මුදල් වලින් . ඒ දිනවල අපි කුඩා කල සිට තිබුණු ළමා ක්‍රිඩාංගණයේ ඒ භූමි ප්‍රමාණය වෙන්කර දෙන්න.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

එය අපි අනුමත කළා.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**

ඕව් අනුමත කළා. නගර සභාවෙන් එම ප්‍රදේශය අපිට වෙන්කර දෙන්න. එසේ වෙන්කිරිමෙන් අර සවිකර බඩුවල ආරක්ෂාවට හොඳයි. මොකද මේ සඳහා රු.2500000/= ක මුදලක් වැය කරනවා. පෝරඹ ක්‍රිඩාංගණය මුල්ලේ නගර සභාවෙන් ළමුන්ගේ ආරක්ෂාව සඳහා වැට ඉදිකර තිබෙනවානේ. එහි බංකු කිහිපයක් දැමිය හැකියි. එතැනටත් රු.2500000/= කි. එවිට අවශ්‍ය උපකරණ ටික සවි කරන්න පුළුවන්. එවිට එවායේ ආරක්ෂාවත් තියෙනවා.මහ අම්බලන්ගොඩ තැන වැට ගසා වෙන්කර දෙන්න.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

පටබැඳිමුල්ලේ වැසිකිළි පද්ධතිය කොහොමද ? ගරු නගර සභා මන්ත්‍රී පේෂලා මහත්මිය ඔබතුමා කියා අපි සුද්ද කර දුන්නා එම ස්ථානය. මාර්කට් එක අසළ වැසිකිළිය සෑදීම. එහෙනම් අපිම එය ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරන්නම්.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්**

ගරු සභාපතිතුමනි, අපි හිරේවත්තේ ඉන්ටලොග් අල්ලා බලෙන් කපන ලද පාර . එහි දෙපැත්තෙම කැලෑව තිබෙනවා. මා මේ ලඟදි ගියා. ගරු නගර සභා මන්ත්‍රී සෝභිත මහත්මයා එම මාර්ගයේ දෙපැත්ත කපා විදුලි ආලෝකයකුත් ලබා දිමට අවශ්‍ය කටයුතු කරන්න. මාර්ගයේ ඉන්ටලොගින් අස්සට පස් වැටි ඇත. එය සුද්ද කර දෙන්න. බොහොම අමාරුවෙන් ඉදිකළ මාර්ගයකි.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි , අප කොට්ඨාශ 12 ම ඇත්තටම කාණු සදන්නේ නැතිව මාර්ග හදා වැඩක් නැහැ. මට පුළුවන්නම් මේ කොට්ඨාශ 12 ම අපට කාණු සෑදිමට ඇති ඒවා ඇස්තමේන්තු කර දිග පළල ටික මාර්ග වල වළවල් වසා ඇති එවා නැතිව ඉතිරි මාර්ග ටික නම්කර දෙන්න. ඊළඟට ලැබෙන ප්‍රතිපාදන වලින් ප්‍රමුඛතාවය ලබා දි කොට්ඨාශ 12 ටම එම අවස්ථාව සකසා දෙන්න පුළුවන් මාර්ග හා කාණු ඉදිකිරිමට.

**තීරණය -**

අම්බලන්ගොඩ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මගින් ගම්පෙරළිය- කඩිනම් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන 2019 මැයින් එවන ලද ලිපියට අනුව අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශය තුල ක්‍රියාත්මක කිරිමට යෝජිත සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම සුදුසු බව ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**12.18 අම්බලන්ගොඩ , ඩයමන් ඇඩ්වට්‍රයිසින් ආයතනයේ අජිත් සුසන්ත මහතා විසින් 25%ක් වූ ඉහළ විනෝද බදු ප්‍රතිශතය සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ , ඩයමන් ඇඩ්වට්‍රයිසින් ආයතනයේ අජිත් සුසන්ත මහතා විසින් 25%ක් වූ ඉහළ විනෝද බදු ප්‍රතිශතය පිළිබඳවයි. 2019 ජනවාරි මස සංගිත ප්‍රසංගය සඳහා නගර සභාව විසින් 25% ක ඉතා ඉහළ විනෝද බද්දක් අයකිරිම සහ එබඳු කටයුතු සංවිධානය කරන්නන් අතර රසික ප්‍රජාවන් අතර ඉතා අසිරුතාවයකට පත්වි සිටි. නෙළුම් පොකුණ ආදි සුවිශේෂි බදු පහසුකම් සහිත රංග ශාලා පවතින කොළඹ නගරයේ නගර සභා අදටත් මෙවැනි වැඩ සටහන් සඳහා අයකරනු ලබන බඳු මුදල ආදයමෙන් 12% බදු ප්‍රතිශතයකි. එසේම අපගේ නිරික්ෂණයට ලක් වූ ගාල්ල නගරයේ පළාත් පාලන ආයතන රාශියක් සංගිත ප්‍රසංග සඳහා අයකරනු ලබන විනෝද බද්ද ආදායමෙන් 10% ක් නොඉක්මවයි. එබඳු පසුබිමක පමණක් අම්බලන්ගොඩ නගර සභාව පමණක් ආදායමෙන් ¼ පංගුවක් විනෝද බද්ද වශයෙන් අයකර ගැනිමින් ජනතාවට සිදු කර ඇත්තේ බලවත් අසාධාරණයකි. විශේෂයෙන්ම අවම පහසුකම් ඇති කිසිදු රංග ශාලාවක් හෝ ආයතනයක් නැති නගරයක මෙම ක්‍රියාව ඉතාමත්ම කනගාටුදායක වී ඇත. අද දවසේ විකල්ප ආසන 1000 කට අඩු ආසන සංඛ්‍යාවක් පවතින ධර්මාශෝක ශ්‍රවණාගාරය ද රංග ශාලාවක් නොවේ. ගායන ශිල්පින් පවා එළිමහන් ප්‍රසංග සඳහා අයකරන පසුබිමක විනෝද ආශ්වාදයක් ලබන බදු ගෙවන ජනතාවගේ පහසුව සඳහා අඩුවිය යුතු වුවත් මේ ආකාරයෙන් කටයුතු කිරිම අනුචිත හා අසාධාරණ බව මගේ හැඟිමයි. එබැවින් බදු අභයන්ට ගෘහස්ථ ප්‍රසංග සඳහා 10% දක්වා අඩු කරන මෙන් අජිත් සුසන්ත මහතා කාරුණිකව ඉල්ලා ඇත. මේ සමඟම මා වාර්තාවක් කැදෙව්වා. ඒ අනුව මෙම වාර්තාවේ මෙසේ සඳහන් වේ.1986 අංක 12 දරණ විනෝද බදු අඥා පණතට අනුව පළාත් පාලන ආයතන වලට අනුකුලව විනෝද බඳු පනවා ඇත. ඒ අනුව අම්බලන්ගොඩ නගර සභාවට අදාලව 1947.05.30 දින අංක 97067 දරණ ගැසට් පත්‍රයට අනුව විනෝද බඳු පනවා ඇත. ඒ අනුව පහත පරිදි වේ.

01. ශත 19 ට අඩු සහ ශත 50ට නොවැඩි ප්‍රවේශ පත්‍ර සඳහා ශත 0.5 අයකිරිමට තින්දු කර ඇත

02. ශත 50 ට වැඩි රු.50 ට අඩු ප්‍රවේශ පත්‍ර සඳහා ශත 10 ක් අය කිරිමට තින්දු කර ඇත.

03. රු1 ට වැඩි රු.2.50 අඩු ප්‍රවේශ පත්‍ර සඳහා ශත 25 ක් අය කිරිමට තින්දු කර ඇත.

04. රු2.50 ට වැඩි රු.3.50 අඩු ප්‍රවේශ පත්‍ර සඳහා ශත 50 ක මුදලක් අය කිරිමට තින්දු කර ඇත.

05. රු.3.50 ට වැඩි රු.4.50 ට අඩු අඩු ප්‍රවේශ පත්‍ර සඳහා ශත 75 ක මුදලක් අය කිරිමට තින්දු කර ඇත.

06. රු.4.50 ට අඩු රු.5.00 ට අඩු ප්‍රවේශ පත්‍ර සඳහා රු.1.00 ක මුදලක් අය කිරිමට තින්දු කර ඇත.

07. රු.5.00 ට වැඩි සෑම ප්‍ර වේශ පත්‍රයක් සඳහා 25% ක් අයකිරිමට තින්දු කර ඇත.

මේ සම්බන්ධව මා වුණත් සලකා බැලිමේදි ගැසට් පත්‍රය මෙහි තිබෙනවා. එම ගැසට් පත්‍රය අනුව තමයි අද වනතුරු මේ අයකිරිම කරනු ලබන්නේ. මේ විනෝද බදු අයකිරිම නගර සභාව මගින් තින්දු කර ගැසට් පත්‍රය මඟින් පළ කර ඇත්තේ 1947.05.23 දිනයි .නමුත් මෙය එදාට ගැලපෙන ටිකට් ප්‍රවේශ පත්‍රවලට අනුකුලව තමයි මෙය සදා ඇත්තේ. මෙය මා හිතනවා එක පාරට කියන පලියට 12% ට හරි 10% හරි අඩු කරන එක නෙමේ. මේ ගැන යම් විශ්ලේෂණයක් කර අදට ගැලපෙන ටිකට් පත්‍ර අනුව මෙය සංශෝධනය කිරිම වඩාත් සුදුසුයි. ඒ අනුව 7 වෙනි කාරණයට තමයි 25% ක් අයකරනු ලබන්නේ. මුදල් අයකිරිම් වර්ග 6 ක් මිට ඉහත ඉදිරිපත් වී තිබෙනවා. දැන් මේ රු.5/= කියන එක 1947 ලොකු මුදලක් වුවාට අද රු.5/= වැඩක්ම නැහැ. රු.5/= ට ටිකට් එකක් කොහේවත් නැහැ.මේ තිබෙන නිතිය අනුව රු100 ටිකට් එකකින් රු .25/= ක මුදලක් ගෙවිය යුතුයි. එම නිසා මෙය වෙනස් විය යුතු හා සංශෝධනය විය යුතු බව මා දකිනවා. එම නිසා අපි එක් දිනයකින් තින්දුවක් නොගෙන මේ සම්බන්ධව කමිටුවක් වශයෙන් සාකච්ජා කර සංශෝධනය කළ යුතුයි මුලින්ම . එය සංශෝධනය කළ යුතුයි මුලින්ම. ඒ සඳහා සභාවේ අදහස දැන ගැනිමට මුලින්ම මා කැමතියි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි ,මේ සඳහා එකඟ වෙනවා. මා පසුගිය කාලයේ අධ්‍යනයක් කළා. මටත් හිතුණා. එය සංශෝධනය විය යුතුයි කියා. යම්කිසි මුදල් ප්‍රමාණයක් අඩුවිය යුතුයි කියා. එම නිසා මා හිතනවා කමිටුවක් පත්කර තව දුරටත් අධ්‍යනය කර මෙය සංශෝධනය කළානම් හොඳයි කියා. එයයි මගේ අදහස.

**<u>ගරු නගර සභා මන්ත්‍රීනි ඒ.පී ලක්ෂ්මී හේමන්තා මෙනවිය  කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, පළාත් පාලන ආයතනයක් වශයෙන් පළාත් පාලන නිති සම්බන්ධයෙන් මේ සම්බන්ධව සංශෝධනයක් ඇති කර ගැනීමට. ඒ ගැන සලකා බැලිමක් සිදු කරන ලෙස මාත් යෝජනා කර සිටිනවා. මොකද ඕනැම කෙනෙකු මෙවැනි ප්‍රසංගයක් පවත්වනු ලබන්නේ ලාභයක් ලබා ගැනීමේ අරමුණ සහිතවයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මේ ප්‍රසංග කරන විශේෂයෙන්ම අජිත් මහතා වැනි අයගේ වැරදි මතයක් තිබෙනවා මෙය මේ මෑත කාලයේ දමන ලද නිතියක් බව. මෙය අපේ ජීවිත ආරම්භයේ සිට ඊට එහා දෙගුණයක් ගිය එකකි. මෙය 1947 දමන ලද නීතියකි. එය අදට අනුරුපය වෙනස් විය යුතුයි කියන මතයේ තියෙනවා. එම වැරදි මතය මුලින්ම අයින් කර ගත යුතුයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රීනි ඒ.පී ලක්ෂ්මී හේමන්තා මෙනවිය  කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අනුයෝජිත ව්‍යවස්ථාවක් සකසා ගන්න පුළුවන් නිසා පළාත් පාලන නිතියට අනුව කටයුතු කර මෙය සහනාදායි ක්‍රමයකට මෙයට එකඟ වන ලෙස යෝජනා කර සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, විනෝදස්වාදය වෙනුවෙන් ආයෝජනය කරන්නෝ කල කිරවන විදියේ නිතියක් තමයි අපට එදා ඔය ගොඩනැගි තිබෙන්නේ. ඒ නිසා ඔවුන් තව තව දිරිමත් වෙන ඔබතුමන්ලාගේ නව යෝජනාව සංශෝධනය කර මේ උදවියට සහන සැලසෙන විදියේ අපේ පුරවැසියන්ට විනෝදයෙන් කල් ගත කරන්න පුළුවන් තත්වයක් ඇති කරන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ පණත අනුව තමයි ඔබතුමා කටයුතු කර තිබෙන්නේ.මෙතුමාගේ ඉල්ලිම තුල ප්‍රසංගයක් පවත්වනවා ශ්‍රවණාගාරයක . නමුත් එළිමහන් ප්‍රසංගයකට එතරම් මුදලක් ගායකයෙකු අය නොකරයි. නමුත් ශ්‍රවණාගාරයක , රංගශාලාවක ඇතුළත පවත්වන ප්‍රසංගයක ගායකයෙකු වැඩි මුදලක් අය කරයි. එවැනි ගැටළුවකුත් තිබෙනවා මේ ඉල්ලිම බැලු විට. එළිමහන් රංගශාලාවට වඩා මෙය වෙනස්. ඔබතුමාගේ කාරණාව හරි . අපි යම් දෙයක් පෙන්වා දෙනවා නම් ඊට සාධාරණ හේතු තිබිය යුතුයි. ඉදිරියේදි මෙම ගාස්තු අඩු කිරිමක් සිදු කිරිම හොඳයි. මේ බදුගෙවන ජනතාව ඉල්ලුවිට ගරු මන්ත්‍රීවරුත් අසිරුතාවයට පත්වෙනවා මෙය කිව්වාම. මේ කරුණු කරණා කිව්වාම අර හේතුව තමයි ප්‍රශ්නය වී තිබෙන්නේ.එළිමහනක ප්‍රසංගය කරනවා වගේ නෙමේ රංගශාලාවක , ශ්‍රවණාගාරයක ප්‍රසංගයක් කිරිම. ඕනැම ව්‍යාපාරිකයකු බලනවා තමන්ගේ කරණාව කරන්න. ව්‍යාපාරිකයන් කරන දෙයට බදු ගෙවන ජනතාවට අපිත් සාධාරණයක් ඉටු කළ යුතුයි. හැකි ඉක්මනින් මෙම කමිටුව නම්කර මෙම කර්තව්‍ය කරන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම් සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ අදාල පුද්ගලයා මා සමඟත් කතා කළා අදාල සිද්ධිය පිළිබඳව . ඔහු කරුණු කිහිපයක් දැක්වුවා. ඉන් සමහර කරුණු දැන් මෙහි කතා වුණා. ඊට අමතරව විනෝදය පිළිබඳ ඉදිරිපත් කරන පුද්ගලයන් දිරිමත් කරන වෙනුවට අධෛර්යමත් කිරිමක් මෙම පණතින් සිදු වෙනවා. මෙම පණත කලෝචිත නොවිම තමයි මෙතනට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ. අද මට මෙය ආරංචි වු විදියට අනික් කාරණය තමයි මෙම ව්‍යාපාර කරන පුද්ගලයන්ට පුළුවන් ආගමික සිද්ධාස්ථානයකට හේත්තු වෙලා අපටත් එම මුදල නැති වෙන විදියට කරන්න

පුළුවනි. එහෙම ක්‍රමයකුත් තියෙනවා. එම නිසා එවැනි විෂමාචාර දේවල් වලට ඉඩ නොදී අපගේ පණත සංශෝධනය කරන්න. සැමදෙනාම මෙය කරන්න යන්නේ නැහැ. මෙම පුද්ගලයා හොඳ දෙයක් කරන්න යන්නේ. ඒ සඳහා අපගේ පූර්ණ සහායෝගය ලබා දිය යුතු බව මට හිතෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මෙය සංශෝධනය විය යුතුයි ඔබතුමා ප්‍රකාශ කළ ආකාරයට. මොකද 1947 ගනු ලැබූ තීන්දු තීරණ අද සමාජයත් සමඟ වෙනස් විය යුතුයි. අනික් එක මෙතැනදී අපි දෙවිදියකට බැලිය යුතුයි. එකක් තමයි රංගශාලාවක හරි ශ්‍රවණාගාරයක හරි ප්‍රසංගයක් පවත්වනවා නම් ඒ සඳහා යන වියදම වැඩියි. දැමිය හැකි පිරිස අඩුයි. එළිමහන් ප්‍රසංගයක් පවත්වනවා නම් වියදම අඩුයි දැමිය හැකි පිරිස වැඩියි. ඔවුන් ලබන ආදායමත් වැඩියි.එවිට අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලයේ ශ්‍රවණාගාරය අනුව එළිමහන් රංග ශාලාවක පවත්වන විනෝද බද්දට වඩා අඩු විය යුතුයි මා හිතන්නේ අප සියළු දෙනාම නියෝජනය වන පරිදි කමිටුවක් දමා මෙය මේ විදියට සංශෝධනය වුණානම් හොඳයි. අප එවැනි දේවල් සංවිධානය කරන පුද්ගලයන් ධෛර්යමත් කළ යුතුයි. එහෙම නොකොළහොත් නගර සභාවට ලැබෙන ආදායම අඩුවෙන එක එක පැත්තකි. ඒ හා රසවින්දනය බලාපොරොත්තු වන අයට අඩුවක් වෙනවා. සංශෝධනය විය යුතුයි කියා මා යෝජනා කර සිටිනවා. ගරු නගර සභා මන්ත්‍රී එස්.එම් සරත් චන්ද්‍ර මහතා ප්‍රකාශ කළ ආකාරයට සියළු කරුණු සලකා බැලිය යුතුයි. විවිධ උපක්‍රමශීලි වෙනවා සමහර අය විවිධ පාර්ශවයන් හවුල් කරගෙන.එම නිසා අපි ගන්නා ලද තීන්දුවේදි පාසලක් , පන්සලක මොකක් හරිනම් හැර වෙන කිසිම දෙයකට ප්‍රතිපත්තිමය තීන්දුවක් ගත යුතුයි විනෝද බද්ද යම්කිසි මුදලක් අඩු නොකරන බවට. ඒවා වෙනස් කරගෙන යා යුතුයි. නැතිනම් සිදු වන්නේ යම්යම් අයතා ක්‍රම හා මැදිහත් වීම් තුල නගර සභාවට ලැබිය යුතු ආදායම අඩු කිරිමට ක්‍රියා කරනවා. එසේ සිදු වි තිබෙනවා. එසේ නොවිම සඳහා මේ සියළු කරුණු ඇතුලත් කර ඉදිරිපත් කිරිම සුදුසු බව මා යෝජනා කර සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, අනිවාර්යෙන්ම මෙම පණත සංශෝධනය විය යුතුයි කියන ස්ථාවරයේ මාත් සිටිනවා. එසේම ඉතාමත් අඩු පහසුකම් තිබෙන නගරයක් විදියට මෙවැනි සංදර්ශන සඳහා විනෝද අශ්වාදය ලබන ජනතාවගේ පහසුව තකා ඇති පහසුකම් ඉතාමත්ම අල්පයි. අපේ නගර සභා ශාලාව තිබුණා. දැන් එකත් නැහැ. ධර්මාශෝක ශ්‍රවනාගාරය පමණයි තිබෙන්නේ . මේ ශ්‍රවණාගාර ඇතුලේ පවත්වන ප්‍රසංග හා එළිමහන් ප්‍රසංග කරන පුද්ගලයෝ හෝ මේ පුද්ගලයන් ගැන නෙමේ මේ කතා කරන්නේ. ජනතාව පැත්තෙන් හිතා අපට ලබා දිය හැක්කේ පොල්වත්ත ක්‍රිඩා පිටිය හෝ මානාන ක්‍රිඩා පිටිය . හෙට අනිද්දා වන විට ගරු නගර සභා මන්ත්‍රී ජගත් කුමාර මහතා හෙට අනිද්දා වනවිට එයත් දෙන එකක් නැහැ.එවැනි කුඩා ස්ථාන ගැන මේ වගේ සෙනඟක් ගෙන්වා මුදලක් වියදම් කර මේ සභාවට 25% මුදලක් ගෙවා කරන්න ශක්තියක් නැහැ මොනම සංවිධානයකට වත්. ඉන් සිදු වන්නේ ජනතාවගේ රස වින්දනයට අපි කරන බාධාවකි. පණත අනුව තමයි ඒ බාධාව තිබෙන්නේ. අපි නගර සභාව විදියට නෙමේ එම බාධාව සිදු කර ඇත්තේ. සියළුම ගරු මන්ත්‍රිවරු ප්‍රකාශ කළ ආකාරයට මේ සඳහා කමිටුවක් පත්කර උපදෙස් ලබාගෙන ඒ සඳහා අනුමතිය ලබා දෙයි කියා මා විශ්වාස කරනවා. මොකද අද දිනයේ සංගිත ප්‍රසංගයක ගිත ගායනා කිරිමට ගායකයකු නම් රංගශාලාවක හෝ ශ්‍රවනාගාරයක ප්‍රසංගයකට නම් රු.200000/= කට වැඩි මුදලක් ඉල්ලා සිටිනවා. එළිමහන් ප්‍රසංගයක නම් රු.100000/= කට වැඩියි. දැන් මිට ඉහත කතා කළා භක්තිගීත ප්‍රසංගය සඳහා ශබ්ද විකාශන යන්ත්‍ර සඳහි යන වියදම රු 70000/= කි. ඉතිං මෙවැනි ප්‍රසංගයක ශබ්ද වාහනි යන්ත්‍ර සඳහා යන වියදම අපට සිතා ගත හැකිය. එම නිසා මෙහි ඉතා අධික වියදමක් තිබෙනවා.කවුරු මෙය කළත් යම්කිසි ලාභයක් ලබන එක වෙනම කතාවක්. මෙම 25% ගෙවන්න සිදු වෙනවා නම් මේ අයට සිදුවෙනවා මේ කර්තව්‍යයට ආයුබෝවන් කියන්න.අපිත් නගර සභාවක් විදියට අපිට යුතුකමක් තිබෙනවා මේ සඳහා ජනතාවගේ පැත්තෙන් හිතා ජනතාවට කරන සේවයක් විදියට, ජනතාවට කරන පහසුකමක් විදියට මෙය සංශෝධනය කරන ලෙස ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

මේ සම්බන්ධව සාකච්ඡා කර කමිටුවක් වශයෙන් තීරණයක් ගන්නම්. නිකං නෙමේ අද ප්‍රවේශපත්‍ර වල තිබෙන මිල හා එම ටිකට් පත්‍ර වර්ගිකරණයක් පිළිබඳ අයකරන ක්‍රමයක තින්දුවක් ගත යුතුයි. මා ඉල්ලා සිටිනවා සාමන්‍ය

විදියට මේ සභාවට වංචනික ලෙස ලිපි ගෙන අපි නිදහස් කරන ලද ඒවා තිබෙනවා. උදාහරණයක් විදියට ධර්මාශෝක විදුහල්පතිතුමාගෙන්ම ලිපිය ගෙන බැඩ්මින්ටන් ක්‍රීඩාවට ආධාර කියා බැඩ්මින්ටන් වලට අවශ්‍ය මල් පෙට්ටි 2ක් 3ක් ලබා දී තිබෙනවා. නමුත් විනෝද බදු ආඥා පණත විග්‍රහ කිරීමේදි අපට පෙනි ගිහින් තිබෙනවා මෙම විනෝද බදු නිදහස් කළ යුතු විදියත් පණතේ පෙන්වා දී තිබෙනවා. පණතේ සඳහන් කර තිබෙන්නේ සියළු විනෝද බද්දෙන් බදු මුදල අදාල සභාවට ගෙවිය යුතුයි. අපි නිදහස් කරනවා කියා තින්දුවක් ගත් පසු එම තින්දුව පරිදි ලැබෙන ආදායමෙන් 40% ක් එම ආයතනයට ගෙවිය යුතුයි. උදාහරණයක් ලෙස ධර්මාශෝක විද්‍යාලයට අධාර පිණිස ප්‍රසංගය කරනවා කියා. ඉන් ලැබෙන ආදායමෙන් 40% ක් ධර්මාශෝක විද්‍යාලයට ගෙවිය යුතුයි. ගෙවා එම බිල්පත ලැබුණු විට අපිට පුළුවනි අපට ලැබෙන විනෝද බද්ද ධර්මාශෝක විද්‍යාලයට පරිත්‍යාග කරන්න. මේ සංදර්ශන කරන බොහෝ පිරිස් බලාපොරොත්තු වන්නේ අපේ මුදල් වලින් පංකම් කරන්න.විනෝද බදු ලෙස ලැබෙන මුදල නගර සභාව සතු මහජනතාවගේ මුදලකි. මෙම මුදල නිදහස් කරගෙන මෙම මුදල කාටහරි දෙනවා කියා ඒ අය පිංකමට ලැහැස්ති වෙනවා. හොඳම දේ තමයි මෙම පිංකම සභාව විසින්ම කළ යුතුයි. ඒ පණතට අනුව ඒ කරන්න පුළුවන් උපරිම දෙනවා. මේ ළඟදි ගරු ආරියදේව ස්වාමීන් වහන්සේගේ ලිපියක් සමඟ පැමිණියා. එය පැහැදිලි කර දි තිබෙනවා. දැන් ඔවුන් මුදල් බඳිනවා. එම ස්වාමීන් වහන්සේට 40% ක් ලැබූ බවට ලිපියක් ඉදිරිපත් කළ විට අපට ලැබෙන මුදල් ටික අපි එම ස්වාමීන් වහන්සේට යවනවා. එවිට පිංකම එම මහතා 40% කුත් සභාව විසින් 25% කුත් ලෙස 65% අදාල ආයතනයට ලැබි ඇත. ඒ ලෙස නියම ක්‍රමය අනුගමනය කළහොත් අපෙන් මෙයට වැට පනින කෙනා වැට පනින්නේ නැහැ ඇත්තටම. මේ ක්‍රමයක් අපට දි තිබෙනවා මේ පණත තුල නිදහස් කළ යුත්තේ කොහොමද කියා. මෙහිදි මෙම අයකරන මුදල වර්ග කර කියවනු ලැබුවේ ඒ කාලේ ශත 50 ට රුපියලට තිබුණු ප්‍ර වේශ පත්‍ර අද නැහැ. අද ප්‍ර වේශපත්‍රය රු1000/= ක මුදලකි. එම නිසා බදු ප්‍රමාණය තින්දු කළ යුතුයි. එකපාරටම හදිස්සි නොවි තින්දුවක් ගත යුතුයි. මා යෝජනා කර සිටිනවා. කමිටුවක් වශයෙන් ආදායම් පරිපාලකවරු 3ක් සිටිනවා නගර සභාවේ. ඔවුන් 3 සමඟ සෑම පක්ෂයකම එක් කෙනෙකු බැගින් යෝජනා කරන්නම්. එක්සත් ජාතික පක්ෂයෙන් ගරු නගර සභා මන්ත්‍රී සෝභිත රංජිත් මහතා, ශ්‍රිලංකා නිදහස් පක්ෂයෙන් ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා , ජනතා විමුක්ති පෙරමුණෙන් ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා, ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා, මාත් එහි සිටිනවා. මෙහි මුලින්ම ගැසට් පත්‍රය සංශෝධනය කර ගත යුතුයි. මේ විදියේ දෙයක් අඩු කරන විට විශාල ප්‍රශ්නයක් පැමිණෙනවා. මේ නගරයේ බදු ගෙවන ජනතාවගේ බදු ප්‍රතිශතය 1% පහත දැමුවා. එම පහත දැමු අවස්ථාවේ ඔබ සියළු දෙනා එය ඒකමතිකව අනුමත කළා. ගරු මන්ත්‍රිවරු කවුරුත් කතා කළේ නැහැ. මෙය ගරු ප්‍රධාන අමාත්‍යතුමාට අනුමතියට ගියාට පසු සාධාරණිකරණ වාර්තාවක් ඉල්ලා සිටියා. අපේ 1% කින් බදු අඩු කරන විට ආදායමෙන් ලක්ෂ 25ක් අඩු වෙනවා. මෙය කොහොමද සපයා ගන්නේ කියා සාධාරණිකරණ වාර්තාවක් ඉල්ලා සිටියා. අයවැයෙන් මෙය අඩු කළාට ඒ අය බලන්නේ මෙය එම නිලධාරි වශයෙන් මෙම 1% අඩු කළ විට ඒ සඳහා ලැබිය මෙම ලක්ෂ 25 කොහොමද සපයා ගන්නේ කියා. මෙය අඩු කිරිමේදි අපි විතරක් කතා කර මදියි. මේ සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුවේ විමර්ශන නිලධාරියෙකුත් ඇතුල් කර ගැනිම සුදුසු වේ. මොකද එ අයට ගැලපෙන විදියට නිතිය සදා ගත යුතුයි. අන්තිමට වෙනම මා පුද්ගලිකව ගරු ප්‍රධාන අමාත්‍යතුමාට කතා කළා. මේ ජනතාවගේ පැත්තෙන් සිතා මෙය අඩු කලේ කියා. එහෙම හරි ලියා එවන්න කිව්වා. මෙය ලියා යවා දෙවැනි වර තමයි අනුමත කරගනු ලැබුවේ. ඒ විස්තර සහිතව කරන්න ඕන. ආදායමෙන් අඩු කිරිම අනුමත කර ගැනිමේදි සාධාරණ විස්තරයක් පළාත් පාලන දෙපාර්තමේන්තුවට දිය යුතුයි. නැතිනම් මෙය අනුමත වෙන්නේ නැහැ. ඊළඟට ගැසට් කරන්න හම්බවෙන්නේ ඊට පසුවයි. ඒ අනුව කටයුතු කළ යුතුයි.

**තීරණය -**

අජිත් සුසන්ත මහතා විසින් 25%ක් විනෝද බදු ප්‍රතිශතයඅඩු කිරිම සඳහා ක්‍රියාත්මක කිරිම සඳහි පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් පත් කර ඇති විමර්ශන නිලධාරි , ගරු සභාපතිතුමා , ගරු උප සභාපතිතුමා ,ගරු නගර සභා මන්ත්‍රී සෝභිත රංජිත් මහතා , ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා හා ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා ආදි පිරිසගෙන් සමන්විත කමිටුවක් පත්කර සකච්ඡා කර කරුණු ලබන සභාවට ඉදිරිපත් කිරිමෙන් පසු පණත සංශෝධනය සුදුසු බව ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**12.19 එන්.එච් ආනන්ද මහතා හා ධම්මිකා මහත්මිය විසින් පරිසර බලපත්‍රයක් ලබා ගැනිම සම්බන්ධව කරන ලද ලිපිය සභා ගත කරන ලදී.**

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, පරිසර බලපත්‍රයක් ලබා ගැනිම සඳහා. එන්.එච්. ආනන්ද මහතා හා ධම්මිකා මහත්මිය විසින් තම වඩු මඩුව සඳහා පරිසර බලපත්‍රයක් ලබා ගැනීම සඳහා ඉල්ලීමක් කර ඇත. අම්බලන්ගොඩ , මානිම්මුල්ල ,වටරවුම්පාරේ අංක 11/33 හි පවත්වාගෙන යනු ලබන වඩු මඩුව සඳහා 2012 වසරේ සිට 2015 වසර දක්වා පරිසර බලපත්‍ර ලබා දි ඇත.2016 වසරේ පරිසර බලපත්‍රය සඳහා ගාස්තු ගෙවූ නමුත් බලපත්‍රය දීම අත් හිටවනු ලැබිය. එයට හේතුව ලෙස පරිසර නිලධාරිතුමිය අප වෙත පවසා සිටියේ පරිසර අයදුම්පත අනුමත නොවූ බවයි.එසේ අනුමත නොවිමට හේතු වී ඇත්තේ වාරිමාර්ග දෙපාර්තමෙන්තුව විසින් එම ගොඩනැගිල්ල මාදම්පා ගඟට ආසන්නව ඇති ප්‍රශ්නයකි. වාරිමාර්ග දෙපාර්තමේන්තුව එම ගොඩනැගිල්ල අනුමත නොකරන බැවින් අම්බලන්ගොඩ නගර සභාව එම පරිසර බලපත්‍රය ලබා දිම අත්හිටුවා ඇත. අප ආයතනයට පරිසර බලපත්‍රය නොමැති බැවින්

**<u>ගරු සභාපති එම් .ඩබ් . අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගරු මන්ත්‍රීතුමා ඔය සිද්ධිය මට මතකයි. මා ඔය ගැන සාකච්ඡා කළා. දැනට මෙහෙම ප්‍රශ්නයක් තිබෙනවා. පරිසර බලපත්‍ර නිකුත් කිරිමේ නිලධාරිතුමිය ඇත්තටම මා එම විෂයෙන් මාරු කරන්න කිව්වා. දැනට පරිසර බලපත්‍ර ලබා දීමේ ක්‍රමවේදය තිබෙන්නේ පරිසර අමාත්‍යාංශයෙන් පැමිණෙන නිලධාරිතුමා , නිලධාරිතුමිය හා අපගේ කාර්මික නිලධාරිතුමා, මහජන සෞඛ්‍ය පරික්ෂක මහතා ,විෂය සම්බන්ධව එය පවරන නිලධාරිණිය ආදි පිරිස සිටිනවා. අර කමිටුව මඟින් තමයි මෙවා පරික්ෂා කිරිමට යන්නේ. නමුත් මෙම නිලධාරිතුමිය ප්‍රකාශ කර සිටිනවා එයටත් ක්ෂේත්‍ර පරික්ෂාවට යාමේ අයිතියක් ඇති බව.මැය අනවශ්‍ය වැඩ වලට ඇඟිලි ගසනවා. මා නිතරම බලන්නේ මෙම ඇන්ටික් වැඩ කරන පුද්ගලයන් ළඟ අඩුම ගණනේ සේවකයන් 7 ක් 8ක් වැඩ කරනවා. මේ අයගේ බලපත්‍රය අපි ලබා නොදුන්නොත් එහෙම මේ අයට ලී ගෙන යාමේ බලපත්‍රය ලබා ගැනිමට නොහැකි වෙනවා. හදිස්සියේවත් මේ අය ව්‍යාපාරය නැවැත්වුවහොත් ගැටළුවක් මතු වෙනවා. දැන් මෙතැන ඔය කියන ප්‍රශ්නය වෙලා තියෙන්නේ. මේ අය මෙය කරන ගමන් තව ඉදිකිරිමක් කර තිබෙනවා ගඟ අයිනේම. එම ගඟ අයිනේ කරන ඉදිකිරිමට අනුමතියක් ලබා නැහැ. නමුත් මෙම කර්මාන්තය කරගෙන යන්නේ පැරණි ගොඩනැගිල්ලක. එහි සාදන බඩුටික තමයි මෙයට දමා ඇත්තේ. එහි බඩු හදන්නේ නැහැ. නමුත් බලපත්‍රය දිම ප්‍රතික්ෂේප කර දී තිබෙන්නේ මෙම ලිපිගොනුව පරික්ෂා කිරිමේදි මා දුටුවා අපගේ නිලධාරිතුමිය. ඒ වගේම තව එකක් තිබුණා එඩෙරමුල්ල පාරේ. එහි මේ කමිටුව විසින් තින්දු කර තිබෙනවා ශබ්දය මැනිමේ පිළිගත් ආයතනයකින් වාර්තාවක් ගෙන්න. මනා ගෘහ පාලනයකින් යුක්ත වීම . පිරිසිදු කම තියෙන්න ඕන එක. ඔහු මේ ශබ්දය මැනිමේ උපකරණය ගෙන එම සඳහා අදාල ආයතනයට රු.60000/= ක මුදලක් වියදම් කර තිබෙනවා. මනා ගෘහ පාලනයක් තිබෙනවාද කියා බලන්න යන්න තියෙන්නේ මහජන සෞඛ්‍ය පරික්ෂක මහතාට.එම වාර්තාව ලැබුණට පස්සේ නැවත වාර්තා කරනවා මේ පිළිබඳව පැමිණිල්ල කරන අය සමඟ නඩුවක් තිබෙනවා. මධ්‍යම පරිසර අධිකාරියේ උපදෙස් පතනවා. මේ විෂය නිලධාරියා අනවශ්‍ය විදියට මැදිහත් විම් සිදු වන නිසා මේ ලිපිගොණුවම පරික්ෂා කර බලා ඇය අනවශ්‍ය වැඩ කරන්නේ . ඇයට වැඩක් නැහැ ක්ෂේත්‍ර පරික්ෂාවේදි මහජන සෞඛ්‍ය පරික්ෂක මහතා මධ්‍යම පරිසර අධිකාරියෙන් ආදි ප්‍රගති සමාලෝචන කමිටුවෙන් දෙන තින්දුව අපි පිළිගත යුතුයි. ඇයට ඇත්තේ මේ අය කියන වාර්තාව සකසා යවන්න විතරයි තියෙන්නේ. මේ නඩුව පිළිබඳවත් මා සොයා බැලුවා. එම නඩුව ඇත්තේ අර ව්‍යාපාරය කරන කෙනාගේ ඉඩමට තව ඔප්පුවක් ලියා එම ඔප්පුව වැරදියි කියා එම පුද්ගලයා දමනු ලැබූ නඩුවකි. මා දන්නවා පරිසර අධිකාරියට ගියාට පසු තව වසර 2-3 කට පැමිණෙන්නේ නැහැ. එම නිසා මා පවසා සිටියා ඔබ විසින් එවන ලද ලිපිය තිබෙනවා. දින 14 ක් ඇතුළත නිසි අධිකරණයේ තින්දුවක් ගෙන මෙය තහනම් නියෝගයක් ඉදිරිපත් කරන්නේ නම් අදාල බලපත්‍රය නිකුත් කිරිමෙන් වලකිනවා. දැනට සියළු අඩුපාඩු සපුරා ඇති බැවින් බලපත්‍රය නිකුත් කිරිම ඔබගේ ක්‍රියාව මත සිදු කරනවා කියා. එවිට දෙපැත්තම ඇහුම්කන් දිමක් කරා වෙනවා මෙයට. මෙය ගැටළුවකි. මා එම විෂය නිලධාරිණිය මාරු කරන්න කිව්වා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ අය පරිසර බලපත්‍රය ලබා ගෙනනේ කරන්නේ. මෙය නොලබ කරන අයට මෙය බලපාන්නේ නැද්ද? මා විමසා සිටින්නේ එයයි.

**<u>ගරු සභාපති එම් .ඩබ් . අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නොලබා කරනවා විශාල ප්‍රමාණයක්

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

දැන් ඔය කියන නිලධාරිතුමිය/ තුමන්ලා දැන ගතයුතුයි පරිසර බලපත්‍රයක් නොගෙන කරන අයට ගත යුතු ක්‍රියා මාර්ග ගැනිමට.

**<u>ගරු සභාපති එම් .ඩබ් . අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ පරිසර නිලධාරිතුමිය පැමිණියා මා මුණ ගැසිමට . අපගේ ලංකාවේ ම පරිසර අමාත්‍යාංශය යටතේ තිබෙන පණතේ ලොකු දෝෂ තිබෙනවා කියා. ඒ කියන්නේ පරිසර බලපත්‍රය ගත් කෙනෙකුට බලපත්‍රය කැඩුවා කියා නඩුවක් පැවරිමට පුළුවන් වුණාට පරිසර බලපත්‍රය නොගත් කෙනෙකුට නඩුවක් පැවරිමට ඒ පණතේ නැහැ. එම නිසා ඒ පුද්ගලයන් මේ බව දන්න නිසා බලපත්‍ර ගන්නේ නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මින් සිදු වන්නේ මේ සඳහා අපට ලැබෙන ආදායමක් අහිමි විමයි. මෙය දැනගත්තාම කිසිම කෙනෙක් බලපත්‍රය ලබා ගන්නේ නැහැ.

**<u>ගරු සභාපති එම් .ඩබ් . අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ ප්‍රසිද්ධ මට්ටමේ කරන 4ක් මෙම බලපත්‍රය ලබා ගෙන නැහැ. එක් පුද්ගලයෙකු සිටිනවා වඩු මඩු 4ක් කරන පුද්ගලයෙකු සිටිනවා. ඒ අය බලපත්‍ර ලබා ගෙන නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , එයට නිතියේ ආවරණයක් නැති කමද ?

**<u>ගරු සභාපති එම් .ඩබ් . අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නිතියේ දෝෂයක් තිබෙනවා. පරිසර අමාත්‍යාංශයේ පනවන ලද දෝෂයක් තිබෙනවා. පරිසර බලපත්‍රයක් නොගත් කෙනෙකුට නඩුවක් දැම්මට නිතියේ ක්‍රමවේදයක් එහි ලියා නැත. එම නිසා කරන්න දෙයක් නැහැ. මිට වසර 15 කට කලින් ගරු හිටපු අමාත්‍ය මහින්ද විජේසේකර මැතිතුමාට එතුමා අමාත්‍යවරයා වශයෙන් සිටි කාලයේ මා මෙය මතුකර ප්‍රකාශ කර සිටියා. මේ නිතිය ඉක්මනින් වෙනස් කර ගන්න කියා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, දැන් මෙය මෙසේ සිදු වුණොත් හැමදෙනාම මේ අක්‍රමිතතාවය කරනවානේ. දැන් මෙය ගත් පුද්ගලයන්ට මෙච්චර අසාධාරණයක් වෙනවා නම් නොගත්ත පුද්ගලයා යහතින් ඉන්නවා. ගත්ත පුද්ගලයා මෙය නොමැතිව බියෙන් සිටිය යුතු වෙනවා. අපි ගරු සභාවෙන් යෝජනවාක් ලෙස ඉදිරිපත් කරන්න. දැන් සිටින පරිසර අමාත්‍යවරයා වන්නේ අතිගරු ජනාධිපතිතුමා නම් එතුමාට අපි යෝජනවාක් ඉදිරිපත් කරන්න මේ පණතේ මෙය සංශෝධනය විය යුතු බවට ගරු නගර සභා මන්ත්‍රීවරු හා සභාපතිතුමා විසින් ඡන්ද ප්‍රමාණයකින් මෙම යෝජනාව සම්මත කළ බවත් ඒ පිළිබඳව ලේකම්තුමිය විසින් ලිපියකින් දන්වා යවන ලෙස ඉල්ලිමක් කර සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, දැන් මෙයට ගැටළුවක් නැහැනේ . එම විෂය නිලධාරිතුමිය මාරු කළ නිසා.

**<u>ගරු සභාපති එම් .ඩබ් . අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මා වෙනස් කරන්න කිව්වාට මේ අපේ ලේකම්තුමිය වෙනස් කර නැහැ. එය තවම ප්‍රමාදයි.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>
වෙනස් කර මෙම බලපත්‍රය ලබා දෙන්න. ඔය නිලධාරිතුමිය ගැන අපි දන්නවා. බොහෝ කලක සිට. ලේකම්තුමිය මෙය බලා ඉක්මනින් වැඩය කරන්න.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**</u>
ගරු සභාපතිතුමනි, මෙම ප්‍රශ්නයේදී අම්බලන්ගොඩ නගරයට වැඩි ආදායමක් ලැබෙන ව්‍යාපාරයකි. මෙයින් යැපෙන පුද්ගලයන් බොහෝ පිරිස් සිටි. මෙම ව්‍යාපාරය කරන පුද්ගලයන්ට කිසිදු භේදයකින් තොරව අපිට කළහැකි උදවු කළ යුතුයි. මොකද පවුල් සංඛ්‍යාවක් යැපෙනවා එ අය හරහා. රටට විශාල ආදායමක් ලැබෙනවා. මෙම ඉල්ලිම කරන එන්.එච් ආනන්ද මහතාගේ මෙම ඉල්ලීමේදි ප්‍රකාශ කළා තවකාලික ගොඩනැගිල්ලක් ඉදි කර ඇති බව. එයට අවසර නැහැ කියා. එය ගඟ රක්ෂිතයේ සාදා නැතිනම් ඔවුන්ගේ ඉඩම තුල නම් මෙය සාදා ඇත්තේ ප්‍රශ්නයක් නැහැ.

<u>**ගරු සභාපති එම් .ඩබ් . අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>
ගඟ රක්ෂිතයේ මෙය ඉදිකර ඇත්තේ. අඩි 3 ක් විතර ප්‍රමාණයක් අයිති වෙනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**</u>
ගඟ රක්ෂිතයේ නම් සාදා ඇත්තේ කිසිම දිනක මේ සඳහා අවසර දෙන්නේ නැහැ. මෙය රක්ෂිතයේ ඇතිනම් මේ වාරිමාර්ගයෙන් අවස දෙන්නේ නැහැ.

<u>**ගරු සභාපති එම් .ඩබ් . අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>
සිදු වි ඇත්තේ මෙය අනුමත කිරිමට වාරිමාර්ගයෙන් බලය දෙන්නේ නැහැ. එයයි සිදු වි ඇත්තේ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**</u>
අනිවාර්යෙන්ම මේ සඳහා බලය දෙන්නේ නැහැ. එම නිසා සුදුසුම දෙය වන්නේ එම රක්ෂිතයේ ඇති කොටස මෙහාට ගෙන නැතිනම් මෙය නිත්‍යානුකූල වන්නේ නැති නිසා එම ඉදිකිරිම වෙනස් කර අපි නගර සභාව ප්‍රමාදයකින් තොරව එය අනුමත කර දෙන්න. ඔබතුමා ගනු ලැබූ ක්‍රියාව ඉතාම හොඳයි. ඔය වැනි රාජකාරියේදි මහජනතාව අපහසුතාවයට පත් කර දිය නොහැකිය. එවැනි සිද්ධින් වලදි ලේකම්තුමියනි , ඉක්මනින් කටයුතු කරන්න. නැතිනම් නගරයේ ජනතාවයි ඉන් අපහසුතාවන්ට පත් වන්නේ. අනාන්ද මහතා මෙය ඉල්ලා සිටිනවා බලපත්‍රය ගැනීමට. බහුතරයක්ම මෙය නොකර කරනවා. එහෙත් මෙය නිත්‍යානුකූල විදියට කරන්න යන පුද්ගලයාට අපි බාධා පමුණනවා. අනික් පුදගලයන් ඔහේ බලපත්‍ර නොගෙන කරගෙන යනවා. නිති කඩ කඩ සියල්ලම කරගෙන යනවා. මෙම ආනන්ද මහතා මෙය ඉල්ලා සිටින්නේ බොහොම සත්භාවයෙන්. එතුමාත් දැනුවත් කරන්න රක්ෂිතයේ කොටස මෙහාට කර සාදා ගැනිමට අනුමතිය දුන් පසු ප්‍රමාදයකින් තොරව මෙය ලබා දෙන්න.

<u>**ගරු සභාපති එම් .ඩබ් . අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>
ගරු මන්ත්‍රිතුමනි, මා ඔය කියන කොටස ඉවත් කරන්න කියන කතාවට එතුමාත් එකඟතාවයක් නැහැ. වසර 3 කට සිට මෙය ගැනිමට සටන් කළා මිස මෙය ඉවත් කිරිමට උත්සාහ කළේ නැහැ. මෙය ඉවත් කළානම් හෙට දිනයේ වුණත් බලපත්‍රය ගත හැකිය. එතුමා නිතරම කියන්නේ මා මෙහි රක්ෂාව කරන්නේ නැහැ. අනිත් පැත්තේ රක්ෂාව කරන්නේ . මෙය සලකන්න එපා කියා. මා ඒ පිළිබඳවත් මාගේ නිලධාරින්ට ඉල්ලුවා. මෙම කමිටුවේ මා ක්‍රියාශිලි පුද්ගලයෙකු නොවේ. මා බලපත්‍ර අත්සන් කරන පුද්ගලයා පමණි. කමිටු නිලධාරින් වශයෙන් තීරණය ගෙන එවන්න ඕන. මා ප්‍රකාශ කර සිටියා මෙය ගණන් නොගෙන අනෙක් කරුණු තිබෙනවා නම් මෙය ලබා දෙන ලෙස.අනෙක් කාරණය වඩුමඩුවක් කියන්නේ අපේ අතීතයේ සැලසුම් දාමා සාදන ලද ඒවා නොවේ.කණු 4 ක් දමා ඉදිකරන ලද දෙයකි.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**</u>
මේවා තාවකාලික ඉදිකිරිමිය. මෙයින් සිදුවන්නේ එම වෘත්තිය කරන පුද්ගලයාගේ ආර්ථික මට්ටම වැටෙනවා සේම අපේ අම්බලන්ගොඩ නගරයට වැටෙන ආදායම වැටෙනවා සේම , රටට ලැබෙන ආදායම වැටෙනවා,ඒ

හරහා යැපෙන පවුල් සංඛ්‍යාවටත් මින් බලපෑමක් ඇතිවේ. මේ අනුමතිය ලබා ගැනීමට යම් මුදලකුතු අපට ගෙවනවානේ.මුදල් නොගෙව කරන පුද්ගලයන් ආරක්ෂා වෙනවා. මුදල් ගෙවා කරන පුද්ගලයන්ට පහරක් ඇති වෙනවා. මේ පිළිබඳව සාධාරණ තීන්දුවක් ගෙන මේ අය ආරක්ෂා කර ගත යුතුයි. අර දේවල් සංශෝධනය කර ප්‍රමාදයකින් තොරව මෙය ලබා දෙන ලෙස ඉල්ලීමක් කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම් සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

මෙම වඩු මඩුව කරගෙන යන මහතාගේ පරිසර නීතිය හා පරිසර අයිතිය සමඟ අපි එතුමා සමඟ එකට සිටිනවා. නමුත් එතුමා ගඟ බඩ ප්‍රදේශය ගෙන ගොඩනැඟිලි ඉදිකරගෙන යන වැඩ පිළිවෙල වැරදියි. එහිදී අපි එයට අනුමතිය ලබා දුන්නොත් අපි වරදක් කළා වෙනවා. ගඟ අසල වැඩ නොකරනවා කියා ප්‍රකාශ කළාට අපි බලාගෙන ඉන්නේ නැහැ ඔහු එහි වැඩ කරනවා ද කියා. එවිට පරිසරය කැඩීමට අපි ඔහුට අනුබල දුන්නා වෙනවා. එතුමාගේ වැඩපල කරගෙන යාම සඳහා පරිසර බලපත්‍රය ලබා දීම පිළිබඳ ප්‍රශ්නයක් නැහැ. නමුත් අනවසර ඉදිකිරීමකට අවසර දීම සිදු නොකළ යුතුයි. එයට අවසර දෙනවිට ඉදිරියේදී එයට තව කෙනෙකුට පුළුවනි තවත් අනවසර ඉදිකිරීමක් කිරීමට.

**<u>ගරු සභාපති එම් .ඩබ් . අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගරු මන්ත්‍රතුමා මේ සඳහා අනුමතිය දීමට අපට බලයක් නැහැ. එසේ ලබා දෙන විට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අනුමතිය සහිතව ලබා දීමට තමයි බලය ඇත්තේ.එය ලැබෙන්නේ නැතිනම් අපිට කරන්න දෙයක් නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ ගරු මන්ත්‍රීතුමන්ලා , තුමියන්ලා ප්‍රකාශ කරන කරුණු සමඟ මා එකඟයි මේ ආනන්ද මහතාගේ ඉල්ලීම සම්බන්ධව. නමුත මේ සභාවේ කතා නෙකරපු දෙයක් තියෙනවා මේ සම්බන්ධව. මෙය ආනන්ද මහතා හෝ ධම්මිකා මහත්මිය ඉදිකරනු ලැබූ ගොඩනැගිල්ලක් නෙමේ. මෙය මාත් දන්න කාලයක මෙහි තිබුණේ බේකරියක්. ඉතිහාසයේ වසර 30 ක 40 ක ඉහත තිබුණේ බේකරියකි. එම බේකරියේ ගොඩනැගිල්ලේ තමයි මෙම වැඩපළ පවත්වාගෙන යනු ලබන්නේ. එම ගඟේ හෝ අයිනේ හෝ ඉදිකරන ලද ගොඩනැඟිල්ල තමයි මෙතුමාලා ගනු ලැබුවේ. මුදල් පොළියට ගෙන මා දන්නා තරමින් ඉතා අමාරුවෙන් තමයි මේවා ගනු ලැබුවේ. එම නිසා මේ පුද්ගලයන් ගොඩනැඟිලි ඉදිකරනු ලැබුවේ නැහැ. ඉදිරියට මේ අය ගොඩනැඟිලි ඉදිකිරීමට අදහසකුත් නැහැ. මෙම ගොඩනැගිල්ලේ ලී බඩු , ලී වැනි දේවල් දමා තිබෙන එක තමයි කරනු ලබන්නේ. ඔහුට අයිති බේකරියේ ගොඩනැඟිල්ලේ තමයි වඩු මඩුව පවත්වාගෙන යන්නේ. මෙයට විරෝධතාවයට ප්‍රධාන හේතුව වී ඇත්තේ ගඟේ රක්ෂිතය. එම ගඟ රක්ෂිතයට වාරිමාර්ගය විසින් නඩු කියයි. මෙම ගඟ රක්ෂිතයේ මාදම්පේ සිට දෙල්දූවට වෙනකම් ගොඩනැඟිලි ඉදිකර ඇත. මෙතුමා මේ කණු දෙකක් දමාපු එක නෙමේ. පරිසරය දූෂණය වෙලා ඉවරයි. එසේ බලනවා නම් මහා පාරට වනකම් එකක්වත් හදන්න බැහැ. අඩි50 ක් හෝ 60ක් ගඟේ රක්ෂිතය. එහෙම බලනවානම් මේ ගඟ රක්ෂිතයේ පාරට වනකම් කිසිම දෙයක් ඉදිකරන්න බැහැ. මේ සියළු කාරණා පසුබිමක තිබියදි මෙතුමාට මේ පරිසර බලපත්‍රය ලබා දිම මෙය අයුධයක් කර ගන්නවා. අම්බලන්ගොඩ නගර සභාව විසින් පරිසර බලපත්‍රය ලබා දීම පිළිබඳ අනවසර ඉදිකිරීමක් විදයට මෙයට නඩු දැම්මට අශා නැහැ. මෙය 1970 ගණන් වල නෙමේ 1960 ගණන් වල ඉදිකරනු ලැබූ ගොඩනැගිලි. මෙතුමන්ලා මෙම ඉඩම ගන්න විට තිබුණු ඒවා. නමුත් අපට බලපාන නාගරික සංවර්ධන අධිකාරියේ නීතිය බලපාන්නේ 1987 ට පසුව ඉදිකළානම්. ඉතිං අපට මෙයට බලපත්‍රය දීමේ බලපෑමක් නැහැ. අනවසර ඉදිකිරීමක් නිසා. අනවසර ඉදිකිරීම් තියෙනවා. මා නැහැ කියන්නේ නැහැ. එය පසෙක දමා පරිසර බලපත්‍රය ලබා දිමේ බලයක් තියෙනවා. ගරු නගර සභා මන්ත්‍රී සරත් චන්ද්‍ර මහතා ප්‍රකාශ කළ පරිදි පරිසර දූෂණය පිළිබඳ ප්‍රශ්නයේදි මින් ඉදිරියට මේවා හදන්න එපා කියා වාරිමාර්ගය සමඟ මෙම ගණුදෙණුව බේර ගන්න කියා අපේ පැත්තෙන් මෙම පරිසර බලපත්‍රය ලබා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා. මේ ප්‍රකාශ කළ ආකාරයට මින් විශාල පිරිසක් යැපෙන අය සිටිනවා. මේ බලපත්‍රය නොගන්න හේතුව අර අයගේ පුළුවන් කාර කම නෙමේ. මෙහි බලපත්‍රය ගන්න බැහැ. මෙයට ගන්න ගියාම තිබෙන බාධක . රජයේ නීතිරීති. දැන් අපි මිට ඉහත කතා කළා 1947 නීතිය ගැලපෙනවාද ? රු5 ට වැඩිනම් 25% ක බදු මුදලක්.එය ගැලපෙන්නේ නැහැ. මේවා තමයි මෙයටත් බලපා ඇත්තේ. පරිසර නීතියත් 1932 හරි 1936 හරි පරිසර නීති. අද තිබෙන තත්වයට මෙය ගැලපෙන්නේ නැහැ. එම නිසා තමයි බලපත්‍රයක් නොගැනීමට ඉදිරිපත් වීමට ප්‍රධාන හේතුව. එය නිදහසට කරුණක් නෙමේ නීතියට ගියාම නම්. මෙය ඉල්ලා සිටින පුද්ගලයෙකුට එය ලබා නොදී සිටීම සාධාරණ යුක්තිසහගත නැහැ. ගමේ ජනතාවට මෙම ව්‍යාපාර කරගෙන යාමට අවශ්‍ය පසුබිම සකසා දී තිබිය යුතු වෙනවා. ඒ සාධාරණ පැත්තත් බැලිය යුතු වෙනවා. මෙය විදේශීය මුදල් උපදවන කර්මාන්තයක්. විශාල වශයෙන් මා

පුද්ගලිකව දන්නවා මොවුන් මෙය කරනවා. විශාල සේවකසංඛ්‍යාවක් යැපෙනවා. අනුබද්ධ සේවක සංඛ්‍යාවක් යැපෙනවා. එම නිසා මෙම කර්මාන්ත ආරක්ෂා කර ගත යුතුව තිබෙනවා. අපි නගර සභාවක් විදියට අපට ලබා දිය හැකි සහයෝගයක් ලබා දිය යුතුයි. මොකද එතුමන්ලා ආණ්ඩුවකින් හෝ කිසිම නගර සභාවකින් වෙන කිසිදු සහනයක් ඉල්ලා සිටින්නේ නැහැ. මේ දෙය විතරයි ඉල්ලා සිටින්නේ. ඇත්තටම පොඩි අඩුවක් වන දෙයට මින් ඉදිරියට කිසිදු ඉදිකිරීමක් සිදු නොකරන ලෙස දැඩි උපදෙස් ලබා දී තාවකාලිකව ගිවිසුමක් අත්සන් කර හෝ එතුමන්ලාට පරිසර බලපත්‍රය ලබා ගැනීමට මෙම අනුමතිය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, ඔබතුමා පැවසූ ආකාරයට මෙයට යම් බාධාවක් වෙලා තිබෙන්නේ අප නගර සභාවේ නිලධාරිතුමියක් . නිලධාරින් විසින් අදාල කටයුතු ගෙනත් දුන් පසුත් එතුමියට පරි බාහිරව කටයුතු කිරීමට යාම ඔබතුමාට ඉතාමත්ම කරන මදිකමකි. ඔබතුමාට එම කටයුත්ත කරන්න බැරි වන විට ජනතාවට සේවය කරන්න බැරි කමක් වෙනවා මෙවැනි නිලධාරිතුමියන්ලා සභාවේ තබා ගෙන සිටීම. ඒ පිළබඳ තීරණයක් ගන්නා ලෙස ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මෙම ඉල්ලීම කර ඇති මහතාගේ ව්‍යාපාරයෙන් ස්වයං රැකියාවන් වශයෙන් පවුල් 21 ක් යැපෙනවා. එම නිසා මෙම කටයුත්තත් පුළුවන්තරම් සාර්ථක කර දෙන ලෙස ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්</u>

එම පරිසර බලපත්‍රය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**තීරණය -**

අම්බලන්ගොඩ මානිමුල්ල , වටරවුම් පාරේ, අංක 44/11 දරණ ස්ථානයේ එන්.එච්. ආනන්ද මහතා , ඩබ්. ධම්මි ප්‍රියන්තා මහත්මිය විසින් පවත්වාගෙන යනු ලබන වඩු මඩුව සඳහා පරිසර බලපත්‍රය ලබා දීම පිළිබඳ සාකච්ඡා කල අතර එම ගොනුව ප්‍රගති සමාලෝචන කමටු රැස්වීමට ඉදිරිපත් කර තීරණයක් ගැනීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මෙම ලිපියෙන් කියවෙන්නේ ඕකන්ද උඩ සිට පැමිණෙන වටරවුමේ දැන් ටිකක් විශාල තාප්පයක් බැඳ තිබෙනවා. තාප්පය බැඳීම තුල දෙ පැත්තේ සිට පැමිණෙන වාහන හැපෙන්න පුළුවනි පෙනෙන්නේ නැති නිසා. දෙපැත් පෙනෙන කන්ණාඩියක් සවිකර දෙන ලෙස ඉල්ලා සිටිනවා. එය ඉටු කර දෙන්න.

<u>ගරු සභාපති එම් .ඩබ් . අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

අපි මෙතෙක් කල් සවි කරන ලද දර්පණ තල සවිකර ඇත්තේ පුද්ගලික අංශයේ උදවු සහිතව. ඔබතුමා මේ සඳහා කවුරුහරි සම්බන්ධ කරගෙන ඉටුකර ගන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

මේ සඳහා කවුරුහරි සම්බන්ධ කර මෙය ඉටු කර දෙන්න. ඔබතුමාට පුළුවන් එය කරන්න. ඔබතුමා නිදහසට කරුණක් කියන්න අවශ්‍ය නැහැ. එය ඔබතුමාට කළ හැකියි. පොඩි මුදලක් යනවා ඇත්තේ.

<u>ගරු සභාපති එම් .ඩබ් . අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මේ දර්පණයක් සවිකිරීමට රු.25000/= ක විතර මුදලක් යනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, දැන් වෙනම එකක් ඇවිත් තිබෙනවා. ප්ලාස්ටික්

<u>ගරු සභාපති එම් .ඩබ් . අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ප්ලාස්ටික් තමයි. අපි පියාපියෝ සමාගමෙ අනුග්‍රහයෙන් මෙය සවිකර දෙනු ලැබුවේ

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

පසුගිය දිනක ත්‍රී රෝද රථයක් හැපි තිබුණා. මීට වසර 30 කට කලින් පොල්වත්තපුර නිවාස යෝජනා ක්‍රමයට ඉඩම් ඔප්පු ලබා දෙන්න කියා.

**<u>ගරු සභාපති එම් .ඩබ් . අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එය සිදු කරන්න මෙය නගර සභාව සතු ඉඩමක් නොවේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

දැන් නගර සභාව සතු නොවුනාට මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ වැඩකරන චන්ද්‍රසිරි මහතා මුණ ගැසුනා. එතුමාත් එම නිවාස වල සිටින්නේ. එතුමා ළඟ විස්තර වගයක් තියෙනවා. මා ගෙනත් දෙන්නම් එම මිනුම්දෝරු දෙපාර්තමේන්තුවෙන් ගනු ලැබු විස්තර ටික. අවුරුදු 30 ක් තිස්සේ මෙය කවුරුත් ගන්න කෙනෙකුත් නැහැ. මෙය බලන්න. ගරු හිටපු ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මැතිතුමාගේ නම කොටන ලද මුල් ගලකුත් තිබෙනවා. මුල් ගල් තබා රජයෙන් මුදල් ලබා දී තිබෙනවා මෙය සාදා ගැනිමට. මේ ගැන බලා එය ඉටු කර දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති එම් .ඩබ් . අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එම ඉඩමට අයිතිකරුවන් ඉන්නවා. එම ඉඩමේ අයිතිකරුවන් බලාගෙන සිටිනවා ඔප්පුවක් ලබා දිමට මෙම ඉඩම පවරා ගන්නා තුරු. එයයි සිදු වි තිබෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ප්‍රාදේශිය ලේකම් දැනුවත් කර එම පැවරුම් නියෝගය ලබා ගන්න.

**<u>ගරු සභාපති එම් .ඩබ් . අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ප්‍රාදේශිය ලේකම් හරහා නගර සභාව සම්බන්ධ කර නොගෙන කෙලින්ම රජයට කියන්න. අපට වන්දි ගෙවන්න වෙන්නේ අපට. එය අමාරුයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්දා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා ඉදිරිපත් කළ පොල්වත්තපුර නිවාස වලට ඔප්පු ලබා දීම පිළිබඳ ගරු අමාත්‍ය ගයාන්ත කරුණාතිලක මැතිතුමා සමඟ සාකච්ඡා කර තිබෙන්නේ.ඔප්පු ලබා දීම පිළිබඳ එම නිවැසියන්ගෙන් ඉල්ලීමක් කර තිබෙනවා. ඉදිරියේදි ඒ සම්බන්ධව කටයුතු කිරිමට බලපොරෝත්තු වෙනවා. මා මේ ලිපිය ඔබතුමාට ඉදිරිපත් කළා. මා මෙය කියවන්න කැමතියි. අම්බලන්ගොඩ ඕකන්ද මරණාධාර සමිතිය මඟින් ඉල්ලා තිබෙනවා. ප්‍රාදේශිය සිවිල් කොන්ත්‍රාත්කරුවන් ලියා පදිංචිය සිදු කරන්න කියා. ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට ගිය විට ප්‍රකාශ කර සිටියා මේ සම්බන්ධව සභාවෙන් තින්දුවක් ගත යුතු බව. ඉහත නම ඇති අප ග්‍රාම සංවර්ධන සමිති ක්‍රියාකාරි එක්සත් මරණාධාර සමිතිය ලියාපදිංචි වී ඇත්තේද අම්බලන්ගොඩ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය යටතේය.වෙනත් සිවිල් කොන්ත්‍රාත් වැඩ කටයුතු අම්බලන්ගොඩ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය යටතේ ලියා පදිංචි වි අති අතර අප එක්සත් මරණාධාර සමිතියට එම වැඩ ලබා නොදිම බලවත් අසාධාරණයකි. මෙවන් සිවිල් කොන්ත්‍රාත් වැඩ ඉටු කිරිමෙන් එම සමිතියට කොමිස් මුදල් ලැබෙන අතර එමඟින් රජයට බරක් නොවි සමාජ සුබ සාධනය සඳහා එකි සමිතියේ අඩුපාඩු සකසා ගත හැකිය.කරුණ මෙසේ වුවද ලේකම් ධූරය දරන මාද ක්‍රියාකාරි එක්සත් මරණාධාර සමිතියට දැන්විම සඳහා ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට දැන්විම සඳහා මා විසින් යෝජනා කර ඉල්ලා සිටිමි.

**<u>ගරු සභාපති එම් .ඩබ් . අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගරු මන්ත්‍රිතුමියණනි, කොන්ත්‍රාත් ලබා දිම පිළිබඳ රජය නිකුත් කරන ලද චක්‍ර ලේඛයක් තිබෙනවා.එම චක්‍ර ලේඛණයට මෙය වැටුණානම් අපේ අනුමතිය අවශ්‍ය නැහැ. මෙය නිකම්ම ලැබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්දා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

මරණාධාර සමිතිය වැටි නැත.

**<u>ගරු සභාපති එම් .ඩබ් . අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙය වැටි නැත්නම් අපිට බලයක් දෙන්න බැහැ. අපිත් ක්‍රියා කරන්නේ පාර්ලිමේන්තුවෙන් දෙනු ලැබූ නියෝග පරිදි. එම චක්‍ර ලේඛණ අනුව. අපිටත් බැහැ මේ අයට ලබා දෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්දා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

අනික් කරුණ නම් ඕකන්ද ගමේ අය ප්‍රකාශ කළ දෙයක් තමයි මේ පත්තරයේ අද දින වැටි ඇත්තේ . බොන්න වතුර ටිකක එකතු කර ගැනීමට ඊ එළිවනකම් දුක් විඳින්න වෙලා. ගිය සභාවේදි මෙය ප්‍රකාශ කර සිටියා. මෙය දරුණු ප්‍රශ්නයකි. මේ ජලසම්පාදන මණ්ඩලයෙන් ඇස්තමේන්තුව එවා තිබෙනවා එය දෙන්නම් කියා. අපිට මුදල් වෙන්කිරිම සිදු කර ගත හැකිය ගරු ප්‍රධාන අමාත්‍යතුමා මඟින් හෝ කෙසේ හෝ . ගියවර එවා තිබුණා ඇස්තමේන්තුව ඉදිරිපත් කරන්න බැහැ කියා එවා තිබුණා. දැන් අම්බලන්ගොඩ නගරයේ ප්‍රධාන පුරවැසියා ඔබතුමා තමයි.

**<u>ගරු සභාපති එම් .ඩබ් . අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

කියද එහි ඇස්තමේන්තු කර ඇති මුදල

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්දා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

මුලින් අර ඇස්තමේන්තු කර ඇති මුදල දෙන්න බැහැ කියා තිබුණා. මා අම්බලන්ගොඩ ප්‍රධාන පුරවැසියා වශයෙන් මා ඔබතුමාගෙන් ඉල්ලීමක් කර සිටිනවා. අම්බලන්ගොඩ වතුර ටැංකිය ඇත්තේ ඕකන්ද ප්‍රදේශයට යාබද ගමේ. නමුත් ඕකන්දට ජලය නැහැ. මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා මේ ලිපියට ඇස්තමේන්තුව ලබා ගැනිමට කටයුතු කරන ලෙස. දැන් මෙහි ඔබතුමාට තමයි මේ ලිපිය යොමු කර ඇත්තේ. එහි දුරකථන අංකයකුත් ලබා දි ඇත.මුලින් ඇස්තමේන්තු එවන්නම් කියා ඊළඟ ලිපියේ ඇස්තමේන්තු එවිමට නොහැකි බවත් ජල සම්පදානය සැපයිමට නොහැකි බවත් . මේ සභාවේ මා බොහෝ කනගාටුවෙන් ප්‍රකාශ කර සිටිනවා අපි කියන වැඩ බොහෝමයක් කෙරෙනවා අඩුයි. බලන්න වැසිකිළි පද්ධතිය දැන් වසරක් වෙනවා. අපි සභාවට පත් වී වසරක් වෙනවා. හැම දිනකම ඔය වැසිකිළිය ගැන කියනවා. අපිට කාන්තාවන් වශයෙන් යාමට වැසිකිළියක් නැහැ කියා.මේ පුස්තකාලයේ වැඩි දෙනෙක් සිටින්නේ කාන්තාවන්. රු437000/= ක පමණ මුදලක් වියදම් කර මෙම වැසිකිළිය වසා දමා තිබෙනවා. ඇයි එහෙම කරන්න එපා. මෙම වැඩ කටයුතු ටික ඉටු කර දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති එම් .ඩබ් . අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙම ජල ප්‍රශ්නය පිළිබඳ මා ගරු මන්ත්‍රිවරු 3 කියා සිටියා. නගර සභාවේ බවුසරය ලබා දෙන්නම් හැම දිනකම ජලය ගෙන එම සඳහා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්දා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

මේ පිළිබඳ මා ගමේ ජනතාව සමඟ සාකච්ඡා කළා. ඒ අය කියා සිටියේ මෙය කෙටි විසඳුමක් ලෙස.

**<u>ගරු සභාපති එම් .ඩබ් . අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

කෙටි විසඳුමක් නෙමේ හැමදාම බවුසරය දෙන්නම් . හැමතැනම ගොස් ජලය බෙදන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්දා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

බවුසරයෙන් ජලය පුරවා ගත්තාත් නාන කාමර වලට ජලය පොම්බ වෙන්නේ නැහැ. ඕකන්දේ සිටින ජනතාව එතරම් පොහොසත් අය නෙමේ.දැන් ජල ටැංකියවසා මොනවා හරි කරන්න සිදු වෙනවා. ගමේ අල්ලපු වැටේ තිබෙන ජල ටැංකියෙන් ගමට ජලය ලැබෙන්නේ නැහැ.

**<u>ගරු සභාපති එම් .ඩබ් . අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
මට කළහැකි දෙය මම බවුසරය තෙල් ගසා ලබා දෙන්නම්. ජලය පුරවා ගෙන ගොස් බෙදන්න.

- **පස්වරු 1.45 ට රැස්වීමේ වැඩ කටයුතු අවසන් කරන ලදී.**

අරුණ ප්‍රදීප් මණිමෙල් වඩු,
සභාපති,
අම්බලන්ගොඩ නගර සභාව.

ලේකම්,
අම්බලන්ගොඩ නගර සභාව.

**2019 -02–26 වන දින,**
අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේදීය.